
# පහන් කණුව ධර්ම දේශනා

## 9 - වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# පහන් කණුව
# ධර්ම දේශනා

නවවෙනි වෙළුම

ISBN 955 - 1255 - 06 - 02

**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

මොරගොල්ල වත්ත
ඉඹුල්ගස්දෙණිය

ප්‍රකාශනය
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය

2015



**ධර්ම දානයකි**

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2015

**පොත ලබාගත හැකි ස්ථාන:**

1. අනුර රූපසිංහ මහතා - 27, කොළඹ වීදිය, මහනුවර.
2. ස්ටැන්ලි සූරියාරච්චි මහතා - 25, කඩවීදිය, දේවාලේගම.
3. ඩී. ටී. වේරගල මහතා - 422, වැලිපාර, තලවතුගොඩ.
4. හේමමාලා ජයසිංහ මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
5. සංජීව නවරත්න මහතා
   අංක 308/17 බී, කිරිවත්තුඩුව පාර, මාගම්මන, හෝමාගම.
6. හේමා රූපසිංහ මිය - 26, හැව්ලොක් පාර, ගාල්ල.
7. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මණ පාර, මාතර.
8. සිරිමා විජේරත්න මිය - ඇලපාත, රත්නපුර.
9. ඒ.ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   සමන්, ඇරැවුල හන්දිය, කණ්ඩලම පාර, දඹුල්ල.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ජේ.ඒ.ඩී. ජයමාන්න මහතා
    ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
12. ආර්.ඒ. චන්දි රණසිංහ මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net

මුද්‍රණය:
**කොලිටි ප්‍රින්ටර්ස්**
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 011-4 870 333

# පටුන


| | පිටු |
|---|---|
| හැඳින්වීම | iv |
| ප්‍රකාශක නිවේදනය | vi |
| පොත්ගුල්ගල ධර්මග්‍රන්ථ ධර්මශ්‍රවණ මාධ්‍ය භාරය මගින් පළකැරෙන මුද්‍රණයට දායකවීම | vii |
| අමාගඟ | viii |
| 41. **'කිස්මිං ලොකො සමුප්පන්නා'** (සළායතන ලෝකය) | 1-24 |
| 42. **'අයං ලොකො පරලොකො'** (සසර ගවරළ එතරකිරීම) | 22-41 |
| 43. **'චත්තාරො ච පටිපන්නා'** (ආර්ය පුද්ගලයින් අටදෙනා) | 42-63 |
| 44. **'ඉදං හි තං ජෙතවනං'** (අනේපිඬු සිටුතුමා) | 64-84 |
| 45. **'කිං පත්තිනමාහු භික්ඛුනං'** (සභිය පරිබ්බාජක චරිතය) | 85-104 |




# හැඳින්වීම

දහම් දන හැමදන්ම පරදයි
දහම්රස හැම රසම පරදයි
දම් ඇලුම හැම ඇලුම් පරදයි
නිවන් සුව හැමදුක්ම පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දානයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දානයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මඟ හෙළිකරයි. මොහොතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි.

'නිවනේ නිවීම' පොත් පෙළෙන්* අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ **'පහන් කණුව ධර්ම දේශනා'** පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟ පිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් **33** ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙදා ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදායක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සහරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සලකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සලකමු.'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම

'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදාළහ. දාන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ සිතට චතුරාර්‍ය්‍යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සලකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම ('සන්දස්සෙති') සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මහ හෙළි පෙහෙළි වේවා!

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමාගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි. එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා!

අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමට ද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

මෙයට
සසුන් ලැදි,
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
(2542) 1999 පෙබරවාරි 12



## පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ ප්‍රකාශක නිවේදනය

දේවාලේගම, කන්දේගෙදර පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනවාසී පූජ්‍ය කටුකුරුන්දේ ඥාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීම උන්වහන්සේගේ අභිමතාර්ථයයි. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩ වෙසෙන ඓතිහාසික මහනුවර පුරවරය කේන්ද්‍රකොටගෙන අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය එම උදාරතර අරමුණ ඉටු කිරීමට ඇප කැපවී සිටියි.

මේතාක් කොළඹ කේන්ද්‍රකොටගෙන පවත්වා ගෙන යන ලද **ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය** තුළින් මින් ඉදිරියට උන්වහන්සේගේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය නොකෙරෙන අතර එයට අදාළව පැවති ග්‍රන්ථ මුද්‍රණය හා බෙදාහැරීම පිළිබඳ කාර්‍ය්‍යභාරයත්, මේතාක් මහනුවර **ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය** මගින් ඉටුකරන ලද ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ (seeingthroughthenet.net) වෙබ් අඩවිය පවත්වා ගෙන යාමත් මෙම **පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ** වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන්හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇති අතර ඒ පිළිබඳ සියලු විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කිරීම මැනවි. ආධාර යොමු කිරීමට මෙම ගිණුම හැර සම්පත් බැංකුවේ **වෙනත් ගිණුමක් නොමැති** බව අප පාඨක පිරිස දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරමු.

මෙයට,
සසුන් ලැදි
**පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය**

**ආධාර මුදල් යොමු කිරීම:**
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය
ගිණුම් අංක: 100761000202
සම්පත් බැංකුව - මහනුවර

**මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ විමසීම්:**
අනුර රූපසිංහ, 27, කොළඹ වීදිය, මහනුවර.
දුරකථන අංක: 0777-801938
ඊමේල් ලිපිනය: pothgulgala@seeingthroughthenet.net



# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ ''උතුරට'' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා ''එදා-වේල'' සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

''ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ ''උතුරට'' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. ''නිවනේ නිවීම'' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී ''පහන් කණුව ධර්මදේශනා'' පොත් පෙළෙහි ''බර පැන'' දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. ''දෙන දේ පිරිසිදුවම දීමේ'' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම ''නැවත මුද්‍රණ'' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

''පොත් අලෙවිය'' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන ''දහම් පඬුර'' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් ''ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට'' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

**''සබ්බදානං ධම්මදානං ජිනාති''**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

# 41 වන දේශනය

## 41 වන දේශනය (පහන් කණුව ධර්ම දේශනා අංක 155)

‘නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස’

කිසමිං ලොකො සමුපපනෙනා
කිසමිං කුබබති සනථවං
කිසස ලොකො උපාදාය
කිසමිං ලොකො විහඤඤති

ඡසු ලොකො සමුපපනෙනා
ඡසු කුබබති සනථවං
ඡනනමෙව උපාදාය
ඡසු ලොකො විහඤඤති

- හෙමවත සු. සුතත නිපාත

සැදැහැවත් පින්වතුනි,

වෙසක් පෝය දවස බෞද්ධ අපට තෙමඟුල් දිනයක්. බුදු උපතත් මඟුලක්, සම්බෝධියත් මඟුලක්, සම්බුද්ධ පරිනිර්වාණයත් මඟුලක්. මේ යුගයේ අවිද්‍යා බිත්තර කටුව බිඳගෙන පළමුවෙන්ම එළියට ආපු කුකුළු පැටවා තමන් වහන්සේ බව තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවා. අද වගේ දවසක ඒ ලබාගත්තු සම්බෝධි ඥානය තුළ ‘අවිද්‍යා බිත්තර කටුව තුළ හිරවෙලා ඉන්න ලෝක සත්ත්වයාගේ ප්‍රශ්නවලට පිළිතුරු අඩංගු වෙලා තියනවා. අද මේ වටිනා දවසේ අපි ඉදිරියට ගත්තු ගාථා දෙක ඒකට හොඳ නිදර්ශනයක්.

මේ ගාථා දෙක දකින්ට ලැබෙන්නේ සුත්ත නිපාතයේ හේමවත කියන සූත්‍රයේයි. ඒ සූත්‍රයට අදාළ අටුවා ආදියේ තියන විස්තරයට අනුව සාතාගිර හේමවත, කියන යක්ෂ සේනාපතියන් දෙදෙනා අතීතයේ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ගේ කාලයේ මහණවෙලා හොඳට මහණ දම් රැක්ක නමුත් ඒ භික්ෂූන් වහන්සේලා දෙදෙනා අතින් යම් කිසි



අවස්ථාවක විනය ප්‍රශ්නයක් විසඳීමේදී පක්ෂග්‍රාහීවීම නිසා වැරැද්දක් සිදු වුනා. ඒ ගැන පසුතැවිල්ල ඇති වීමෙන් මරණින් පස්සේ දිව්‍ය ලෝකයේ උපදිනවා වෙනුවට දීඝායුෂ්ක යක්ෂ උත්පත්තියක් ලැබූ බවයි කියවෙන්නේ. ඒ දෙදෙනා අතරින් වැඩිහිටි භික්ෂුව හිමාලයේ හේමවත පර්වතයේ හේමවත නමින් යක්ෂ සේනාධිපතියෙක් වුනා. අනෙක් භික්ෂුව ඉන්දියාවේ මධ්‍යම දේශයේ සාත පර්වතයේ සාතාගිර නමින් යක්ෂ සේනාපතියෙක් වුනා. මේ දෙදෙනා වාර්ෂිකව පැවැත්වෙන යක්ෂ සමාගමේදී - ඒ කාලයේ යක්ෂ සේනාපතියන් අතර දිව්‍ය සභාවේ වගේම තිබෙනවා විටින් විට හමුවන සිරිතක් - ඒ යක්ෂ සමාගමේදී හමුවෙලා පැරණි දන හැඳිනුම් කම් මතක් වෙලා ඔවුනොවුන් කතිකා කර ගත්තා. හිමාලය ප්‍රදේශයේ හෝ මධ්‍ය ප්‍රදේශයේ හෝ යම්කිසි ආශ්චර්ය අද්භූත දෙයක් සිදු වුනොත් ඔවුනොවුන්ට දන්වන හැටියට.

මෙවැනි අවස්ථාවකයි බුදුරජාණන් වහන්සේ ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව පැවැත්වූයේ. ඒ අවස්ථාවේදී සාත පර්වතයේ සාතාගිර යක්ෂයා තමන්ගේ යක්ෂ සේනාවත් එක්ක ඇවිල්ලා ධම්මචක්කප්පවත්තන සූත්‍රයට සවන් දුන් නමුත් හිත එකඟ කර ගන්න බැරි වුනා කියලා සඳහන් වෙනවා. තමන්ගේ යහළුකම් මතක් වෙලා හේමවත යක්ෂයාත් එතන ඉන්නවාද කියලා බැලුවා. නැති නිසා දේශනාවෙන් පස්සේ සාතාගිර යක්ෂයා තමන්ගේ පිරිසත් එක්ක අහසින් හේමවත යක්ෂයා සොයාගෙන ගියා. ඒ අතර හේමවත යක්ෂයාත් හිමාලයේ ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනා අවස්ථාවේ සිදුවුන ආශ්චර්යවත් සිද්ධි දැකලා ඒක තමන්ගේ යහළුවාට කියන්න අහසින් පිරිසත් එක්ක මධ්‍යම දේශය බලා පිටත් වෙලා ගියා. ඒ දෙගොල්ල ඒ අටුවා කථාවේ සඳහන් වෙන ආකාරයට රජගහ නුවර උඩදී හමුවෙලා ඒ පැවැත්වූ බුදු ගුණ පිළිබඳ සංවාදයයි මේ සූත්‍රයේ අඩංගු වෙන්නේ.

මේ යක්ෂ සේනාපතියන් දෙදෙනාගෙන් සාතාගිර යක්ෂයා බුදුරජාණන් වහන්සේ පහළ වෙච්ච ප්‍රවෘත්තිය ප්‍රකාශ කරලා සූත්‍රය ආරම්භ වන්නේ මේ විදියටයි. හේමවත යක්ෂයාට ආරාධනා කරනවා බුදුරජාණන් වහන්සේ දකින්න යන්න කියලා. අද පසළොස්වක පොහොය දවසයි. මේ හොඳ ලස්සන රාත්‍රියක්, අපි අසමසම නාමය ඇති

ගෞතම ශාස්තෘන් වහන්සේ දකින්න යමුද? එතකොට හේමවත යක්ෂයා අහනවා තව තවත් ස්ථිර කර ගන්න මේ බුදු කෙනෙක් ය කියලා මම හිතනවා උන්වහන්සේ හිත හොඳට පිහිටුවාගෙන ඉන්නවා කියලා. හැම සත්ත්වයින් පිළිබඳ සම සිත් ඇති කෙනෙක් කියලා. ඒ වගේම ඉෂ්ටානිෂ්ට අරමුණු පිළිබඳව සිතිවිලි පාලනය කරගෙන ඉන්නවා කියලා. එතකොට සාතාගිර යක්ෂයා කියනවා ඒක එහෙමමයි කියලා. ඒ ගාථාවේ විදියට අපි සම්පූර්ණයෙන් නොකිව්වත්, ඔව් ගෞතම ශාස්තෘන් වහන්සේ සිත පිහිටුවා ගෙන සෑම සත්ත්වයන් කෙරෙහි තාදී ගුණයෙන් යුක්තව ඉෂ්ටානිෂ්ට අරමුණු කෙරෙහි මධ්‍යස්ථව ඉන්න කෙනෙක්. ආයිත් හේමවත යක්ෂයා අහනවා මම හිතනවා උන්වහන්සේ ප්‍රාණඝාත, අදින්නාදාන ආදී අකුසල්වලින් වැළකිලා ඉන්නවා කියලා, ප්‍රමාදයෙන් වෙන්වෙලා නිරන්තරයෙන් ධ්‍යානයේ යෙදිලා ඉන්න කෙනෙක් කියලා. සාතාගිර යක්ෂයා කියනවා ඔව් උන්වහන්සේ කායික අකුසල්වලින් වෙන්වෙලා. ප්‍රමාදයෙන් වෙන්වෙලා, නිරන්තරයෙන් ධ්‍යානගතව සිටිනවා. ආයෙත් හේමවත යක්ෂයා අහනවා මා හිතනවා උන්වහන්සේ මුසාවාද පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්පලාප ආදියෙන් වෙන්වෙලා ඉන්නවා කියලා. ඒකටත් පිළිතුරු දෙනවා සාතාගිර යක්ෂයා ඔව් උන්වහන්සේ වාචසික අකුසල් වලින් වෙන්වෙලා ඉන්නවා කියලා. ආයිත් හේමවත යක්ෂයා අහනවා මම හිතනවා උන්වහන්සේ කාම සිතිවිලිවලින් වෙන්වෙලා, මෝහය ඉවත් කරලා, නිරන්තරයෙන් ධර්මයන් පිළිබඳව ප්‍රඥාවෙන් යුක්ත කෙනෙක් කියලා, ඒකටත් අර විදියට සාතාගිර යක්ෂයා පිළිතුරු දෙනවා. ආයිත් හේමවත යක්ෂයා කියනවා මම හිතනවා උන්වහන්සේ විජ්ජාචරණ සම්පන්න ගුණයෙන් යුක්තයි. උන්වහන්සේ ආශ්‍රවයන් දුරු කරලයි කියල. උන්වහන්සේට නැවත පුනර්භවයක් නැතෙයි කියලා. ඒකත් එසේමයි කියලා සාතාගිර යක්ෂයා ප්‍රකාශ කරනවා. ඔන්න ඊළඟට තියෙන්නේ එතන ඉඳලා ''අපි යමු දැන් ඉතින් ඒ වනයේ ධ්‍යාන වඩන අල්පේච්ඡ බුදුරජාණන් වහන්සේ දකින්න අපි යමු. ඒ ශාස්තෘන් වහන්සේ දකින්න යමු. වනයේ සිටින සිංහ රාජයෙක් වැනි උන්වහන්සේ හමු වෙලා, මාරයාගේ පාෂයෙන් බේරෙන හැටි අපි අහමු. එතන ඉඳලා නාට්‍යාකාරයෙන් වගේ මේ ප්‍රවෘත්තිය ඒ සූත්‍රයේ සඳහන් වෙන්නේ. ඊළඟට ගිහිල්ලා බුදුන් වහන්සේට ආමන්ත්‍රණය කරලා, භාග්‍යවතුන් වහන්ස, අපට මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න කියලා හේමවත යක්ෂයා ඇසූ ප්‍රශ්නයයි අපි මාතෘකාව හැටියට තැබුව ගාථා දෙකෙන් පළමුවෙනි ගාථාව. බුදුරජාණන් වහන්සේ ගෙන් අහනවා.



කිස්මිං ලොකො සමුප්පන්නො
කිස්මිං කුබ්බති සන්ථවං
කිස්ස ලොකො උපාදාය
කිස්මිං ලොකො විහඤ්ඤති

ලෝකය කොතනද උපන්නේ, ලෝකය කොතනද ඇසුර පවත්වන්නේ, සම්බන්ධකම් පවත්වන්නේ. ලෝකය කුමක් අල්ලාගෙන කොතනද වෙහෙසට පත් වෙන්නේ. මෙතන ප්‍රශ්න කීපයක්, ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ දුන්න පිළිතුරයි සඳහන් වෙන්නේ.

ඡසු ලොකො සමුප්පන්නො
ඡසු කුබ්බති සන්ථවං
ඡන්නමෙව උපාදාය
ඡසු ලොකො විහඤ්ඤති

ලෝකය හයෙහිය උපන්නේ. හයෙහිමය ඇසුර, සම්බන්ධකම් පවත්වන්නේ. ලෝකය හයම අල්ලාගෙන හයෙහිම වෙහෙසට පත් වෙනවා. මේ පින්වතුන්ට ඔය හයේ කථාව මතක තියාගන්න අපි කවියක් හැටියට ඉදිරිපත් කළොත් -

ලොව හයෙහි උපනේ - හයෙහිම ඇසුර සොයනේ
හය දැඩි කොට ගෙනේ - හයෙහිමය ලොව වෙහෙස විඳිනේ

ඔන්න ඔය අදහසයි බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළේ. ඊළඟට ප්‍රශ්න උත්තර වශයෙන් යන්නේ ඒ ගාථාවේ අර්ථය පැහැදිලි කර ගැනීමටයි. හේමවත යක්ෂයා විශේෂයෙන් අහනවා, මෙතන කියන උපාදානය මොකක්ද කියලා. මොකක් හරි දැඩිව අල්ලාගෙනනේ මේ වෙහෙසට පත් වෙන්නේ. ඒකට බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර ''පඤ්ච කාම ගුණා ලොකෙ - මනො ඡට්ඨා පවෙදිතා'' එයින් කියවෙන්නේ පඤ්ච කාම ගුණය, පඤ්ච කාම සම්පත්තිය කියන එක මනස හය වෙනි කොට පවතිනවා. එතකොට සළායතනයට අහුවෙනවා කියන එකයි. අපි පඤ්ච කාමය ගැන විතරනේ බොහෝවිට කථා

කරන්නේ. පඤ්ච කාම ගුණයන් එක්කම සිතත් සම්බන්ධ වෙනවා. ඒක නිසයි ''පඤ්ච කාම ගුණා ලොකෙ - මනො ඡට්ඨා පවෙදිතා'' අන්න එතනයි එතකොට පඤ්ච කාම ගුණය හා මනස - ඕකයි උපාදානය. ඊළඟට ඒකෙන් මිදීමත් අහනවා. කොහොමද මේ ලෝකයෙන් එතර වෙන්නේ, මේ දුකෙන් මිදෙන්නේ කියන එකත් අහනවා අර යක්ෂ සේනාපතියා. එයට දෙන පිළිතුර ''එත්ථ ඡන්දං විරාජෙත්වා'' මේ සළායතනයන් පිළිබඳව ඡන්දය ආශාව දුරු කිරීමෙන් තමයි දුක කෙළවර වෙන්නෙත්, ලෝක නිර්යානය කියල කියන්නේ - ලෝකයෙන් එතර වෙන්නෙත් එයින් කියලා ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. තව දුරටත් ඒ සංවාදය තව තවත් පැහැදිලි කරගන්න. ඒකට ප්‍රතිපදා වශයෙන් පිළිතුරු දෙනවා. ඒ සඳහා ගත යුතු ප්‍රතිපදාව සීල සමාධි පඤ්ඤා, ඒ විදියට සතිය ආදිය දියුණු කර ගැනීමෙන්, භවයට ඇති ආශාව දුරලීමෙන් තමයි ලෝකයෙන් එතෙර වෙන්න පුළුවන් කියලා. ඒ විදියට තව තවත් ඊළඟ ගාථාවලින් මූලික ප්‍රශ්නය පැහැදිලි කර ගත්තට පස්සේ මේ යක්ෂ සේනාපතියන් දෙදෙනා බොහොම සතුටු වෙලා ස්තෝත්‍ර ගීතිකා වගේ ප්‍රකාශ කරනවා. අද හොඳ උදෑසනක්, හොඳ පිබිදීමක්, හොඳ දර්ශනයක් අපට ලැබුණේ කියලා මේ ශාස්තෘන් වහන්සේ දක්නට ලැබීම. දැන් අපි ගමින් ගමට, පර්වතයෙන්, පර්වතයට, බුදු ගුණ ගයමින් ධර්මයේ ගුණ ගයමින් යනවා කියලා. ඒ විදියටයි සූත්‍රය අවසන් වෙන්නේ.

එතකොට එක අතකින් කෙනෙකුට ශ්‍රද්ධාව ඇතිවන අන්දමින් ඒ යක්ෂ සේනාපතියන් දෙදෙනා පිළිබඳ කතාන්තරය හේමවත සූත්‍රයේ අඩංගු වෙනවා. යක්ෂ සේනාපතියන් උනත් තුණුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ප්‍රකාශ වන ආකාරය **ශ්‍රද්ධාවක් නැති 'යක්ෂයින්ට'** හොඳ ආදර්ශයක්. ඊළඟට අපි කෙලින්ම එමු මේ ගාථාවල ගැඹුරු අර්ථයට. මේ හය කියල කිව්වේ මොකක්ද? ''**ඡසු ලොකො සමුප්පන්නො**'' - ඒක පැහැදිලි වුනා මේ ආයතන හයයි. ආයතන කියල කිව්වේ ඇස, කණ, නාසය, දිව, කය, මන සළායතනයටයි. සළායතන නමින් හඳුන්වන්නේ ස්පර්ශ ආයතන හයයි. මේ ධර්මය විග්‍රහ කරන අවස්ථාවල්වල බොහෝ අවස්ථාවල පඤ්ච උපාදානස්කන්ධය කියලා ස්කන්ධ පහක් ආශ්‍රයෙන් ධර්ම විග්‍රහයෙ යෙදෙනවා. නිවන ගැන, භාවනාව ගැන, කියන කොට තවත් අවස්ථාවල ආයතන හයක් හැටියට දක්වනවා, ඇස, කණ, නාසය, දිව, කය, මන



ඒවාට අදාළ අරමුණුත් එක්ක ගත්තහම ස්පර්ශ ආයතන හයයි. එතකොට මේ ලෝකය උපන්නේ මේ ස්පර්ශ ආයතන හයෙහිය කියන එකයි මෙතන කියවෙන්නේ. මේක කෙනෙකුට එක පාරටම තේරුම් ගන්න අමාරු වෙන්න පුළුවන්. ලෝකය උපන්නේ මේ හයේ. ඊළඟට ලෝකයේ ඇතිතාක් සම්බන්ධකම් ඇසුරු කිරීම් පවතින්නේත් මේ හය තුළයි. ඊළඟට මේ හය අල්ලාගනම තමයි ලෝකය වෙහෙසට පත්වෙන්නේ. ඕකයි ඔය හයේ කථාව, මේ හය පිළිබඳ ප්‍රශ්නය තව තවත් හිතට කාවැද්දීමට අපි ඊට අදාළ සූත්‍ර ඒ ඒ තැන්වලින් අරගෙන මතුකරගෙන තේරුම් ගන්න බලමු.

බොහෝ අවස්ථාවල බුදුරජාණන්වහන්සේ ගෙන් ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා අහනවා, ''ස්වාමීනි මේ ලෝකය ලෝකය කියල කියනවා මොකක්ද මේ ලෝකය කියන්නේ?'' එහෙම ඇහුවේ ඒක ප්‍රශ්නයක් නිසා නේ. මේ ධර්මය ගැන අවබෝධයක් ඇති කෙනෙකුට එහෙම ප්‍රශ්නයක් නගිනවා. ඒ ලෝකය පිළිබඳ සම්මුති සංකල්පය ගැන සෑහීමක් නැති නිසා වෙන්න ඇති එහෙම අහන්නේ. එහෙම සූත්‍ර ගණනාවක් තියනවා. අපි ගනිමු මෙතන ආනන්ද ස්වාමීන් වහන්සේම - බුදුරජාණන් වහන්සේ ගේ උපස්ථායකයන් වහන්සේ - උන්වහන්සේම අහනවා එක් අවස්ථාවක බුදුරජාණන් වහන්ස, මේ 'ලෝකය' 'ලෝකය' කියල කියනවා. කොතෙකින්ද ලෝකයක් වෙන්නෙ. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ දෙන පිළිතුර 'ආනන්ද යමක් - එතන යොදනවා වචනයක් ''පලොක ධම්මං'' කියලා. පලොක ධම්මං කියන වචනයේ අදහස ''පලුදු'' වෙන සවභාවය ඇති කියන එකයි. පලුදු යන වචනය සිංහලයේ භාවිතා වෙනව නේ යමක් පලුදු වෙනවා කියන්නේ පාලියේ දෙකම යෙදෙනවා ලුජ්ජති, පලුජ්ජති, කියලා. ලුජ්ජති කියන්නේ ලුදු වෙනවා. ලුදු වෙනවා කියලා සාමාන්‍ය සිංහලයේ භාවිතයක් නැහැ. පලුදු වෙනවා කියන එක මා දන්නේ නැහැ. ඒක ඇතැම් පළාත්වල භාවිතා වෙනවද කියලා. පලුදු වෙනවා කියන්නේ බිඳිලා යනවා කියන එකයි. බුදුරජාණන් වහන්සේ දෙන නිරුක්තිය මොකක්ද, යමක් පලුදු වෙනවා නම් ඒක තමයි ලෝකය. අමුතු නිරුක්තියක් ඒක. ඊළඟට ආනන්ද හාමුදුරුවන්ගෙන් අහනවා කුමක්ද ආනන්ද පලුදු වෙන්නේ, ඇස පලුදු වෙනවා, රූපය පලුදු වෙනවා. ඇස පිළිබඳ විඤ්ඤාණය පලුදු වෙනවා. ඇස පිළිබඳ විඤ්ඤාණයෙන් ඇතිවන ස්පර්ශයත් පලුදු වෙනවා, ඒ නිසා ඇතිවන

වේදයිතයන් සැප දුක් ඒවත් පලුදු වෙනවා. ඒ හැම එකක්ම පලුදු වෙන නිසා ඒකටයි ලෝකය කියන්නේ. එයිනුත් අපට පේනවා මේ සළායතනයන් පිළිබඳවයි මේ කථාව. එහෙම කියලා අන්තිමට කියනවා අවසාන කරන්නේ මේ ආර්ය ශික්ෂණයෙ එක්තරා වචනයක් සඳහන් වෙනවා. මේ ධර්මයේ සුවිශේෂ විග්‍රහයක්, බුදුරජාණන් වහන්සේ දෙන සුවිශේෂ විග්‍රහ හැඳින්වෙන්නේ මේ පාඨයත් එක්ක ''අරියස්ස විනයෙ'' කියන්නේ ආර්ය ශික්ෂණයට අනුව, ආර්ය ව්‍යවහාරයට අනුව - එතකොට ආර්ය ව්‍යවහාරයට හෝ ආර්ය ශික්ෂණයට අනුව ලෝකය කියල කියන්නේ ඕකයි. යමක් පලුදු වෙනවා නම් ඒ පලුදු වෙන්නේ ඇස, කණ, නාසය ආදී ඒවයි. ඒවට අදාල අරමුණුයි. ඒ හැම එකක්ම පලුදු වෙනවා. පලුදු වෙන අර්ථයෙනුයි ලෝකයක් කියලා කියන්නේ. දැන් අපට වෙලා තියෙන්නේ මේ උගතුන් බොහෝවිට මේ 'අරියස්ස විනයෙ' කියන පාඨය ගැන එතරම්ම තැකීමක් නැතිව නැවතත් සම්මුති  විග්‍රහවලට යනවා. ඇත්ත වශයෙන් යම් ප්‍රශ්නයක් තියන නිසානෙ ඒ ස්වාමීන්වහන්සේලා බුදුරජාණන් වහන්සේ ගෙන් ලෝකය මොකක්ද කියලා ඇහුවේ. ඉතින් බුදුරජාණන් වහන්සේට ඕන නම් පිළිතුරු දෙන්න තිබුණනේ ''ඕක අහන්න දෙයක්ද ඔය වට පිට බැලුවහම පේන්නෙ.'' එහෙම නොකියා අර විදියේ ගැඹුරු පිළිතුරක් දුන්නේ මේ ධර්මානුකූල විග්‍රහයක් නිසා. **'අරියස්ස විනයෙ' කියලා යම් විවරණයක් දීල තියනව නම්, එතනටයි අපේ අවධානය යොමු විය යුත්තේ. ධර්මයේ ගැඹුර තියෙන්නේ එතනයි.**

එහෙම කියල නැවතුනේ නෑ. ඒවට අදාළ තවත් සූත්‍ර තියනවා. තවත් අවස්ථාවක - අපි කෙටියෙන් ගත්තොත් - සමිද්ධි කියලා ස්වාමීන් වහන්සේ නමක් ඒත් බුදුරජාණන් වහන්සේ ගෙන් අහනවා, ''ස්වාමීනි, මේ ලෝකය ලෝකය කියලා කියනවා කෙතෙකින්ද ලෝකයක් හෝ ලෝක ප්‍රඥප්තියක් තියෙන්නේ'' ලෝක ප්‍රඥප්තිය කියන්නේ ලෝකයක් කියල පනවාලිය හැක්කේ, කියන එක. එතනදීත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, ''සමිද්ධි යම් තැනක ඇසක් ඇද්ද. රූප ඇද්ද ඇස පිළිබඳ විඤ්ඤාණයක් ඇද්ද, ඇස පිළිබඳ විඤ්ඤාණයෙන් දත යුතු ධර්ම ඇද්ද, අන්න එතනයි ලෝකයක් තියෙන්නේ. එතනයි ලෝක ප්‍රඥප්තියක් තියෙන්නේ. ''ඒ විදියටම මේ පින්වතුන් හිතාගන්න. අමුතුවෙන් නොකිව්වත් කණ පිළිබඳවත් ඒ විදියයි කියල හිතාගන්න. අවසාන



වශයෙන් මනස පිළිබඳවත් අපි ඒක විශේෂයෙන් කියනවා සුවිශේෂ නිසා. ''යම් තැනක සමිද්ධි මනසක් තිබේද, හිතක් තිබේද, මනසට එන අරමුණු තිබේද, මනෝ විඤ්ඤාණයක් තිබේද මනෝ විඤ්ඤාණය තුළින් දත යුතු ධර්ම තිබේද - 'දේවල්' කියල දෙයක් - අන්න එතනයි ලෝකයක් තිබෙන්නේ'', එතනින් නැවතුනේ නැහැ බුදුරජාණන් වහන්සේ, ලෝකය නැති තැනකුත් කිව්වා. ඔන්න එතනයි ගැඹුරු තැනට එන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ''සමිද්ධි යම් තැනක ඇස නැද්ද, රූප නැද්ද, ඇස පිළිබඳ විඤ්ඤාණයක් නැද්ද, ඇස පිළිබඳ විඤ්ඤාණයෙන් දත යුතු දේවල් නැද්ද, එතන ලෝකයක් වත් ලෝක ප්‍රඥප්තියක් වත් නැහැ'' ඒ විදියටම හිතා ගන්න. අන්තිමට මනස ගැන අපි කියමු. අනිත් ඒවා මේ පින්වතුන්ට හිතාගන්න ඉඩ තියලා. ''යම් තැනක මනසක් නැද්ද මනසට එන අරමුණු නැද්ද - ඒ කියන්නේ ධම්මා, මනසට එන අරමුණු - ඇසට රූපය වගේ මනසට එන අරමුණු හඳුන්වන්නේ ධම්ම නමින්, මනසකුත් නැද්ද ධම්මා කියලා හඳුන්වන මනසට එන අරමුණුත් නැද්ද, ඒ දෙක නිසා ඇතිවන මනෝ විඤ්ඤාණයකුත් නැද්ද, මනෝ විඤ්ඤාණයක් තුළින් දත යුතුයි කියල හිතන දේවලුත් නැද්ද, එතන ලෝකයකුත් නැහැ ලෝක ප්‍රඥප්තියකුත් නැහැ.'' එතනත් ආර්ය ව්‍යවහාරය අනුව දුන්න විග්‍රහයක් දක්වන්නේ. ඔන්න එතකොට පේනවා අපට, මේ අපි සම්මුති වශයෙන් ගන්න ලෝකය බුදුරජාණන් වහන්සේ දක්වන්නේ මේ සළායතනයන්ට සාපේක්ෂව තිබෙන දෙයක් ලෙස. එපමණක් නොවෙයි. මේ ලෝකය නිරුද්ධ වෙන හැටිත් පෙන්නුවා අර සමිද්ධි ස්වාමීන් වහන්සේට කළ දේශනාව තුළින්, ඇස කණ ආදිය තිබෙනකන් ලෝකයක් තිබෙනවා. ඒවා නැති තැන ලෝකයක් නැහැ. මොකක්ද ඒවා නැති තැන? ඔන්න ඔතනයි ගැටළුව, බොහෝ දෙනාට තියන ගැටලුව ඒකයි. ඇස ආදිය නැති තැනක් ඇති විය හැකිද? ඇස, කණ, නාසය, දිව, කය, මන හා ඒවාට අදාළ අරමුණු නැති තැනක් තිබෙන්න පුළුවන්ද? ඒක තමයි සළායතන නිරෝධ කියල කියන්නේ, සළායතන නිරෝධ කියල කියන්නේ මේ අපි ලෝකය කියල ගත්තු සළායතනයෙන් පිටවීමයි. එතකොට **අවිද්‍යා බිත්තර කටුව කියල කියන්නේ ඕකයි. අවිද්‍යා බිත්තර කටුව කියල කියන්නෙ ඔය සළායතනයයි. සළායතන නිරෝධය තමයි ලෝකෝත්තර වීම.** බිත්තර කටුව බිඳගෙන එළියට එනවා කියල කියන්නේ ඒකයි.

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ පළමුවෙනි කුකුළු පැටියා කියල ප්‍රකාශ කළේ සමහරවිට මේ පින්වතුන්ට හිතෙන්න පුළුවන් බුදුරජාණන් වහන්සේට නිග්‍රහ කරන්න කුකුළු පැටියා කියලා කිව්වා කියලා. බුදුරජාණන් වහන්සේ බෝධිසත්ව කෙනෙක් හැටියට උත්පත්තිය ලැබීම නෙවෙයි මෙතන කියන්නෙ. **සම්බෝධි අවස්ථාවෙයි බුදුරජාණන් වහන්සේ කුකුළු පැටියා වගේ අර අවිද්‍යා බිත්තර කටුව බින්දේ.** සළායතන බිත්තර කටුව බිඳගෙන එළියට ආවේ. අන්න ඒ කතාන්තරය අතුරු කථාවල් හුඟක් කියවෙන නමුත් ඒකත් වටිනා සූත්‍රයක්. ඒක අපි කෙටියෙන් කියමු. ඒකත් බුද්ධ වචනයක් වශයෙන්ම සඳහන් වෙන්නේ වේරඤ්ජා සූත්‍රයේ. වේරඤ්ජ කියන බ්‍රාහමණයා එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ගැන අප්‍රසාදයක් ඇතිකර ගෙන බමුණන්ට නිග්‍රහ කරනවා කියලා ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට  නිග්‍රහ වෙන වචන රාශියක් කිව්වා උච්ඡේදවාදියෙක්ය 'අපගබ්භො' ආදී වශයෙන් නොයෙකුත් ඒ කාලයේ ව්‍යවහාර වෙන නරක වචන ගොඩක් බුදුරජාණන් වහන්සේට යෙදුවා. බුදුරජාණන් වහන්සේ එක එකක් අරගෙන ධර්මානුකූලව පෙන්වනවා ඔව්, ඔව් මම එහෙම තමයි නමුත් මෙන්න මේ අර්ථයෙන්ය කියල අන්තිමට බ්‍රාහමණයාට ශ්‍රද්ධාව  ඇති කරලා බුදුන් සරණ යන තත්ත්වයට ගෙනාවා. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ ප්‍රකාශ කළා බමුණ, - මේ පින්වතුන් හොඳට දන්න කතන්දරයක් නේ මේක විශේෂයෙන් කුකුළන් ගැන එහෙම දන්න අය - ඔය කිකිළියන් සමහර විට බිත්තර අටක් දහයක් හෝ දොළහක් හෝ රකිනවා. එහෙම රැකල ඉවර උනහම යම්කිසි කුකුළු පැටවෙක් නිය තුඩින් හරි, මුව තුඩින් හරි, බිත්තර කටුව බිඳගෙන එළියට ආවොත් බමුණ ඒ කුකුළු පැටවාට කියන්නේ ජ්‍යෙෂ්ඨයා කියල නේද, ප්‍රධානියා කියල නේද ශ්‍රේෂ්ඨයා කියල නේද? ඔව්, ඔව්, එහෙම තමයි කියන්නේ, ඒ වගේ තමයි මමත් මේ අවිද්‍යාව නමැති බිත්තර කටුවෙ හිරවෙලා ඉන්න ලෝකයා අතරේ මම තමයි පළමුවෙන්ම බිත්තර කටුව බිඳගෙන එළියට ආවේ. එතකොට බිත්තර කටුව බිඳගෙන ආවේ සම්බෝධි අවස්ථාවේ. **එතකොට නිවන කියල කියන්නේ සළායතන නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂයයි. මෙලොවම ලබන ප්‍රත්‍යක්ෂයයි.**

සළායතනය තුළ නම් ලෝකය තියෙන්නේ සළායතන, තුළ නම් ඔක්කොම තියෙන්නේ, මේ පින්වතුන්ගේ ඔය උපකරණ වලින් දික්



කරලා ඒ අතට මේ අතට විහිදුවන මේ සම්බන්ධකම් හසුරුවලා තියෙන්නේ ඔය දැන් තියන උපකරණ හැම එකක්ම හැම අනුදක්නයකම, දුර දක්නයක්නයකම එක් කොණක ඇහැක් තිබේ. සමහර උපකරණවල එක් කොණක කණක් තිබේ. ඒ විදියට හැම එකක්ම සළායතනයේ දික් ගැස්සීමක් පමණයි. ඒක තුළයි හිරවෙලා ඉන්නේ. **විද්‍යාව හිරවෙලා ඉන්නෙත් ඒකෙයි. බිත්තර කටුව තුළ හිරවෙලා ඉන්න අය හුඟක් ඉන්නවා. මේ සත්‍යය ලෝකයාට විශේෂයෙන්ම බටහිර ලෝකයාට අපට දෙන්න පුළුවන්කම තියනවා නම් ධර්මයෙ ගැඹුරු දෙයක් හැටියට පටිච්ච සමුප්පාදය ධර්මයෙ ගැඹුර නිවන පිළිබඳ මේ කාරණය මේ වටිනා මොළ රාශියක්, මේවා තුළ හිරවෙලා ඉන්න කුකුළු පැටවුන් කීප දෙනෙක් හරි බිත්තර කටුව බිඳගෙන එළියට එන්න උත්සාහ කරාවි.** කොහොමද බිත්තර කටුව බිඳින්නේ. අන්න ඒකට අදාළ ඒවා තමයි කෙටියෙන් ගත්තොත් ඉතින් ආර්‍ය අෂ්ටාංගික මාර්ගය කියාවි. තවත් විදියකින් කියනවා නම් සීල, සමාධි, පඤ්ඤා. තවත් ගැඹුරින් බලනවා නම් ත්‍රිලක්ෂණය වැඩීම. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ඒකත් බුදුරජාණන් වහන්සේ නොයෙකුත් සූත්‍රවල මේ සළායතනයන්ගෙන් එතරවීම සඳහා යොදන විදර්ශනාව ප්‍රබල අන්දමින් විස්තර කරල තියනවා. මේ ඇස  නිත්‍ය වශයෙන් ගැනීම තුළින් ඒවා පිළිබඳ ඡන්දය ඇතිකර ගැනීම තුළින්, ඡන්දය ඇති වන්නේ නිත්‍ය වශයෙන් ගැනීමෙන්. ඡන්දය තිබීම තමයි මේක ඇතුළේ හිරවී තිබීම. ඡන්දය කියන්නේ ආශාව තණ්හාව. ඡන්දය නැති කළ අවස්ථාවේ නික්මීම තිබෙන්නේ. ඒ සඳහා උපකාර වන්නේ ත්‍රිලක්ෂණය වැඩීමයි. **නිත්‍ය නිමිත්ත ඉවත් කරලා, අනිත්‍ය වශයෙන් දකින්න උත්සාහ කරනවා යෝනිසෝ මනසිකාර වශයෙන්. අන්න ඒක තමයි අර කුකුළු පැටියාගේ තුඩ හැටියට ගන්න තියෙන්නේ.** නිරන්තරයෙන් සම්මර්ෂණය කරනවා අනිත්‍ය හැටියට, අනිත්‍ය නම් යමක් බිඳෙන සුළු නම්, වෙනස් වෙනවා නම් 'පලොක ධම්මං' කියනවා වගේ බිඳෙනවා නම් මහ කරදරයක් මේක. මේක ප්‍රතිසංස්කරණය කර කර තියාගන්න එක දුකක්. ඊළඟට මේක තමන්ගේ වසයේ පවත්වා ගන්න බැරිනම් කොහොමද මගේ ආත්මය කියන්නේ - අනාත්මයි.  ඔන්න බුදුරජාණන් වහන්සේ මතු කරලා දුන්න ත්‍රිලක්ෂණය. ඔතනට ගලපලා ගන්නවා නම් ත්‍රිලක්ෂණය වැඩීම තුළින් තමයි යම් අවස්ථාවක උග්‍ර විදියට වැඩුවහමයි අර කියාපු විදර්ශනා ඥාන තුළින් මේ බිත්තර කටුව බිඳගෙන  එළියට එන්න පුළුවන් වෙන්නේ. ඔන්න ඔය තත්ත්වයයි බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය තුළ තිබෙන්නේ.

නමුත් බොහෝ දෙනා බයයි දුක නැතිකර ගන්න. බුදුරජාණන් වහන්සේ කියල තියනවා දුකම තමයි ලෝකය කියන්නේ. හරියට පියන්පත් දෙකක් එකකට එකක් වැහෙනවා වගේ දුක තුළයි ලෝකය තිබෙන්නේ. ලෝකය තුළයි දුක තිබෙන්නේ. එහෙම නැත්නම් සම්පූර්ණ සරල සමීකරණයක් ඒක. ලෝකය සමානයි දුකට. ඒකයි බුද්ධ වචනය. අපි ඒක පිළිගන්න සූදානම් නැතත්, 'සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා' කියල කියන්නේත් ඒකයි. සැකෙවින් ගත්තොත් ජාති, ජරා, මරණ, මේ හැම එකක්ම දුකක් බව ඇත්ත, නමුත් අවසාන වශයෙන් මේ අල්ලගන ඉන්න ගොඩවල් පහම දුකක් කියල කිව්වෙත් ඒකයි. ඒ අල්ලා ගැනීම පඤ්චඋපාදානස්කන්ධ වශයෙන් හඳුන්වන අවස්ථාවලුත් තියනවා. මේ සළායතනය එදිනෙදා ප්‍රත්‍යක්ෂ ආයතන හය තුළ තිබෙන අරමුණු, ඒවාට තිබෙන ඇල්ම හා ඒවා ආශ්‍රයෙන් ඇති කර ගන්න ප්‍රපංච ආදිය නිසා තමයි ලෝකයක් තිබෙන්නේ. විද්‍යාවෙන් පරතෙරට ගියත් එතන තමයි ලෝකය තියෙන්නේ. සමිද්ධි ආදී සූත්‍රවලින් අපට පේනවා බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා මේ සළායතන ගෙවෙන ස්වභාවය. නිරන්තරයෙන් මේ ගැන මෙනෙහි කරන කෙනාට ටිකෙන් ටික ඒ තුළින් එන්නේ විරාගය නොඇල්ම, නිබ්බිදා කියලත් කියනවා නිබ්බිදා - නොඇල්ම, ඒ තුළින් ඊළඟට නික්මෙන අවස්ථාවට උපකාර වන 'විමොක්ඛ මුඛ' හැටියට දක්වනවා. විමොක්ෂ කියලත් කියනවා. මේ පින්වතුන් අහලත් තියනවා භාවනා කරන පින්වතුන් නිත්‍ය නිමිත්ත අනිත්‍ය වශයෙන් දැකීමේ අන්තිම කෙළවර තමයි අනිමිත්ත. නිමිත්තක් එන්නෙ නැහැ හිතට. නිමිත්තක් ගන්න බැරි තරමට මේකෙ අනිත්‍යතාව පේනවා. බිඳී බිඳී යන ස්වභාවය ඒ තරම් උග්‍ර හැටියට පේනවා. එතකොට ඒ වෙලාවේ නිමිත්තක් ගන්න බැහැ සිතට - අනිමිත්ත. එතකොට  එහෙම නිමිත්තක් ගන්නෙ නැති එකේ රඳන්න බැහැනෙ. පණිධි කියන්නේ ප්‍රාර්ථනාවක් පිහිටුවා ගැනීම, ප්‍රාර්ථනාවක් පිහිටුවා ගන්න තැනක් නැහැ. අප්පණිහිත, අනිත්‍යතාව වැඩීම තුළින් ත්‍රිලක්ෂණයට සම්බන්ධ කර ගත්තොත් අනිත්‍යතාව වැඩීමේ කෙළවර තමයි අනිමිත්ත විමොක්ඛය. දුක්ඛ සංඥාවේ වැඩීම තුළින් අවසන් වන්නේ අප්පණිහිත, ප්‍රණිධියක් නැහැ. ආශාවක් නැහැ. එපා කමක් තියෙන්නේ. ඊළඟට අනාත්ම සංඥාව, ප්‍රඥාවන්තයින් මේක අනාත්ම හැටියට තේරුම් ගත්තොත් 'මමය මගේය කියල ගන්න දෙයක් නැහැ කියලා අන්න ඒක වැඩීමේ අවසාන



අවස්ථාවයි සුඤ්ඤත, ශුන්‍ය වශයෙන් දකිනවා. මමය මගේය කියලා ගන්න දෙයක් නැහැ. එතකොට ත්‍රිලක්ෂණය වැඩීමෙනුයි මේ සළායතන ලෝකයෙන් එතරවීම තිබෙන්නේ.

මෙන්න මේ ලෝක නිරෝධය කථාව තවත් ආකාරයකින් බුදුරජාණන් වහන්සේ නොයෙකුත් සූත්‍රවල විග්‍රහ කරල තියනවා. ඒ වගේම බුදුරජාණන් වහන්සේ ශාස්තෲන් වහන්සේ කෙනෙක් හැටියට, ගුරුවරයෙක් හැටියට, ඉදිරිපත් කරපු ආකාරය මහා ආශ්චර්යවත්. මේ කාලයේ ගුරුවරුන්ටත් ඉගන ගන්න දේවල් තියනවා. උන්වහන්සේ ගැඹුරු කාරණාවල් ඉදිරිපත් කරපු ආකාරය ධර්ම කාරණා ඉදිරිපත් කරපු ආකාරය. එක් අවස්ථාවක උන්වහන්සේ සංඝයා මැද ඉඳගෙන දේශනයක් කරනවා. කවුරුත් අහපු ප්‍රශ්නයකට පිළිතුරු හැටියට නොවෙයි. **මහණෙනි මම කියන්නේ ගමන් කරලා ලෝකයෙ කෙළවරට පැමිණෙන්න බැරිය කියලා. ඒ වගේම මම කියනවා ලෝකයෙ කෙළවරට නොපැමිණ දුක කෙළවර කරන්ටත් බැරිය කියලා.** පරස්පර විරෝධී කියමනක්. එකක් මතක තියාගන්න ඉස්සෙල්ලා කිව්වෙ මොකක්ද කියලා - මම කියනවා ගමන් කිරීමෙන් ලෝකයේ කෙළවරට පැමිණිය නොහැකිය කියලා. ඊළඟට කියනවා ලෝකයෙ කෙළවරට නොපැමිණ දුක් කෙළවර කිරීමකුත් නැත කියලා. ඕක කියලා බුදුරජාණන් වහන්සේ ඒක විග්‍රහ කරන්න ගියේ නැහැ. නැගිටලා විහාරයට වැඩම කළා. ඉතින් කොහොමද වැඬේ? අර සංඝයා වහන්සේලාට කර කියා ගන්න දෙයක් නැතිව වට පිට බලනකොට ඔන්න ආනන්ද හාමුදුරුවෝ ඉන්නවා. ආනන්ද හාමුදුරුවෝ ගැන බුදුරජාණන් වහන්සේත් නිරන්තරයෙන් වර්ණනා කරල තියනවා. අනිත් සංඝයා වහන්සේලාත් බොහොම ගෞරව කරන කෙනෙක්, බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් ඇසුරු කරන නිසා. අපි ගිහිල්ලා ආනන්ද හාමුදුරුවන්ගෙන් වත් අහමු. අහගන්න ඕන කියලා ආයිත් බුදුරජාණන් වහන්සේට කරදර නොකර, ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟට වැඩලා මේ බුදුරජාණන් වහන්සේ කෙටියෙන් දේශනා කළ පාඨයේ අදහස මොකක්ද කියලා ඇහුවා. ඉතින් ආනන්ද ස්වාමීන් වහන්සේත් ඇයි ඒ අවස්ථාවේ නේ අහන්න තිබුණේ. මං වගේ කෙනෙක් ළඟට මොකටද එන්නේ කියලා ටිකක් අදි මදි කරලා ඔන්න උත්තරේ දුන්නා, ''**ඇවැත්නි යමකින් ලෝකය පිළිබඳ සංඥාවක් හැඳිනීමක් ඇති**

**වෙයිද යමකින් ලෝකය පිළිබඳව මානයක් මැනීමක් වෙයිද ඒකයි මේ ආර්ය ව්‍යවහාරයට අනුව ලෝකය කියලා කියන්නේ.''** මේ ආර්ය ව්‍යවහාරයට අනුව - අන්න අර සුවිශේෂ නිර්වචනය - ශාසනික හැඳින්වීමට අනුව ලෝකය කියන්නේ ඒකටයි. ඊළඟට **කුමකින්ද ලෝකය මනින්නේ, ඇසින්, කණෙන්, නහයෙන්, දිවෙන්, කයින්, මනෙන්.** ඔයින් ඇර මනින්න එකක් නැහැ. ඉතින් අන්න ඒ මනින ඒවයි ඕකයි, ඔය විවරණය කිව්වා. ඒ විවරණය බුදුරජාණන් වහන්සේත් අනුමත කළා.

ඉතින් අන්න ඒ අනුව අපට හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළේ මේ ලෝකය, ලෝකයෙන් එතෙරවීමේ කථාව එහෙම පිටින්ම සළායතන හා සම්බන්ධ බව. ලෝකයත් සළායතනයත් පිළිබඳ ඒ සම්බන්ධතාව තව දුරටත් පැහැදිලි වෙනවා මේ පින්වතුන්ට අපි කලින් අවස්ථාවකත් සඳහන් කරලා තියනවා බොහෝ දෙනෙක් කියවලත් ඇති රෝහිතස්ස සූත්‍රයෙන්. අති විශේෂ සූත්‍රයක් හැටියට, බුද්ධ වචනයක් හැටියට උගතුන් පවා සළකන එකක්. මහ පුදුම දේශනාවක්, මම ප්‍රකාශ කරනවා - ලෝකය ගැනයි එතනදීත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ - **සංඥාවත්, මනසත් සහිතවූ බඹයක් පමණ වූ මේ ශරීර කූඩුව තුළම මම ලෝකයත්, ලෝකයේ හටගැනීමත්, ලෝක නිරෝධයත්, ලෝක නිරෝධයට යන මාර්ගයත් පෙන්වාලමි.** මේ බඹයක් පමණ වූ සංඥාවත් මනසත් සහිතවූ මේ ශරීරය තුළම ශරීර කූඩුව තුළම - ''කළෙබරෙ'' කියන වචනයක් යොදනවා. අපි නම් මෘත කලෙබරෙ කියන්නේ. ඒ ටික අහක් කළහම මෘත කලෙබරයක් තමයි නිකම් මලකඳක් - නමුත් සංඥාවත් මනසත් සහිතයි. එතන විශේෂයි. සංඥාවත් මනසත් සහිත වූ මේ ජීවමාන කය තුළම තමයි ලෝකයක් තියෙන්නෙත්, ලෝකයේ හට ගැනීම තියෙන්නෙත්, ලෝක නිරෝධය තියෙන්නෙත් එතනයි. ලෝක නිරෝධයට මාර්ගය තියෙන්නෙත් එතනයි. වෙන ලෝකයක නොවේ. වෙන තැනක නොවේ. අන්න ඒ දේශනාව තමයි ඇත්ත වශයෙන් මේ යුගයට, ඔය විද්‍යාවට ගිහිල්ලා හිරවෙච්ච කට්ටියට මේ බුද්ධ වචනය තේරුම් ගැනීමට ඇති හොඳම අවස්ථාව, මොකද මේ පින්වතුන් කොතෙකුත් අහලත් ඇති ඇතැම් අය විද්‍යාව පැත්තෙන් එහෙම ඒ ගැන කියාගන්න අය බටහිර ලෝකයේ වටිනා මොළ රාශියක් දැන් හිරවෙලා



ඉන්නේ භෞතික විද්‍යාව ඔස්සේ ගිහිල්ල **ක්වොන්ටම් භෞතිකය** කියලා කියන නවීන විද්‍යාවේ. නමුත් ඔය හැම එකක්ම අන්තිමට ගිහිල්ලා තේරුම් ගන්නවා මේ **දෘෂ්ටි කෝණයකින් තොරව ලෝකයක් නැහැ** කියලා. අන්න එතනටයි මේ ධර්මය එන්නේ. දෘෂ්ටි කෝණයකින් තොරව ලෝකයක් නැහැ කියන එක පිළිගන්න ඔවුන් සූදානම් නැහැ. ඒක නිසා ඔවුන් තව තවත් සොයනවා. නමුත් ඔවුන්ගේ ඒ පර්යේෂණ පරමාණුව කියන එක සොයන්න යන ඒ සෙවිල්ල නිෂ්ඵල වෙනවා. මොකද මේ බුද්ධ වචනය. බුදුරජාණන් වහන්සේ ඊට කලින් මේක කියලා තියනවා.

**යම්කිසි දෘෂ්ටි කෝණයක් ඇතිවයි ලෝකයක් ඇති වෙන්නේ.** ඒ 'අස්මි' කියන ඒ මානය ගත්ත අස්මි මානය කියල කියන්නේ ඒකයි. 'වෙමි' කියල ඒ මානය ගත්තු තැනයි, සත්ත්වයෙක් පිළිබඳ ඒ සංකල්පයක් ඇති තැනයි, සත්ත්වයාට අදාල සළායතනයෙන් තමයි ලෝකයක් ඇති වෙන්නේ. දැන් අපට වෙලා තියෙන්නේ අපි මනුෂ්‍යයින් උනාට පස්සේ අපි අනිත් ලෝකයන් ගැන තැකීමක් නැහැ. තිරිසන් ලෝකය ගැන තැකීමක් නැහැ. ඒ අය සමහරවිට අපේ ජීවිතයට උපකාර කර ගන්න අය හැටියට සමහරු සතුන් ගැන සිතනවා. නමුත් ඒ එක එක සතාට අදාළ ලෝකයක් තියනවා. කූඹියගෙ ලෝකය අපට තේරුම් ගන්න බැහැ. අනික් සතුන්ගෙ ලෝකත් තේරුම් ගන්න බැහැ. එක එක සතාට අදාළ ලෝකයක් තියනවා. අපි උනත් ගිහිල්ල ඒවයේ උපන්නට පස්සේ අපි ඉන්නේ අමුතුම ලෝකයක. **ඔය විද්‍යාව ගැන මහ පර්යේෂණ කරන විද්‍යාඥයෝ මරණින් පසු යම්කිසි අකුසල කර්මයකින් ගිහිල්ලා අපි හිතමු බල්ලෙක් හරි කුකුළෙක් හරි මොකෙක් හරි සතෙක් උනා කියලා. එතකොට ඔය ක්වොන්ටම් භෞතිකය නොවෙයි තියෙන්නේ. එතකොට ඉතින් මේ කුණු කන්දල් කකා ඉන්න වෙනවා.** මේ සළායතනය තුළයි ලෝකය තියෙන්නේ, ඇසට එන රූප, කණට එන ශබ්ද, ඒවාට දක්වන ප්‍රතිචාර අනුව අපට හිතාගන්න පුළුවන්. අපි කන කෑම නොවෙයි ඌරන් ආදී අය කන්නේ. අපිට දැනෙන ගඳ ඒ අයට සුවඳ දෙයක්. ඌරන්ට සුවඳයි අපිට ගඳයි කියන එක. අන්න එහෙම හිතාගන්න තියෙන්නේ. නමුත් ලෝකයා තුළ තියනවා - අපි කියමු - **'මානවාභිමානය'** කියලා මානවාභිමානය එක්තරා මානයක් ඇතිකර ගෙන ලෝකය තමන්ට අයිති

කර ගන්නවා. මේක තමයි ලෝකනීතිය. මේකෙ කෙළවර අපි සොයාගන යන්න ඕන. **ඉතින් මේකට කෝටි ගණන් වියදම් කරගෙන නොයෙකුත් වාහන යොදාගෙන යනවා. ඒත් බිත්තර කටුව ඇතුළෙමයි. ඔය අභ්‍යවකාශ තරණය කළා කියලා හිතන එක භව තරණයක් නොවෙයි. ගිහිල්ලා බිත්තර කටුවේ ආයෙ කොහේ කොහේ හරි හැපිලා ආයෙ වැටෙනවා, සක්වල කෙළවරට ගියත් - මෙන්න මේ අවිද්‍යා බිත්තර කටුව කියලා කියන්නේ කෙටියෙන් ගත්තොත් අන්න අර සළායතනයමයි.** එතකොට සළායතනය තුළයි මේ ඔක්කොම ප්‍රශ්න තියෙන්නේ. ඒක තුළ වෙහෙසට පත්වෙනවා කියලා කියන්නේ ඒකයි සළායතනය අල්ලා ගැනීම තුළින්, සළායතනය ලොකුවට ගැනීම තුළින්. නමුත් අන්න බුද්ධ වචනය අනුව අපි තේරුම් ගත්ත නම් මෙතන නිත්‍ය සංඥාවක් පවතින්න හැටියක් නැහැ. ඇසත් අනිත්‍ය නම් නිරන්තරයෙන් බිඳි බිඳී යනවා නම්, ඒ විදියේ සූත්‍රයක් අපි කලින් අවස්ථාවල පෙන්වලා තියනවා. බුද්ධ වචනය හැටියට. භාවනාමය වශයෙන් බුද්ධ වචනය හැටියට මේවා ''චලං'' කියලා කියනවා ''චලං චෙව වයංච විපරිනාම ධම්මං'' මේවා නිතරම සැලි සැලී තියෙන්නේ වෙනස් වෙවී තියෙන්නේ. අඤ්ඤථා භාවයට පත්වෙමින් තිබෙන දේවල්. ඒවා නොපෙනෙනවා පමණයි. අප ගන්නා ඒ භ්‍රාන්තිය උඩ, වැරදි හැඟීම උඩ, ආත්ම සංඥාව උඩ, සක්කාය දෘෂ්ටිය උඩ, සක්කාය කියල කියන්නේ මේ සමූහයම තියනවා කියලා ගන්නවා. ඒක නිසා අර කාරණා ගැන අන්ධයි. ඒ අන්ධභාවය තුළ හිතනවා මේක තමයි කෙළවර කියලා. නමුත් අන්න බිත්තර කටුව බින්ද අවස්ථාවකයි තේරෙන්නේ. බිත්තර කටුව බින්දා කියන්නේ අරව සේරම දුකක් නම්, වෙහෙසක් නම්, විමුක්තියයි එතන තියෙන්නේ. ඒක වෙනම ලෝකයක් නොවෙයි.

කෙනෙක් මැරුණහම ඒකට මේ පින්වතුන් යොදන වචනය අවමඟුල නේ, ඇයි බුද්ධ පරිනිර්වාණය 'මඟුලක්' වුණේ? ඇයි අපි කිව්වනේ මේ පින්වතුන් යොදන වචනය තෙමඟුල් දවස කියලා. දැන් මව් කුසයෙන් එළියට එන එක තමයි උත්පත්තිය. සම්බෝධිය කියල කියන්නේ අර අවිද්‍යා බිත්තර කටුවෙන් එළියට ඇවිල්ලා ඒක ප්‍රත්‍යක්ෂයක් හැටියට 'දිට්ඨෙව ධම්මෙ' දිටු දැමියෙහිම ප්‍රත්‍යක්ෂ කර ගත්තට පස්සෙ ආයෙ සැකයක් නැහැ. ඊළඟට එතන ඉඳල තියන කථාව ඉතාමත් ගැඹුරුයි.



බුදුරජාණන් වහන්සේලා රහතන් වහන්සේලා **'ලොකෙ ඨිතො ලොකෙන අනුපලිත්තො'** (ලෝකයෙ සිටිනවා ලෝකයෙන් නොතැවරී) ලෝකයේ ඉන්නේ ඒ ප්‍රත්‍යක්ෂය තිබෙනවා, ඒක තමයි පරිනිර්වාන අවස්ථාවේ ඒක මතුවෙලා, ජීවත් වෙන අවස්ථාවේම අමෘත තත්වය පරිභෝග කළානම්. රහතන් වහන්සේලා ඒ අරහත් ඵල සමාපත්තිය අවස්ථාවෙ ඉන්නවා කියන්නේ මේ ලෝකයේ තිබෙන දුක් කම්කටොලු වලින් මොහොතකට හෝ ඒ අවස්ථාවේදී වෙන්වෙලා **මේ සළායතන නිරෝධය පිළිබඳ ප්‍රත්‍යක්ෂය භුක්ති විඳින අවස්ථාව. ඒක දක්වන්නයි මේ නිවන දිවයිනක්, ලෙනක්, සරණක්, පරායණයක් ආදී වචන වලින් විග්‍රහ කරල තියෙන්නේ.** අමුතු ලෝකයක තියන එකක් නොවෙයි. මෙතනම ඒ ප්‍රත්‍යක්ෂය විඳපු අවස්ථාවයි බුදුරජාණන් වහන්සේයි, අනෙකුත් රහතන් වහන්සේලායි, ඒ ඵල සමාපත්ති අවස්ථාවේදී ලෝකයෙන් වෙන්වෙලා, එතකොට ඒ ඔක්කොම පඤ්ච උපාදානස්කන්ධය අත් හැරපු විමුක්ති අවස්ථාවයි. ඒක කෙරෙන්නෙ ප්‍රඥාව තුළින්. ඒ ප්‍රඥාවට අදාළ මූලික කාරණය හැම සත්ත්වයා තුළම තියනවා. මනසිකාරය, ඒ මනසිකාරය **'යෝනිසෝ මනසිකාරය'** හැටියට යෙදීම තුළින් තමයි විමුක්තිය කරා යන්න පුළුවන් වෙන්නේ.

අපට කීප අවස්ථාවක කියන්න සිදුවුනා ඒ ගන්න මාතෘකාව අනුව මේ පින්වතුන්ට විඤ්ඤාණයත් නාමරූපයත් අතර කථාව. **මේ හැම දෙනෙක්ම හිරවෙලා තියෙන්නේ විඤ්ඤාණ මායාව තුළයි. ඒකට මායාවක් කියල කියන්නේ මොකද නාමයත් රූපයත් මැදින් තියෙන්නේ විඤ්ඤාණයයි,** දැන් නාමරූප කියන වචනය ගැන අපි බොහෝ අවස්ථාවල ප්‍රකාශ කරල තියනවා. නාමය කියන්නේ නැමීමක් නොවේ. ඔය ධර්මයේ දැක්වෙන හැටියට බුදුරජාණන් වහන්සේ ගේ වචනයෙන්ම ගත්තොත් වේදනා, සඤ්ඤා, චේතනා, ඵස්ස, මනසිකාර. වේදනාව, වේදනාව අනුව යන සංඥාව, ඒ අනුව ඇති කර ගන්න චේතනාව, චේතනාවට අරමුණු වන ස්පර්ශය, ඒකට අවසාන වශයෙන් මනසිකාර ඒ ගැන මෙනෙහි කිරීම යනවා. ඔය නාම ධර්මවලින් ලෝකයේ යමක් හඳුනා ගන්නේ. පොදුවේ අදහස් හුවමාරු කර ගන්න ඕන නිසා අපි වචන යොදා ගන්නවා. නමුත් වචන යොදා ගන්නා හැම අවස්ථාවකම තමන්ට හා සමානම හැඟීමක් එන්නෙ නැහැනෙ අනෙකාට. අපි නිදර්ශනයක් ගනිමු,

යම්කිසි කෙනෙක් ගඟක වැටිලා යන්තම් බේරුණා. එහෙම කෙනෙකුට 'ගඟ' කියලා කියන කොට හිත තුළට එන්නේ අර ගඟ හා සම්බන්ධ පරණ මතකයයි. භයකුත් එන්න පුළුවන් සමහර විට. ඒ වගේ වචනයක් තුළ සම්පූර්ණ අදහස අපට කෙනෙකුට දෙන්න බැහැ. එතකොට හඳුනාගන්නේ මොනවායින්ද? අන්න අර වේදනා සඤ්ඤා චේතනා ඵස්ස මනසිකාරවලින්, ඉතාමත්ම පෞද්ගලික සුවිශේෂ හැඳින්වීම ඒකයි. පොදු හැඳින්වීම සම්මුතියක් එක එක පළාත්බදව, රටවල් අතර අදහස් හුවමාරු කර ගන්න යොදා ගන්න එකක්. දැන් වෙලා තියෙන්නේ ඒ ඇති කර ගන්න සම්මුතිය තුළ ලෝකයා හිරවෙලා පරමාර්ථය අමතක කරනවා. පරමාර්ථයයි බුදුරජාණන් වහන්සේ මතු කරල දුන්නේ නාම රූප ධර්ම තුළින්. මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර නිරන්තරයෙන්ම තියනවා සම්බන්ධතාවක් - මහ පුදුම සම්බන්ධතාවක් ලෝකයා මුළා කරවන. ඒ ගැන අපි නිදර්ශන කොතෙකුත් දක්වලා තියනවා. මතක් කරන්න පමණයි මේ පින්වතුන්ට තියෙන්නේ අර ඒදණ්ඩ උඩ බල්ලාගේ කථාව කොතෙකුත් කියල තියනවා. බල්ලට පෙනෙන්නේ අර වතුරේ තියන පිළිබිඹු කරන ස්වභාවය. ඒ නිසා ඒදණ්ඩ උඩ යන බල්ලට පේනවා යම්කිසි බල්ලෙක් ඉන්නවා වගේ. ඌ ඒක වෙන බල්ලෙක් කියලා ඒකට යම් ප්‍රතිචාරයක් දක්වනවා. ඒ වගේ විඤ්ඤාණයේත් තියනවා විඤ්ඤාණය මැදින් ඉන්න නිසා නාමයත් රූපයත් අතර. රැවටෙන ස්වභාවයක්, ඉතින් ඒ බල්ලා හිතන්නේ පෙනෙන නිසා බලනවා කියලා. නමුත් ඇත්ත වශයෙන් බලන නිසයි පෙනෙන්නේ. එතකොට **බලන නිසයි පෙනෙන්නේ කිව්වහම ඔන්න මනසිකාර කථාවටයි එන්නෙ 'මනසිකාර සම්භවා සබ්බෙ ධම්මා.'** බුද්ධ වචනයේ තියෙන්නේ, 'ඡන්ද මූලකා සබ්බෙ ධම්මා', හැම එකකටම මුල ඡන්දයයි.

දැන් අර විද්‍යාඥයින් අච්චර කරදර මධ්‍යයේ තව තවත් ඒවා සොයන්නේ මොකද? සමහර වෙලාවට අපි කලින් අවස්ථාවකත් කිව්වේ 'මේ කාලකන්නි ක්වොන්ටම්' කියල කියන්නෙ අර ගණනක් හදන්න ගිහින් බැරිඋන වෙලාවෙ අන්තිමට පෑන ගහල දානවා වගේ ඒ අයට කර කියාගන්න දෙයක් නැතිව. බුද්ධ වචනය ගැන දැනීමක් නැතිව. මේක කවදාවත් කරල ඉවර කර ගන්න බැරි දෙයක් බුදුරජාණන් වහන්සේ පෙන්නල දීල තියනවා. දෘෂ්ටි කෝණයකින් තොරව ලෝකයක් නැහැ කියලා. දෘෂ්ටි කෝණයකින් තොර ලෝකයක් සොයන්නයි මේ අය



පෙළඹෙන්නේ. එතකොට රූප ධර්ම ඒ ඒ ආකාරයෙන්ම යථා වශයෙන් හඳුනා ගන්නත් බැහැ. ඒ නාම රූප කියන වචනය තුළ තියෙන්නේ ඒකයි. රූපය කියන්නේ නමට රූපයක්, නාමය කියන්නේ නාම ස්වරූපයක් නියම සම්මුතිය නොවෙයි ඒක තම තමන්ටම පෞද්ගලික වූ නමක් වගේ දෙයක්, නාම ස්වරූපයක්. ඒක තමයි වේදනා සංඥා චේතනා ආදී වශයෙන් දැක්වූයේ. නාම මාත්‍ර රූපයක් කිව්වේ මොකද, බුදුරජාණන් වහන්සේ රූපය ගැන කියනකොට නිතරම මතක් කරන්නේ මහාභූත ධර්ම හතරක් තියනවය එකිනෙක සම්බන්ධ වෙලා යන, පඨවි, ආපො, තෙජො, වායො යන නමින්. ඒවා මිශ්‍රවෙලා ඒවායේ අධික භාවය අනුව අපි අවස්ථානුකූලව ඒවායේ තද ගතිය උණුසුම් ගතිය ආදී වශයෙන්. ඒත් නාම ධර්ම තුළින්මයි හඳුනා ගන්නේ. එතකොට නාම ධර්ම තුළින් හඳුනා ගන්න මහාභූත ධර්මයන් පිළිබඳව ඇති කරගන්නා රූප සංඥාව එයින් පිට යන්න දෙයක් නැහැ. තනිකර රූපය හඳුනා ගන්න බැහැ. එතකොට ආයිත් එන්නේ විඤ්ඤාණයට අරමුණ නාමරූපයමයි. ඒ මිසක් රූපය තනිකර හඳුනා ගන්න බැහැ. ඒක තමයි අපි අර නාසිසස් කථාව තුළින් කිව්වේ. ඒ නාසිසස් තරුණයා තමන්ගේ මුහුණ දකින කොට දෙවඟනක් කියලා හිතුවා වගේ තමයි සාමාන්‍ය ලෝකයා අවට ලෝකය දැකලා ආත්ම සංඥාව ඇති කර ගන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ලෝකයා තුළ තියන ආත්ම සංඥාව තනිකර මුළාවක් - මමය, මගේය කියල ගන්න එක තනිකර මුළාවක් කියල. සක්කාය දිට්ඨිය. එතන තමයි අවිද්‍යාව තියෙන්නේ. ඒක නිසා නිත්‍ය සංඥාව ඇති කර ගන්නවා. ඒක අල්ලාගන සිටීම නිසා.

බුදුරජාණන් වහන්සේ පඤ්චඋපාදානස්කන්ධය ගැන ප්‍රකාශ කරන තැන පුදුම උපමාවක් දෙනවා. මේ පින්වතුන්ට හිතාගන්න. මේ පින්වතුන්ට පමණක් නොවෙයි සතෙකුට උනත් හිතා ගන්න පුළුවන් උපමාවක් බුදුරජාණන් වහන්සේ දෙනවා. යම් සේ කණුවක දම්වැලකින් බැඳපු බල්ලෙක් ඒ කණුව වටා ඇවිදින අතරේ එයා ඉඳගන්නේ කණුව ළඟමයි. හිට ගන්නෙත් කණුව ළඟමයි. ඇවිදින්නෙත් කණුව ආශ්‍රය කරගෙනමයි. ලගින්නෙත් කණුව ළඟමයි. මොකද කණුවෙන් එහාට යන්න බැහැ. අන්න ඒ වගේ තමයි සක්කාය දිට්ඨිය. සක්කාය දිට්ඨිය අල්ල ගත්තු කෙනාට මේ පඤ්ච උපාදානස්කන්ධය මේ ගොඩවල් පහ යන යන

තැන උස්සගෙන යන්නේ. අල්ලගන හැම තැනම යන්නේ. ඇත්ත වශයෙන් ගොඩවල් පහ කිව්වට මේ මනසිකාරයෙන් මතුවන කොට පේනවා මේවා හිතෙන්ම හදා ගත්තු ගොඩවල් පහක් බව. ඒ ඒ මොහොතට පැන නගින්නේ නාමරූප ධර්ම පමණයි. නමුත් අර නොබැලුවත් තියනවා කියලා අර බල්ලා හිතන්න වාගේ, නොබැලුවත් වතුරෙ ඒක තියනවා කියලා හිතන්නා වගෙ, සක්කාය දිට්ඨිය නිසා ලෝකයාට හිතා ගන්න බැහැ. ඔහොම කිව්වොත් කියයි ඇයි නොබැලුවොත් ඕක නැතිවෙලා යනවද? ඒක නැතිවෙලා යනවද? නමුත් ඔහු දුටුවේ මොකක්ද? ''දුටුව'' පමණයි දුටුවෙ. අපි හිතන්නේ යමක් දැක්කා කියලා. 'දෙයක්' දැක්කා කියලා නමුත් බුදුරජාණන් වහන්සේ කියන්නේ දෙයක් නොවෙයි දැක්කේ. දැක්කේ ''දුටුව'' එතකොට ඇසුණෙ මොකක්ද සිංදුව නොවෙයි ''ඇසුන''. අනිත් ඒවත් එහෙමයි. අනිත් ඉන්ද්‍රියයන් ගැන කියන්නෙ මොකක්ද? ''දැනුන''. හිතුවෙ මොකක්ද සිතිවිලි ගැන ඒකත් ''සිතුන''. එච්චරයි තියෙන්නේ. එතකොට බුද්ධ වචනය අනුව ඇත්ත වශයෙන් තියෙන්නේ දුටුවයි, ඇසුනයි, දැනුනයි, සිතුනයි. ඉන් එහාට යන එක ප්‍රපංචයක්. ඕකයි, මේ ධර්මයේ ගැඹුරුම එක.

අපි වචන වශයෙන් කිව්වට අන්න ප්‍රත්‍යක්‍ෂ කර ගැනීම සඳහා මනසිකාරය යොදලා, අර නාමධර්ම තුළින්ම බුදුරජාණන් වහන්සේ හෙළි කරල දෙනවා කිසියම් අවස්ථාවක තමන්ගේ විමුක්තියට උපකාර වන දේවල්, බිත්තර කටුව ඇතුළේ ඉඳගෙනම නිය තුඩ යොදලා ඒ බිත්තර කටුව බිඳගන්නේ අර අනිත්‍ය දුක්ඛ අනාත්ම කියන ත්‍රිලක්‍ෂණයට අනුව යෝනිසෝ මනසිකාරය තුළින්. මනසිකාරය කියන එක නාම රූප ධර්මයන්ට අයිති එකක්. ඒ මනසිකාරය අයෝනිසෝ වෙන්නත් පුළුවන්, යෝනිසෝ වෙන්නත් පුළුවන්. සාමාන්‍යයෙන් ලෝකයා තුළ තියෙන්නේ අයෝනිසෝ. අයෝනිසෝ කියල කියන්නේ අනිත්‍ය දේ නිත්‍ය හැටියට සළකනවා. දුක් සහිත දේ සැප හැටියට සළකනවා. අශුභ දේ ශුභ හැටියට සළකනවා අනාත්ම දේ ආත්ම හැටියට සළකනවා. ඒ වගේ වැරදි විදියට ඒ ගැනීම, ඒ වෙනුවට අන්න බුද්ධ වචනය අනුව අනිත්‍ය දේ අනිත්‍ය හැටියට දැකීම ඒ දැකීම තව තවත් සියුම් අන්දමින් අර ග්‍රහණය වෙනුවට, 'පරාමර්ෂණය' කියන අල්ලා ගැනීම දැඩිව ගැනීම වෙනුවට, බුදුරජාණන් වහන්සේ දක්වනවා 'සම්මර්ෂණය' කියල දෙයක්. ඉතින් ඒක තමයි මේ



පින්වතුන් කොතෙකුත් අහල තියන උපමාව. මේ සංස්කාර ස්කන්ධය උපමා කරල තියෙන්නේ කෙහෙල් කඳකට. කෙහෙල් කඳේ හරයක් තියනවා කියල හිතාගන අල්මාරියක් පුටුවක් හදාගන්න කියලා හිතාගන උඩිනුත් යටිනුත්  කපලා කරගහගෙන යන මිනිහා ඒක බදාගෙන යනවා. නමුත් එතනදීම කල්පනාකාරීව මේකෙ ඇත්ත වශයෙන්ම හරයක් තිබෙනවාද කියලා දැනගන්න මොකක්ද කරන්නේ? ඒකෙ පොත්තක් ගලවලා බලනවා. එක පොත්තක් ගලවලා හිමින් අතගාලා බලන කොට මෙන්න තව පොත්තක්. තව පොත්තක්. ඒක දැන ගන්න නම් අන්න හිමින් අතගාන්න ඕන. සම්මර්ෂණ කියන්නේ අන්න ඒ විදියේ එකක්. හිතෙන් අතගෑමක්. ඒකට කියනවා ''සලක්ඛණ''. විදර්ශනා භාවනා කරන අය අහල තියනවා. සලක්ඛණ කියල කියන්නේ සැළකීම නුවණින් සළකා බැලීම. විදර්ශනා යෝගීන් එතකොට මේවා ග්‍රහණය කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දීපු උපදෙස් අනුව කල්පනාකාරීව නිත්‍ය සංඥා ආදියට ඉඩ නොදී මේක හිමිහිට මෙනෙහි කරනවා. මෙනෙහි කිරීම කියන වචනයයි වැඩියක් යෙදෙන්නේ. එතෙන්ට මෙනෙහි කිරීම කිව්වට වැරදි විදියට නොවේ. අපි පහසුවට මෙනෙහි කිරීම කිව්වට එතන තේරුම් ගන්න ඕන යෝනිසෝ මනසිකාරය-නුවණින් මෙනෙහි කිරීම.

ඒ විදර්ශනා යෝගියා ඒ මෙනෙහි කිරීම එන්න එන්නම සියුම් අන්දමින් ශීඝ්‍ර කිරීම තුළින් තේරුම් ගන්නවා මෙතන තියෙන්නේ සංස්කාර ගොඩක්, සකස් කිරීම් ගොඩක්. එකක් ඇතුළේ එකක් වගේ. නමුත් මෙතන හරයක් නැහැ. අරටුවක් නැහැ. අන්න ඒ අවබෝධය තියුණු වුණු අවස්ථාවේ නිරායාසයෙන් ඇත්ත ඇති හැටියේ දැකීම. ඒක තමයි යථාභූත ඥානය කියල කියන්නේ. මේ කට්ටිය මුළාව තුළයි රැඳිල ඉන්නෙ. අයෝනිසෝ මනසිකාරයෙන් යථාභූත වශයෙන් ඒ තත්ත්වය දැක ගන්න බැහැ කිසිවෙකුට. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා. අර විදර්ශනාමය ප්‍රඥාව මතු කරගෙන යම් කෙනෙක් හරියාකාර මෙනෙහි කරනවා නම් ඒ අවස්ථාවේ ක්‍රම ක්‍රමයෙන් පෙනෙනවා මේ පඤ්ච උපාදානස්කන්ධය. ඉතින් ඒ සඳහා පළමු පියවර තමයි සෝවාන් වන අවස්ථාවේ සක්කාය දිට්ඨිය බිඳෙනවා කියන්නේ. මේකයි අර බැඳලා හිටිය කණුව. තවත් ඒක ඈතට යනවා, ''අස්මි මාන'' කියන කොට. නමුත් අර ප්‍රධාන වශයෙන්ම අර වැරදි ගැනීම, මේ රූප ආදිය අතීතයේ දැක්ක

රූපත්, වර්තමානයේ දකින රූපත්, අනාගතයේ දකින රූපත් මේ ඔක්කොම මමය, මගේය, කියලා ගැනීම තුළින් අර උපාදාන ස්කන්ධ කියන ඒ ගොඩවල් එකතු වෙනවා. මේක කරගහගන යනවා. නමුත් විදර්ශනාව කරන කෙනෙකුට තේරෙනවා මේවා මෙනෙහි කරන, මතුවෙන, මතුවෙන වාරයක් පාසා පමණයි මේක තියෙන්නේ. ඒ මතුවෙන මතුවෙන වාරයක් පාසා. අතීතය ගැන මෙනෙහි කරන කොට අපි දන්නෙම නැතිව අතීතයේ ජීවත් වෙනවා. මේක අතීතයයි කියල එවෙලෙම හඳුනා ගත්තොත් ඒක එතනින්ම ඉවරයි. අනාගතය ගැන මෙනෙහි කරන අවස්ථාවලදී අපි ඒක ගැන තව නොයෙකුත් සැලසුම් හද හදා යනවා. නමුත් මොහොතකට හරි අපට තේරෙනවා නම් මේක අනාගතය පමණක්ය කියලා ඒක වර්තමානය කරගන්නේ නැහැ.

ඊළඟට වර්තමානය ගැන බලනකොට ඒකත් මේ වර්තමානය කියල කියන්නේ අපේ අල්ලාගැනීම අනුවයි. අල්ලා ගැනීමට සාපේක්ෂවයි. 'දූන්' කියන එක විග්‍රහ කරන්න බැරි වචනයක්, 'දූන්' කියන එක අවස්ථානුකූලවයි තේරුම් ගන්නේ. මොකටද 'දූන්' කියල කියන්නේ? දූන් කියන එක පවා විදර්ශකයා අන්තිමට ඉතාමත්ම සූක්ෂම අන්දමින්, සියුම් අන්දමින් ඒ සම්මර්ෂණය කිරීම තුළින් තේරුම් ගන්නවා මෙතන අන්තිමට තියෙන්නේ අන්න බුද්ධ වචනයට එනවා ඡන්දය තමයි, අපි මේ 'දෙයක්' හැටියට ගන්න එකේ මුල. ඊළඟට මේකෙ හටගැනීම ඇති වන්නේ මෙනෙහි කිරීම තුළින්. ඊළඟට මතුවන තැන තමයි ස්පර්ශය. ඒකයි ස්පර්ශ ආයතන කියලා කියන්නේ. එතනයි මුළු ලෝකයක් හැදිල තියෙන්නේ. ඔය කියාපු ඇස, කන, නාසය, දිව, කය, මන හා ඒවාට අදාළ අරමුණු ආශ්‍රයෙන්. ඊළඟට ඒ අරමුණුවල ඒ ඒ තැන්වල නවතින්නේ නැතිව, ප්‍රපංච වශයෙන්. තව තවත් දිගට යන්න යන්නම යන්නේ මුළාව ඔස්සේයි. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා ඒවායේ යථා තත්ත්වය. එතන, එතනම, නැතිවන ආකාරය දක්කහම යම් අවස්ථාවක මේවා ගැන කලකිරීම ඇති වෙනවා. ඒ කලකිරීම තුළින් තමයි විදර්ශනා වශයෙන් අන්තිමට මේවා සංස්කාර වශයෙන් තේරුම් අරගෙන ආත්ම දෘෂ්ටිය ඉවත් කරලා. ඊළඟට ''අස්මි මානය'' කියල කියන්නේ අවසාන තුරුම්පුව වගේ තියෙන්නේ 'වෙමි' කියලා සාමාන්‍ය ලෝකයා තුළ තියනවා. සෑම කෙනෙක් තුළම 'වෙමි' කියන මානයක් තියනවා.



බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා යම්කිසි කේන්ද්‍රස්ථානයක් ආශ්‍රය කරගෙනයි මේ මැනීම් තියෙන්නේ. ඒ කේන්ද්‍රස්ථානය පවා උගුල්ල ගන්නා ආකාරයට ඒ තණ්හාව, අවිද්‍යාව නැති කරන අවස්ථාවෙ තමයි අන්තිමට විමුක්තිය කියන්නේ. ලෝකයා බලාපොරොත්තු වන්නේ විමුක්තිය නම් කවුරුත් විමුක්තිය ගැනයි කථා කරන්නේ. ලෝකය ඇතුළේ ඉඳගෙන ලබන නොයෙකුත් විමුක්ති තියනවා. සාමාන්‍යයෙන් ඔය සමාජයේ සම්මත විමුක්ති පමණක් නොවෙයි, බුදුරජාණන් වහන්සේ පහළ වන විට විමුක්තිය කියල හිතාගන හිටපු ඒ ධ්‍යානලාභී ආළාරකාලාම, උද්දකරාම ආදී ශ්‍රේෂ්ඨ ධ්‍යානලාභීන් පවා විමුක්තිය කියල හිතාගත්තට අන්තිමට ඒ අයත් ඉන්නේ යම් කිසි මුළාවක් තුළ බව බුදුරජාණන් වහන්සේ තේරුම් ගත්තට පස්සේ තමයි ඒ අය ශාශ්වත තත්ත්වය වෙනුවට අන්තිමට ඒ අයටත් ඒක තේරුණ නිසා තමයි යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ අතහැරල ගියෙ, ඒ වගේම බුදුරජාණන් වහන්සේ දැනගත්තා ඒ අයට මේ ධර්මය හරියාකාරව ඉදිරිපත් කළොත් ඒ අයට ඒ මුළාව අත හැරලා රහත් වෙන්න පුළුවන් බව.

එතකොට ධ්‍යානලාභීන් පවා අවසාන වශයෙන් ආත්ම දෘෂ්ටියේ හිරවෙලා හිටියා. තනිකර සමථයෙන් පමණක් විමුක්තිය සොයා ගිහිච්ච අය තාවකාලික වශයෙන් ඒ ධ්‍යාන ආදී සුවය ලබාගෙන හිටියත්, ඔවුන් කර්ම වේග අනුව බ්‍රහ්ම ලෝකවල ගිහිල්ල කල්ප ගණන් හිටියත් ආපසු කරකැවිල එනවා සංසාරයටම. බුදුරජාණන් වහන්සේ පමණයි පෙන්නුවේ ඒ අයට සංසාර විමුක්තිය තියෙන්නේ මේ තුළිනුයි. ඒ හැම දෙනෙක්ම ඉන්නේ සළායතන කියන ඒ ස්පර්ශය හා සම්බන්ධව ඒකට අහුවෙලයි. සළායතන නිරෝධය කියන්නේ අවසාන වශයෙන් නිවනමයි. මේ සඳහා ගත යුතු ප්‍රතිපදාව බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ. සමථ වශයෙන් සමාධි ශක්තියක් ඇති කරගෙන ඕන විදර්ශනාවට යන්න. විදර්ශනාව තියුණු වෙන්නෙ විදර්ශනාව කියන්නේ සියුම් දැකීමයි. ඒ දැකීම සඳහා සිත ශක්තිමත් වෙන්න ඕන. සමාධිමත් වෙන්න ඕන. ශක්තිමත් එකඟවූ සිතෙන් තමයි ත්‍රිලක්ෂණයට අනුව බුදුරජාණන් වහන්සේ දුන් මූලික උපදෙස් අනුව සිත යොදන්න යොදන්න අන්තිමට මේවායේ අනිත්‍යතාව - අනිත්‍යතාව ආරෝපණය කිරීමක් නොවෙයි. මෙතෙක් නොදැක තිබූ අනිත්‍යතාව අන්තිමට දකින්න ලැබෙනව. ඒ දකින්න

ලැබෙන කොට ස්වාභාවිකවම ඒ ගැන කලකිරීමක් ඇති වෙනවා මේවා බිඳෙන කොට. භංග ඥාන ආදි වශයෙන් දක්වෙන්නේ මේවායේ බිඳෙන ස්වභාවය. ලෙඩක් නොවෙයි ලෙඩ හොඳවීමේ ලක්ෂණයක්. ඊළඟට ඒක දුටු අවස්ථාවේ කලකිරීම ඇති වෙලා, අන්තිමට ඒ එපාවීම තුළින් මෙතෙක් ගත්තු ගැන්ම මමය මාගේය කියල ගත්තු ගැනීම, ඒවා යම් අවස්ථාවක නැති උනාද අන්න ඒ අවස්ථාවේ තමයි බිත්තර කටුවෙන් එළියට එන්නේ. අවිද්‍යා තණ්හා නැති කරපු අවස්ථාවෙ.

සළායතන නිරෝධය කියල කියන මේ ලෝකයෙන් වෙන් වූ - බුදුරජාණන් වහන්සේ ලෝකය ගැන ප්‍රකාශ කරන කාරණය ලෝක නිරෝධයත් මෙතනමයි ප්‍රත්‍යක්ෂ වෙන්නේ. මේ ශරීරය තුළින්මයි. **බුදුරජාණන් වහන්සේ පරිනිර්වාන අවස්ථාවේ අමුතු ලෝකයකට ගියා නොවෙයි. අර සම්බෝධි අවස්ථාවේ ලබාගත්තු ප්‍රත්‍යක්ෂය - ඒ ජීවමාන කයින් ලබාගත්තු ප්‍රත්‍යක්ෂය - ඒ ජීවිත ඉන්ද්‍රිය තිබෙන තාක් ලෝකයේ ඉඳීම නිසා අෂ්ට ලෝක ධර්මයට අදාළව කර්මානුරූපව ශරීරයට අදාළ නොයෙකුත් වින්දන ආවා. නමුත් ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේ සළායතන නිරෝධය හා සම්බන්ධ අරහත්ඵල සමාපත්තියට සිත යවලා - ඒ විමුක්තිය ඒක ලෙනක්, සරණක්, දිවයිනක් හැටියට දක්වන්නේ ඒකයි. - ඒ ලෝකෝත්තර සැනසීම ලබාගත්තා.** ඒකට තමයි නිවන් අමෘතය භුක්ති විඳිනවා කියල කියන්නේ. රහතන් වහන්සේලා, බුදුරජාණන් වහන්සේ භුක්ති වින්ද අමෘතය. අවසාන අවස්ථාවේ ඒක මතුවෙනවා. ස්වාභාවිකව. ඒක මතුවෙලා අන්තිමට මොකක්ද වෙන්නේ, මේ ශරීරයේ ධාතු හතර, ධාතු හතරට එකතු වෙනවා. නමුත් උච්ඡේද වාදයක් නොවෙන්නේ මොකද? මෙතන නැති වෙන්න ආත්මයක් නැහැ. නමුත් බොහෝ දෙනාට වෙලා තියෙන්නේ දුකෙන් මිදෙන්නත් ඕන. නමුත් භවය තුළ ඉන්නත් ඕන. ඒ දෙකම කරන්න බැහැ. **භව නිරෝධය කියල කියන්නේ දුක්ඛ නිරෝධයමයි. ලෝක නිරෝධය කියල කියන්නේ දුක්ඛ නිරෝධයමයි. ඒක සමීකරණයක්.**

අන්න ඒ කාරණය අපි තේරුම් ගත්තා නම් අද වැනි වෙසක් දවසක මෙන්න මේ අවබෝධය අර කියාපු වටිනා මොළ රාශියක් අතරමං වෙලා ඉන්නවා. ඒ අයට මේ ධර්මය හරි ගැඹුරින් පටිච්ච සමුප්පාදය ආදිය තේරුම්



කරල දුන්නොත් අර කිව්ව වගේ තව කුකුළු පැටියන් කීප දෙනෙක් හරි ඔය බිත්තර කටුව බිඳගෙන එළියට එන්න උත්සාහ කරයි. අපි අද මේ වටිනා දවසේ ගැඹුරු දේශනයක් ඉදිරිපත් කළා. මේ තුළ සද්ධාවත් තියනවා ප්‍රඥාවත් තියනවා. ඇත්ත වශයෙන් මේ සමහර උගතුන්ට සද්ධාව නැහැ. ඒක නිසා මේකට ක්‍රියාශීලි වෙන්නෙ නැහැ. වීර්යයක් හට ගන්නෙ නැහැ. නමුත් සද්ධාවත් ඕන. ඒකයි අපි කිවුවේ ශ්‍රද්ධාවත් අවශ්‍යයි. ඒ සද්ධාව උපකාර කරගෙන ඊළඟට **සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා අන්තිමටයි ප්‍රඥාව එන්නේ. උගත්කමට පණ්ඩිතකමට ඒවයින් ලැබෙන දෙයක් නොවෙයි මේක. සද්ධාව අනුව ඇති කරගත්තු වීර්යයෙන්, දියුණු කර ගත්තු සතියෙන්, දියුණු කර ගත්තු සමාධියෙන් තමයි ප්‍රඥාව ලබාගන්න පුළුවන් වෙන්නේ.**

ඒක නිසා මධ්‍යස්ථ විදියට ධර්මය දෙස බලන්න මේ දේශනාවත් උපකාර වේ යයි සිතනවා. මේ වටිනා දවසේ මේ පින්වතුන් ඒ සඳහා වෙන්වෙලා බොහෝ දෙනා වටිනා සීලයක් සමාදන් වුනා. ඒ අතරතුර බණ භාවනා කළා. දැන් මේ අවස්ථාවෙ විදර්ශනාවට උපකාරවන දේශනාවක් අහන්න ලැබුණා. මේ හැම එකක්ම උපකාර කරගෙන මේ වටිනා බුද්ධෝත්පාද කාලයේ - මේ දුර්ලභ බුද්ධෝත්පාද කාලයේ - තම තමන් හැකිතාක් උත්සාහ කරල අවිද්‍යා බිත්තර කටුව බිඳගන්න උත්සාහ ගන්න ඕන. ඒක සඳහා මේ දේශනාව උපකාර වේවා කියල අපි ප්‍රාර්ථනා කරනවා. මේ දේශනාව පැවැත්වීමෙනුත් දේශනාව ශ්‍රවණය කිරීමෙනුත් අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම්තාක් සත්ත්වයින් පිං අනුමෝදන්වීමට බලාපොරොත්තු වෙනවා නම් ඒ අනුමෝදන්වීම තුළින් ඔවුන් බලාපොරොත්තු වන උත්තමාර්ථයන් සාක්ෂාත් කර ගනිත්වා කියන ප්‍රාර්ථනාවෙන් මේ ගාථා කියලා පින් දෙන්න.

**එත්තාවතා ච අම්හෙහි...**

# 42 වන දේශනය

## 42 වන දේශනය (පහන් කණුව ධර්ම දේශනා අංක 169)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අයං ලොකො පර ලොකො - ජානතා සුප්පකාසිතො
යඤ්ච මාරෙන සම්පත්තං - අප්පත්තං යඤ්ච මච්චුනා
සබ්බං ලොකං අභිඤ්ඤාය - සම්බුද්ධෙන පජානතා
විවටං අමතද්වාරං - ඛෙමං නිබ්බානපත්තියා
ඡින්නං පාපිමතො සොතං - විද්ධස්තං විනළීකතං
පාමුජ්ජබහුලා හොථ - ඛෙමං පත්ථෙථ භික්ඛවො'

-චුල ගොපාලක සු. මජ්ඣිම නිකාය.

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ අද වගේ ඇසළ පුර පසළොස්වක පොහොය දවසක ලෝකයා හමුවේ තැබූ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය ඝොරතර සසර සැඩ වතුර දෙබෑ කරගෙන මෙතෙරින් එතරට යාමේ එකම ලොවුතුරු මඟයි. මාරයාගේ රාජධානියෙන් මිදිල මාරයාට හසු නොවන නිවන් පරතෙරට යන නෛර්‍ය්‍යාණික මාර්ගයයි. දක්ෂ ගොපල්ලෙක් වර්ෂා කාලයේ තමන්ගේ ගවරැල ආරක්ෂා සහිතව ගඟකින් මෙතෙරින් එතරට ගෙනියන්න වගේ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ මේ ලෝක සත්ත්වයා සසර සැඩ වතුරෙන් එතරට ගෙනයන මැදුම් පිළිවෙත හෙළිකර වදාළ.

මැදුම් සඟියේ චූළ ගෝපාලක සූත්‍රයේ ඇත්ත වශයෙන්ම ගොපලු උපමාවකින් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ඒ අනුත්තර සම්බෝධි ඥානය විදහා දැක්වූවා. ඒ සූත්‍ර දේශනාව කූළුගන්වන අවසානයට එන ගාථා තුනක් තමයි අද අපි මාතෘකාව හැටියට තබාගත්තේ. ඒ සූත්‍ර දේශනාවේ තිබෙන ආකාරයට නිදාන කථාව හැටියට දැක්වෙන්නේ මෙච්චරයි. භාග්‍යවතුන් වහන්සේ එක්තරා අවස්ථාවක වජ්ජි රටේ උක්කාචේල කියන නගරයේ ගංගා නම් ගඟේ නදී තෙර භික්ෂූන් වහන්සේලා පිරිසක් එක්ක වැඩ වාසය කළා. අපට පෙනෙන හැටියට අමුතු ප්‍රශ්නයක් සිද්ධියක් සිදුඋන නිසා නොවෙයි. බුදුරජාණන්



වහන්සේට ඇතැම් විට සිතෙන්ට ඇති ගංගා නම් ගඟේ නිතර දක්නට ලැබෙන සුලබ දර්ශනයක් ආශ්‍රයෙන් සංඝයා වහන්සේලාට සිත් කාවදින අන්දමින් දේශනයක් පවත්වන්ට. කොහොම නමුත් උන්වහන්සේ ඒ දේශනාව ආරම්භ කළේ මේ විදියටයි. පාලි භාෂාවේ 'භූතපුබ්බං' කියන වචනයක් තියනවා. ඒකේ අදහස සත්‍ය සිද්ධියක් - ඇත්ත වශයෙන්ම මෙහෙම සිද්ධියක් සිදුවුනා. අන්න ඒ වචනයෙන් පටන් ගන්නේ. මහණෙනි, මෙහෙම සිද්ධියක් සිදුවුනා. මොකක්ද? මගධ රටේ ගොපල්ලෙක් වර්ෂා කාලයේ අවසාන මාසයේ සරත් සමයේ ගංගා නම් ගඟේ මෙතෙර හරියට පරීක්ෂා කරන්නේ නැතිව එතෙර හරියට පරීක්ෂා කරන්නේ නැතිව නොතොටින් - නොතොට කියල කියන්නේ, ගංතොට කියල කියන එක මේ පින්වතුන් දන්නවා ගඟේ ඉතාම නොගැඹුරු තැන. එතරවීමට පහසු තැන. තොටින් නොවෙයි නොතොටින් - තමන්ගේ ගව රැල ගඟින් එතර පිහිටි විදේහ රටට එතර කරන්න උත්සාහ කළා. නමුත් මහණෙනි, ඒ ගව රැල ගඟමැද දිය වැලට අහුවෙලා විනාශයට පත්උනා. මොකද හේතුව, අර ඒ මගධ රටේ ගොපල්ලා ප්‍රඥාව නැති කෙනෙක්. ඒ වගේම ඒ කටයුත්ත කරන්න කලින් මෙතෙර හරියට පරීක්ෂා කළෙත් නැහැ. එතෙර හරියට පරීක්ෂා කළෙත් නැහැ. ඒ වගේම ගවයින් එතර කරන්න උත්සාහ කළේ නොතොටින්. ඒ නිසයි සාර්ථක උනේ නැත්තේ. එසේම, මහණෙනි යම් ශ්‍රමණ බ්‍රාහ්මණයින් මේ ලෝකය ගැන අදක්ෂ නම් - 'අකුසලා' කියන වචනයයි එතන යෙදෙන්නෙ. මේ ලෝකය ගැන අදක්ෂ නම්, පරලෝකය ගැන අදක්ෂ නම්, අවබෝධයක් නැති නම්, මාරයාගේ රාජධානිය ගැන අදක්ෂ නම්, මාරයාගේ රාජධානිය නොවන ප්‍රදේශය ගැන අදක්ෂ නම්, මරණයට හසුවන ප්‍රදේශය ගැන අදක්ෂ නම්, එබඳු වූ ශ්‍රමණ බ්‍රාහ්මණයින් කෙරෙහි යම් කෙනෙක් ශ්‍රද්ධාව තබන්ට බලාපොරොත්තු වෙනවා නම්, ඔවුන්ට සවන් දෙන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒක ඒ අයගේ දුක පිණිස, අයහපත පිණිස හේතු වෙනවා. අහිත පිණිස අවැඩ පිණිස හේතුවෙනවා කියල බුදුරජාණන් වහන්සේ වදාළ.

අර උපමාවට අනුව ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ තවත් ඒ වගේම සත්‍ය සිද්ධියක් හැටියට ඉදිරිපත් කරනවා. මහණෙනි, මෙන්න මෙහෙම සිද්ධියකුත් සිද්ධ වුනා. මගධ රටේ දක්ෂ ගොපල්ලෙක් ප්‍රඥාවන්ත

ගොපල්ලෙක් අර වගේම වර්ෂා කාලයේ අවසාන මාසයේ සරත් සමයේ ගඟේ මෙතෙර හරියට පරීක්ෂා කරල, එතරත් හරියට පරීක්ෂා කරල නියම ගංතොටින්ම ගවරැල එතර කළා. ඔන්න එතර කළ ආකාරයත් ලස්සනට කියනවා බුදුරජාණන් වහන්සේ. පළමුවෙන්ම ඒ ගොපල්ලා කළේ ගවරැලේ නායක 'ගොපිතරො ගොපරිනායකා' කියල කියන්නේ ගව පීතෘ පරිනායක ප්‍රධාන ගවයින් ගඟේ දියවැල කපාගෙන ඉදිරියට අරගෙන ගිහිල්ල සුවසේ එතර කළා. දෙවනුව ඒ ගවරැලේ ශක්තිමත් ගවයින් ගවදෙනුන් අර වගේම ගඟේ දියවැල් කපාගෙන ඉදිරියට ගෙනිහිල්ල එතර කළා. තුන්වෙනුව, වැඩුනු වස්සන් වැස්සියන් අර වගේ ගඟේ දිය වැල කපාගෙන ඉදිරියට ගෙනිහිල්ල සුවසේ එතර කළා. හතරවෙනුව ගවරැලේ දුර්වල වස්සන් ඒත් අරගෙන ගිහිල්ල දිය වැල කපාගෙන ඉදිරියට ගෙනිහිල්ල එතර කළා සුවසේ. ඔන්න ඊළඟට තව එකක් ප්‍රකාශ කරනවා. විශේෂ දෙයක් - බුදුරජාණන් වහන්සේ. මහණෙනි, මෙන්න මෙහෙම දේකුත් එක් අවස්ථාවක සිද්ධ වුනා. ඒ ගවරැලේ හිටිය එදාම උපන් වහු පැටිය ඒ තමන්ගේ මවගේ - එතන අමුතු වචනයක් සඳහන් වෙනවා. උගතුන් නොයෙක් විදියට තෝරන - 'මාතුගොරවකෙන වුයහමානො' මාතුගොරව කියන්නේ දූන් මේ පින්වතුන් දන්නවා එළදෙනක් පැටවෙක් ලැබුනට පස්සේ පැටව ආරක්ෂා කරන්න විශේෂ ශබ්දයක් යොදනවා හුම්, හුම් කියලා වගේ, හුම් හුම් කිය කියා අර වහුපැටිය ඉස්සර කරගෙන එහෙම නැත්නම් නැතිඋනහමත් සොයාගෙන යන්නේ ඒ වගේ - අන්න ඒ ගවරාවයෙන් උත්සාහවත් කරමින් එදාම උපන් ගව පැටියත් එළදෙනගේ උරෙන් ඉවත්වෙන වතුර පාර තුළින් ඉදිරියට සුරක්ෂිතව ගිහිල්ල එතර වුනා.

ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ඊළඟට ඒ උපමාව අනුව ප්‍රකාශ කරනවා. මොකද ඒකට හේතුව? අර ගොපල්ල ප්‍රඥාවන්තයි. ඒ වගේම මෙතෙර හරියට පරීක්ෂා කළා. එතෙර හරියට පරීක්ෂා කළා. ඒ වගේම නියම තොටින් ඒ ගවයන් එතෙර කළා. ඒකයි ඒක සාර්ථක වුනේ එසේම, මහණෙනි යම් ශ්‍රමණ බ්‍රාහමණයින් මෙලොව ගැන දක්ෂ නම්, පරලොව ගැන දක්ෂනම්, මාරයාගේ රාජධානිය ගැන දක්ෂනම්, රාජධානිය නොවන ප්‍රදේශය ගැන දක්ෂ නම්, මරණයට හසුවන ප්‍රදේශය ගැන දක්ෂ නම්, මරණයට හසු නොවන ප්‍රදේශය ගැන දක්ෂ නම්, යම් කෙනෙක්



එවැනි ශ්‍රමණ බ්‍රාහමණයින්ට කන්දෙන්නට සුදුසු යයි සිතත් නම්, ඔවුන් කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවන්නට සුදුසුයයි සිතත් නම්, එය දීර්ඝ කාලයක් ඔවුන්ගේ හිත සුව පිණිස හේතු වෙනවා. එහෙම ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ අර දක්ෂ ගොපල්ලගේ ක්‍රියාවලිය ආශ්‍රයෙන් ඒක උපමාව හැටියට අරගෙන උපමේය වශයෙන් මේ ශාසනයේ ආර්ය පුද්ගලයින් පිළිබඳව යමක් ප්‍රකාශ කරනවා ඔන්න ඊළඟට. යම් සේ මහණෙනි අර ගොපල්ලා පළමුවෙන්ම ගව රැලේ ගවපිතෘන් ගව පරිනායකයින් වන ප්‍රධාන ගවයින් එතර කළාද එසේම මහණෙනි, මේ ශාසනයේ සසරට බඳින දස සංයෝජන සිඳලා, ආශ්‍රවයන් ක්ෂය කරල - තවත් එතන වචන රාශියක් රහතන් වහන්සේලා පිළිබඳව සඳහන් වෙනවා - මේ ශාසනයේ රහතන් වහන්සේලා අර දස සංයෝජනම සිඳගෙන සුවසේ නිවන් පරතෙරට යනවා. ඔන්න එතකොට ඒකට උපමාව එහෙමයි. රහතන් වහන්සේලා සියලුම කෙලෙස් නසල පිරිසිදුව සුවසේ එතර වෙනවා.

ඔන්න දෙවනුව දෙවෙනි කාරණය දක්වන්නෙ අර ගව රැලේ ශක්තිමත් ගවයින්, ගව දෙනුන් දෙවනුව සුවසේ එතර වුනා වගේ මේ ශාසනයේ ඊළඟට කියවෙන්නේ - මේ පින්වතුන් දන්නවා අනාගාමී ආර්ය පුද්ගලයින් පිළිබඳව, දූන් අර දස සංයෝජන කියන එකත් අපි හඳුන්වමු නොදන්න අයට. සංයෝජන සසරට බැඳෙන බැමි හැටියට දක්වෙනවා. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස, කාමරාග, පටිඝ, රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා කියන දහයයි. දස සංයෝජන හැටියට ධර්මයේ හැඳින්වෙන්නේ. සංයෝජන දහය බෙදල තියනවා ධර්මයේ, පින්වතුනි, 'ඕරම්භාගිය' 'උද්ධම්භාගිය' කියල. ඕරම්භාගිය සංයෝජන කියල කියන්නෙ මේ පැත්තට අයිති. අපි මේ පැත්තෙ ඉඳල බලනකොට මේ පැත්තට තියන සංයෝජන පහ. 'උද්ධම්භාගිය' ඉහළ පැත්තට අයිති. ඉතින් අනාගාමී පුද්ගලයා පිළිබඳව සඳහන් වෙන්නේ ඒ ඕරම්භාගිය සංයෝජන පහ සිඳල එවගේම ඒ අය ගිහිල්ල උපදින්නේ ඕපපාතික වශයෙන් මව් - පිය සම්බන්ධයක් නැතිව සුද්ධාවාස ලෝකවල බව මේ පින්වතුන් අහල ඇති. අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකනිට්ඨා කියන ශුද්ධාවාස බ්‍රහ්මලෝකවල උත්පත්තිය ලබනවා. ඒ වගේම අනාගාමී කියන වචනයේ තේරුමත් ආපහු එන්නෙ නැහැ මෙහාට. මෙලොවට නැවත

එන්නෙ නෑ - අනාගාමී. ඒකට ධර්මයේ තවත් වචනයක් කියනවා 'අනාවත්තිධම්මා තස්මා ලොකා'. බ්‍රහ්ම ලෝකයෙන් ආපස්සට හැරිල එන්නෙ නැහැ. අන්න ඒ තත්ත්වයට පත්වුණු අනාගාමී පුද්ගලයයි අර දෙවෙනි ගණයට සමාන කරන්නේ. එතකොට ඒ පුද්ගලයින් පිළිබඳව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ රහතන් වහන්සේලා නම් එතර වුනා. මේ අය 'එතර වන්නාහ'. අනාගත වශයෙන් කියනවා ඒකාන්තයෙන් එතර වෙනවා. නියත වශයෙන්. අනාගාමී පුද්ගලයන් ගැන බුදුරජාණන් වහන්සේ ස්ථිරව ප්‍රකාශ කරනවා. ඔන්න එතකොට ඒ දෙවෙනි කාරණය තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට තුන්වෙනුව - තුන්වෙනුව ඉන්නේ අර වැඩුනු වස්සන් වැස්සියන්. ඒ එතර කළා වගේ තමයි මේ ශාසනයේ ඔන්න ඊළඟට තිබෙන්නේ සකදාගාමි නේ. මේ පින්වතුන් අහල ඇතිනේ. 'සකදාගාමි' කියන වචනයේ තේරුම. 'එක වරක් පමණක් මේ ලෝකයට එන' ඒ සකදාගාමී පුද්ගලයින් පිළිබඳව ධර්මයේ දක්වෙන්නේ මෙහෙමයි. මේ සූත්‍රයේත් ඒ අය ගැන කියවෙන්නේ පළමු සංයෝජන තුන සිඳලා සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත, පරාමාස කියන සංයෝජන තුන සිඳලා ඊට අමතරව සකදාගාමී අය ගැන මෙහෙම කියවෙනවා, රාග ද්වෙෂ, මෝහ කියන කෙලෙස් තුනී කරලා. එතකොට සංයෝජන තුනක් සින්දා. ඒ වගේම රාග, දෝස, මෝහ තුනී කළා. අර ගඟේ දියවැල කපාගෙන යන එකට බුදුරජාණන් වහන්සේ මෙතන සමාන කළේ මාරයාගේ දියවැල කපාගෙන යනවා කියලා.

'මාරස්ස සොතං ඡෙත්වා' මාරයාගේ දියවැල කියන්නේ තණ්හාවයි. තණ්හා දියවැල කපාගෙන ගිහිල්ල මේ තුන්වෙනි කොටසත් එතරට යන්නාහ. නියත වශයෙන්ම යනවා. ඒක අනාගතයේ වෙන දෙයක්. නැවත එක් වරයි එන්නේ. නමුත් නියත වශයෙන් නිවන් දකිනවා. ඔන්න එතකොට තුන්වෙනි ගණය.

හතරවන ගණයට ඉන්නේ දුර්වල වස්සන්. ඒ උපමාව දක්වල තියෙන්නෙ සෝවාන් පුද්ගලයා පිළිබඳව. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන මුල් සංයෝජන තුන පමණක් සිඳලා ඉන්න ඒ අය පිළිබඳව බුදුරජාණන් වහන්සේ සඳහන් කරන්නේ බොහෝ විට



''නියතො සම්බොධි පරායණො'' ඒ වගේම ''අවිනිපාත ධම්මො'' නැවත අපායවලට යන්නේ නැහැ. දුගතියට යන්නෙ නැහැ. සෝවාන් පුද්ගලයා පිළිබඳවත් විශේෂ දේවල් සඳහන් වෙනවා. රහතන් වහන්සේ ගැන ඒ පැත්තෙන් කියනව වගේ මේ පැත්තෙන් සාමාන්‍ය පුද්ගලයින්ගේ මට්ටමින් බලනවනම් ඒත් ශ්‍රේෂ්ඨ කෙනෙක්. ඒත් මෙතන උපමා කරල තියෙන්නේ, දුර්වල වස්සන්ට, කොහොමද වැඩේ. දුර්වල වස්ස කියන්නේ සංයෝජන දහයෙන් තුනයි සිඳල තියෙන්නේ. නිගාකරන්න කියනව නොවෙයි. නමුත් මේ ටික නියතයි. ඒ අය දන් වෙන තැන්වල සඳහන් වෙනවා මේ සූත්‍රයේ නැතත් මේ පින්වතුනුත් අහල තියනවා, සෝවාන් පුද්ගලයා හඳුන්වන්නේ 'සත්තක්ඛත්තු පරම' කියල. තව හත් සැරයයි උපත ගන්නෙ. හත් සැරයක් තුළ කොහොම හරි සසර දුක් කෙළවර කරනවා. 'නියතො සම්බොධි පරායණො' කියන වචන තියෙනවා. නියත වශයෙන්ම 'සම්බොධි' කියන්නේ නිවනයි. එහෙම නැත්නම් රහත් බවයි. ඒ රහත් බව ලබනව. ඒ සැනසිල්ල සෝවාන් පුද්ගලයාටත් තියනවා. ඒ වගේම ''අවිනිපාත ධම්මො'' අපාය ආදී තැන්වල උපදින්නෙ නැහැ. දුගතියක උපදින්නෙ නැහැ. අන්න එතකොට ඒක සමාන කරල තියෙන්නෙ අර දුර්වල වස්සන්ට.

ඔන්න එනව ගැඹුරු හරියක්. ඊළඟට කියාපු පස්වෙනි ගණය ඒකට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ මේ පින්වතුන් බොහෝවිට අහල නැති වචන.

යම්සේ මහණෙනි අර ගොපල්ලා එදාම උපන් වහු පැටියා මවගේ හුම්, හුම් හඬින් ඒ වගේම මවගේ උපකාරයෙන් එහාට තල්ලු කරල ගියා වගේ මේ ශාසනයේත් ඉන්නව පුද්ගල කොට්ඨාශ දෙකක් **'ධම්මානුසාරී'**, **'සද්ධානුසාරී'**, නමින් හඳුන්වන ඒ දෙගොල්ලන් - සෝවාන් තත්ත්වයටත් අඩුයි. නමුත් ඒ දෙගොල්ල ගැනත් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. එදාම උපන් වහුපැටිය වගේ ඒ බොළඳ දෙන්නත් නියතයෙන්ම එතෙරට යන්නාහ. ඒක ලොකු සැනසිල්ලක් මේ ශාසනයේ. සෝවාන් එකෙන්ම ඉවරවෙන්නෙත් නැහැ. තවත් ඉඩ තියනවා කියන එකයි එයින් පෙන්නුම් කරන්නේ. **අර එදා උපන් වහු පැටියන්ටත් මේ මාරයාගේ දියවැල කපාගෙන යන්න පුළුවන් මැදුම් පිළිවෙතක් බුදුරජාණන් වහන්සේ**

හෙළිකළ බවයි මෙයින් කියවෙන්නේ. ඉතින් ඒ ධම්මානුසාරී සද්ධානුසාරී කියන ඒ පුද්ගල කොට්ඨාශ දෙකත් ඒ විදියට එතර වෙනවා. ඒවා ගැන අපි යථා කාලයේ දී කියනවා මේ පින්වතුන්ට. මේ කථාව ඉස්සෙල්ල ඉවර කරල සිටිමු. කෙටියෙන් මෙතන කියවෙන්නේ එච්චරයි. අර වහුපැටියට සමාන කරල තියෙන්නේ ධම්මානුසාරී, සද්ධානුසාරී නමින් මේ ශාසනයේ ආයඝී පුද්ගලයින්. සත්පුරුෂ පුද්ගලයින් දක්වන තැන්වල සඳහන් කරන ඒ දෙගොල්ලත් අර වගේම කවදාහරි නියත වශයෙන්ම එතරට යනවා ඇති.

එහෙම කියල බුදුරජාණන් වහන්සේ ඒකට හේතු හැටියට දක්වන්නෙ - එතෙන්දි සිංහනාදයක් වගේ එකක් කියනවා ''මහණෙනි එහෙම වෙන්නෙ මොකද? මම මහණෙනි මේ ලෝකය ගැනත් දක්ෂයි. ''කුසලො'' කියන වචනයයි යොදන්නෙ. පරලෝකය ගැනත් දක්ෂයි, මාරයාගේ රාජධානිය ගැනත් දක්ෂයි. මාරයාගේ - මරණයට - හසුවන ප්‍රදේශය ගැනත් දක්ෂයි, මරණයට හසුනොවන ප්‍රදේශය ගැනත් දක්ෂයි. ඒක නිසා මහණෙනි යම් කෙනෙක් මට කන්දෙන්න සුදුසු යයි හඟිත් නම්, මා කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගත යුතුයයි හඟිත් නම්, ඒ අයට දීඝී කාලයක් හිත සුව පිණිස වෙනවා. එහෙම ප්‍රකාශ කරල තමයි අන්න අර ඒ දේශනාව කුළුගන්වන අපි මාතෘකා කළ ගාථා තුන වදාළේ.

**අයං ලොකො පර ලොකො - ජානතා සුප්පකාසිතො**
**යඤ්ච මාරෙන සම්පත්තං - අප්පත්තං යඤ්ච මච්චුනා**

ඒ ගාථාවෙ තේරුම -

මෙලොවත් පරලොවත් මේවා ගැන හොඳ අවබෝධයක් ඇති එතන අධ්‍යාහාරයි - අපට හිතාගන්න තියෙන්නෙ - බුදුවරයා විසින් - සම්බුදුරජාණන් වහන්සේ විසින් - මැනවින් ප්‍රකාශ කරල තියනවා. ඊළඟට ඒ එක්කම කියනව - 'යඤ්ච මාරෙන සම්පත්තං 'මාරයාට කිට්ටු වෙන්න පුළුවන් තැනත්' අප්පත්තං යඤ්ච මච්චුනා' මාරයාට කිට්ටු වෙන්න බැරි තැනත්. ඒ දෙකම සම්බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශ කරල තියනවා.



**සබ්බං ලොකං අභිඤ්ඤාය - සම්බුද්ධෙන පජානතා**
**විවටං අමතද්වාරං - ඛෙමං නිබ්බානපත්තියා**

මුළු ලෝකයම පිළිබඳව අභිඤ්ඤාවෙන් දැන - විශිෂ්ට ඥානයෙන් දැනගෙන - 'සම්බුද්ධෙන පජානතා' විශේෂ ඥානයක් ඇත්තා වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ විසින් 'විවටං අමතද්වාරං' අමෘත ද්වාරය - අමා දොර - ඇරලයි තියෙන්නෙ 'ඛෙමං' ආරක්ෂා සහිත අමාදොර ඇරල තියනවා. 'නිබ්බාන පත්තියා' නිවනට පැමිණීම සඳහා, ඊළඟ ගාථාවේ කියවෙන්නේ:-

**ඡින්නං පාපිමතො සොතං - විද්ධස්තං විනළීකතං**
**පාමුජ්ජ බහුලා හොථ - ඛෙමං පත්තෙථ භික්ඛවො**

ඒ ජයග්‍රහණය ඊළඟට බුදුරජාණන් වහන්සේ ඊළඟ ගාථාවෙන් ප්‍රකාශ කරනවා 'ඡින්නං පාපිමතො සොතං' මාරයාගේ දියවැල අන්න අර කියාපු තණ්හා දියවැල - ඒක සිඳල දාල තියනවා. 'විද්ධස්තං' විනාශ කරල තියනවා, 'විනළීකතං' මාරයාගේ මානය නැති කරල තියනවා. ඊළඟට ඒක නිසා 'පාමුජ්ජ බහුලා හොථ' ඒ නිසා ප්‍රමෝදය සතුට ඇතිකර ගන්න. මහණෙනි, 'ඛෙමං පත්තෙථ භික්ඛවො' ඛෙමං කියල. එතෙන්දි කියන්නේ නිවන ප්‍රාර්ථනා කරවු. ඔන්න එතකොට ඒ සූත්‍රය අපි කිව්වා සම්පූර්ණයෙන්ම වාගේ.

දැන් ඉතින් තියෙන්නේ විවරණ වශයෙන් අපට යමක් කියන්නයි. විශේෂයෙන්ම සූත්‍රයේ කියාපු කාරණා ටිකෙන් ඒ උපමා උපමේය සංසන්දනයෙන් මේ පින්වතුන්ට තේරුම් ගන්න පුළුවන්. ඒ වගේම වැඩි විස්තර නොදැක්වුවත් මේ අවස්ථාවේ අර සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් කියන ඒ කථාන්තරය කවුරුත් අහල තියනවා. මෙතෙන්දි කියවුනු අමුතු දෙයක් තමයි '**ධම්මානුසාරී**' '**සද්ධානුසාරී**', ඔන්න ඒ ගැනයි අපි විශේෂ විවරණයක් කරන්නෙ. ඒ දෙකොටස ගැන මේ සූත්‍රයේ කෙටියෙන් සඳහන් වෙන්නේ. නමුත් සූත්‍ර කීපයක ඇතැම් තැන්වල බුදුරජාණන් වහන්සේ සාමාන්‍යයෙන් අප්‍රකට පුද්ගලයින් දෙදෙනා ගැන මෙන්න මේ විදියට විස්තර කරනවා. විශේෂයෙන් අලගද්දූපම සූත්‍රයේ සඳහන් වෙනවා. නිසැකවම 'සම්බොධි පරායණ' නිවනට අරහත්වයට නියත

පුද්ගලයින් හැටියට මේ ශාසනයේ ඔය ධම්මානුසාරී සද්ධානුසාරී යන දෙගොල්ල. ඒ අයගේ සුදුසුකම් ඊළඟට කියවෙනවා මැදුම් සඟියේ කීටාගිරි සූත්‍රයේ වඩාත් ප්‍රකටව පුද්ගලයින් හත් දෙනෙක් හැටියට දක්වල අගට දක්වනවා මේ දෙදෙනා ගැන. ධම්මානුසාරී පුද්ගලයා ගැන කීටාගිරි සූත්‍රයේ සඳහන් වෙන්නේ මෙහෙමයි. ඒ ධම්මානුසාරී පුද්ගලයා තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය පිළිබඳව එක්තරා ප්‍රමාණයකට කල්පනා කරල නුවණින් විමසල ඒත්තු ගිහිල්ල තියනවා ඒ තැනැත්තට. ඒකට යොදන පාළි වචනය ඒකත් ගැඹුරු වචනයක් 'මත්තසො නිජ්ඣානං ඛමන්ති' එක්තරා මාත්‍රයකට ප්‍රමාණයකට නිජ්ඣානං ඛමන්ති කියන්නේ අපට කියන්න පුළුවන් 'ඒත්තු ගිහිල්ල තියනවා. හිතල කල්පනා කරල' ආ මේක මෙහෙම තමයි' කියල යම්කිසි නිගමනයකට පැමිණිලා තියනවා. ඒක ඒ පැත්තෙන්. ඊළඟට විශේෂ දේ තමයි ඒ ධම්මානුසාරී පුද්ගලයා තුළ පිහිටලා තියනවා - මේ පින්වතුනුත් අහල තියනවා අර සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අතර තිබෙන ඉන්ද්‍රිය ධර්ම පහ - සද්ධා විරිය සති සමාධි පඤ්ඤා. එතකොට සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය කියන ආධ්‍යාත්මික ඉන්ද්‍රිය පහ මේ ධම්මානුසාරී පුද්ගලයා තුළ පිහිටලා තියනවා. ඒකයි විශේෂත්වය. පෘථග්ජනයට ඒව නැහැ. තියනවා කියල හිතාගත්තට 'සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං නත්ථි.' කියල කිසිම ආකාරයකින් පෘථග්ජන පුද්ගලයාට මේ ඉන්ද්‍රිය පහ පිහිටලා නැහැ. ශ්‍රද්ධාව තියෙන්න පුළුවන්. අනිත් ඒවාත් තියෙන්න පුළුවන්. නමුත් ඉන්ද්‍රිය තත්ත්වයට පත්වෙලා නැහැ. එතකොට ඒක අවම වශයෙන් ඒ තත්ත්වයවත් ලැබිල තියෙන්නේ ඔන්න ඔය කියාපු ධම්මානුසාරී පුද්ගලයාට. එතකොට ධම්මානුසාරී කියන වචනය යොදන්නේ මොකද? මෙතන ඒකට හේතුව දක්වන්නේ ගැඹුරු අර්ථයක් තියනවා. අර ඉන්ද්‍රිය පහ අතරින් ඇතැම් කෙනෙකුට 'පඤ්ඤින්ද්‍රිය' ශක්තිමත් - සංසාරයේ ඒක දියුණු කරල තියනවා. ඇතැම් කෙනෙකුට සද්ධින්ද්‍රිය ශක්තිමත්. දැන් මේ කියාපු ධම්මානුසාරී පුද්ගලයා තුළ පඤ්ඤින්ද්‍රිය ශක්තිමත්. ඉන්ද්‍රිය පහම පිහිටලා තියනවා පඤ්ඤින්ද්‍රිය ශක්තිමත් - ඒක නිසා ඉදිරියට කටයුතු කරලා තව විස්තර ඒ ගැන කියවෙනවා. ක්‍රමානුකූලව අපි කිව්වොත් - ඔන්න එතකොට ඒ ටික කියවෙනවා කීටාගිරි සූත්‍රයේ.



ඒ වගේම ඊළඟට සද්ධානුසාරී පුද්ගලයා ගැන කියවෙන්නේ ඒ තැනැත්තා ධම්මානුසාරී පුද්ගලයාගෙන් වෙන් වෙන්නේ අර තැනැත්තා ධර්මය අනුසාරයෙන් මේ ගමන යනවා සද්ධානුසාරී පුද්ගලයා ශ්‍රද්ධාව අනුසාරයෙන් ශ්‍රද්ධාව උපකාර කරගෙන එතරට යනවා. ඒක නිසා ඒ තැනැත්තා ගැන කියන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ධර්මය පිළිබඳ ඒත්තුයාමක් නොවෙයි. එතන විශේෂ දෙයක් කියවෙනවා ''තථාගතෙ චස්ස සද්ධාමත්තං හොති පෙමමත්තං'' ශ්‍රද්ධාවක් ප්‍රේමයක් තියනවා තථාගතයන් වහන්සේ කෙරෙහි. දැන් අපට හිතාගන්න පුළුවන් මේ පින්වතුන් අහල තියනව නේ වක්කලී ආදීන් ගැන. අන්න එහෙම ශ්‍රද්ධා ඉන්ද්‍රිය අධික නිසා සංසාරයේ බුදුවරුන් ඇසුරු කිරීම නිසා හෝ ආයි සැකයක් නෑ. තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවක් ප්‍රේමයක් තියනවා. ඒකයි සද්ධානුසාරී කියන්නේ. එතකොට ධම්මානුසාරී පුද්ගලයට ධර්මය යම් ප්‍රමාණයකට ඒත්තු ගිහින් තියනවා. සද්ධානුසාරී පුද්ගලයාට ඒකත් නැහැ. නමුත් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවත් ප්‍රේමයත් තියනවා. ඔන්න ඊළඟට ඊට අමතරව අර කලින් කියාපු පුද්ගලයාට වගේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඉන්ද්‍රිය පහත් පිහිටල තියනවා. ඒ සුදුසුකමත් තියනවා. එතකොට අර දෙන්න ගැන දැන් ටිකක් දුරට මේ පින්වතුන්ට අවබෝධයක් තියනවා.

ඊළඟට මේ දෙන්න ගැන තවත් දැනගන්න හොඳ සූත්‍රයක් කෙනෙකුට බලාගන්න ඕන නම් සංයුත් සඟියෙ 'ඔක්කන්තික සංයුත්ත කියල ධර්ම කොට්ඨාශයක්. තියනව බුද්ධ වචනයක් - බුද්ධ දේශනාවක් - 'ඔක්කන්තික කියල කියන්නේ 'බැසීම' කියන අදහස තියන වචනයක්. ඔක්කන්තික කියල කියන්නෙ - ඇත්තවශයෙන් මේ දෙදෙනා ගැන විශේෂයෙන්ම කියවෙන්නේ ඒ සූත්‍රයේයි. ඒ ඔක්කන්තික සංයුත්තයේ මෙන්න මෙහෙම ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, ඇස අනිත්‍යයි වෙනස් වෙන සුළුයි. අන්‍යාකාරයකට පත්වෙන සුළුයි. අනිච්චං, විපරිනාමි, අඤ්ඤථාභාවී කියන වචන යොදනව. ඇස වගේම කණ, නැහැය, දිව, කය, මන. මනසත් ඇතුළු හයම අනිත්‍යයි, වෙනස්වන සුළුයි, අන්‍යාකාරයකට පත්වෙන සුළුයි. මෙන්න මේ කියාපු ධර්මය පිළිබඳව කෙනෙක් එක්තරා ප්‍රමාණයකට ඒත්තු ගෙන තිබෙනවා. ඒ කියන්නෙ

ධම්මානුසාරී පුද්ගලයා, තාම ඥාන දර්ශන වශයෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කරල නැහැ. නමුත් ඒ ගැන හිත යොදල මේක මෙහෙම තමයි කියල 'පඤ්ඤාය මත්තසො නිජ්ඣානං ඛමන්ති' ඒත්තු ගිහිල්ල තියනවා එක්තරා ප්‍රමාණයකට. අන්න එතකොට එතන යමක් කියවෙනවා. ඒ ධම්මානුසාරී පුද්ගලයා පිළිබඳව. ඒ එක්කම තවත් කීපයක් කියවෙනවා ඒ පුද්ගලයා හඳුනාගන්ට. ඒ තැනැත්තා ගැන කියවෙන්නෙ 'ඔක්කන්තො සම්මත්ත නියාමං' කියන වචන යෙදෙනව. ඊළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ තැනැත්තට අර සුදුසුකමට අමතරව 'ඔක්කන්තො සම්මත්තනියාමං' කියන එකේ තේරුම පින්වතුනි, 'සම්මත්ත' කියන්නේ 'සම්‍යක්ත්ව සම්මා කියන වචනය මේ පින්වතුන් දන්නවා. සම්මා, මිච්ඡා කියන වචන දෙක. සම්මත්ත කියන්නේ නිවැරදි බව. එතකොට නිවැරදි බව කියන නියාමතාවට බැහැල. නිවැරදි බව කියන නියාමතාවට මනස බැහැලයි කියන්නෙ ආයි මිච්ඡා පැත්තට හැරෙන්නෙ නැහැ. 'මිච්ඡත්ත' - 'සම්මත්ත' කියල දෙකක් තියනවා. මිච්ඡත්ත කියන්නේ මිච්ඡා බව, සම්මත්ත කියන්නේ සම්‍යක් බව. එතකොට මේ කියාපු ධම්මානුසාරී පුද්ගලයා බැහැගෙන තියනවා සම්මත්ත කියල කියන නියාමයට, නිවැරදි මඟට, හරි මඟට පැමිණිල තියෙනව. ඒ එක්කම කියනවා 'සප්පුරිස භූමිං ඔක්කන්තො' ධම්මානුසාරී පුද්ගලයා සත්පුරුෂ භූමියට බැහැල තියනවා. පින්වතුනි, සත් පුරුෂ - අසත්පුරුෂ කියල කියන එක සමාජයේ තියන අර්ථයෙන්මත් නොවෙයි ධර්මයේ යෙදෙන්නෙ. සත්පුරුෂ කියන වචනය ආර්ය පුද්ගලයා පිළිබඳවත් යෙදෙනවා. මැදුම් සඟියේ සප්පුරිස සූත්‍රය ආදියේදී ආර්ය පුද්ගලයට යෙදෙනව. නියම සත්පුරුෂය නම් ඒ තැනැත්තයි. ආර්ය පුද්ගලයා. එතකොට 'සප්පුරිසභූමිං ඔක්කන්තො' කියල කියන්නේ මේ ධම්මානුසාරී පුද්ගලයා සප්පුරිස භූමියටත් බැහැලයි කියනවා. ඊළඟට තවත් සුදුසු කමක් කියනවා 'වීතිවත්තො පුථුජ්ජනභූමිං'. පෘථග්ජන භූමියෙන් එතර වෙලා. පෘථග්ජන භූමියෙනුත් එහාට ගිහිල්ල. ඊළඟට තවත් එකක් කියනවා ''අභබ්බො තං කම්මං කාතුං යං කම්මං කත්වා නිරයං වා තිරච්ඡානයොනිං වා පෙත්තිවිසයං වා උප්පජ්ජෙය්‍ය'' ඒ කියන්නේ මේ ධම්මානුසාරී පුද්ගලයාට කරන්න බැහැ යම්කිසි පාප කර්මයක් නිරය තිරිසන් ලෝක ප්‍රේත ලෝක ආදියෙහි උපදින්ට හේතුවන. කරන්න බැහැ. 'අභව්‍ය' කියල කියන්නේ ඒකයි. ඒකත් ලොකු සුදුසුකමක්. දැන් මේ පින්වතුන් එක්කෙනෙකුටවත් එහෙම කියන්න බැහැනේ. ඒ



තැනැත්තාට කරන්න බැහැ කියලා. මේ බුද්ධ වචනයයි. 'අභබ්බො' අභව්‍ය කියන වචනය විශේෂ වචනයක්. ආයි කරන්න බැහැ කියන එකයි. ඒ වගේම ඔන්න අන්තිමට දැක්වෙනවා විශේෂම කාරණය. ඒ ධම්මානුසාරී පුද්ගලයා මරණයට පත්වෙන්නෙ නෑ සෝවාන් ඵලය නොලබා. සෝවාන් ඵලය නොලබා මරණයට පත්වෙන්නෙ නෑ. එතකොට මරණයට කලින් ධම්මානුසාරී පුද්ගලයාට බැරිඋනොත් යම් හෙයකින් සෝවාන් වෙන්න, අන්තිම පරිච්ඡේදයෙන් - අවසාන වශයෙන් - මරණයට කලින් සෝවාන් වෙනවාමයි. ඒක බුද්ධ වචනයයි. අන්න ඒකයි එතකොට විශේෂත්වය. ඔන්න දැන් ධම්මානුසාරී පුද්ගලයා පිළිබඳව මේ පින්වතුන් යමක් තේරුම් ගත්තා.

සද්ධානුසාරී පුද්ගලයා ගැන කියන එක දැන් පහසුයි. මොකද අනික් ටිකට අමතරව මෙතෙන්දිත් ඒක සඳහන් වෙනව. සද්ධානුසාරී පුද්ගලයාට අර කියාපු අනිච්චතාව ගැන ඒවා මොකක්වත් නැහැ. ටිකක් හරි ඒත්තු ගිහිල්ලත් නැහැ. ශ්‍රද්ධාව, ප්‍රේමය තිබෙනව. ඔන්න ඊළඟට අපි යමක් කිවුව නම් ධම්මානුසාරී පුද්ගලය පිළිබඳව විශේෂ සුදුසුකම් හැටියට, ඒ සියල්ලම සද්ධානුසාරී පුද්ගලයාටත් තියනවා. මොනවද, නිවැරදි බව කියන නියාමතාවට බැහැල, සත්පුරුෂ භූමියට බැහැල, පෘථග්ජන භූමිය ඉක්මවල, නිරය තිරිසන් යෝනිය ප්‍රේත යෝනිය වැනි දුගතියට යන්න හේතුවන කර්මයක් කරන්න බැහැ. ඊළඟට නියත වශයෙන්ම මරණයට කලින් සෝවාන් ඵලයට පත් වෙනවා. ඔන්න එතකොට මේ පින්වතුන්ට මෙතෙක් අර හතරදෙනා ගැන පමණක් දැනගෙන හිටි අයට මේ විදියේ පිහිටක් ශාසනයේ තියනව. ඒක නිසා අර හතර පමණක් නොවෙයි. ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේ හරියට හඳුන්වා දුන්න ධර්ම මාර්ගයේ හැසිරෙනවා නම් නියම ශ්‍රද්ධාවක් ඇතිව අන්න අවම වශයෙන් අර වහු පැටිය වගේ - මවගේ ආරක්ෂාව ඇතිව එතර වෙන වහු පැටිය වගේ - ඒත් එතෙරවෙන්න පුළුවන් - **විශේෂ දේ තමයි මරණයට කලින් බුද්ධ වචනය අනුව, කොහොම හරි මරණ වේදනාව හමුවේ හරි විදර්ශනා වඩලා සෝවාන් වෙනවා ඇති. ඒකයි එතන කියන්නේ.**

ඔන්න එතකොට එතන ඉඳල අපි ඉදිරියට යමු. දැන් අපි ප්‍රකාශ කළ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය අද වැනි දවසක මේ පින්වතුන් අහල තියනව

ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය බුදුරජාණන් වහන්සේ මැදුම් පිළිවෙත කියල හැඳින්වූ බව. මේ පින්වතුන් කවුරුත් දන්නවා කියල හිතනවා. මැදුම් පිළිවෙත කියන්නෙ මොකක්ද කියන එකත් කෙටියෙන් සළකාගත්තොත් මේ අවස්ථාවෙ, මේ පින්වතුන් අහල තියනවා කාමසුඛල්ලිකානු යෝගය, අත්ත කිලමථානුයෝගය කියල ලෝකයේ තිබුනු ඒ දෘෂ්ටි දෙකක්. කාමසුඛල්ලිකානු යෝගය හැටියට ගන්න පුළුවන් පරලොවක් ගැන විශ්වාසයක් නැතිව පස්කම් සැප විඳිමින් කකා බොමින් ලිහිල් ජීවිතයක් ගෙවමින් අන්න අර මෙලොව ගැන හරි අවබෝධයක් නැතිව.

අත්ත කිලමථානුයෝගය කියල කියන්නේ මේ ආත්මය බේරගන්න කියල අනවශ්‍ය අන්දමින් කයට වද දීල එපමණකින් නිවන් දකින්න පුළුවන් කියල අන්න එතකොට පරතෙර ගැන අවබෝධයකුත් නැහැ. අන්න ඒ දෙගොල්ලම සංසාරයේ දිගින් දිගට යනවා. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ මේ සොයාගත්තු මැදුම් මඟ, මැදුම් මඟ හැටියට හඳුන්වල තියෙන්නේත් ආර්ය අෂ්ටාංගික මාර්ගයමයි, ඒක සුරක්ෂිතයි. ඒ විදියේ ප්‍රකාශයක්. ඒ සූත්‍රය දිගට නොකිව්වත්. යම්තාක් සත්ත්වයෝ සිටිත්නම් මේ ලෝකයේ අපා, දෙපා, සිවුපා, බහුපා, රූපී, අරූපී, සඤ්ඤී, අසඤ්ඤී, නෙවසඤ්ඤානාසඤ්ඤී ඒ සියලුම සත්ත්වයන් අතර තථාගතයන් වහන්සේ අග්‍රයි කියල ඒ අදහස  වශයෙන් කියනව නම් යම් කෙනෙක් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටෙව්ව නම් ඒ ශ්‍රද්ධාව පිහිටෙව්වේ ලෝකයේ අග්‍රම පුද්ගලයා පිළිබඳවයි. ඊළඟට කියනවා අවසාන වශයෙන් **'යෙ භික්ඛවෙ බුද්ධෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති''** යම් කෙනෙක් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගත්තා  නම්, ඒ ශ්‍රද්ධාව ඇතිකර ගත්තෙ ලෝකයේ අග්‍ර පුද්ගලයා පිළිබඳවයි. එතකොට ඒකේ ආනිශංසයි අර කියන්නේ. අර කියාපු අන්තවලට යන්නෙ නැහැ.

ඉතින් පළමුවෙන්ම අපි තව ටිකක් කියනව නම් ඔන්න ඊළඟට ටිකක් ගැඹුරු දේවලුත් කියන්න වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන යමක් කියනවා නම්. මේ පින්වතුන් සමහර විට අහල ඇති 'අග්ගප්පසාද



කියල සූත්‍රයක්  තියනවා. අග්ගප්පසාද සූත්‍රය ශ්‍රද්ධාවන්තයෙකුට බොහොම කාවදින විදියට බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙන්නේ. තමන් වහන්සේ ගැන. මෙතන ශ්‍රද්ධාව ගැන කියවෙච්ච නිසා අපි ඇතැම් අවස්ථාවල මේක ප්‍රකාශ කරල තියනවා. මේ දේශනාව ඒ තරම් ප්‍රබල ප්‍රකාශනයක්. 'යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා, බහුප්පදා වා, රූපීනො වා, අරූපිනො වා, සඤ්ඤිනො වා, අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති. අරහං සම්මාසම්බුද්ධො' කියල. අග්‍ර පුද්ගලයකු කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගැනීමේ ආනිශංසත් ඒ වගේම අග්‍රයි. ඒ විදියටම ධර්මය ගැනත් මේ සූත්‍රයේ කියවෙනවා. ඔන්න ධර්මය ගැන කියවෙන ටික අපි මෙතෙන්දි එළියට ගනිමු. ගැඹුරු කාරණයක් කියවෙන නිසා, ''යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා යම්තාක් සඞ්ඛත ධර්මයෝ වෙත්ද - සඞ්ඛත කියන්නේ පින්වතුනි හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස්වුනු දේවල්. ලෝකයෙ තියන සෑම දෙයක්ම එහෙමනේ. හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් වුන දෙයක්. 'අසඞ්ඛත' කියල කියන්නේ නිවනට. හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් නොවුනු කියන අර්ථයෙන්. සඞ්ඛත අසඞ්ඛත කියල දෙකක් තිබෙනවා. සඞ්ඛත ධර්මයන් අතර - 'යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති ලෝකයේ තිබෙන සඞ්ඛත ධර්ම අතුරින් ආර්ය අෂ්ටාංගික මාර්ගය අග්‍රයි. එහෙම කියල අර විදියටම කියනව. 'යෙ ඛො පන භික්ඛවෙ අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති'' ඒ නිසාම ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙරෙහි ප්‍රසාදයක් පිහිටුවා ගත්තොත් ඒ ප්‍රසාදය අග්‍ර වූ විපාකයක් ආනිසංසත් ලබා දෙනවා කියල. මෙතනදී අපි මේ ටික මතු කරන්නේ මොකද ආර්ය අෂ්ටාංගික මාර්ගය සංඛතයි. **මේක මහා ආශ්චර්යවත් දෙයක්. සංඛත දේකින් අසංඛතය කරා යනවා.** කෙනෙකුට තර්ක කරන්න පුළුවන්. මේ කාලයේ ඉන්න තර්ක කාරයෙකුට, කොහොමද සංඛතයෙන් අසංඛතයට යන්නේ, අන්න එතනම තමයි හපන්කම බුදුරජාණන් වහන්සේගේ, සංඛතය උපකාර කරගෙන මැදුම් මඟ කියන, හරියට අර ගොපල්ල මෙතෙරයි එතෙරයි තේරුම් අරගෙන නියම තොටින් නුවණින් ඉස්සෙල්ල එක කොටසක් එතර කරල, ඒකෙන් ඇතිවන ශ්‍රද්ධාවෙන් දෙවෙනි කොටස ඒ විදියෙ යම්කිසි විශේෂ පරීක්ෂණයක් ඇතිවයි ගොපල්ලෙක් ඒ විදියට ගවරැළේ අන්තිමට අර  එදා උපන් වසුපැටියා දක්වා එතර කළේ. ඒ වගේ බුදුරජාණන් වහන්සේත් මේ

ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළින් අර විදියට එතර කළා කියන එකයි අපට හිතාගන්න තියෙන්නේ.

ඔන්න ඊළඟට තව පැත්තකට එමු. ආර්ය අෂ්ටාංගික මාර්ගය. මේ පින්වතුන් කොතෙකුත් අහල තියනවා, ඒ අංග අට, අංග අටක් උනාට මොකද මේකට ඒකකයක් හැටියට 'අරියො අට්ඨඞ්ගිකො මග්ගො' කියන්නෙ මොකද කියල බොහෝ දෙනා කල්පනා කරලත් නැහැ. මේ අංග අටම ඒකකයක්. ''අරියො අට්ඨඞ්ගිකො මග්ගො'' ඇත්ත වශයෙන්ම මාර්ගය මේ අගට එන සම්මා සමාධියයි. සම්මා සමාධි කියන එකයි නියම මාර්ගය. ඒ ටික කියන්න වෙන්නේ අපිට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තියනවා ලෞකික පැත්තකුත් ලෝකෝත්තර පැත්තකුත්. අන්න ඒක හෙළිකර දෙන මහා ගැඹුරු සූත්‍ර දේශනාවක් තියනවා මැදුම් සඟියේ **මහාචත්තාරීසක සූත්‍රය** නමින්. අන්න ඒ මහාචත්තාරීසක සූත්‍ර දේශනාව ආශ්‍රයෙන් ඔන්න එතන ඉඳල අපි යන්නෙ ඉදිරියට. මේ මහා චත්තාරීසක සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'මහණෙනි, මම නුඹලාට ආර්ය සම්මා සමාධිය ප්‍රකාශ කරනවා. 'සඋපනිසං, සපරික්ඛාරං' මම නුඹලාට කියල දෙනව ආර්ය සම්මා සමාධිය ඊට අදාළ - දැන් පරිෂ්කාර කියන එක මේ පින්වතුන් දන්නවනේ. සංඝයා වහන්සේලාට පරිෂ්කාර දෙනව කියන්නේ ජීවිතයට උපකාරවන දේවල්, අදාළ දේවල්, ඒ වගේ මේ සම්මා සමාධියට 'සඋපනිසං' කියන්නෙ ඊට සමීපව සිටගෙන ආධාර කරන, 'පරිෂ්කාර' වශයෙන් උපකාර වන දේවල් සහිතව මම නුඹලාට ආර්ය සම්මා සමාධිය ප්‍රකාශ කරනවා කියල ඒ දේශනාව පැවැත්වූවා. එයින් බුදුරජාණන් වහන්සේ කෙලින්ම පෙන්නුම් කරනවා අර මුල් අංග හත සම්මා සමාධියට පරිෂ්කාර වශයෙන් සිටිනවා. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති කියන අංග හත ඕනෑ වෙන්නේ සම්මා සමාධිය පිහිටුවා ගැනීමටයි. ඒක හරි ගැඹුරු කාරණයක්, අපි මේ වෙලාව තියන හැටියට උනන්දුව ඇති කිරීමටවත් මේ ටික මතක් කරමු මේකට අදාළ නිසා වැදගත් නිසා. මේ පැත්ත වැඩිය සළකන්නෙ නැති නිසාත් මේ කාලේ.

ඉතින් ඔන්න ඒ ආර්ය සම්මා සමාධිය ගැන කියන්න ගිහිල්ල බුදුරජාණන් වහන්සේ එතෙන්දි නැවත නැවත පුන පුනා කියනවා අපි අර



කිච්ච මහ පුදුම වාක්‍යයක්, සම්මා දිට්ඨියේ වැදගත්කම පෙන්නුම් කරන, මහණෙනි, එහිලා සම්මා දිට්ඨිය පෙරටු වෙයි 'තත්‍ර භික්ඛවෙ සම්මා දිට්ඨි පුබ්බඞ්ගමා' නිරන්තරයෙන් මතක් කර දෙනවා සම්මා දිට්ඨිය පෙරටු වෙනවා සම්මා දිට්ඨිය පෙරටු වෙනවා. බොහෝ දෙනා ප්‍රශ්න නගනවා මොකද ඒක ඉස්සරහට දාල තියෙන්නෙ කියල. සම්මා දිට්ඨිය පෙරටු වෙනවා. ඒකට හේතුව මොකද්ද? දැන් ඔන්න හිතල බලන්න. කෙනෙකුට සම්මා දිට්ඨියක් ඇතිකර ගන්නත් සම්මා දිට්ඨියක් අවශ්‍ය වෙනවා. සමහර විට අපට මේ ගැටළු වගේ දේවල් කියන්න වෙනවා. සම්මා දිට්ඨිය ඇතිකර ගන්න පවා සම්මා දිට්ඨියක් ඕන වෙනවා. මොකද හේතුව? බුදුරජාණන් වහන්සේ දක්වන්නේ මෙහෙමයි. සම්මා දිට්ඨිය පූර්වාංගම වෙන්නේ සම්මා දිට්ඨිය දැනගන්න කලින් මිච්ඡා දිට්ඨිය හඳුනාගන්න ඕන. මිච්ඡා දිට්ඨිය මිච්ඡා දිට්ඨිය බව. ඒකටත් සම්මා දිට්ඨියක් ඕන වෙනවා. එතකොට අන්න සම්මා දිට්ඨිය හැඳින්වීමෙදි එහෙමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නෙ සම්මා දිට්ඨිය පූර්වාංගම වෙන්නෙ මොකද? මිච්ඡා දිට්ඨිය මිච්ඡා දිට්ඨිය හැටියට තේරුම් ගන්නවා. සම්මා දිට්ඨිය, සම්මා දිට්ඨිය හැටියට තේරුම් ගන්නවා.

එතකොට ඊළඟට දක්වනවා ඔන්න එතන ඉඳල යන්නෙ අමුතු මාර්ගයක්. මෙතැන්දි ඊළඟට සම්මා දිට්ඨිය කියන එක වෙන තැන්වල දකින්ට නොලැබෙන ආකාරයට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. මහණෙනි, සම්මා දිට්ඨිය දෙයාකාරයයි කියමි. '**සම්මා දිට්ඨිම්පහං ද්වයං වදාමි**' මොකක්ද දෙයාකාරය? ඔන්න දෙයාකාරය ඊළඟට දක්වනවා. මහණෙනි, තිබෙනවා එක්තරා සම්මා දිට්ඨියක් '**සාසවා පුඤ්ඤභාගියා උපධිවෙපක්කා**' ආශ්‍රව සහිත පින් පැත්තට නැඹුරු, උපධි කියන උපධි සම්පත් කියල කියවෙන සංසාරයට උපකාර වෙන භව භෝග සම්පත් ආදිය. ඒව ලබාදෙන සම්මා දිට්ඨියකුත් තියනවා. ඒක ලෞකික සම්මා දිට්ඨියයි. ඔන්න ඊළඟට ලෝකෝත්තර සම්මා දිට්ඨිය. 'අත්ථි භික්ඛවෙ සම්මා දිට්ඨි **අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා**'. ආර්යවූ අනාශ්‍රව වූ ලෝකෝත්තර වූ ලෝකෝත්තර මාර්ගයේ අංගයක් බවට පත්වූ සම්මා දිට්ඨියකුත් ඇත. ඔන්න දෙක. මේ දෙකෙන් බොහෝ දෙනා දන්නේ අහල තියෙන්නේ දශවස්තුක සම්මා දිට්ඨිය කියල ඒකෙ අනිත් පැත්ත සමහරවිට මේ පින්වතුන් අහල ඇති මිච්ඡා දිට්ඨික අය කියන දහයක් කියනව

ලෝකය ගැන. අපි කෙටියෙන් කිව්වොත් දාන යාග හෝම ආදිය කියල දෙයක් නැත. හොඳ කර්ම නරක කර්ම කියල දෙයක් නැත. මෙලොවක් පරලොවක් නැත. මවෙක් පියෙක් නැත, ඕපපාතික සත්ත්වයින් නැත. මේ ලෝකය ගැන හරියට අවබෝධයක් ඇති කෙනෙක් නැත. ''නැත නැත'' කථාවක් කියන දහයකට තමයි 'මිථ්‍යා දිට්ඨි' කියල කියන්නේ. ඒ දහයටම බුදුරජාණන් වහන්සේ 'ඇත' කියල කියනවා. ඒ ලෞකික සම්මාදිට්ඨියයි දන් දීම් ආදියේ ආනිශංස විපාක තියනවා, කුසල කර්ම පාප කර්ම ඒවායේ විපාක තියනවා. මවුපිය ආදීන්ට උපකාර කිරීමේ විපාක තියනවා. මේ ලෝකයේ ඕපපාතික සත්ත්වයින් කියල කොටසක් ඉන්නවා. මේ ලෝකය පරලෝකය ආදිය ගැන තේරුම් කරල දෙන ශ්‍රමණ බ්‍රාහ්මණයින් ඉන්නවා කියන ඒ හැකි සංඥාව - නොහැකි සංඥාව වෙනුවට හැකි සංඥාව, - අරගොල්ල නැතෙයි කියපු ඒවට ඇතෙයි කියනවා. අන්න මැදුම් මඟ. අර අය එහෙම කියාපු කට්ටිය නිරයට යනවා 'ආ ඒව නෑ. කාල බීල අපි විනාශ වෙමු' කියල කිවුවොත් නිරයට යනවා. එතනදී බුදුරජාණන් වහන්සේ දුගතිය ඉවත් කරල සුගතියට යන්න උපකාරවෙන මේ කියාපු ලෞකික සම්මාදිට්ඨිය දක්වූවා. නමුත් සසරින් එතර වෙන්නෙ නැහැ. ඔන්න ඒ ටික කෙරෙන්නේ අර දෙවනුව කියාපු එකෙන්. දැන් අරක බුදුරජාණන් වහන්සේ පිළිගන්නවා සාසවා අර කියාපු සම්මා දිට්ඨිය ආසව සහිතයි නමුත් පුඤ්ඤභාගියයි. පිනට බරයි. අනිත් අය පවට බරයි නේ අර මිථ්‍යා දිට්ඨිය. පිනට බරයි. පිං පැත්තට. ඒ වගේම උපධි විපාක ගෙන දෙනවා සංසාරයේ. හොඳ උත්පත්ති ගෙන දෙනවා. ඒ ටික තියනවා ඒ ටිකට හොඳයි. නමුත් ඔන්න ඔය සසරින් මිදෙන්නත් එපායැ.

ඔන්න ඒ ටික කෙරෙන්නේ ආර්ය සම්මා දිට්ඨියෙනුයි. ඒක මහ පුදුම වැඩක් එතන කියවෙන්නෙ. 'අරියා අනාසවා ලොකුත්තරා මග්ගඞ්ගා' - ඒ සම්මා දිට්ඨිය පහළ වෙන්නේ අර කියාපු ලෝකෝත්තර මාර්ගක්ෂණයෙදි. ඉතා සුළුක්ෂණයක් තුළ මහ පුදුම දෙයක් සිද්ධ වෙනවා. මේ අංග අටම පෙළගැහිල යම් අවස්ථාවක එක සිතක ක්ෂණිකව පහළවෙලා තමයි එතරට යන්නෙ. මහ පුදුම දෙයක් ඒක. ඒ ගැන නොයෙකුත් මතභේද තියනවා. අන්න ඒ අවස්ථාවේදී සම්මා දිට්ඨිය එතනදි දක්වන්නේ ඒ කියාපු අවස්ථාවට අදාළ යම් පඤ්ඤා, පඤ්ඤින්ද්‍රියං, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො ඔය ආදී වශයෙන් දක්වනව. ඒ අවස්ථාවෙ සම්මා දිට්ඨිය



පෙනී සිටින්නේ ධම්ම විචය 'සම්බොජ්ඣඞ්ගය පඤ්ඤා පඤ්ඤින්ද්‍රිය' ස්වරූපයෙන්. අර කියාපු දහය ආදියෙන් නොවෙයි. ඒ විදියට ලෝකෝත්තර සම්මා දිට්ඨිය. ඔයවිදියට ඊළඟට - මේ එක එකක් ගැන විස්තර සහිතව කියන්න බැරි වෙන්න පුළුවන් වෙලාව අනුව. මෙන්න මේ ටික හිතාගන්න. බුදුරජාණන් වහන්සේ එතන පෙන්නුම් කරනවා මේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, ආදිය ගැන මේ පින්වතුන් යම් ප්‍රමාණයකට අහල තියනවා කියල අපි හිතනවා. ඒ වගේම පොත පතින් බලාගන්නත් පුළුවන්. නමුත් මෙතන විශේෂත්වය තියෙන්නේ ලෝකෝත්තර මාර්ගයේ දී මේ එක එකක් ගැන අමුතු විදියටයි හඳුන්වන්නේ. ඒ මාර්ගක්ෂණයේ දී මේවා පෙනී සිටින්නේ අමුතු ස්වරූපයකින්. විතර්ක වශයෙන් නොවෙයි. සාමාන්‍යයෙන් ලෝකයේ හිතන විදියට නොවෙයි මිථ්‍යා සංකප්ප පිළිබඳවත් කියවෙන්නෙ. එතෙන්දිත් සම්මා දිට්ඨිය උපකාර වෙන්නෙ මිථ්‍යා සංකප්ප හඳුනාගන්නත් සම්මා සංකප්ප හරියාකාරව හඳුනාගන්නත්. පළමුවෙන්ම සම්මා දිට්ඨිය පෙරටු වෙන්න ඕනෙ. ඊට පස්සෙ නෙක්ඛම්ම සංකප්ප, අව්‍යාපාද සංකප්ප, අවිහිංසා සංකප්ප කියන ඒ සංකල්ප තුන සාමාන්‍ය ලෝකයේ සම්මා සංකප්ප හැටියට හැඳින්වෙනවා. නමුත් ලෝකෝත්තර අවස්ථාවේ දී සමාධියට හිත නංවන 'තක්කො විතක්කො' ඒකට හිත නංවන ඒ ශක්තිය තමයි එතෙන්දි සම්මා සංකප්ප කියන්නෙ. ඒ වගේම විශේෂයෙන් කියන්න තියෙන්නේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන ඒවා සාමාන්‍ය අවස්ථාවෙදි විදියට නොවෙයි ලෝකෝත්තර මාර්ගක්ෂණයෙදි ඒවා දක්වෙන්නේ. කලින්ම ඒවායින් වෙන්වෙලා. ඒ අවස්ථාව පහළවෙනකොට කලින්ම වෙන්වෙලා. ඒක නිසා එතෙන්දි පෙනී සිටින්නේ 'විරති' හැටියට. වෙන්වෙන්න අමුතු උත්සාහයක් නෑ එතෙන්දි. වෙන්වෙලා ඉවරයි. එතකොට ඒ තුනෙන් එහෙම වෙන්වෙනව.

ඔය විදියට දක්වනව ඔන්න ඊළඟට - විශේෂයෙන් දක්වන්නේ එතන මහ පුදුම දෙයක් දක්වනව. ලෝකෝත්තර අවස්ථාවේදී ඒ හිතට ආරක්ෂාව සලසා දෙනවා තුන් ආකාරයකින් - **සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති කියන අංග තුන,** අර ලෝකෝත්තර අවස්ථාවේදී ඒ කියන්නේ මාර්ග ඥාන පහළවන අවස්ථාවේදී ඒවා විශේෂ කෘත්‍යයක් විශේෂ වැඩක් කරනවා. ඒකට කියන්නෙ, ඒ හිතට එතන බුදුරජාණන් වහන්සේ යොදන

වචනය 'අනුපරිධාවන්ති', 'අනුපරිධාවන්ති'. අනුපරිවත්තන්ති කියන්නේ' ඒ අනුව වටේට දුවනවා. 'අනුපරිවත්තන්ති කියන්නේ' ඒ අනුව වටේට පවතිනවා'. එතකොට **මේ ලෝකෝත්තර මාර්ගක්ෂණය ඒ කියන්නෙ එතකොට මේ සංඛතය උපකාර කරගෙන අසංඛතය කරා යන ගමන මහ පුදුම ආශ්චර්යවත් දෙයක්. ඒකෙදි ආරක්ෂාව සලසා දෙනවා අර සිතට. සම්මා දිට්ඨිය පෙරටු වෙලා, සම්මා වායාම පිටිපස්සෙන් ඉඳගෙන තල්ලුව දෙනවා. ආරක්ෂාව සපයා දෙනවා. සම්මා සතිය අතළග ඉඳගෙන ඊට උපකාර වෙනවා.** ඉතින් ඒක යම් අවස්ථාවක පොතේ එන උපමාවක් නූනත් මේ පින්වතුන්ට සිත් කාවදින අන්දමින් අපි යම් අවස්ථාවක ප්‍රකාශ කරල ඇති. දැන් මේ කාලයේ ප්‍රකට දේශපාලනඥයින් කියන්න ඕන නෑ නෙ, ඔය 'ලොකු ලොකු අය' යනකොට ජංගම දුරකථනත් අරගෙන ආරක්ෂක භට හමුදාවේ එක කොටසක් ඉස්සරහින් යනවා, තව කොටසක් පස්සෙන් එනවා. පිටි පස්සෙන් එනවා උපද්‍රව වලින් බේරගන්න, අතළගත් ඉන්නවා කොටසක්. අන්න ඒ වගේ තමයි. ඒ වගෙ ආරක්ෂාව සපයල මේ ලෝකයේ ලොකු ලොකු අය යනව වගේ අර විශාල ප්‍රබල කටයුත්තක් කරන ආර්ය සම්මා සමාධියට පිරිවර වශයෙන් 'අනුපරිධාවන්ති අනුපරිවත්තන්ති' කියල හොඳ ලස්සන වචන දෙකක් එතන එනවා. **මේ අංගතුන සම්මා දිට්ඨි, සම්මා වායාම, සම්මා සති කියන අංග තුන ලෝකෝත්තර මාර්ග අවස්ථාවේ දී ඊට ආරක්ෂාව සපයා දෙනවා.** එතකොට ඒ වගේම අපි කලින් කිව්ව ඒ කාරණා තුන එදිනෙදා ලෝකයෙ තියෙන්නේ උත්සාහයක් දරණව හැම තිස්සෙම මිථ්‍යා වචනය අත හැරල සම්මා වචනය පාවිච්චි කරන්න. ඒ විදියට ඒක ශික්ෂණයක් පමණයි. ඒ ශික්ෂණය සම්පූර්ණ වුන අවස්ථාවෙ - ඒක කාලයක් තිස්සේ කරන එකක්. සම්පූර්ණ වුන අවස්ථාවේ - එතෙන්දි දක්වන්නෙ ආරති, විරති, පටිවිරති, ඒ තැනැත්තා එයින් දුරින් දුරුවෙලා තියෙන්නෙ. 'විරති' ඒකමත් ආරක්ෂාවක් වෙනවා මේ ආර්ය සම්මා සමාධියට.

මේ අංග අටේ තියන 'ඇතුළත' අභ්‍යන්තර පුදුම සම්බන්ධය හරි ආශ්චර්යවත්. අපි නිකං කියාගන යනවා අටෙයි කියලා. නමුත් මේ අට තුළින් අර එක පැත්තකින් දුගතියෙන් වළක්වල සත්ත්වයා සුගතියට යොමු කරනවා. අර සාශ්‍රව ලෞකික සම්මා දිට්ඨියෙන්. ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඊට වඩා මහා ප්‍රබල වැඩක් කරන්නේ, මේ ලෞකිකත්වය



ඉක්මවල මාර්ගඵල තත්ත්වයේදී යම් අවස්ථාවක අපි කෙටියෙන් කියතොත් මෙහෙම සලකා ගනිමු. යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ දක්වල තිබෙන යම්කිසි ආනාපාන ආදී සමාධියක් පුරුදු කරන අතරේ ත්‍රිලක්ෂණයට අදාළ විපස්සනාවත් වඩල අර සම්බොධි අංග කොටින්ම සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් - එයින් පහක් නේ අර කිව්වෙ ඉන්ද්‍රිය කියල - ඒවා සම්පූර්ණ වුන අවස්ථාව වෙනකොට ආයාසයෙන් කියල කියන්නත් බැහැ. නිරායාසයෙන් වගේ ධර්මතා වශයෙන්ම වෙන දෙයක් තමයි ඒ වෙනකොට මේ කියාපු පඤ්ච උපාදානක්ඛන්ධය ගැන යම් ප්‍රබල කලකිරීමක් තියනවා. ඒ කලකිරීම තුළින් තමයි ලෝකෝත්තර තත්ත්වයට පත්වන්නෙ. මෙතෙර අතහැරල එතෙරට පනින්නෙ. ඒ අවස්ථාවේදී ආරක්ෂාව සපයනවා ඒ සම්මා සමාධියට. ඒ සම්මා සමාධිය ගැන තමයි පින්වතුනි මේ කවුරුත් අහල තියෙන්නෙ රතන සූත්‍රයේ

**යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තෙන සමො න විජ්ජති**

කියල කියන්නේ. අන්න එතනදී කියවෙන අර කියාපු ආනන්තරික සමාධියයි. බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් වර්ණනා කරල තියන ආනන්තරික සමාධිය කියල කියන්නේ මාර්ග සමාධියයි. ඒ මාර්ග සමාධියට අනතුරුවම ඵලයට පත් වෙනවා ඒකාන්තයි. ආනන්තරික කියල කියන්නේ ඒකයි.

මේක ගැන අතීතයේ පඬිවරුන් නොයෙකුත් මතභේද ඇති කර ගත්තු බව අටුවාවල සඳහන් වෙනවා. නමුත් මෙතෙන්දි අපි වෙලාවත් අනුව කෙටියෙන් කියතොත් දැන් මේ පින්වතුන් අහල තියනව ආර්ය පුද්ගලයන් අට දෙනෙක් ගැන. ඇහුවහම එකපාරම කියාවි සෝවාන් මාර්ගයේ ඉන්න කෙනා ඵලයේ ඉන්න කෙනා, එහෙම තමයි පිළිතුරු දෙන්නේ. සතරමඟ සතරඵල කියල. නමුත් පින්වතුනි ධර්මයේ සඳහන් වෙන්නේ මෙහෙමයි. ආර්ය පුද්ගලයින් අට දෙනා ගැන සඳහන් වෙන්නේ එක තැනක නොවෙයි. කීප තැනකම. මෙන්න මේ විදියටයි සොතාපන්නො, සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො, සකදාගාමි, සකදාගාමි ඵල සච්ඡිකිරියාය පටිපන්නො, අනාගාමි, අනාගාමි ඵල

සච්ඡිකිරියාය පටිපන්නො' ඒ විදියටයි අට දෙනා ගැන කියන්නේ. එතකොට මෙතනදි විශේෂයෙන් කියන්න වෙන්නේ **'මග්ග' 'පටිපදා', කියන වචන දෙක පරියාය හැටියට අපි යෙදුවට ඒ දෙක අතර යම් වෙනසක් තියනවා. එතකොට මාර්ගයට වැටෙන්නෙ ප්‍රතිපදාවක් පිරීමෙන්.** අන්න ඒ ප්‍රතිපදාව තුළයි. ඔන්න දැන් මේක සම්බන්ධ වෙන්නේ. අපි අර මේ දේශනාව ආරම්භ කළේ - එහෙම නැත්නම් විශේෂ කාරණය වශයෙන් මතුඋනේ - ධම්මානුසාරී, සද්ධානුසාරී දෙන්නා ගැන නේ. ඒ දෙන්නා ගැන බොහෝවිට කියන්නේ සෝවාන් මාර්ගයේ ඉන්නවා කියලා. අපට කියන්න වෙන්නෙ ඒ ලෝකෝත්තර මාර්ගයට යන පිළිවෙතේ ප්‍රතිපදාවේ ඉන්න අය - අර කියවුනා නේ සොතාපන්නො සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො. කෙටියෙන් කියන්න පුළුවන් නම් බුදුරජාණන් වහන්සේ කියනවා කෙලින්ම සෝවාන් මාර්ගයේ හිටි අය කියල. **සෝවාන් මාර්ගය ඒක ක්ෂණික නිසා දැන් ඔය අට දෙනාටම දන් දෙන්නෙ කොහොමද? ඒක ක්ෂණයක් නම් හිත තියෙන්නෙ, කොහොමද අට දෙනාට දන් දෙන්නෙ?** දැන් මෙතන අපි පෙන්නුවා ඒ ධම්මානුසාරී, සද්ධානුසාරී කියන පුද්ගලයින් දෙදෙනා ඉන්නේ 'සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො' පැහැදිලිව පේනවනේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. මරණයට කලින් කොහොම හරි මේ දෙන්නා සෝවාන් ඵලයට පැමිණෙන බව. ඒක නිසා ඒ අයත් ආර්ය පුද්ගලයින්. ඒ අයත් සත්පුරුෂ භූමියට වැටිල ඉන්නෙ පෘථග්ජන තත්ත්වය ඉක්මවල ඉන්නෙ. ගැටළුවක් හැටියට තියෙන්නෙ ඔතනයි. ඉතින් ඒක නිසා අපට ඇත්ත වශයෙන් යොදන්න වෙන්නෙ ධර්මානුකූලව සූත්‍ර ධර්මයට අනුව ප්‍රතිපදාවටයි, සෝවාන් මාර්ගයට වැටීමට යන ප්‍රතිපදාවට වැටුනු අය, පටිපන්න කියල කියන්නේ. **ප්‍රතිපදාවට වැටුනු අය ඔය සද්ධානුසාරී ධම්මානුසාරී, සෝවාන් මාර්ගය නොවෙයි සෝවාන් මාර්ගය ඇතිඋනා නම් කෙලින්ම ඵලය. ක්ෂණිකවම ඵලය ලැබෙනවා. ආනන්තරික කියන්නේ ඒකයි.** එතකොට ලෝකෝත්තර මාර්ගය වෙනයි. මෙතන කියන්නේ ප්‍රතිපදාව. අන්න ඒක නිසා ඒ ටික හොඳට පැහැදිලි වෙන එක්තරා ගාථාවක් තියනවා.

**'චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙ ඨිතා**
**එස සංඝො උජුභූතො - පඤ්ඤා සීල සමාහිතො'**

කියල අංගුත්තර නිකායේ සඳහන් වෙන,



'චත්තාරොච පටිපන්නා' එතනදී කියන්න තිබුණෙ 'මග්ගට්ඨා' කියල. එහෙම නොවෙයි කියන්නේ. දැන් මාර්ගස්ථ කියන වචනය මේ පින්වතුන් අහලත් තියනවනෙ. මාර්ගස්ථ කථාවක් නැහැ. මෙතන 'පටිපන්න'.

**'චත්තාරොච පටිපන්නා චත්තාරොච ඵලෙ ඨිතා'** ඔන්න අට දෙනා. ප්‍රතිපදාවට බැස්සා වූ හතර දෙනාත් ඵලයේ සිටියාවූ හතර දෙනාත් 'එස සංඝො උජුභූතො'. මේ අය තමයි ඍජු පටිපන්න ආර්ය පුද්ගලයින් අට දෙනා හැටියට දක්වෙන්නේ 'පඤ්ඤා සීල සමාහිතො' සීල සමාධි ප්‍රඥා සහිත. මේ ගාථාවෙන් අපට පෙන්නුම් කරන අට දෙනා තමයි විශේෂයෙන් කිවුවෙ. මේ මාර්ගයත් ප්‍රතිපදාවත් කියන එක මෙතෙන්දි සාමාන්‍යයෙන් අපි පරියාය පද හැටියට මාර්ගයත් ප්‍රතිපදාවත් එකයි කියල හිතුවත් මෙතන විශේෂයක් තියනවා. එතකොට ආර්ය පුද්ගලයන් හඳුනා ගැනීමේදී හඳුන්වා දීමේදී අපි සැලකිලිමත් වෙන්න ඕනෙ අන්න ඒ මාර්ගස්ථ නොවෙයි එතන කියන්නේ සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ ප්‍රතිපදාවට වැටුනු - ටිකක් විස්තර සහිතව කියන්න වේවි. කෙටි නැහැ ඒක. අට දෙනා කවුද - සෝවාන් පුද්ගලයා. සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ ප්‍රතිපදාවට වැටුනු පුද්ගලයා, සකදාගාමි පුද්ගලයා, සකදාගාමී ඵලය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ ප්‍රතිපදාවට වැටුනු පුද්ගලයා. සෝවාන් ඵලය ලැබූ පුද්ගලයා ගැනයි අපි විශේෂයෙන් කිවුවෙ. අනිත් ටික හිතා ගන්න පුළුවන් මේ පින්වතුන්ට. කෙනෙක් සෝවාන් ඵලයට පත්උනා කියල හිතමු. ඊට පස්සෙ එයා ප්‍රමාදයට වැටිල ප්‍රමාද සේඛයෙක් නූනොත් තව තව වැඩ කරනවා නම්, ඒ ඥාන මාර්ගයේ හැසිරෙනවා නම් අන්න ඒ තැනැත්තා හඳුන්වන්නේ එතන ඉඳල සෝවාන් පුද්ගලයා සකදාගාමි වනතුරු යන ප්‍රතිපදාව තමයි 'සකදාගාමී ඵල සච්ඡිකිරියාය පටිපන්නො' සකදාගාමී ඵලයට යාම සඳහා උත්සාහ ගන්න. ඒ විදියට හිතාගන්න පුළුවන් ඊළඟට අන්තිමට තියෙන්නේ අරහා, අරහත්තාය පටිපන්නො. රහතන් වහන්සේ, රහත් තත්ත්වය ලබාගැනීමට පිළිපන් පුද්ගලයා.

එතකොට අපි මේ පින්වතුන්ට මේ ප්‍රකාශකළ ධර්මය ගැඹුරුයි. ගැඹුරු ධර්මය නොගැඹුරු හැටියට අනවශ්‍ය විදියට ලිහිල් කරල ඉදිරිපත් කළොත් ඒක ධර්මය විනාශ වෙන වැඩක්. එහෙම කෙටිකරල දක්වන්නෙ

නැතිව ධර්මය ධර්මය හැටියට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරල තියන මේ මැදුම් පිළිවෙත යම් ප්‍රමාණයකට පැයක් තුළ මේ පින්වතුන්ට තේරුම් කරල දුන්න, අද වගේ වටිනා දවසක. ශාසනයේ මේ පැත්ත දැන් බොහෝ දුරට අමතක වෙලා යන පැත්තක්. ඒක නිසා මේ පින්වතුන් අද දින මේ වටිනා දවසෙ, තමාගේ ශක්ති ප්‍රමාණයෙන් ශීලයක් රැක්ක. දැන් අප ළඟට එන බොහෝ ගිහි පින්වතුන් කියනවා තවත් නම් සසර උපදින්න ඕනෙ නැහැ. හැකි ඉක්මනින් කොහෙහරි ගිහිල්ල මාර්ගඵල ලබාගන්න ඕන. කොහේ හරි ගිහිල්ල මහණ වෙලා, ඔය විදියට හැම දෙනාම කියනව. එතකොට අන්න ඒ අයට උපකාරවීමටයි අපි මේ ටික ඉදිරිපත් කළේ, හිතන්න. එතකොට සෝවාන් ඵලයට පැමිණෙන්න බැරිඋනත් මේක ලොකු සැනසිල්ලක්. අර මවගේ හුම් හුම් හඬින් උත්සාහවත් වෙන වහු පැටියෙක් වගේවත් වෙන්න උත්සාහවත් වෙමු. කියන එකයි අපට මේ පින්වතුන්ට කියන්න තියෙන්නෙ.

එතකොට අද දින රැක්ක ශීලයෙන්, කළ භාවනාවෙන්, මේ ඇසූ විදර්ශනාත්මක බණින්, මේ පින්වතුන්ට හැකිතාක් ඉක්මණින් ඒ තමන්ගේ බණ භාවනා මුදුන් පත් කරගෙන අර කිච්ච උතුම් තත්ත්ව සාක්ෂාත් කරගෙන මුළු මහත් සංසාර කතරින් එතර වෙලා, මෙතරින් එතරට යාම කියන එකත් දැන් ලිහිල් කරගෙන. අතීතයේ නම් මෙතෙරින් එතරට යනවා කියන්නේ විදේශ ගතවීම නොවෙයි. මෙන්න මේ සංසාර සාගරයෙන් එතරවීමයි. ඒ සඳහා මේ පින්වතුන්ට අවශ්‍ය ශක්තිය බලය යෝධ වීර්යය ලැබේවා. ඒ බණ භාවනා ඉක්මණින් සාර්ථක කරගෙන ඒ නිර්වාණ තත්ත්වයට පත්වෙන්න හැකියාව ලැබේවා කියල ප්‍රාර්ථනා කරනවා. අවීචියේ සිට අකනිටා දක්වා යම් කෙනෙක් මෙබඳු ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය ආනිශංස අනුමෝදන්වීමට බලාපොරොත්තු වෙනවා නම් අනුමෝදන් වීම තුළින් තම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගනිත්වා. 'මේ පින්වතුන්ටත් ඉක්මණින්ම ඒ උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගැනීමට ශක්තිය බලය ලැබේවා කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**එත්තාවතා ච අම්හෙහි....**

# 43 වන දේශනය

## 43 වන දේශනය (පහන් කණුව ධර්ම දේශනා අංක 206)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

**චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙඨිතා**
**එස සංඝො උජුභූතො - පඤ්ඤා සීල සමාහිතො**
**යජමානානං මනුස්සානං - පුඤ්ඤපෙක්ඛාන පාණිනං**
**කරොතං ඔපධිකං පුඤ්ඤං - සංඝෙදින්නං මහප්ඵලං**

පඨම අට්ඨපුග්ගල සූ. අංගුත්තර නිකාය

සැදැහැවත් පින්වතුනි,

තථාගත භාග්‍යවත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ සම්බෝධි ලාභයෙන් පස්සෙ බරණැස ඉසිපතනයේ මිගදායේදී කොණ්ඩඤ්ඤ, භද්දිය, වප්ප, මහානාම, අස්සජි කියන පස්වග මහණුන් වහන්සේලාට ධම්ම චක්කප්පවත්තන සූත්‍රයෙන් ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූවේ අද වගේ ඇසළ පුර පසළොස්වක පොහොය දවසකයි. ඒ දේශනාව අහල කොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේ උතුම්වූ සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කරගැනීමෙන් ප්‍රථම වරට ලෝකයේ ආර්ය සංඝරත්නය පහළ උනා. අන්න ඒ ආර්ය සංඝරත්නය පිළිබඳව තමයි මේ පින්වතුන් නිතර සජ්ඣායනා කරන සඟගුණ පාඨයේ සඳහන් වෙන්නෙ. ඒ සඟගුණ පාඨයේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාට අයත් පුද්ගලයින් අට දෙනෙක් ගැන සඳහන් වෙනව. ඒ අට දෙනා ගැන යමක් කියවෙන අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ අට්ඨපුග්ගල සූත්‍රයේ එන ගාථා දෙකකුයි අද අපි මාතෘකාව හැටියට ඉදිරිපත් කරගත්තෙ.

**'චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙඨිතා'**
ප්‍රතිපදාවට වැටුනු හතර දෙනාත් ඵලයෙහි සිටි හතර දෙනාත්.

**'එස සංඝො උජුභූතො - පඤ්ඤා සීල සමාහිතො'**
ප්‍රඥා ශීල සමාධි ගුණයන්ගෙන් යුක්ත ඍජුවූ සංඝයාය මේ.

**'යජමානානං මනුස්සානං - පුඤ්ඤපෙක්ඛාන පාණිනං'**



යාග පවත්වන්නාවූ මනුෂ්‍යයින්ට පින් බලාපොරොත්තු වන්නාවූ ප්‍රාණීන්ට

**'කරොතං ඔපධිකං පුඤ්ඤං - සංඝෙදින්නං මහප්ඵලං'**
උපධි සම්පත් සඳහා පින් කරන්නවුන්ට සංඝයා කෙරෙහි දෙන ලද්ද මහත්ඵලවේ.

මෙන්න මේ මහත්ඵල භාවයම තමයි මේ පින්වතුන් නිතර සජ්ඣායනා කරණ සඟගුණ පාඨයේත් තියෙන්නෙ. **'සුපටිපන්නො භගවතො සාවක සංඝො උජුපටිපන්නො භගවතො සාවක සංඝො, ඤායපටිපන්නො භගවතො සාවක සංඝො, සාමීචි පටිපන්නො භගවතො සාවක සංඝො යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුණෙය්‍යො, පාහුණෙය්‍යො, දක්ඛිණෙය්‍යො, අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.** මේ පාඨය නිතර කියන නිසා පින්වතුන් බොහෝ දෙනා තේරුමත් දන්නවා ඇති.

**'සුපටිපන්නො භගවතො සාවක සංඝො'**
භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා මැනවින් ප්‍රතිපදාවට වැටුනාහුය.

**'උජුපටිපන්නො'** - ඍජුව ප්‍රතිපදාවට වැටුනාහුය.

**'ඤායපටිපන්නො'** - න්‍යායානුකූලවම ප්‍රතිපදාවට බැස්සාහුය.

**'සාමීචි පටිපන්නො'** - හරිහැටියටම ප්‍රතිපදාවට වැටුනාහුය.

**'යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා'**
එනම් පුරුෂ යුගල සතර, පුරුෂ පුද්ගලයින් අටදෙනා

**'එස භගවතො සාවක සංඝො'**
මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා,
උන්වහන්සේලාගේ ගුණ ප්‍රකාශ කරල ඊළඟට උන්වහන්සේලාට දානය පිරිනැමීමට සුදුසුකම් දක්වෙනවා.

**'ආහුණෙය්‍යො'**
දුරසිට ගෙනවුත් දෙන දාන වස්තුව පිළිගැනීමට සුදුසුය.

**'පාහුණෙය්‍යො'**
ආගන්තුකයින්ට පිළියෙල කර තිබෙන දාන වස්තුව ලැබීමට සුදුසුය.

**'දක්ඛිණෙය්‍යො'**
පරලොව සලකා දෙන පුද පඬුරු පිළිගැනීමට සුදුසුය.

**'අඤ්ජලිකරණීයො'**
දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසුය.

**'අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස'**
ලෝකයාට තියන උත්තරීතර පුණ්‍ය ක්ෂේත්‍රයයි.

එතකොට මෙන්න මේ පාඨයට අදාළව අටුවාවේ කෙරෙන විග්‍රහය විවරණය අපි ඉස්සෙල්ල ඉදිරිපත් කරමු. විශුද්ධි මාර්ගයේ අනුස්සති නිද්දේශයේදී බුද්ධ ඝෝෂ ස්වාමීන් වහන්සේ මෙන්න මේ ප්‍රධාන පදටික තෝරන්නේ - **'පුරිස යුගල'**

කෙනෙක් අහන්න පුළුවන් මොකක්ද මේ 'පුරිස යුගල' - පුරිස පුද්ගලයින් අටදෙනා කවුද? ඒකට මේ අටුවාචාරීන් වහන්සේලා මේ විදියටයි අර්ථ ඉදිරිපත් කරන්නේ. පුරිස යුගල හතර දක්වන්නේ ''චත්තාරි පුරිස යුගානීති පඨම මග්ගට්ඨො ඵලට්ඨො' ප්‍රථම මාර්ගයෙහි සිටිහා ඵලයෙහි සිටි. ඒ කියන්නේ සෝවාන් මාර්ගයෙහි සිටි හා සෝවාන් ඵලයෙහි සිටි. ඒ ආකාරයෙන් සකදාගාමී මාර්ගයෙහි සිටි සකදාගාමි ඵලයෙහි සිටි, ආදි වශයෙන් අරහත් මාර්ගයෙහි සිටි අරහත් ඵලයෙහි සිටි. අටුවාවේ තෝරන්නේ ඒ විදියටයි. 'මග්ගට්ඨ' 'ඵලට්ඨ' කියන විවරණයයි යෙදෙන්නෙ. ඒ අනුව තමයි දැන් ව්‍යවහාරයට ඇවිල්ල තියෙන්නෙ **'සතරමඟ සතරඵල'** කියල. නමුත් මේක තුළින් යම්කිසි ගැටළුවක්



මතුවෙනව. මොකක්ද ඒ? ලෝකෝත්තර මාර්ගයට අනතුරුවම ඵලය ලැබෙන බව ආනන්තරික සමාධිය පිළිබඳ කියවෙන විට ධර්මයේ සඳහන් වෙනව. වෙන එකක් තබා මේ පින්වතුන් හොඳට දන්න රතන සූත්‍රයෙහි පවා සඳහන් වෙනවා.

**'යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං**
**සමාධිමානන්තරිකඤ්ඤමාහු**
**සමාධිනා තෙන සමො න විජ්ජති...**

ආදී වශයෙන් සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් වර්ණනා කළ ඒ පිරිසිදුවූ සමාධියට 'ආනන්තරික' යයි ව්‍යවහාර කරනවාද ඒ සමාධිය හා සමාන සමාධියක් නැත. මේ ආනන්තරික කියන වචනයේ තේරුම මේ මාර්ග සමාධියට අනතුරුවම ඵලයට වැටෙනවා. **එතකොට මාර්ග සමාධියට අනතුරුවම ඵලයට වැටෙනවා නම් මාර්ගයේ සිටි හතර දෙනාත් ඵලයේ සිටි හතර දෙනාත් වෙන් කරගන්නේ කොහොමද?** කියන ඔය ප්‍රශ්නය ඈත අතීතයේ ඉඳලම සංඝයා වහන්සේලා අතරත් සාකච්ඡා උනා. අපටත් මේ ප්‍රශ්නය බොහෝ දෙනෙක් ඉදිරිපත් කරල තියනවා. පෞද්ගලික වශයෙන්. ඒකට යම් යම් පිළිතුරු දුන්නත් මට මේ අවස්ථාවේ හිතුන එක දේශනයක් පැවැත්වුවහම අපට ලේසියි ඉදිරියට අන්න අර දේශනාව අහන්න කියල මගේ අදහස ඒ පිළිබඳව ප්‍රකාශ කරන්න. ඒකයි මේ දේශනාව විශේෂයෙන් පවත්වන්නෙ. මෙන්න මේ 'මග්ගට්ඨ ඵලට්ඨ' කථාව ගැන කියනකොට රතන සූත්‍රයේම තියනව මේ පින්වතුන් හොඳින් දන්නව සඟගුණ කියන අවස්ථාවේ

**යෙ පුග්ගලා අට්ඨ සතංපසත්ථා**
**චත්තාරි එතානි යුගානි හොන්ති**
**තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා**
**එතෙසු දින්නානි මහප්ඵලානි**
**ඉදම්පි සංඝෙ රතනං පණීතං**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු**

කියල දක්වෙනවා.

එතනත් අපට කියවෙන්නේ - යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා - යම් පුද්ගලයින් අටදෙනෙක් 'සතං පසත්ථා' කියන්නේ පින්වතුනි 'සත්පුරුෂයන් විසින් පසස්නා ලද කියන එකයි. චත්තාරි එතානි යුගානි හොන්ති - යුග හතරක් මෙතැන තියනවය.

'තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා - 'සුගතයන් වහන්සේගේ ඒ ශ්‍රාවකයින් වහන්සේලා දක්ෂිණාව ලැබීමට සුදුසුය' ඒ විදියටයි මෙතැන සඳහන් වෙන්නෙ. නමුත් මේක තෝරන්න ගියහම අපේ බුද්ධඝෝෂ අටුවාචාරීන් වහන්සේ පටන් ගන්නේ අපි කියාපු ගාථාවේ මුල් පදයෙන්.

'චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙ ඨිතා' නමුත් තෝරන කොට කියන්නේ 'මග්ගට්ඨ, ඵලට්ඨ' වචන දෙකයි. එපමණක් නෙවෙයි. මහ පුදුම දෙයක්. **අටුවා යුගයේ පවා අර්ථ විකෘත වීමේ අවස්ථාවක් මෙතන පැහැදිලිවම දක්වන්න පුළුවන්. මොකද, මේ ගාථාව විවරණය කිරීමේදී 'යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා' කියන එකේ පාළි භාෂාව දන්න අය තේරුම් ගන්නව මෙතැන කියවෙන්නේ අට දෙනෙක් ගැන සත්පුරුෂයන් විසින් පසස්නා ලද.** නමුත් පාළි භාෂාව නොදන්නා අව්‍යක්ත කෙනෙක් මේ ගාථාව උච්චාරණය වරදවලා මෙහෙම කියන්න පුළුවන්.

'යෙ පුග්ගලා **අට්ඨසතං** පසත්ථා' එතන උච්චාරණය පවා වැරදියි. අර්ථය විකෘත කරනව. නමුත් ඒකත් මේ අටුවාචාරීන් වහන්සේ මෙහෙමයි කියන්නේ. නිවැරදි අර්ථය ඉස්සෙල්ල කියල, 'සත්පුරුෂයින් විසින් පසස්නාලද' කියල ඊළඟට කියනව 'අථවා' 'එසේ නැතහොත්' කියල **එකසිය අටක් හදනව එකතුකරල වැඩිකරල. දැනටත් දේශකයින් බොහෝවිට එකසිය අට දෙනෙක් ගැන කථාව කියන්නේ ඒ නිසයි.** බොහොම මහන්සියෙන් එකසිය අටදෙනෙක් හදාගෙන. ඒක කිසිසේත් ගැලපෙන්නේ නැහැ. **කිසිසේත් ගැලපෙන්නේ නැහැ. මෙතැන එකසිය අටක් ගැන නොවෙයි කියන්නේ.** බුද්ධ වචනය බලනකොට 'යෙ පුග්ගලා අට්ඨ - සතං' ඔය 'සතං' කියන වචනය පාළි භාෂාව නොදන්න අයට උනත් තේරුම් ගන්න පුළුවන් නිදසුනක් කිව්වොත්. ධම්මපදයේ තියනව **'සතං හිසො පියො හොති - අසතං හොති අප්පියො'** 'සත්පුරුෂයින්ට ඔහු ප්‍රියයි අසත්පුරුෂයින්ට අප්‍රියයි.' එතකොට 'සතං' කිවුවෙ සත්පුරුෂයින්



පිළිබඳව - **සීයක් නොවෙයි.** එතකොට අටුවාචාරීන් වහන්සේත් අර අව්‍යක්ත විවරණයටත් ඉඩක් දීපු බවයි එයින් පේන්නේ. හොඳයි ඒක අමතර කාරණයක් කියල ගනිමු. නමුත් ප්‍රධාන කාරණය මේව තෝරන්න ගිහිල්ල - 'චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙඨිතා' කිව්වට උන්වහන්සේලා දැකල නැහැ. එහෙම නැත්නම් **උන්වහන්සේලා පිළිඅරගෙන නැහැ, වැදගත් දෙයක් හැටියට මේ 'මග්ග' - 'පටිපදා' කියන දෙකෙහි අර්ථයේ වෙනසක් ඇති බව.** අපි කිවුවා ලෝකෝත්තර මාර්ගය ක්ෂණිකයි. ඒකට අනුව ඵලය ලැබෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ යොදන්නෙ 'පටිපන්න' කියන වචනය. 'ප්‍රතිපදාවට බැස්ස'. එතකොට මාර්ගයත් ප්‍රතිපදාවත් අතර වෙනස මෙහෙම තේරුම් ගන්න. මාර්ගය තියෙන්න පුළුවන්. මාර්ගය අනුව හික්මෙන ප්‍රතිපන්න බව එහෙම නැත්නම් ඒ පිළිවෙත පිළිපදින බවයි පටිපන්න වචනයෙන් දැක්වෙන්නේ. බුදුරජාණන් වහන්සේට ඕනනම් කියන්න තිබුන නේ මේ ගාථාව 'චත්තාරොච මග්ගට්ඨා - චත්තාරොච ඵලෙඨිතා' කියල. කල්පනා කරල බලන්න. අටුවාචාරීන් වහන්සේලා කියනවා වගේ 'මග්ගට්ඨ', 'ඵලට්ඨ' කියන්න තිබුනනේ. නමුත් මෙතන යෙදුනෙ කොහොමද?

**'චත්තාරොච පටිපන්නා - චත්තාරොච ඵලෙඨිතා'** එපමණක් නොවෙයි. ඔන්න දැනුයි අපි මේ පින්වතුන්ට හඳුන්වන්නෙ - මේ කියාපු සූත්‍රයෙ මුල් ගාථා දෙකනේ අපි උද්ධෘත කරල දැක්වූවේ. මේ ගාථා දෙකට කලින් බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ ඒ සූත්‍රය මෙහෙමයි පටන් ගන්නේ. **'අට්ඨිමෙ භික්ඛවෙ පුග්ගලා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයා අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස'** මහණෙනි මේ පුද්ගලයින් අටදෙනෙක් ඉන්නව. අර කියාපු ආහුණෙය්‍ය, පාහුණෙය්‍ය ආදී ගුණයන්ගෙන් යුත්. ඒ ටික දිගට නොකිව්වට තේරුම් ගන්න බලන්න. ඊළඟට ඒ අට දෙනා හඳුන්වන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ - **'සොතාපන්නො, සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො' සකදාගාමී, සකදාගාමි ඵල සච්ඡිකිරියාය පටිපන්නො අනාගාමී අනාගාමි ඵල සච්ඡිකිරියාය පටිපන්නො, අරහා අරහත්තාය පටිපන්නො.** මොකද මේ බුදුරජාණන් වහන්සේ මේ දිග පාඨයක් යෙදුවේ? ලේසියට කියන්න තිබුන නේ, මග්ගට්ඨ ඵලට්ඨ කියල. අන්න බලන්න අර 'මග්ග' කියන වචනය යෙදිලවත් නැහැ එතන. ඒ

වෙනුවට 'පටිපන්න'. ඒ වගේම මතක් කරගන්න **'සුපටිපන්නෝ උජුපටිපන්නෝ' ආදී ඒ හැම තැනකම සඟ ගුණ පාඨයේ 'මග්ග' ගැන නොවෙයි කියන්නෙ. 'පටිපන්න' - ප්‍රතිපදාව ගැනයි කියන්නෙ.** මේක ඉතාම වැදගත් කාරණයක්. මෙච්චර කාලයක් මේ කට්ටිය හිත යොදල නැහැ. 'සුපටිපන්නෝ', 'උජුපටිපන්නෝ' - **ප්‍රතිපදාව යම් කාලසීමාවක් තුළ යන එකක්. නමුත් ලෝකෝත්තර මාර්ගයේ ඇති විශේෂත්වය ඒකට අනතුරුවම ඵලයට වැටෙනවා.** එතකොට අටදෙනා බෙදාගෙන දන් **දෙන්න බැහැ. නමුත් අටුවාචාරීන් වහන්සේලා ඒකටත් හාස්‍යජනක අඳමේ හේතුවක් දක්වනව.** අපේ බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේම ප්‍රශ්නය නගල කොහොමද දෙන්න බැරිද මේ අට දෙනාට කියල නිදර්ශනයක් හැටියට දක්වන්නෙ යම්කිසි ආරද්ධ විපස්සක භික්ෂුවක් - විදර්ශනා වඩන භික්ෂුවක් - ගෙදරක් ළඟට ගිහිල්ල ගේ ඉදිරියට ගිහිල්ල, (තවම මේ භාවනා කරගෙන යන්නෙ) ඒ පාත්තරේ දෙනවලු ගෙදර කට්ටියට. ඒ පාත්තරේට දානෙ පිළිගන්වන අතරේ මේ හාමුදුරුවො අන්න අර මාර්ගයට වැටෙනව. ඔය විදියටයි තෝරන්නෙ. **ඒක ඉතාමත් අස්වාභාවික විවරණයක්.** ඒ කිසි කරදරයක් නැහැ. අපි 'පටිපදා' කියන වචනය ඉස්සරහට ගත්තහම. බුද්ධ වචනය තියෙන්නෙ ඒකයි. මේ අන්දමට දිගට කිවුවෙ මොකද 'සොතාපත්ති ඵලය සාක්ෂාත් කිරීම සඳහා පිළිපන්' - **මග්ග කථාවක් නැහැ කොහෙත්ම.** 'සකදාගාමී ඵලය සාක්ෂාත් කිරීම සඳහා පිළිපන්.'

අන්න එතන ගැඹුරු කාරණයක් තියනව. මේ බුද්ධ වචනය කියල හිතාගන්න. අපි අටුවාචාරීන් වහන්සේලාට වඩා, **බුද්ධඝෝෂ වචනයට වඩා බුද්ධ වචනයට තැන දෙනව. ඒක නිසයි මේ කියන්නේ.** මේ පින්වතුන්ට කාලයක් තිස්සේ වැරදි අදහසක් - යම්කිසි ප්‍රමාණයකට මේ ධර්මය විකෘත කිරීමක් ඇතිවී ඇති නිසයි මේ මතක් කරල දෙන්නේ. ඒනිසාම ගැටළුවක් පැන නැඟී තිබෙනවා. එතකොට පටිපදා වචනය ගත්තහම ප්‍රශ්නයක් නැහැ. අට දෙනෙකුට කදිමට දාන දෙන්න පුළුවන්. ඊළඟට අහන්න පුළුවන් කවුද මේ කියන 'සෝතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්න' කියන එකට අහුවෙන කොටස? සෝතාපත්ති ඵලය සාක්ෂාත් කිරීම සඳහා පිළිපන් අය කවුද? අන්න එතෙන්දි අපි එළියට ගන්න ඕන. මේ පිළිබඳව සූත්‍ර කීපයක්ම තියනව. මේ කාරණයට අදාළව අපි කලින්



දේශනාවක් කරල තියනව චූල ගෝපාලක සූත්‍රය මුල්කරගෙන. නමුත් මෙතෙන්දි අපි කෙටියෙන් කිවුවොත් මේ කොටසට අයිතිවෙන විශේෂ පුද්ගලයින් දෙකොටසක් ඉන්නව. **'ධම්මානුසාරී' 'සද්ධානුසාරී'** නමින්. ඒ අය සෝවාන් වෙලා නැහැ. නමුත් අති විශේෂ පුද්ගලයින් දෙදෙනෙක්. මොකද ඒ අය ගැන සූත්‍රය ඉදිරියට කියනකොට අහුවේවි. කොයිතරම්ද කියතොත් බුදුරජාණන් වහන්සේ ගේ වචනයෙන්ම කියල තියනව. ඒ දෙන්නා සද්ධානුසාරී ධම්මානුසාරී කියන ගණයට අයිති ඒ පුද්ගලයින් **සෝවාන් නොවී කාලක්‍රියා කරන්නෙ නැහැ කියල. එතකොට සෝවාන් මාර්ගයේ හික්මෙනව. අර ප්‍රතිපදාවෙ හික්මෙනව ඒ දෙන්න - නිසැකවම.**

කොයිතරම්ද කියතොත් අපි ඒ සූත්‍රවලින්ම කියමු. මැදුම් සඟියේ අලගද්දූපම සූත්‍රය බුදුරජාණන් වහන්සේ ගේ දේශනාවේ ස්වාක්ඛාත බව පුදුම විදියට අවධාරණය කරන සූත්‍රයක්. ඒ සූත්‍රය අවසාන කරන්නේ මෙහෙමයි. මේ ස්වාක්ඛාත ධර්මය තුළ යම්කිසි කෙනෙක් ධම්මානුසාරීද සද්ධානුසාරීද ඒ අය සම්බෝධි පරායණයි. සාමාන්‍යයෙන් 'එතෙ සම්බෝධි පරායණා' කියල යොදන්නෙ සෝවාන් පුද්ගලයින් පිළිබඳව. නමුත් ඊට මෙහායින් ඉන්න මේ දෙදෙනා පිළිබඳව බුදුරජාණන් වහන්සේ කියනව 'සම්බෝධි පරායණ' කියල ඔන්න එතන එහෙම කිවුව. තව ඉස්සරහට යමු. ඊළඟට වඩා හොඳ විස්තරයක් තියනව චූල ගෝපාලක සූත්‍රයේ - හොඳ ලස්සන උපමාවකුත් එක්ක. ගෝපාලක සූත්‍රය දේශනා කළේ බුදුරජාණන් වහන්සේ වජ්ජි රටේ ගංගානම් ගංතෙර පිහිටි උක්කාචෙල නමැති නගරයේදී සංඝයා වහන්සේලා අමතල ගැඹුරු උපමාවක් දුන්න. මහණෙනි, වස්කාලයේ අවසාන මාසයේ මේ මගධ රටේ ඉතාම ප්‍රඥාව අඩු මෝඩපහේ ගොපල්ලෙක් තමන්ගේ ගවරැළ එතර කළේ මෙහෙමයි. මෙතෙර හරියට පරීක්ෂා නොකර, එතෙර හරියට පරීක්ෂා නොකර නොතොටින් (නියම තොටින් නොවෙයි) නොතොටින් ගවරැල එතර කරන්න ගිහිල්ල ගවරැල දියවැලට අහුවෙලා විනාශ මුඛයට පත් උනා. නමුත් මගධරටේම එක්තරා ප්‍රඥාවන්ත ගොපල්ලෙක් මෙතෙර හොඳට පරීක්ෂා කරල බලල, එතෙර හොඳට පරීක්ෂා කරල බලල, නියම තොටින්ම ගවරැල එතර කළා. එතර කළ ආකාරය බුදුරජාණන් වහන්සේ ලස්සනට ඉදිරිපත් කරනව. පළමුවෙන්ම ගවරැලේ ගවපිතෘන් ගවපරිනායක කියල කියන ප්‍රධාන ගවයින් ඉස්සෙල්ලම. ඊළඟට උන්ගේ

පිටිපස්සෙන් 'බලව ගාවෙ දමම ගාවෙ' කියල සඳහන් වෙනව. දමනය කළ යුතු විදියේ ශක්තිමත් ගවයින් යනව. ඊළඟට ඊට පිටිපස්සෙන් යනව වස්සන් වැස්සියන්. ඊට පස්සෙන් යනවා දුර්වල වහුපැටියන්. ඔන්න ඊළඟට පුදුම දෙයක් කියනව. මේ ගොපල්ලගෙ දක්ෂකම කොයිතරම්ද කියතොත් අන්තිමට අර එදිනම උපන් වහුපැටියත් මවගේ ගවරාවයෙන් 'මාතු ගොරවකෙන' කියල කියනව. එළදෙන 'හුම්' හුම්' ගගා වහුපැටියා මෙල්ල කරන්නෙ. ඒ වගේ මවගේ ඒ නාදයෙන් උත්සාහවත් කරමින් අර එදා උපන් වහුපැටියත් එතර වුනා. මේක නිකම් උපමාවක් නොවෙයි. අපි කෙටියෙන් කිවුවොත් අර අදක්ෂ ගොපල්ල තමයි අන්‍යාගමික අන්‍ය තීර්ථක ඒ ශ්‍රමණ බ්‍රාහමණයින්. ඒ ගොපල්ල මෙතෙර දන්නෙත් නැහැ. පරතෙර දන්නෙත් නැහැ. වැරදි තොටින් එතර කරන්න ගිහිල්ල විනාශයට පත්උනා. නමුත් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ, (තමන් වහන්සේ ගැනයි මේ කියන්නේ). අන්න ප්‍රඥාවන්ත ගොපල්ල හැටියට නියම තොටින් එතර කරනවා. පරීක්ෂා කරල ක්‍රමානුකූලව. මේ අවසාන ගණයයි අපේ අවධානයට යොමුවිය යුත්තේ. **කවුද මේ එදා උපන් පැටියා? එතෙන්දි බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ 'ධම්මානුසාරී' 'සද්ධානුසාරී' කියන දෙන්නා.** එතකොට ධම්මානුසාරී සද්ධානුසාරී කියන්නේ අවම මට්ටම. ඒ දෙන්නත් අන්තිමට එතර වෙනව. ඒකයි ඒ 'සම්බෝධි පරායණ' කිවුවෙ. ඔන්න ඒ චූලගෝපාලක සූත්‍රය. හුඟක් දේවල් කියන්න තියනව. ඒ නිසයි මේ කෙටියෙන් කියන්නෙ.

ඊළඟට මේ දෙදෙනා ගැන තවත් විස්තර අපට හමුවෙන සූත්‍රයක් තියනව. සංයුත් සඟියේ ඛන්ධ සංයුක්තයේ ඔක්කන්තික සංයුක්තයේ. ඒකෙ මීට වඩා විස්තර සඳහන් වෙනව. එතෙන්දි සංඝයා වහන්සේල අමතල බුදුරජාණන් වහන්සේ කියනව 'මහණෙනි, චක්ඛුං අනිච්චං විපරිනාමී අඤ්ඤථාභාවී ඇස අනිත්‍යයි වෙනස්වෙන සුළුයි. අන්‍ය ස්වභාවයට පත්වෙන සුළුයි.' ඒ විදියටම කණ නැහැය දිව කය මන යන හය ගැන කියල තියනව. යම් කෙනෙක් ශ්‍රද්ධාවෙන් මේ කාරණය පිළිඅරගෙන පිළිවෙත්හි යෙදෙනව නම් අන්න ඒ තැනැත්තා සද්ධානුසාරී. ඊළඟට යම් කෙනෙක් මේ කාරණය ප්‍රඥාවෙන් එක්තරා ප්‍රමාණයකට පිළිඅරගෙන හික්මෙනව නම් ඒ තැනැත්තා ධම්මානුසාරී. ඔය කියන්නේ අපේ ඉන්ද්‍රිය ධර්ම අතරින් සද්ධින්ද්‍රිය අධික පුද්ගලයා සද්ධානුසාරී පැත්තට



යනවා. පඤ්ඤින්ද්‍රිය අධික පුද්ගලයා ධම්මානුසාරී. ඔන්න ඔය දෙන්නා විශේෂ පුද්ගලයින් දෙදෙනෙක්. ඊළඟට ඒ දෙන්නා ගැන අමුතුම දෙයක් බුදුරජාණන් වහන්සේ මෙතනදී කියනව ඒ දෙදෙනා සාමාන්‍ය සුළුපටු අය නොවන බව.

ඔක්කන්තික සංයුත්තයේදී ඒ දෙදෙනා ගැන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව ඒ දෙන්නා '**සම්මත්ත නියාමං ඔක්කන්තො**' කියල අමුතු වචනයක් තියෙනව - 'සම්මත්ත නියාම' කියන්නේ පින්වතුනි, අපට කියන්න පුළුවන් 'නිවැරදි බව පිළිබඳ නියාමයට වැටිල ඉන්නෙ' ඒ දෙදෙනාම. තවත් පැහැදිලිව කියනවනම් සත්පුරුෂ භූමියට වැටිල. සත්පුරුෂ වචනය යොදන්නෙ බොහෝවිට ආර්යයන් වහන්සේලාට. ඊළඟට කියනව ඒ දෙදෙනා සත්පුරුෂ භූමියට වැටිල පෘථග්ජන බව ඉක්මවල. ඊළඟට විශේෂ දෙයක් කියනවා. මේ සද්ධානුසාරී ධම්මානුසාරී පුද්ගලයින් දෙදෙනා නිරයට, තිරිසන් යෝනියට ප්‍රේත යෝනියට යන පාපකර්ම කරන්නෙ නැහැ. ඊළඟට කියනවා **මේ දෙන්නා සෝවාන් නොවී කාලක්‍රියා කරන්නෙ නැහැ. 'අභව්‍ය' කියන වචනය එතන යෙදෙනව. 'අභබ්බා'** සෝවාන් නොවී කාලක්‍රියා කිරීමට නොහැකියි කියල බුද්ධ වචනය තියනව. ඔන්න එතකොට ඒ තරම් විශිෂ්ට ගුණ ඇති මේ දෙන්නා ගැන තවත් විස්තර ලැබෙනව, අපට කීටාගිරි සූත්‍රයෙන්. කීටාගිරි සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ දෙදෙනාටම තියනව - සාමාන්‍ය පෘථග්ජනයින්ට නැති ආර්යයන් වහන්සේලාට සුවිශේෂ වූ ඉන්ද්‍රිය පහක්. **සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා** කියන. කවුරුත් කියන්න පුළුවන් අපටත් තියනව කියල. නමුත් ඉන්ද්‍රිය තත්ත්වයෙන් පිහිටල නැහැ. නමුත් මේ දෙන්නට ඒකත් පිහිටල තියනව. **එතකොට යම් අඩුවක් තියනව ඒ අඩුව තමයි පුරවන්න ඕනෙ. නමුත් අපට හිතාගන්න තියෙන්නෙ ඒ අඩුව මේ ජීවිතය තුළ කොහොම හරි පුරවනව.**

නමුත් අවාසනාවකට වගේ අපි කියන්න හොඳ නැහැ මේවා ඇතැම් කෙනෙක් අපව විවේචනය කරන්න පුළුවන්. නමුත් **පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණයේ** මේ කියාපු සද්ධානුසාරී ධම්මානුසාරී දෙදෙනා ගැන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ අභව්‍යතාව විස්තර කරන්න ගිහිල්ල ටිකක් **නොගැලපෙන විදියේ විවරණයක් කරනවා.** එතන මේ

දෙන්නා හඳුන්වන්නේ '**ඨිත කප්පී**' කියල 'ඨිත කප්පී' කියන්නේ මේ දෙන්නට පුළුවන්ලු කල්පය නතර කරන්න. කල්පය දැවෙන විනාශවෙන එක නතර කරන්න පුළුවන්ලු මේ දෙන්නට. කොහොමද නතර කරන්නෙ? මේ විදියටයි. ඔන්න ටිකකට හිතාගන්න කල්පය කියන එකට පණ තියනවයි කියල. ඔන්න දැන් කල්පය දැවෙන වෙලාව. දැවෙන වෙලාවෙ 'කල්පය' වටපිට බලනකොට පේනව සද්ධානුසාරී ධම්මානුසාරී දෙන්නෙක් තාම නැහැ සෝවාන් වෙලා. **කල්පෙ නවතිනවාලු - දැවෙන්නෙ නැතිව අර දෙන්න සෝවාන් වෙනකම්!** මේක අපට නම් පේන්නේ 'අශ්වයට ඉදිරියෙන් කරත්තෙ දැමීම' වගේ වැඩක්. බුද්ධ වචනයේ තියෙන එක ගැඹුරින් කල්පනා කරනව නම් අපට හිතාගන්න තියෙන්නෙ කෙනෙකුගේ වටිනාම මොහොත තමයි මරණ මොහොත. අපි අහල තියනව සමහරු මරණ මොහොතෙදි රහත් වෙලා තියනව. අපි මේ පින්වතුන්ට කියල තියෙනව විවාදාපන්න කථාවක් නමුත්, ගෙල කපාගෙන රහත් වෙච්ච තුන් නමක් ගැන. ඒ කියන්නෙ මරණ අවස්ථාව, මරණයත් අමෘතත්වයත් අතර දෙක බේරගන්න තියන අවස්ථාව, ටිකක් පොඩි අඩුවක් තිබුන නම් මේ ජීවිතය තුළ ආයිත් කල්පය ගැන බාහිර කථාවක් ඕනෙ නැහැ. එතනම බුද්ධ වචනයෙ 'අභව්‍යයි' කියල කිව්වෙ මේ ජීවිත කාලය තුළ සද්ධානුසාරි ධම්මානුසාරි දෙන්න ඒ මාර්ගඵලය ප්‍රත්‍යක්ෂ නොකළනම් මරණ අවස්ථාවේදී හරි ඒක ලබනව. ඒ ටික කිව්වනම් ඇති. නමුත් අන්න අර විදියේ කථාන්තරයක් 'ඨිතකප්පී' ව්‍යවහාරය දැනටත් ඔය දේශකයන් යොදනව. 'ඨිතකප්පී' කියන්නේ මේ දෙන්නට පුළුවන්ලු කල්පය දැවීම නතර කරන්න. ඒක ටිකක් ගැලපෙන්නෙ නැති බවයි අපට කියන්න වෙන්නෙ.

හොඳයි, ඔන්න අට දෙනාගේ කතාව, හිතාගන්න. බුදුරජාණන් වහන්සේ නම් කියන්නෙ 'මග්ගට්ඨා ඵලට්ඨා' නොවෙයි. දිග පාඨයක් යොදනව. සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො ආදී වශයෙන්. එහෙම කියන්න සිදු උනේ අර හේතුව නිසයි. මොකක්ද? ලෝකෝත්තර මාර්ග ක්ෂණිකයි. ක්ෂණිකයි. ඒක වෙන්කරල දානෙ දෙන්න බැහැ. නමුත් ප්‍රතිපදාවෙ හික්මුණු කෙනෙකුට පුළුවන්. බලන්න අපේ සඟගුණ පාඨයේ සුපටිපන්න, උජුපටිපන්න, පටිපන්න පදයයි. මග්ග කථාවක් නැහැ ඒකෙ. 'පටිපන්න පටිපන්න.' ප්‍රතිපදාවේ හික්මෙන බවින්මත් දානය - ඒ පූජාවල්



ලැබීමට සුදුසුයි. සෝවාන් මාර්ගඵල ගැන විශේෂයෙන් කෙනෙක් අහන්න පුළුවන් නිසයි මේ ගැන කිවුවෙ. අනිත් ඒවා මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්. අපි හිතමු කෙනෙක් සකදාගාමී උනා කියල. එතන ඉඳල නිකම් ඉන්නෙ නැහැනෙ. එතන සේඛ කියන වචනය යොදන්නෙ. සේඛ කියන්නෙ හික්මෙන පුද්ගලයා. රහත් බව දක්වා හික්මෙනවා. එතන වැඩ ඉවර නැහැනෙ. ඇතැම් කෙනෙක් මොන හේතුවකින් හරි ප්‍රමාදයට වැටෙනව. ඒ කට්ටියට කියන්නෙ 'පමාද සෙඛ' කියල. ඔය විශාඛා අනාථපිණ්ඩික ආදීන්ට ඉන් එහාට යන්න බැරි උනා. නොයෙකුත් ඒ ලෞකික හේතු නිසා. ඒක වෙනමයි. නමුත් සාමාන්‍ය රීතිය සෝවාන් උනාට පස්සෙ ඊළඟ විදර්ශනා වීර්යයෙ යනව.

දැන් අපි අටදෙනා ගැන කථා කරල ඉවරයි. ඔන්න ඊළඟට නව දෙනෙකුගේ කථාව ඉස්සරහට ගන්නව. මොකක්ද ඒ? අංගුත්තර නිකායේ නවක නිපාතයේ තියනව මෙන්න මෙහෙම සූත්‍රයක්. '**නව ඉමෙ භික්ඛවෙ ආහුනෙය්‍යා, පාහුනෙය්‍යා, දක්ඛිණෙය්‍යා, අඤ්ජලිකරණීයා, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස**' ලෝකයේ ආහුනෙය්‍ය පාහුනෙය්‍ය ආදී ගුණ තිබෙන උත්තරීතර පුණ්‍ය ක්ෂේත්‍රයන් වන නව දෙනෙක් ඉන්නවා. අට දෙනයි කියාපු එක මේ නව දෙනෙක් උනේ කොහොමද? ඒකත් විවාදාපන්න කාරණයක් නිසයි මේ කියන්නෙ. අට දෙනා දැන් කවුරුත් දන්නව නේ. ඒ අටදෙනාට අමතරව තියෙන්නෙ **ගොත්‍රභූ** කියන වචනයක්. මේ '**ගොත්‍රභූ**' කියන වචනය ඇත්ත වශයෙන් විදර්ශනා ඥාන වීර්ය ගැන කියනකොටත් යෙදෙන වචනයක්. පෘථග්ජන තත්ත්වයේ ඉඳල මාර්ගඵලය ලැබෙන අවස්ථාව අතරේ පවතින සුළු අවස්ථාව, ඉතාම සුළු අවස්ථාව, ක්ෂණික අවස්ථාව - විසුද්ධි මාර්ගයේ උපමාවකින් කිවුවොත් මේ පින්වතුන්ට පහසුයි. මේක තේරුම් ගන්න. මේ මුළු මහත් විදර්ශනා කෘත්‍යය මේ මැදුම් පිළිවෙත ධර්මානුකූලව හඳුන්වන්න පුළුවන් යමක් උපකාර කරගෙනයි පවතින්නෙ. මොකක්ද උපකාර කරගන්නෙ විදර්ශනාව සඳහා? සංස්කාර සම්මර්ශණයයි. සංස්කාර සම්මර්ශණය කරල අන්තිමට සංස්කාරත් අතහරිනව. අන්න ඒක හොඳ උපමාවකින් දක්වල තියනව. ඒක පිළිගත හැකි උපමාවක්. වැහිකාලේ දොළපාරකින් එතරවෙන්න යනකොට පාලමක් වැන්නක් නැත්නම් මොකක්ද කරන්නෙ. ශක්තිමත් පුරුෂයෙක් නුවණින් කල්පනා කරල ගහක එල්ලෙන වැලක් අල්ලගෙන පැද්දෙනවා.

පැද්දිල, පැද්දිල, පැද්දිල එහා ගොඩට කිට්ටු උන හැටියේ වැල අතහැරල - ආයි අල්ලගෙන හිටියොත් මෙහා පැත්තට එනවනෙ - ඒ සුළු වෙලාව තුළ වැල අතහැරල එහා පැත්තට වැටෙනවා. **අන්න ඒ වැල අතහරින චකිත වෙලාව තමයි ගොත්‍රභූ කියන්නේ.** එහෙම හිතාගන්න. ඉතාමත්ම සියුම්, විදර්ශනා චිත්ත වීථියේ ඉතාම සියුම් අවස්ථාවක්, ඵලයට වැටෙන කම්. එතකොට ඒ අවස්ථාව අල්ලල කොහොමද දන් දෙන්නෙ. ඒකනෙ කිවුවෙ ගෙදර ඉස්සරහට ගිහිල්ල පාත්තරේට දන් බෙදන වෙලාවෙ විදර්ශනා වඩල. ඔන්න ඔය විදියෙ කෘත්‍රිම විවරණයක් දෙන්නෙ. ඒ කිසිවක් අවශ්‍ය නැහැ. **අපි කිවුව හැටියට ඇත්ත වශයෙන් මේ කට්ටියත් 'ගොත්‍රභූ' වචනය තෝරන්නෙ විදර්ශනාව ආශ්‍රයෙන්. ඒක වැරදියි. මොකද හේතුව. සොතාපතති ඵල සච්ඡිකිරියාය පටිපන්නො කියන එකට අහුවෙලා ඉවරයි 'ගොත්‍රභූ' අවස්ථාව. හිතාගන්න සෝවාන් ඵලය සාක්ෂාත් කිරීම සඳහා පිළිපන් පුද්ගලයන් කියන එක අවස්ථාවක් නේ. ගොත්‍රභූ කියන්න බැහැනේ.**

**එහෙනම් මේ 'ගොත්‍රභූ' කියන වචනය තෝරගන්නේ කොහොමද? ඔන්න ඕකයි ප්‍රශ්නය. ඔන්න ඒකට උත්තරය ගන්න නම් අපි යන්න ඕනෙ 'දක්ඛිණා විභංග සූත්‍රයට'.** මැදුම් සඟියේ එන දකඛිණා විභංග සූත්‍රය ධර්‍ම දේශකයින් අතර ඉතාම ජනප්‍රිය එකක්. ඒක භුක්තානු මෝදනා අවස්ථාවෙ දාන ගෙවල් වලදී මේ පින්වතුන්ට නිතර අහන්න ලැබිල ඇති. ඒ සූත්‍රයේ නිදාන කථාව අතිශය විශේෂයි, අපි මේ සඟගුණ කථා කරණකොට. මෙහෙමයි දක්වෙන්නෙ-බුදුරජාණන් වහන්සේ ශාක්‍යයින්ගේ කපිලවස්තු පුරවරයේ නිග්‍රෝධාරාමයේ වැඩවසන අවස්ථාවක මහා පජාපතී ගොතමී (බුදුරජාණන් වහන්සේ ගේ සුළු මව) සියතින්ම නූල් කැටල වියපු අලුත් වස්ත්‍ර යුගලයක් ගෙනල්ල බුදුරජාණන් වහන්සේට පූජා කරනව. 'භාග්‍යවතුන් වහන්සේ මා කෙරෙහි අනුකම්පාවෙන් මෙය පිළිගන්නා සේක්වා' කියල බුදුරජාණන් වහන්සේ කියන්නෙ මොකක්ද? මහ පුදුම දෙයක් ඒ අවස්ථාවෙදි කියන්නෙ. **'සංඝෙ ගොතමී දෙහි. සංඝෙ තෙ දිනෙන අහමපි පූජිතො භවිසසාමි'.** ගොතමී මේක සංඝයාට දෙන්න. සංඝයාට පූජා කළහම මටත් ඒක පූජා කළා වෙනවා. දෙවනුවත්, තෙවනුවත් ප්‍රජාපතී ගොතමිය ඉල්ලා හිටිය. ඒ මදිවට ආනන්ද හාමුදුරුවොත් එකතු වෙලා කියනව 'අනේ භාග්‍යවතුන් වහන්සේ මේක



පිළිගන්න. භාග්‍යවතුන් වහන්සේට මෑණියන් වහන්සේ නැති උනහම කිරිපෙව්වෙ මේ සුළු මව්නේ. ඇති දැඩි කළ අයනේ.' ඒක කිවුවහම බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට එල්ලකරල දේශනා කරනව. ඒක දානය පිළිබඳව මහ පුදුම විග්‍රහයක් දක්වෙන එකක්. අපි කෙටියෙන් කිවුවොත් මේ විදියටයි පටන් ගන්නේ. **'පාටිපුද්ගලික දාන'** පුද්ගලික වශයෙන් දෙන දාන - ඒවා දාහතරක් දක්වනවා. ඒව කෙටියෙන් සලකාගන්න. පළමුවෙන්ම තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේට පෞද්ගලික වශයෙන් දෙන දානය. ඒ විධියේ දෙයක් තමයි ප්‍රජාපතී ගෝතමී ගේ දානය මොකද පෞද්ගලික දෙයක්නේ ඒක. ඒ තමන්ගේ සුළුමව. ඒ දරුවා වෙනුවෙන් ඒක පූජා කරන්නෙ. පෞද්ගලික දානයක්. බලන්න බුදුරජාණන් වහන්සේගේ මහා පුදුම දුලීභ ගුණයක් ඒක. පෞද්ගලිකව පිරිනමපු එකත් ප්‍රතික්ෂේප කරල සංඝයාට පූජා කළා. එතනම ලෝකයාට ඉගෙන ගන්න ලොකු දෙයක් තියනව. සංඝයාට පූජා කළා. මොකද සංඝයාට තමනුත් අයිති නිසා. ඊළඟට කියනව පසේබුදුරජාණන් වහන්සේ නමකට පෞද්ගලික වශයෙන් දෙන පූජාව. ඊළඟට තියෙන්නේ අර කියාපු අට දෙනා ගැන. රහතන් වහන්සේට, ඊළඟට අරහත්මඟට ප්‍රතිපන්න ඊළඟට අනාගාමී අනාගාමී ඵල සච්ඡිකිරියාය පටිපන්න. දැන් කියාපු අටදෙනා. එතකොට ඒ අටදෙනයි අර කියාපු දෙනමයි ගත්තහම දහයක් කියල හිතාගන්න. ඔන්න එකොළොස් වෙනියා ගැන. එකොළොස් වෙනියාට තියෙන්නේ 'බාහිරෙසු කාමෙසු විතරාගී' කාමයන් පිළිබඳ වීතරාගී බාහිර තාපසයන් ඍෂිවරුන් ඉන්න පුළුවන්. ඒ අය ඊළඟ මට්ටමට එනවා. එකොළොස් වෙනි මට්ටමට. මේ කියන්නේ පූජනීය තත්ත්වය අනුව. ඊළඟට දක්වනවා ශීලවන්ත පෘථග්ජනයා. දහතුනට දක්වන්නේ දුස්සීල පෘථග්ජනයා. දහහතරට දක්වන්නෙ තිරිසනා. අවරෝහණ ක්‍රමයකටයි එතනදී බුදුරජාණන් වහන්සේ දාහතර දෙනා හැඳින්වූයේ.

නමුත් ඔන්න දානානිසංස කියනකොට ආරෝහණ ක්‍රමයට බුදුරජාණන් වහන්සේ ඒක තේරුම් කරනවා. මේ කාලෙ කෙනෙක් අතිශයෝක්තිය කියාවි. පස්සෙ එකතු කරපුවයි කියාවි. කොහොම හරි බුදුරජාණන් වහන්සේ මෙහෙමයි තේරුම් කරන්නේ. තිරිසනාට දානයක් - යමක් දීල සියගුණයක් ආනිසංස බලාපොරොත්තු විය හැකියි. දුස්සීල

පෘථග්ජනයෙකුට දීල දහස් ගුණයක්. ශීලවන්ත පෘථග්ජනයෙකුට දීල ලක්ෂ ගුණයක්. බාහිර කාමයන්හි වීතරාගී තාපසයකුට දීල කෝටි ලක්ෂ වාරයක් ආනිශංස බලාපොරොත්තු විය හැකියි. ඊළඟට සොතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නො අර කියාපු සද්ධානුසාරී ධම්මානුසාරී ආදී පුද්ගලයකුට දීල බුදුරජාණන් වහන්සේ කියන්නේ '**අසංඛෙය්‍යං අප්පමෙය්‍යං**' ගණන් කරන්න බැහැ, ප්‍රමාණ කරන්න බැහැ. එතන ඉඳල ඉහළට කියන්නේ. පුදුම වචනයක් කියනව. ගණන් කරන්න බැරිනම්. ප්‍රමාණ කරන්න බැරිනම් ආයි ඕක වැඩිකරන්න බැහැනෙ. ඒ නිසා එකම පාඨයයි බුදුරජාණන් වහන්සේ එතන ඉඳල ඉහළට කියන්නෙ. '**කො පන වාදො**' - කො පන වාදො කියල කියන්නේ පිංවතුනි, 'කියනුම කවරේද?' කියල. ඔය පරණ පොත්වල එහෙම - කවර කථාද - කියල කියන්නේ. එතකොට සෝවාන් ඵලය සාක්ෂාත් කිරීමට පිළිපන් ඒ පුද්ගලයාට දානයක් පූජා කිරීමෙන් අසංඛෙය්‍ය අප්‍රමාණ ආනිසංස තිබේනම් ඊට ඉහළ ගැන දිගටම කියන්නේ 'කො පන වාදො' කවර කථාද? කවර කථාද? එයින් පෙන්නුම් කරන්නේ ආනිසංස ශක්තියයි. තේරුම් ගන්න පුළුවන් නේ මේ පින්වතුන්ට. ආරෝහණ ක්‍රමයෙන් දක්වන්නේ. තිරිසනාගෙන් පටන්ගෙන ඔහොම කියල ඊළඟට කියනව - ඒ කිව්වෙ පාටිපුග්ගලික දාන - පෞද්ගලික දාන.

ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ දක්වනවා **සංඝගත දක්ෂිණා හතක්.** මෙහෙමයි දක්වන්නෙ. දැන් අපි පාවිච්චි කරන වචන. බුද්ධ ප්‍රමුඛ උභතො සංඝයා බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්න කාලෙ බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂු භික්ෂුණීන් දෙපක්ෂයටම අනේපිඬු සිටාණන් ආදීන් පූජාකළේ එබඳු දානය. ඉතාමත්ම මහත්ඵල මහානිසංසයි. බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝයාට ඊළඟට කියනව තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පස්සෙ උභතො සංඝයාට. භික්ෂු-භික්ෂුණී සංඝයාට. ඒ දෙවෙනි එක. තුන්වෙනි එක තථාගත පරිනිර්වාණයෙන් පස්සෙ භික්ෂු සංඝයාට පූජා කිරීම. හතරවෙනි එක භික්ෂුණී සංඝයාට පූජා කිරීම. පස්වෙනි එක අමුතු ආකාරයකට දක්වන්නේ. යම්කිසි දායකයෙක් ඉල්ල ගන්නවා සංඝයා වහන්සේලාගෙන් අපට යම්කිසි භික්ෂූන් පිරිසක් භික්ෂුණීන් පිරිසක් දෙන්න සංඝයා වෙනුවෙන් කියල අන්න ඒ පස්වෙනි දානය, හයවෙනුව දක්වන්නෙ භික්ෂූන්ට විතරක්. භික්ෂූන් විතරක් අපට



දෙන්න කියල ඉල්ලා ගැනීම. හත්වෙනි එක භික්ෂුණීන් විතරක් අපට දෙන්න කියල ඉල්ලල දීම. ඔන්න ඔය සංඝගත දක්ෂිණා හත. ඊට පස්සෙ බුදුරජාණන් වහන්සේ අමුතු දෙයක් සඳහන් කරනවා. මහණෙනි, අනාගතයේ '**ගොත්‍රභූ** හැටියට සලකන කාසාවකණ්ඨ දුස්සීල පාපධර්මී භික්ෂූන් ඇතිවෙනව. සිවුර කරේ එල්ලෙන දුස්සීල පාපධර්මී ඒ අය හඳුන්වන්නෙ '**ගොත්‍රභූ**' කියල. ගොත්‍රභූ කියන වචනය එතන තේරුම් ගන්න තියෙන්නෙ අර විදර්ශනා අර්ථයෙන් නොවෙයි. **දායකයාගේ අවබෝධය අනුව දායකයාගේ පෙනුම අනුව මේ තැනැත්තා සංඝ තත්ත්වය පෙන්නුම් කරනව. කරේ එල්ලෙන සිවුරෙ ප්‍රමාණයෙන්. ඒ කියන්නේ ආයශී ගෝත්‍රය පෙන්නුම් කිරීමක් පමණයි.** ඒ අර්ථයෙන් අපි මේ වචනය තෝරන්නේ. ඊළඟට කියනව බුදුරජාණන් වහන්සේ එබඳු ඒ පුද්ගලයින් සඳහා වුවත් සංඝයා වෙනුවෙන් කෙනෙක් පූජා කරනවා නම් - ඒකත් අසංඛෙය්‍යයි. අප්පමෙය්‍යයි. ඕක විවාදයට භාජන වෙච්ච එකක්. විශේෂයෙන් බටහිර විචාරකයින් මේ සූත්‍රය ප්‍රතික්ෂේප කරනවා. මේක නිසා. ඒ කට්ටිය කියන්නේ ශාසන පරිහානියේදී සංඝයා වහන්සේලා දානෙ ලබාගන්න ගොතාපු සූත්‍රයක් කියල. **මේක මහා ගැඹුරු සූත්‍රයක්. එක වචනයක්වත් අහක් කරන්න බැහැ. නමුත් මේක තේරුම් ගන්න ආකාරයයි වැරදි.** එතකොට මේ කිව්ව කාරණය ඇත්තවශයෙන් විවාදයට භාජන වෙච්ච එකක්. කාසාවකණ්ඨ දුස්සීල භික්ෂූන් වහන්සේලා. නමුත් උන්වහන්සේලාට **මේ දායකයා පිරිනමන්නෙ දානෙ අන්න අර සංඝයා සිහිපත් කරගෙන.**

එතනදී තවදුරටත් බුදුරජාණන් වහන්සේ ප්‍රශ්නයක් ආවොත් ඒකට උත්තර දෙන්න කදිමට කියනව කාරණයක්. උන්වහන්සේ **දක්ඛිණා විසුද්ධි** හතරක් දක්වනවා. දක්ඛිණා විසුද්ධි කියන්නේ පින්වතුනි, ඒ සංඝගත දක්ෂිණාව පිරිසිදුවන ආකාරය. පළමුවෙනි පිරිසිදුවීම දක්වන්නෙ මෙහෙමයි. '**දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො' දායකයා පැත්තෙන් ඒ දානය පිරිසිදුයි. ප්‍රතිග්‍රාහකයා පැත්තෙන් අපිරිසිදුයි.** ඊළඟ එක දායකයා පැත්තෙන් අපිරිසිදුයි. ප්‍රතිග්‍රාහකයා පැත්තෙන් පිරිසිදුයි. ඊළඟට දායකයා පැත්තෙනුත් ප්‍රතිග්‍රාහකයා පැත්තෙනුත් දෙකෙන්ම අපිරිසිදුයි. අන්තිම එක දායකයා පැත්තෙනුත් පිරිසිදුයි. ප්‍රතිග්‍රාහකයා පැත්තෙනුත් පිරිසිදුයි. මෙතන පිරිසිදු අපිරිසිදු භේදය කෙටියෙන්

සලකගන්න. දායකයා පිරිසිදු කියන්නෙ සීලවා කල්‍යාණ ධම්මෝ’ සිල්වත් කල්‍යාණ ධම්මයි. ප්‍රතිග්‍රාහකයෝ ‘දුස්සීලා පාපධම්මා’. එතකොට මෙතනිනුත් පෙන්නුවා යම්කිසි ඉඟියක් බුදුරජාණන් වහන්සේ. මේ කාසාවකණ්ඨ ගොත්‍රභූ පුද්ගලයා අන්න අර ශ්‍රද්ධාවන්ත දායකයාට සිහිපත් කරදෙනවා ආර්ය සංඝ රත්නය. මේ පින්වතුන් හොඳට දන්න කාරණයක් **දන් දීල දිව්‍ය ලෝක යන්න පුළුවන්. නමුත් දන් වළඳල දිව්‍ය ලෝකෙ යන්න පුළුවන්ද** හිතල බලන්න. එතකොට මොකක්ද වෙන්නේ **අර දායකයා, දුස්සීල කරේ එල්ලෙන සිවුර දැකල ඒක තුළින් ශ්‍රද්ධාව ඇතිකරගෙන දානය පූජා කරල දිව්‍ය ලෝකෙ යනවා. ඒ දානෙ වළඳල අර පාප භික්ෂුව නිරයට යනවා.** බුද්ධ වචනයේ පරස්පර විරෝධීත්වයක් නැහැ නේද? මොකද අපි මේව කියන්නේ මේ දේශනාව ඇත්ත වශයෙන් ශ්‍රේෂ්ඨයි. **මොනයම් හේතුවකින් හරි මේ දේශනාව සමහරු පාවිච්චි කරන්නේ ශාසන පරිහානියට අතවැනීමක් විදියට.** ඒක මේ පින්වතුන් දන්නව. මෙහෙමයි කියන්නෙ. මේ කාලෙ ආර්යයන් වහන්සේලා ඉන්න, රහතන් වහන්සේලා ඉන්න, කාලයක් නොවෙයි. දැන් ඉතින් ඉදිරියට එන්නෙ කාසාකණ්ඨකයින් ගේ කාලෙ. ඒ කට්ටියට දුන්නත් වරදක් නැහැ. කාරණේ ඇත්ත. නමුත් අන්න අරකයි රහස. **දානය දෙන පින්වතා දිව්‍ය ලෝකෙ යනවා. දානය වළඳන භික්ෂුව අපායට යනවා. බුද්ධ වචනයේ එතකොට විරෝධයක් නැහැනෙ. ඒක දෙපැත්ත කැපෙන ආයුධයක් වගේ.**

මේකට මම පුංචි උපමාවක් දෙන්නම්. අපේ උපමා ඉතින් ගොඩේ උපමා තමයි. දැන් මේ පින්වතුන්ගේ ගෙදරට වීමල්ලක් ගේනවා. බිත්තර වී මල්ලක්. වීමල්ලෙ තියෙන ඒවා හිස් කරල ඉවරවෙලා, මොකක් හරි පෙට්ටියකට දාල ඉවරවෙලා මේ මල්ල ගෙදර පිලිකන්නට ගෙනිහිල්ල ගසනවා. මල්ලෙ ඇලිල තිබුණ වී ඇටයක් වැටෙනවා මඩගොඩට. දන්නෙම නැහැ හොඳ වී පඳුරක් ගේ පිටිපස්සෙ හැදිලා. අර බිම සරු නිසා. අන්න ඒ වගෙ තමයි **මේ ආර්ය සංඝරත්නය පුණ්‍යක්ෂේත්‍රයක් කියන්නෙ. නිකම් නොවෙයි. පින් කෙතක්. මේ පින් කෙතට අයාලේ වැටෙන වී ඇටය පවා පැලවෙනවා.** අන්න ඒ වගෙයි කියල හිතාගන්න. එතකොට ගොත්‍රභූ කාසාවකණ්ඨ ඒ භික්ෂුව ඒ සංඥාව ලෝකයාට දෙනව. සංකේතවත් කරනව. දායකයාට උදව්වෙනව තමයි මතක් කරල දෙන්න.



නමුත් එපමණකින් බැහැ නිරයෙන් බේරෙන්න. අපි හිතල බලමු. **ලෝකයා ඉන්නෙ සංඥාව තුළයි.** අපි පුංචි නිදර්ශනයක් හැටියට කිවුවට මේ පින්වතුන් ලොකුවට ගන්න එපා. ටිකකට හිතන්න දැන් දුටුගැමුණු රජ්ජුරුවො රුවන්වැලිසෑය තිබෙන තැන පුංචි කරඬුවක දාල ඒ සර්වඥ ධාතූන් වහන්සේලා තැබුවයි කියල. මේ වගේ ශතවර්ෂ ගණනක් තිස්සේ මනුෂ්‍යයින්ගේ හදවත් පුබුදු වෙනවද? **අන්න ඒ චෛත්‍ය සංඥාව. චෛත්‍ය සංඥාව තුළ ලෝකයා ඇදිල යනවා.** ඒ චීවරය අද පමණක් නොවෙයි ජාතක කථාවලත් තියෙන්නෙ. මේ පින්වතුන් අහල ඇති අබුද්දොත්පාද කාලවල පවා ඒ චීවරයේ ඇති පුදුම ශක්තිය දැක්වෙන ජාතක කථාවක්. ඒ ජාතක කථාවේ හැටියට බෝධිසත්ත්වයන් වහන්සේ ඇත් රජෙක්. ලොකු ඇත් පිරිසක් හිටිය. දේවදත්ත ඇතුන් මරන්නෙක්. එයා මොකද කරන්නේ පසේ බුදුරජාණන් වහන්සේගේ සිවුරක් පොරවාගෙන ඉඳගෙන ඉන්නව. ඉඳගෙන ඉන්න අතරේ අර ඇතුන් ඔක්කොම වැඳල යනවා. හංගගෙන ආයුධයක් මොකක් හරි තියෙන්න ඇති. බූමරැංගයක් ඒක අපි දන්නෙ නැහැ. ඒක වීසිකරනව. වීසිකරළ අර අන්තිමට යන ඇතා මරණව. ඔහොම ඔහොම ඇත් දළ ගන්න ඇතුන් මර මරා අන්තිමට බෝධි සත්ත්වයෝ කල්පනා කළා. මොකද අපේ පිරිස අඩුවෙන්නෙ? එහෙම හිතලා ඒ බෝධිසත්ත්ව ඇතා අන්තිමට ගියා. ඇතුන් මරන්නා ආයුධය වීසිකරන විට අනිත් පැත්තට හැරිලා ඒක වළක්වලා **අර මිනිසා නොමරා අතහැරියා. අර චීවරය නිසා! චීවරය නිසා!!** අන්න ඒක නිසා අපි මේ ගැන හිතන්න ඕනෙ. ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේ දක්ෂිණාවේ ශ්‍රේෂ්ඨත්වය මේ පුණ්‍යක්ෂේත්‍රයේ වටිනාකම කියන්න මේ ‘ගොත්‍රභූ කථාව’ ගත්තට අපි ඒක අනිත් පැත්තෙන් පටන් ගන්න නරකයි. අනිත් පැත්තෙන් පටන් ගත්තොත්, ශාසන පරිහානියට අතවැනීමක්.

යථාර්ථය හිතන්න ඕනෙ. මොකද හේතුව සංඝරත්නය කියල කියන්නෙ. මේ පින්වතුන් ‘රත්න’ කියන සංඥාව ඒ තුනටම දෙනවනෙ. **බුද්ධ රත්නය, ධම්මරත්නය, සංඝරත්නය,** වෙසක් පුරපසළොස්වක පොහොය දා ලෝකයට බුද්ධ රත්නය පහළ උනා. ඇසළ පුරපසළොස්වක පෝයදා ලෝකයට ධම්මරත්නයත් සංඝරත්නයත් පහළ උනා. මොකද, චතුරාර්ය සත්‍යය ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය. ඒ දේශනාව ඉවර වෙන කොට ප්‍රත්‍යක්ෂ කරගත් කොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේ නිසා සංඝරත්නය පහළ

උනා. ඒ ත්‍රිවිධ රත්නයයි. පසේ බුදුරජාණන් වහන්සේලාගේ කාලවල මෙහෙම එකක් නැහැ. සංඝරත්නයත් නැහැ. ඒක නිසාමයි මේ පින්වතුන් අහල තියන අග්ගප්පසාද සූත්‍රයේ මෙහෙම කියන්නේ බුදුරජාණන් වහන්සේ. '**යාවතා භික්ඛවෙ සංඝා වා ගණා වා තථාගත සාවක සංඝො තෙසං අග්ගමක්ඛායති. යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලි කරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස**'. එහෙම කියල '**යෙ භික්ඛවෙ සංඝෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති.**' ඒ අග්ගප්පසාද සූත්‍රයේ බුද්ධ රත්නය ධම්ම රත්නය ගැන කියල අන්තිමට සංඝ රත්නය ගැන කියනකොට ඔය විදියටයි දක්වන්නෙ. මුලින් කියවෙන විවරණය කවුරුත් දන්නවනෙ. ආයෙත් කියන්න ඕනෙ නැහැනෙ. යම්තාක් ලෝකයේ සමූහ පිරිස් ඉන්නවානම් ඔවුන් අතර තථාගත ශ්‍රාවක සංඝයා අග්‍රයි. අර කියාපු විස්තර අනුව. ඊළඟට කියනව යම් කෙනෙක් සංඝරත්නය කෙරෙහි පැහැදුනා හුද, ඒ පැහැදුනේ ලෝකයේ ශ්‍රේෂ්ඨම පිරිසක් කෙරෙහිය. ඒ නිසා ඒ ප්‍රසාදයේ විපාකත් අග්‍රයි. එතකොට හිතාගන්න ඕන මෙතෙන්දි ඒ සංඝරත්නයේ ශ්‍රේෂ්ඨත්වය පෙන්නුම් කරන්නේ බුදුරජාණන් වහන්සේ අර පෞද්ගලික දානයක් - ඒ මහා ප්‍රජාපතී ගෝතමිය, ඒ මෙහෙණින් වහන්සේ කොයිතරම් වෙහෙස මහන්සි වෙලාද ඒ චීවරය වියන්න ඇත්තේ. අර පොඩි දරුවට කිරි පෙව්ව වගේම හිතාගෙන. සියතින් බොහොම මහන්සියෙන් අර වස්ත්‍රය වියල ඒක පූජා කරනකම් ඉවසිලි නැතිව ඉඳල අන්න පූජා කළහම බුදුරජාණන් වහන්සේ කියාපු එක බලන්න. අකාරුණික බවකින් නොවෙයි. ඒ එක්කම කියනව ආනන්ද සවාමීන් වහන්සේට, උන්වහන්සේ කිව්වහම මහාප්‍රජාපතී ගෝතමී බුදුරජාණන් වහන්සේට බොහොම උපකාර උන බවත් ප්‍රකාශ කරල, බුදුරජාණන් වහන්සේත් මහා ප්‍රජාපතී ගෝතමීට උපකාරවුනා කියල.

බුදුරජාණන් වහන්සේ කළේ මොකක්ද? මේක ප්‍රතික්ෂ්ප කිරීමෙන් කළේ **මේ කාලෙ වචනයෙන් කියනවානම් 'කිරි බිල'** ගෙව්ව. කිරි බිල ගෙව්වෙ ඉහළම මට්ටමින්, තමන්ට පිළිගන්න තිබුන. නමුත් ඊටවඩා මහත්ඵල මහානිසංස වෙන්න, ඒ එක්කම ලෝකයාට සංඝරත්නයේ වටිනාකම හඳුන්වල දෙන්න, ප්‍රතික්ෂේප කරල කිව්ව. දෙනව නම් දෙන්න සංඝයාට. එතකොට මටත් පූජාකළා වෙනවා. බලන්න කොයිතරම් වටිනා



ආදර්ශයක්ද අර පෞද්ගලික වශයෙන් හිතල ඒ පූජා කරපු එක අන්න පොදු පූජාවක් බවට පත් කළා. එතකොට, සංඝරත්නයේ වටිනාකම ගැන හිතන්න ඕන. බොහෝදෙනා දන්නව සංඝයා වහන්සේලාගේ විනය කර්ම ආදී කටයුතුවලදී 'සංඝො' කියන වචනය ඉතාමත්ම ප්‍රබල වචනයක්. 'සංඝො' ඒ සංඝ වචනය ආමන්ත්‍රණය කරන කොට විශාල ශක්තියක් ඒ තුළ තියනව. හතර දෙනාට වැඩි පිරිස 'සංඝ' හැටියට හඳුන්වනව. ඊට අඩු පිරිස 'ගණ' හැටියටයි හඳුන්වන්නේ. මේක ශාසනික ව්‍යවහාරයක්. 'සංඝං උද්දිස්ස' සංඝයා උදෙසා යන වචනයේ මහ ගැඹුරු අර්ථයක් තියනව. එපමණක් නොවෙයි. අවාසනාවකට වගේ අටුවාවල ඇතැම් තැන්වල අඩුපාඩු පවතිනවා. ඒ පෙන්වල දෙන්න සිද්ධ උනා. බුද්ධඝෝෂ ස්වාමීන් වහන්සේ සුපටිපන්න පදය තෝරන්න ගිහිල්ල මෙහෙම තෝරනවා. **අතීතං පටිපදං නිස්සාය සුපටිපන්නො,**' ඒ කියන්නෙ සුපටිපන්න උජුපටිපන්න ආදී වචන යොදල තියෙන්නෙ ඒ උන්වහන්සේලාගේ අතීත ප්‍රතිපදාව. ඒ ප්‍රතිපදාව තුළින් ආවයි කියන එක පෙන්වන්න. **එහෙම නොවෙයි පින්වතුනි, වර්තමානයේ හික්මෙන නිසා. ඒ අතීත ප්‍රතිපදාව නොවෙයි. වර්තමානයේ.** බලන්න ඔය රතන සූත්‍රයේම තියෙන්නෙ,

**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන - නික්කාමිනො ගොතම සාසනම්හි**
**තෙ පත්තිපත්තා අමතං විගය්හ - ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා**

**යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන** - දැඩි මනසකින් ගෞතම ශාසනයෙහි කාය ජීවිත නිරපෙක්ෂව යම් කෙනෙක් හික්මෙනව නම් අන්න ඒ ගුණය තමයි එතන සත්‍යක්‍රියාවට ගත්තෙ. නැතිව අර මාර්ග ඵල කථාව නොවෙයි. නමුත් කාලාන්තරයක් තිස්සේ මේක ආපු නිසා **අපි පහසුවට කවුද අටදෙනා කියල ඇහුවහම සතරමග්ග සතරඵල සතරමග්ග සතරඵල මේක අටුවා යුගයේ ආපු ව්‍යවහාරයක්.** නමුත් බුදුරජාණන් වහන්සේ 'පටිපන්න' පදය යෙදුවෙ. 'ප්‍රතිපදාවටයි තැන දුන්නෙ, ඒ සුපටිපන්න ගාථාවෙන්, මේ කියාපු සච්ඡිකිරියාය පටිපන්නො' ආදී මේ නව දෙනාගේ කථාවේදීත් ඇත්ත වශයෙන් මේක විවාදයට භාජනය වෙන්න පුළුවන්. මම දන්නව බටහිර අය හාස්‍යයට ලක්කරනව, සමහරවිට, මේ කියාපු සිවුර කරේ එල්ලගෙන ඉන්න අයට දන්දීල කොහොමද ආනිසංස ලැබෙන්නේ. ඒ ටිකට තමයි අපි කිවුවෙ දෙපැත්ත කැපෙන ආයුධයක් වගේ. නමුත් සත්‍යය අරකයි. උන්වහන්සේලා එපමණකින්, **එපමණකින්** දායකයාට පිහිට

වෙනවා. 'දායකතො විසුජ්ඣති නො පටිග්ගාහකතො' බුදුරජාණන් වහන්සේ යම් හේතුවක් ඇතුවයි, ඔය කාසාවකණ්ඨ කථාව කිව්වට පස්සෙ දක්ඛිණා විසුද්ධියක් ගැන කිව්වෙ. ඒක හොඳ විවරණයක් වගෙයි. එතකොට අර හතර ආකාරයෙන් පළවෙනි ආකාරය මොකක්ද? දායක පක්ෂයෙන් පිරිසිදුයි, ඒ දානය. නමුත් ප්‍රතිග්‍රාහක පැත්තෙන් අපිරිසිඳුයි. නමුත් ආනිසංස සම්පන්නයි. අසංඛෙය්‍යයි. අප්පමෙය්‍යයි. ගණන් කරන්න බැහැ. 'කොපන වාදො' කිව්වෙ මේක සුළු දෙයක් නොවෙයි.

අපි මේව ප්‍රකාශ කරන්නේ 'දන් අදින කෙක්කක්' හැටියට නොවෙයි. පින්වතුනි. වැඩියෙන් දෙන්නෙයි කියන්න නොවෙයි. බුද්ධ වචනය මතු කරල ගන්න, අපි මේ වගේ දවසක ප්‍රකාශ කරන්නේ. ඇතැම් කෙනෙක් කියනවා වගේ 'දැන් රහතන් වහන්සේලාගේ කාලයත් ආර්‍ය පුද්ගලයන්ගේ කාලයත් ඉවරයි. දැන් අපි බලාගෙන ඉන්නේ අරකියාපු කාසාවකණ්ඨ යුගයයි. ඒ නිසා බය නැතුව දෙන්න.' එහෙම එකක් නොවෙයි. මෙතන තියෙන්නෙ. වී මල්ලෙ උපමාව සිහිපත් කරගන්න. ඒ සඟගුණය කොයිතරම් ශ්‍රේෂ්ඨද කියතොත් 'අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස' උත්තරීතර පිං කෙතේ ඇති ශක්තිය කොයිතරම්ද කියතොත් ඒකට උපකාර කරගන්න ඒ සංඝයා සිහිපත් කරන චීවරය. ඒකනෙ ඔය අෂ්ටපරිෂ්කාර - අපි ඒ කථා විශ්වාස කරනවා නම් බුදුරජාණන් වහන්සේට ඝටීකාර බ්‍රහ්මරාජයා ඒව ගෙනැල්ල පූජා කළා කියනව. කොටින්ම අබුද්ධෝත්පාද කාලවල තියෙන්නෙ තවුස් පිරිකර කථාවක්. ඔය කෙණ්ඩි වගේ දේවල්. බුදුරජාණන් වහන්සේ විතරයි සංඝයා වහන්සේලාට අෂ්ටපරිෂ්කාර අවම පරිෂ්කාර හැටියට අනුදැන වදාළේ. එතනයි ඔය වටිනාකම තියෙන්නේ. පහුකාලීනව නම් ඉතින් ඕව කියන්න හොඳ නැහැ. පහුකාලීනව අෂ්ටපරිෂ්කාර පූජාවේ නානා විධ ආනිසංස බොහොම අතිශයෝක්ති සහිතව කියන්න පටන් ගත්ත. නමුත් නියම හේතුව මේ අෂ්ටපරිෂ්කාර තමයි පැවිද්දට මූලික උපකාරය. ඒ නිසා තමයි යම් කෙනෙක් ඇවිල්ල පැවිද්ද ඉල්ලුවහම අහන්නෙ ඔබගේ පා සිවුරු සම්පූර්ණද? ඉතින් කොහොම හරි සොයාගෙන එන්න ඕනෙ ඒ ටික. එයින් පෙන්නුම් කරනව අෂ්ටපරිෂ්කාරයේ තියන වටිනාකම. මේ පින්වතුන් අෂ්ටපරිෂ්කාර පූජා කරණකොට හිතාගන්න තියෙන්නේ යම්කිසි කෙනෙකුට පැවිද්දට, මේ ශාසනයට එකතුවෙන්න මේ සඟ පිරිසට



එකතුවෙන්න උපකාරයක් වශයෙනුයි, මේ අෂ්ටපරිෂ්කාර පූජා කරන්නෙ කියල. මේකෙ ආනිසංස අපි අමුතුවෙන් නොකිව්වත් අන්න අර විදියට තේරුම් ගන්න ඕන.

එතකොට බුද්ධෝත්පාද කාලයෙ තමයි සංඝරත්නය පහළ වෙන්නෙ. සංඝරත්නයේ අවම පැවැත්මට හේතුවන එක තමයි අෂ්ටපරිෂ්කාර කියල කියන්නෙ. අතීතයේ හිටිය ශ්‍රේෂ්ඨ රහතන් වහන්සේලා, විශේෂයෙන්ම ධුතංගධාරී රහතන්වහන්සේලා ඔය අෂ්ටපරිෂ්කාරයෙන් සෑහීමකට පත්වුනා, ඒක තුළ අවශ්‍යතාවල් ඔක්කොම තියනව, නියම ධර්ම මාර්ගයෙ යනව නම්, ඊට අමතර දේවල් ලෝකෙ වැඩිවෙන්න වැඩිවෙන්න තමයි අෂ්ටපරිෂ්කාර දැන් 'අට පිරිකර' නොවෙයි හැට පිරිකර වෙලා. මේ දායක පින්වතුන් දන්නව අපට වැඩිය හොඳට ඔය පොඩි හාමුදුරුවරුන් ඉල්ලන දේ. බලන කොට 'අට පිරිකර' 'හැට පිරිකර' වෙලා. ඒ තරම් දේවල් වැඩිවෙලා. නමුත් අපි යටත් පිරිසෙයින් මේ සංකල්පයවත් තියාගන්න ඕන. අට පිරිකර හරියට පිරිනමන්න ඕන. ශාසන පරිහානියෙයි කියල ඒක නිකං ආවට ගියාට කළොත් එහෙම අන්න එතන දායක පක්ෂයෙන් නුසුදුසුවීමක්. අපි මේ කියන්නෙ, මේව දැන් කරන්නෙ නොයෙකුත් විදියෙ අනියම් පරමාර්ථ උඩ. ඒක තුළ අර කියාපු සංකේතයත් චීවර සංකේතයත් - ඔහොම ඔහොම ගිහිල්ල යම්කිසි විධියකින් අර ගිහි ඇඳුමක් පූජා කළොත් එහෙම අෂ්ටපරිෂ්කාර කියල එදාට සාසනේ ඉවරයි කියල හිතාගන්න. අපි යටත් පිරිසෙයින් ඒ සංකේතයවත් දකිනව නම්, හරියට සංකේතය ඉදිරිපත් කෙරෙනව නම්, ඒක තුළ අන්න ආර්‍ය සංඝරත්නය සිහිපත් වෙනව. ඒ සංකේත ශක්තිය තමයි අබුද්ධෝතපාද කාලවල පවා බලන්න ඉතින් අර හස්තිරාජයා අර පුද්ගලයා මරන්න තිබුන නමුත් මැරුවෙ නැහැ. අර සිවුරෙන් හිස වහගෙන හිටපු නිසා.

මේ කාලයේ නම් ඒ විදියෙ දේවල් අපට ඉතින් කියන්න ඕනෙ නැහැ. අන්තිම පරිහානි තත්ත්වයට වැටිල තියනව. ඒක හේතුවක් කරගන්න නරකයි. ඒක තුළ අකුසල් ඇතිකර ගන්න නරකයි. ඒ වෙනුවට ඥානවන්ත පින්වතා කරන්නේ ඒ චීවරය දැකල ඒක ගැන සොයන්න යන්නෙ නැහැ. මීට කලින් අපි කියාපු බණක ධර්ම දේශනාවක උග්ග

ගහපති හත්ථිගාමක කියන ඒ දායක පින්වතාගේ ශ්‍රේෂ්ඨ ගුණාංග වලින් එකක් තමයි (මේක අර කියපු විදියට නරකට පාවිච්චි කරන්න එපා) නමුත් ඒ දායක පින්වතාගේ ශ්‍රේෂ්ඨ ගුණයක් හැටියට කලින් දේශනාවක කිය උනා ඒ ශ්‍රේෂ්ඨ ගුණය ගැන. උග්ග ගහපති අනාගාමී බොහොම චිත්ත ශක්තීන් ඇති පින්වත් දායක මහත්මයෙක්. දානයට කලින්දා රාත්‍රියේ දෙවියො ඇවිල්ල කියනවයි ඔය වඩම්මවන්න බලාපොරොත්තුවෙන සංඝයා වහන්සේලා ගෙන් අහවල් සංඝයා වහන්සේ රහත්ය. අහවලා අනාගාමීය. ඔහොම කියාගෙන ගිහිල්ල අහවල් භික්ෂුව දුස්සීලය. එහෙමත් කියනව. නමුත් අර දායක මහත්මයා කියනවා විශිෂ්ට ගුණයක් හැටියට ''ඒක ඇහැව්වට මොකද, මම දානෙ බෙදන කොට වෙනසක් කළේ නැහැ. දානෙ බෙදන කොට වෙනසක් කළේ නැහැ. අරව ගැන හිතන්නෙ නැහැ, දායකයාගේ පැත්තෙන් ඒකයි. ඕව හොයන්න ගියොත් කෙළවරක් නැහැනෙ. කොහොමද දැනගන්නෙ සංඝයා වහන්සේලා ගැන' සංඝයාට අයිතියි සංඝයාගේ පිරිසිදු බව රකින එක. නමුත් අන්න ගිහි පින්වතාට ඒ විදියෙ එකක්, බුදුහාමුදුරුවො කියල තියෙන්නෙ ඒක අපි තෝරන්න ගියොත් අන්තිමට කෙළවරටම යනව. ඒක නිසා 'දායකතො විසුජ්ඣති' දායක පින්වතා ආර්ය සංඝරත්නය සිහිපත් කරගෙන පිරිසිදු සිතින් දානය පිරිනමනවා. ඒකයි අපි කිවුවෙ මේක දෙපැත්ත කැපෙනවයි කියල. **දායක පින්වතා දානය දීලා සුගතිගාමී වෙනවා. දානය වළඳලා දුස්සීල ගොත්‍රභූ කාසාවකණ්ඨ භික්ෂුව නිරයට යනව.** ඔන්න බුද්ධ වචනය හරි දෙපැත්තම. කොතැනකවත් පරස්පර විරෝධී බවක් නැහැ. එතන ප්‍රකාශ කළේ යථාර්ථයයි. ඒ නිසා මේ පින්වතුන් කල්පනා කරගන්න ඕනෙ.

ඉතින් මෙන්න මේවා අපි මේවගෙ දවසක කියන්නෙ කවුරු කවුරුත් දැන් ශාසන පරිහානිය ගැනයි කථාව. මේක ආයි ඉතින් ගොඩගන්න බැහැ. ඇතෙක් ලවාවත්. නමුත් අපි දන්නව අපට අසනීපයක් හැදෙනව. දොස්තරල නම් කියනව වැඩිකල් ජීවත් කරන්න බැහැ කියල. මොනතරම් වීර්යයක් යොදනවද? අරගෙන යනවා දොස්තර ළඟට බැරිනම් වෙද්දු ළඟට අරගෙන යනවා. නොයෙකුත් නොයෙකුත් දේ කරන්නෙ මොකද? එක දවසක් ජීවත් කරගන්න. මේ ශරීරය එක දවසක් ජීවත් කරගන්න. මොකටද? පස්කම් සැප විඳින්න. වෙන දේකට නොවේ. ලක්ෂගණන් ඔය කැලි පුරුද්ද ගන්න බයිපාස් ඔපරේෂන් ඒව මේව සඳහා



වියදම් කරනවා. ඒ මේ ශරීරය - ජීවිතය - ආරක්ෂා කරගන්න. **එතකොට ජීවිතය ආරක්ෂා කරගන්න එහෙම උත්සාහයක් යොදනව නම් ඇයි ශාසනය ගැන එහෙම හිතන්නෙ නැත්තෙ? මේක අනිත්‍යයි කියල අතහරිනවද?** අන්න ඒ කාරණය තමයි පින්වතුනි තේරුම් ගන්න ඕනෙ. අනිත්‍යතාව කියන එක සාධකයක් කරගන්න නරකයි. අනිත්‍ය වුනත් හරි, අපි ඒකට ඉඩ දුන්නොත්. ඒ වෙනුවට තියෙන්නෙ අපට පුළුවන් හැකි ශක්තියෙන් දායක පින්වතුන් දායක පැත්තෙන්, සංඝයා වහන්සේලා ඒ පැත්තෙන් - අන්න අර කියාපු බුදුරජාණන් වහන්සේ මතුකරල දුන්න සඟගුණ සුපටිපන්න උජුපටිපන්න ආදී සඟගුණත් ඒ එක්කම ආහුනෙය්‍ය පාහුනෙය්‍ය ආදී උන්වහන්සේලාගේ ගුණ සම්පත්තිය නිසා **මඟඵල නොවුණත් ප්‍රතිපදාවේ හික්මෙන එකම ඇති.** ඒකම ඇති. ප්‍රතිපදාවේ හරියට හික්මෙනව නම්. ඒක තුළ ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම ඒකාන්ත දෙයක්.

සඟගුණ පාඨයේ වටිනාකම අද වැනි දවසක මේ පින්වතුන් කල්පනා කරන්න ඕන. ත්‍රිවිධරත්නය බුද්ධරත්නය ධර්මරත්නය සංඝරත්නය එකිනෙක වෙන් කරන්න බැහැ. අපි ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කරල තියනව අෂ්ටාර්ය පුද්ගල සංඝරත්නය උපමා කරන්න පුළුවන් යම්කිසි වීදියක තියන පහන් කණු අටකට. හිතාගන්න ආර්ය අෂ්ටාංගික මාර්ගය වීදියක් කියල. මේකෙ යන්නෙ කොහොමද කියන ප්‍රශ්නය එනව. ධර්මය දේශනා කළහම මේ ධර්මය කොහොමද ප්‍රත්‍යක්ෂ කරගන්නේ කියන ප්‍රශ්නය කාටත් එනව. අන්න එතකොට තමයි, මේ ඉන්නේ රහතන් වහන්සේලා අනාගාමී - ඒ අතීතයේ විශේෂයෙන් බුද්ධකාලයේ ඒ මාර්ගයේ යාමට පහන් කණුවක් කියල කිව්වෙ ඒකයි. අන්න ඒ නිසාම තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙන්නෙ සසරින් මිදීමට උපකාරවන ධර්මයක්. පසේ බුදුරජාණන් වහන්සේ කෙනෙකුටවත් දේශනා කරන්න බැහැ. ඒ තරම් ගැඹුරු ධර්මයක්, අපි පෙන්නල දුන්න අපේ පටිච්චසමුප්පාද දේශනාවල. උන්වහන්සේලාගේ තියන ආත්මාර්ථකාමී බවක් නිසා නොවෙයි. **පසේ බුදුරජාණන් වහන්සේ කෙනෙකුට ලෝකයාට තේරෙන හැටියට මේ නිවන් මාර්ගය පෙන්නුම් කරන්න බැහැ. ඒ තරම් මහා පුදුම ධර්මයක්.** නමුත් තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ උන්වහන්සේගේ මහා පුදුම ප්‍රඥා ශක්තිය තුළින් ලෝකයාට ධර්මය දේශනා කළා. **ඒ ධර්මය ක්‍රියාත්මක කළ බවට සාධක තමයි සංඝයා වහන්සේලා. ඒකයි සංඝරත්නය කියන්නෙ.**

**ඒ රත්න තුනම එකකට එකක් සම්බන්ධයි. බුද්ධරත්නය නිසා ධර්මරත්නය පහළ උනා. ධර්මරත්නය නිසා සංඝරත්නය පහළ උනා.** ඒ ධර්මරත්නයේ ප්‍රායෝගික පක්ෂයයි සංඝරත්නයෙන් පෙන්නුම් කරන්නේ. අන්න ඒ ත්‍රිවිධ රත්නය. මේ පින්වතුන් කොතෙකුත් ඔය රතන සූත්‍රයේ මහා බලසම්පන්න භාවය ප්‍රකාශ කරනව. සජ්ඣායනා මාත්‍රයෙනුත් යම්කිසි ශක්තියක් යම්කිසි ආනිසංසයක් ප්‍රබල දේවල් පවා කරන්න පුළුවන් බව කොතෙන්දිත් අහන්න ලැබෙනව. මේවායේ යෙදෙන වචන පවා.

ඒකනෙ අපි කිව්වෙ වචන වරදවා පාවිච්චි කිරීම පවා - අපි අටුවාචාරීන් වහන්සේලාට දොස් කියනවාම නොවෙයි. බලන්න අර ගාථාව, බුද්ධ වචනයේ තියෙන්නෙ. 'යෙ පුග්ගලා අට්ඨ - සතම්පසත්ථා' නමුත් භාෂාව නොදන්නා අය හදාගන්නවා 'යෙ පුග්ගලා අට්ඨසතං' කියල. අටුවාචාරීන් වහන්සේලා මේක සනාථ කරනවා නම් ඒක ලොකු වරදක් නෙ. ඒකයි අපි කියන්නෙ. ඒ අර්ථ සම්පත්තිය - 'සාත්ථං සබ්‍යඤ්ජනං' මේ ධර්මය අර්ථ වශයෙනුත් ව්‍යඤ්ජන වශයෙනුත් තේරුම් ගන්න ඕන. එහෙම තේරුම් අරගෙන මේ ගාථා කියනව නම් කොයිතරම් ප්‍රබල ආනිශංස ලබාගන්න පුළුවන්ද? දැන් ඉතින් ඔය සද්දෙට විතරයි නේ අපි. කිවුවෙ. **සංගීතයක් බවට පත් වෙනවා පිරිත්, රතන සූත්‍ර ආදී සූත්‍ර පවා.** මොකද ඒ වචනවල අර්ථයකුත් නැහැ. ඔහෙ කියාගෙන යනවා. එපමණකින් අර ශබ්දයෙනුත් යම්කිසි ශක්තියක් තියෙන්න පුළුවන්. නමුත් හරි අවබෝධයෙන් මේ බුද්ධරත්නයේ ධර්මරත්නයේ සංඝරත්නයේ ගුණ පිළිබඳ අවබෝධයෙන් කියනවනම් ආයෙත් අපටත් කියන්න තියෙන්නේ ඒක අසංඛෙය්‍යයි අප්පමෙය්‍යයි, අප්‍රමාණ ආනිසංස තියනව. ඒකයි කිව්වෙ **'අග්ගෙ ඛො පන පසන්නානං අග්ගො විපාකො හොති'** කියල.

මේ පින්වතුන්ට අද වගේ වටිනා දවසක අපි මේ කාරණ කිවුවෙ හැම දෙනෙක්ම අපගෙන් අහන නිසයි. ඒවට උත්තරයක් දෙන්න ඕන. අපේ පොත පතේ තියන දේශනාවලදීත් අපි මේ අටුවාචාරීන් වහන්සේලාගේ අඩුපාඩුකම් පෙන්නුවට අපි පිළිගන්නව උන්වහන්සේලා අති ශ්‍රේෂ්ඨ අය.

ඒ භාණක ස්වාමීන් වහන්සේලා ඒවා ආරක්ෂා නොකළා නම් අපිට මේ ටික කියන්න ශක්තියක් නැහැ. නමුත් මොකක්දෝ හේතුවක් නිසා



ආචීර්ණ කල්පික දුර්වලතාවක් නිසා අතීතයේ ආචාර්‍යවරු කිවුව නිසා අපිත් මේවා පිළිගන්නවා කියල සමහරු ඒවා ප්‍රශ්න නොකර ඉතාමත්ම දුර්වල දේවල් පවා පිළිගන්න ස්වභාවයක් තියනවා. සංසයා වහන්සේලා කිවුවහම ගිහියනුත් ඒවා පිළිගන්නවා. ඒක ස්වාභාවිකයි. අන්න ඒ ටික හරිගස්සන්නයි අපි මේ යම් යම් දේවල් කිවුවෙ. විවේචන අදහසින් කියල හෙළා දැකීමට නොවේ. උන්වහන්සේලාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිගන්නා අතර යම් යම් අඩුපාඩුකම් පෙන්වල දෙන්න ඕනෙ.

අද දින මේ පින්වතුන් වෙනද වගේම තම තමන්ට අයිති ශීලයක් සමාදන් වෙලා බණ භාවනා ආදියේ යෙදෙන්න ඇති. මේ දේශනාවෙනුත් යමක් ගත හැකි නම් තමන්ගේ ඉදිරි කටයුතු සඳහා, ප්‍රතිපදාවේ හික්මීම සඳහා, ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා, ඒවා අරගෙන හැකිතාක් ඉක්මනින් අපි නිතරම කියනවා වගේ ශාසන පහන නිවෙන්න කලින් කියල. එහෙම කියන්න සිද්ධවෙන්නෙ මොකද අපට පෙනෙන්නෙ නම් ඒ වගේ ගමනක් යන්නේ. ඒ නිසා අප්‍රමාදය සඳහා මේ වචන කියන්නේ. මේක නිවේවා කියන ප්‍රාර්ථනාවෙන් නොවේ. ඇත්ත වශයෙන්ම ඒ ලකුණු අපට පේන නිසයි. ඒ නිසා මේ පින්වතුන්ට අයිතියි එයින් ප්‍රයෝජන ගැනීම. අද දින මේ දේශනාව උපකාර කරගෙන මේ පින්වතුන් මේ බලාපොරොත්තුවෙන උත්තමාර්ථයන්ට හැකිතාක් ඉක්මනින් ළඟාවීමට මේක බලයක් ශක්තියක් වේවා කියා ප්‍රාර්ථනා කරන අතර අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මෙම ධර්ම දේශනාමය ධර්මශ්‍රවණමය කුසලානිසංස අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන්වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමා මහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**'එත්තාවතා ච අම්හෙහි...''**

# 44 වන දේශනය

## 44 වන දේශනය (පහන් කණුව ධර්ම දේශනා අංක 142)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

1. ඉදං හි තං ජෙතවනං - ඉසිසඞ්ඝනිසෙවිතං
   ආවුත්ථං ධම්මරාජෙන - පීතිසඤ්ජනනං මම
2. කම්මං විජ්ජා ච ධම්මො ච - සීලං ජීවිතමුත්තමං
   එතෙන මච්චා සුජ්ඣන්ති - න ගොත්තෙන ධනෙනවා
3. තස්මාහි පණ්ඩිතො පොසො - සම්පස්සං අත්ථමත්තනො
   යොනිසො විචිනෙ ධම්මං - එවං තත්ථ විසුජ්ඣති
4. සාරිපුත්තොව පඤ්ඤාය - සීලෙන උපසමෙන ච
   යො හි පාරගතො භික්ඛු - එතාව පරමො සියා'

- අනාථපිණ්ඩිකොවාද සු. මජ්ඣිම නිකාය

සැදැහැවත් පින්වතුනි,

බුදුපියාණන් වහන්සේ ගේ ශ්‍රාවක දායක පිරිස අතර අනේපිඬු සිටුතුමා එතදග්ග තනතුර ලබාගත්තු ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. බුද්ධ කාලයේ හිටපු ගිහි ශ්‍රාවක නාමාවලියේ ''අ'' යන්න වෙන්නට තරම් වටිනා කෙනෙක්. ඒ අනේපිඬු සිටුතුමා ජීවිතය අවසානයේදී තුසිත දෙව්ලොව ඉපදිලා මධ්‍යම රාත්‍රියේදී බුදුරජාණන් වහන්සේ දකින්නට ජේතවනාරාමයට පැමිණිලා ප්‍රකාශ කළ ගාථා පෙළක් තමයි අද අපි තෝරා ගත්තේ මාතෘකාව හැටියට.

මේ ගාථා පෙළ දක්වෙන්නේ මජ්ඣිම නිකායේ අනාථ පිණ්ඩිකොවාද සූත්‍රයේ. ඒ සූත්‍රයේ විස්තර කෙරෙන්නේ අනේපිඬු සිටුතුමාගේ අවසාන මොහොතයි. අවසාන මොහොතේ අහන්න ලැබුණු ආසන්න බණ, අවසාන බණයි. ඒ සිද්ධිය මේ විදියට පෙන්නුම් කරනවා. ඒ සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවකම අනේපිඬු සිටුතුමා දැඩිසේ ගිලන් වෙලා රෝගාතුර වෙලා සේවක පුරුෂයකුට කියනවා ගිහිල්ලා භාග්‍යවතුන් වහන්සේට වන්දනා කරන්න. අනේපිඬු සිටු ගෘහපතියා භාග්‍යවතුන් වහන්සේගේ පා යුග



වඳිනවා කියලා මා වෙනුවෙන් වන්දනා කරලා ප්‍රකාශ කරන්න. අනේපිඬු ගෘහපතියා දැඩිව ගිලන්ව ඉන්නවා කියලා. ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ළඟටත් ගිහිල්ලා ඒ විදියට වන්දනා කරලා, මගේ නමින් වන්දනා කරලා සාරිපුත්ත ස්වාමීන් වහන්සේට කියන්න අනුකම්පා පෙරදැරිව අනේපිඬු ගෘහපතියාගේ නිවසට පැමිණෙන්න කියලා.

අර පුරුෂයා ඒ විදියට ගිහිල්ලා සාරිපුත්ත ස්වාමීන් වහන්සේට ඒ විදියට පණිවිඩය කිව්වහම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ පසු ගමන් කරන භික්ෂුව හැටියට එකතු කරගෙන අනේපිඬු සිටුතුමාගේ සිටු මැඳුරට පැමිණියා. පැමිණිලා අර සාමාන්‍ය සුවදුක් විමසීමේ රටාව අනුව, සූත්‍ර දේශනාවල කොතෙකුත් දක්වෙන ආකාරයට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අනේපිඬු සිටුතුමාගෙන් අහනවා ''කොහොමද, ගෘහපතිය දුක් වේදනා අඩු වෙනවද? වේදනා ඉවසිය හැකි තත්ත්වයක ඉන්නවාද? යැපිය හැකිද?'' ඔය විදියට. අනේපිඬු සිටුතුමා තමාගේ රෝගී අවස්ථාවේ බරපතලකම පවසනවා ''සාරිපුත්ත ස්වාමීනි, මට වේදනා අඩු වෙනවා නොවෙයි වැඩි වෙනවා. එන්න එන්නම වැඩි වෙනවා. මට යැපිය හැකි තත්ත්වයක්, ඉවසිය හැකි තත්ත්වයක් නැත. බරපතල වේදනා තත්ත්වයක් තියනවා'', වේදනාවල දුක්ඛ තත්වය ප්‍රකාශ කරනවා. හරියට ශක්තිමත් පුරුෂයෙක් තියුණු කඩුවකින් හිස පලන්නා වාගේ මගේ හිස රුදාව තියනවා, ඒ වගේම බලවත් පුරුෂයෙක් වර පටකින් හිස වෙලන්නා වාගේ මගේ වාත වේදනා හිසට දැනෙනවා. ඊළඟට දක්ෂ ගව ඝාතකයෙක් සැතකින් බඩ කපන්නා වාගේ වේදනාවක් දැනෙනවා. ඊළඟට කියනවා ශක්තිමත් පුරුෂයින් දෙදෙනෙක් දුර්වල මනුෂ්‍යයකුගේ අත් දෙකින් අල්ලාගෙන ගිනි වළක් ළඟට ගිහිල්ලා තවන්නා වාගේ දැඩි දාහයක් ශරීරයේ තියනවා කියලා, ඔය විදියට ප්‍රකාශ කළා.

ඒකට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දුන්නේ බෙහෙතක් නොවෙයි. ධර්ම ඖෂධයක්. එසේනම් ගෘහපතිය මෙන්න මේ විදියට හික්මෙන්න කියලා මෙන්න ධර්ම ඖෂධය සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ විදියටයි ප්‍රකාශ කරන්නේ. ''එසේනම් ගෘහපතිය මෙන්න මේ විදියට සිත යොදන්න ධර්මයේ, මම ඇස උපාදාන වශයෙන් නොගනිමි. උපාදාන

වශයෙන් නොගනිමි කියන්නේ ඇස දැඩිව අල්ලා නොගනිමි තණ්හාවෙන්, මගේ විඤ්ඤාණය ඇස ඇසුරුකොට නොතිබෙන්නේය. ඒ හික්මීම ඒ කියන්නේ ඇස උපාදාන වශයෙන් අල්ලා ගන්නෙත් නැහැ, මගේ විඤ්ඤාණය මගේ හිත ඇස අල්ලාගෙන ඇසුරු කොට නොතිබෙන්නේය. ඒ විදියට හික්මිය යුතුයි කියලා. ඊළඟට මේ පින්වතුන් දන්නවා මේ අධ්‍යාත්මික ආයතන හය, ඇස, කණ, නාසය, දිව, කය, මන ඒ හය ගැනමත් එක එකක් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා, ගෘහපතිය, ඔබ කණ දැඩිව උපාදාන වශයෙන් ග්‍රහණය කරන්න එපා. කණ ඇසුරුකොටගත් විඤ්ඤාණයක් මට නොවන්නේය කියලා එහෙම හික්මෙන්න. එහෙම, එහෙම කියාගන ගිහිල්ලා මනස පිළිබඳවත් ප්‍රකාශ කරනවා. මම මනස උපාදාන වශයෙන් අල්ලාගන්නේ නැත. මනස ඇසුරු කොටගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. ඔය විදියට ආධ්‍යාත්මික ආයතන හය ගැන ප්‍රකාශ කරලා, ඊළඟට බාහිර ආයතන හැටියට දක්වෙන ඒවායේ අරමුණු ගැනත් ඒ විදියටම කියනවා. මම රූපය උපාදාන වශයෙන් නොගනිමි. මගේ විඤ්ඤාණය රූපය ඇසුරු කොට නොසිටින්නේය. මම ශබ්දය උපාදාන වශයෙන් නොගනිමි. මගේ විඤ්ඤාණය ශබ්දය ඇසුරු කොට නොසිටින්නේය, ඔන්න ඔය විදියට හික්මෙන්න කියනවා. අන්තිමට කියනවා මනසට එන අරමුණු, ධර්මයේ දැක්වෙන්නේ 'ධම්මා' නමින්. ධම්ම කියන්නේ 'දේවල්', හිතට එන දේවල්, මම හිතට එන අරමුණු දැඩිව නොගනිමි. හිතට එන අරමුණු ඇසුරු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය කියලා ඔය විදියට ආධ්‍යාත්මික බාහිර ආයතන ගැන ප්‍රකාශ කරලා ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ හික්මිය යුතු ආකාරය දක්වනවා.

මම චක්ඛු විඤ්ඤාණය උපාදාන වශයෙන් නොගනිමි. ඇස පිළිබඳ විඤ්ඤාණය මගේ සිත චක්ඛු විඤ්ඤාණය ඇසුරු කොට නොසිටින්නේය, ඔය විදියටම සොත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය ජිව්හා විඤ්ඤාණය කාය විඤ්ඤාණය මනො විඤ්ඤාණය කියල කියන ඒ විඤ්ඤාණ හය පිළිබඳවත් එහෙම ප්‍රකාශ කරනවා, ඊළඟට විඤ්ඤාණය ගැන කිව්වට පස්සේ එන්නේ ස්පර්ශයනේ. ඒ ස්පර්ශය පිළිබඳවත් ප්‍රකාශ කරනවා. චක්ඛු සම්ඵස්සය, මම ඇස පිළිබඳ ඒ ස්පර්ශය දැඩි ලෙස ග්‍රහණය නොකරමි. ඇස පිළිබඳ ස්පර්ශය (චක්ඛු සම්ඵස්සය) ඇසුරු කොටගත් විඤ්ඤාණයක් මට නොවන්නේය, ඇස පිළිබඳ ස්පර්ශය ග්‍රහණය නොකරන්නෙමි. ඇස පිළිබඳ ස්පර්ශය නිශ්‍රය කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. එතකොට චක්ඛු විඤ්ඤාණය ගැන කිවුව වගේම, ඊළඟට චක්ඛු සම්ඵස්සය - ස්පර්ශයත් අල්ලගන්නෙ නෑ. ඒ විදියට චක්ඛු සම්ඵස්සය වගේම ඒ ස්පර්ශය නිසා ඇතිවන වේදනාව ගැන කියනවා. චක්ඛු සම්ඵස්සයෙන් ඇතිවන වේදනාව මම උපාදාන වශයෙන් ග්‍රහණය නොකරමි. චක්ඛු සම්ඵස්සයෙන් ඇතිවන වේදනාව ඇසුරු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. මේ විදියට කියාගන ගිහිල්ලා අන්තිමට මනො සම්ඵස්සය - හිතට සිතිවිලි වැදීම තුළින් ඇතිවන ස්පර්ශය තුළින් ඇතිවන වේදනාව මම ග්‍රහණය නොකරමි. ඒ වේදනාව ඇසුරු කොටගත් විඤ්ඤාණයක් මට නොවන්නේය කියලා ඔය විදියට සළායතන ආශ්‍රයෙන් ප්‍රකාශ කරලා එතනින් නවතින්නේ නැහැ. මේ අච්චර වේදනා තියනවා කියලා කියාපු අනේපිඬු සිටුතුමාට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දෙන බෙහෙතයි මේ.

ඊළඟට ප්‍රකාශ කරනවා මෙසේ හික්මිය යුතුයි කියලා, පියවර වශයෙන් කියලා, ඊළඟට ධාතු හය ගැන, ධර්මයේ සඳහන් වෙනවා සමහර විට මේ පින්වතුන් අහලත් නැතිව ඇති පඨවි, ආපො, තෙජො, වායො, ආකාස, විඤ්ඤාණ. බොහෝ දෙනා අහල ඇති ධාතු හතරක් ගැන, නමුත් ඇතැම් තැන්වල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මේ පුද්ගලයා 'පුරුෂයා' කියල කියන්නේ මෙන්න මේ ධාතු හයයි. මොන ධාතු හයක්ද? පඨවි, ආපො, තෙජො, වායො, ආකාස, විඤ්ඤාණ. ඔය ධාතු හයයි පුද්ගලයා කියලා අපි හඳුන්වන්නේ. අන්න ඒ ධාතු හය පිළිබඳවත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අර විදියට ප්‍රකාශ කරනවා, මම පඨවි ධාතුව උපාදාන වශයෙන් ග්‍රහණය නොකරමි. පඨවි ධාතුව ඇසුරුකරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. ආපො ධාතුව මම උපාදාන වශයෙන් ග්‍රහණය නොකරමි ආපො ධාතුව ඇසුරු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. ඔය විදියට කියලා පඨවි ආපො, තෙජො, වායො, ආකාස ධාතුව ගැනත් කියනවා, ආකාස ධාතුව මම උපාදාන වශයෙන් නොගනිමි. ආකාස ධාතුව ඇසුරු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. ඊළඟට අන්තිමට තේරුම් ගන්නත් අමාරුයි මම විඤ්ඤාණ ධාතුව උපාදාන වශයෙන් ග්‍රහණය නොකරමි. විඤ්ඤාණ ධාතුව ඇසුරු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. මේ මරණ

අවසථාව, මරණයට සූදානම් වෙන්න කියන හැටියටයි මේ කියන්නේ. ධාතු හය පිළිබඳවත් අර විදියට උපාදානය ඉවත් කිරීමටත් ''නිස්සය'' කියන වචනය එතන යෙදෙනවා. එය ඇසුරු කරගත් කියන තේරුමයි, 'උපාදාන', 'නිස්සය' කියන වචන දෙක මේ ධර්මයේ ඉතාම වැදගත් වචන දෙකක්. අපි ඒක යථා කාලයේදී විස්තර කරනවා.

ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පඤ්චඋපාදානස්කන්ධය ගැනත් ප්‍රකාශ කරනවා අර විදියටම. මම රූප උපාදානස්කන්ධය දෘෂ්ටි ග්‍රහණය නොකරමි. උපාදාන වශයෙන් මගේ සිත මගේ විඤ්ඤාණය රූප උපාදානස්කන්ධය ඇසුරු කර නොසිටින්නේය. ඒ වගේම වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය විඤ්ඤාණ උපාදානස්කන්ධය යන ඒ පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳවත් අර විදියට උපාදානයෙන් තොරව නිස්සයෙන් තොරව අනුපාදාන අනිස්සිත තත්ත්වය දියුණු කර ගන්නා ආකාරයේ කමටහනක් මේ සාරිපුත්ත සවාමීන් වහන්සේ දේශනා කළේ මහ ගැඹුරු කමටහනක්.

එතනින් ඉවර කළේ නැහැ. ඊළඟට කියනවා අරූප ධ්‍යාන පිළිබඳව මම ආකාසනඤ්චායතනය කියන අරූප ධ්‍යානය උපාදාන වශයෙන් අල්ලා ගන්නේ නැත. මගේ සිත ආකාසනඤ්චායතනය ඇසුරු කර නොසිටින්නේය. ඒ වගේම විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනය, කියන අරූප ධ්‍යාන තත්ත්වයන් මම උපාදාන වශයෙන් ගන්නේ නැත. අන්තිමට කෙනෙකුට හිතෙන් අල්ලා ගන්න පුළුවන් යම්තාක් දෙයක් ඇත්නම් ඒ ඔක්කොම අල්ලලා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අවසාන බෙහෙත හැටියට දෙන්නේ. මම මෙලොව උපාදාන වශයෙන් අල්ලා නොගන්නෙමි. මගේ විඤ්ඤාණය මෙලොව ඇසුරු කර නොසිටින්නේය. මම පරලොව උපාදාන වශයෙන් අල්ලා නොගන්නෙමි. මගේ සිත පරලොව ඇසුරු කර නොසිටින්නේය. එතකොට මෙලොවත් නැහැ. පරලොවත් නැහැ. ඊළඟට ප්‍රකාශ කරනවා, ඒවායේ පාලි වචන කියනවා, දිට්ඨ සුත, මුත, විඤ්ඤාත මේ පාලි වචන තියෙන්නේ ධර්මයේ සළායතනයන්ගෙන් ගන්නා අරමුණු කෙටි කරනවා හතරකට, සමහර අවසථාවල, දිට්ඨ කියල කියන්නේ දුටු, සුත කියල කියන්නේ ඇසූ, මුත



කියල කියන්නේ නහයට දිවට කයට දැනුනු, ඒ තුනම එකක් හැටියට අරගෙන, විඤ්ඤාත කියල කියන්නේ හිතට දැනුනු සිතිවිලි. එතකොට දිට්ඨ සුත, මුත, විඤ්ඤාත, එපමණක් නොවෙයි' පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සිතෙන් සොයා බලා පැමිණ විමසා බලන ලද යම්තාක් දෙයක් තිබෙනවාද, යම්තාක් අරමුණු සිතෙන් ගන්න පුළුවන් නම් ඒ කිසිවක් මම උපාදාන වශයෙන් අල්ලා ගන්නේ නැහැ. ඒ කිසිවක් අරමුණු කරගත් විඤ්ඤාණයක් මට නොවන්නේය. එතකොට කෙලින්ම නිවනටයි යොමු කරන්නේ. මෙලොවත් නැහැ පරලොවත් නැහැ. අර සිතට එන අරමුණු ඔක්කොම ඒ එකක් වත් මේ මරණ අවසථාවේ උපාදාන වශයෙන් ගන්න එපාය, ඒවා නිශ්‍රය කරගත් විඤ්ඤාණයක් පවත්වන්න එපාය, කියන උපදේශයයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ දෙන්නෙ. මේක හරියට කොටින්ම කියතොත් සමහර වෙද්දු අමාරු අවසථාවේ දෙනවනෙ 'සින්දූරම්' අන්න ඒ වගේ බෙහෙතක් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දෙන්නේ ගැඹුරුම ධර්ම ඖෂධයක් මේ දෙන්නේ.

ඉතින් මේ දේශනාව ඉවර වෙන කොට අනේපිඩු සිටුතුමා අඬන්න පටන් ගත්තා. කඳුළු වගුරුවන්න පටන් ගත්තා. ආනන්ද ස්වාමීන් වහන්සේ හිතුවා මරණ භය නිසා මේ අඬනවා කියලා. මොකද ගෘහපතිය එතන වචනයක් තියනවා 'කිඳාබසිනවා' කියලා මොකද මේ ඔබ මරණයට පසු බානවද ඒ නිසාද මේ අඬන්නේ. ඔන්න ඊළඟට කියනවා නෑ නෑ ස්වාමීනි මම ශාස්තෲන් වහන්සේත් සිත වැඩීමට උපකාර වන්නා වූ ඒ සංඝයා වහන්සේලාත් මෙච්චර කාලයක් මම ඇසුරු කළා. නමුත් මට මේ වගේ බණක් අහන්න ලැබුණේ නැහැ කියලා ප්‍රකාශ කළහම ඔන්න එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා ඒ වගේ දේශනා නොකරන්න හේතුව. ගෘහපතිය අපට, සුදු වස්ත්‍ර ඇඳ සිටින ගිහියන්ට මේ වගේ දේශනා වැටහෙන්නේ නැත. ඒ කියන්නේ සුදු වස්ත්‍ර ඇඳගෙන ඉන්න ගිහියන් ගතකරන ජීවිතය දක්කහම අපට මේ වගේ දේශනා කරන්ට හිතෙන්නේ නැත. මේ විදියේ දේශනා අපට කරන්න හිතෙන්නේ පැවිද්දන්ටය. ඒ වෙනුවෙන්ම වෙන් වෙච්ච අයටය කියලා. එහෙම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කිව්වහම අනේපිඩු සිටාණන් අන්න විශේෂ ආරාධනාවක් කරනවා. හරියට අර බ්‍රහ්මාරාධනාව වගේ ආරාධනාවක් කරනවා ගිහියන් වෙනුවෙන්, මොකක්ද ඒ ආරාධනාව, එසේනම්

සාරිපුත්ත ස්වාමීන් වහන්ස, ගිහියන්ටද මෙවැනි ධර්මදේශනා වැටහේවා. ඒ ගිහි පින්වතුන් අතරත් ඉන්න පුළුවන් කෙලෙස් රජස් කෙලෙස් ධූවිලි අඩු ගිහියන්. ඔවුන්ට මෙවැනි ධර්ම දේශනා අහන්ට නොලැබීමෙන් පරිහානියට පත්වෙන්න පුළුවන් කියලා ඔන්න ආරාධනාවක් කළා. මේ වගේ ගැඹුරු දේශනා ගිහියන්ටත් මින් පස්සේ දේශනා කරන්ට කියලා අනේපිඬු සිටාණන්ගේ අවසාන ඉල්ලීම කළා. ඉතින් සාරිපුත්ත ස්වාමීන් වහන්සේත්, ආනන්ද හාමුදුරුවෝත් ආපසු වැඩම කළා. පිටත් වෙලා නොබෝ වේලාවකින් අනේපිඬු සිටාණෝ කළුරිය කරලා තුසිත දෙව්ලොව උපන්නා. ඉපදිලා එදා රාත්‍රියේ බුදුරජාණන් වහන්සේ දකින්න ආව. දැන් මේ පින්වතුන් කොතෙකුත් ඔය පිරිත් දේශනාවල පළමුවෙන් කියවෙන්නේ ජේතවනාරාමයට දේවතාවෙක් ඇවිල්ලා හිටගන බුදුරජාණන් වහන්සේට මෙන්න මෙහෙම ප්‍රකාශ කළා කියලා. දැන් මේ එන්නේ කවුද? අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා. අර විදියට ආලෝකයක් ඇතිව ඇවිල්ලා බුදුහාමුදුරුවන්ට වන්දනා කරලා ඔන්න ඒ ප්‍රකාශ කළ ගාථා ටික තමයි අපි අර මාතෘකාව හැටියට මේ අවසථාවේ මේ පින්වතුන්ට දේශනා කළේ.

දැන් ඒකෙ අර්ථය අපි බලමු.

**ඉදං හි තං ජේතවනං - ඉසි සඞ්ඝනිසෙවිතං**
**ආවුත්ථං ධම්ම රාජෙන - පීතිසඤ්ජනනං මම**

මේ ජේතවනය ''ඉසිසඞ්ඝනිසෙවිතං'' කියන්නේ සංඝයා වහන්සේලා වැඩ වාසය කරන මේ ජේතවනය ''ආවුත්ථං ධම්මරාජෙන'' ධර්ම රාජ වූ බුදුරජාණන් වහන්සේ වැඩ වාසය කරන මේ ජේතවනය ''පීති සඤ්ජනනං මම'' මට ප්‍රීතිය උපදවනවා. ඒ විදියට ප්‍රකාශ කරලා ඊළඟට කියනවා

**කම්මං විජ්ජා ච ධම්මො ච - සීලං ජීවිතමුත්තමං**
**එතෙන මච්චා සුජ්ඣන්ති - න ගොත්තෙන ධනෙන වා**

කර්මය - එතන අපට හිතාගන්න තියෙන්නේ කුසල කර්මය. බොහොම කෙටියෙන් මේ ගාථාවේ තියෙන්නේ එතන නා නා අර්ථ මතුවෙන්න ඉඩ තියනවා. අපට හිතාගන්න තියෙන්නේ කුසල කර්මය විජ්ජා කියල කියන්නේ අවබෝධය ඥානය, සම්‍යක් දෘෂ්ටිය ආදිය ගැනෙනවා ධම්මො



ච ධර්මය, කර්මය, විද්‍යාව ධර්මය ''සීලං ජීවිතමුත්තමං'' ශීලය අනුව ගිය ජීවිතය මේවයි උතුම් දේවල්. ''එතෙන මච්චා සුජ්ඣන්ති'' මනුෂ්‍යයෝ පිරිසිදු වන්නේ මේවායින්. ''න ගොත්තෙන, ධනෙන වා'' ගෝත්‍රයෙන් වත් ධනයෙන් වත් නොවේ. ''තස්මාහි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො'' ඒ නිසා පණ්ඩිත පුරුෂයා තමාගේ යහපත ගැන සොයන්නේ, යහපත දකින්නේ ''යොනිසො විචිනෙ ධම්මං එවං තත්ථ විසුජ්ඣති'' යොනිසො විචිනෙ ධම්මං කියල තියෙන්නේ ධම්ම විචය සම්බොජ්ඣංගයට අදාළ එකක්, ඒ කියන්නේ නුවණින් ධර්මයන් පිරික්සන්නේය, ධර්මයන් විමසා බලන්නේය. ඒකට තමයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අර කාරණා අවසාන බණෙන් ධර්මය පිළිබඳව ප්‍රකාශ කරල තියෙන්නේ. එතකොට අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා මෙතන කියනවා පුද්ගලයා නුවණින් ධර්ම කාරණා විග්‍රහ කරල විමසලා බලන්නේය. ''එවං තත්ථ විසුජ්ඣති'' ඒ විදියටයි සත්ත්වයා විසුද්ධිය ලබන්නේ. ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පිළිබඳ ප්‍රශංසාවක්.

**සාරිපුත්තොව පඤ්ඤාය - සීලෙන උපසමෙන ච**
**යො පි පාරගතො භික්ඛු - එතාව පරමො සියා'ති**

යම් කෙනෙක් යම් භික්ෂුවක් නියම පරතෙරට යනවා නම් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ තමයි මේ කියාපු කාරණාවලින් අග්‍ර. ඒ තත්ත්වයට වඩා ඉහළට යන්න බෑ කියන එකයි. 'සාරිපුත්තොව පඤ්ඤාය සීලෙන උපසමෙන ච' ප්‍රඥාවෙන්, සීලයෙන්, උපශාන්ත බවින් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ තමයි ඒ පරතෙරට ගිය භික්ෂූන් අතර අග්‍ර කියන එකයි ඒ ගාථාවෙන් ප්‍රකාශ වෙන්නේ. බුදුරජාණන් වහන්සේ ඒක අනුමත කළා. ඊළඟට අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා ඒ ගාථා ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේට වැඳල පැදකුණු කරල අතුරුදහන් වුනා.

පස්සෙන්දා උදෑසන බුදුරජාණන් වහන්සේ සංඝයා වහන්සේලා අමතලා කියනවා මහණෙනි, ඊයේ රාත්‍රියේ එක්තරා දිව්‍ය පුත්‍රයෙක් - එක්තරා කියලයි කිව්වෙ - මට මෙන්න මෙහෙම වන්දනා කරලා මේ විදියට ගාථා පෙළක් කියලා නික්ම ගියා කියලා කිව්වා. එතකොට ආනන්ද ස්වාමීන් වහන්සේ කියනවා ස්වාමීනි එකත් එකටම ඔය අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා වෙන්න ඇති. මොකද අනාථ පිණ්ඩික ගෘහපතියා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ගැන බොහොම විශේෂ පැහැදීමක් ඇතිවයි සිටියේ. බුදුරජාණන් වහන්සේ ඒක එහෙමයි කියලා ප්‍රකාශ කරනවා. එතනින් ඒ සූත්‍ර දේශනාව අවසානයි.

ඉතින් දැන් මේ පින්වතුන්ට අනේපිඬු සිටුතුමා කියන කොට එක පාරටම මතක් වෙන්නේ දාන කථා. නමුත් කොයි විදියේ කෙනෙක්ද කියල දැන් හිතාගන්න පුළුවන්. අනේපිඬු සිටුතුමා මහා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක්. මේ ගිහි පින්වතුන්ගේ සංකල්පය ඇත්ත වශයෙන් මේ යුගයේ විශේෂයෙන්ම ගිහි ජීවිතය ගත කරන අය සමහර විට විදර්ශනා බණ භාවනා ආදිය ගැන උපේක්ෂා වෙනවා. නමුත් අනේපිඬු සිටුතුමා කළ ආරාධනාව අනුවයි අපෙත් මේ විදර්ශනා බණ, මේ පින්වතුන්ට මේ බණෙන් යමක් ලැබෙනවා නම් එය අනුමෝදන් කරන්න වටිනවා අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයාට තුසිත දෙව්ලොව. අපට හිතාගන්න පුළුවන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ අවසාන අවස්ථාවේදී මේ තරම් ගැඹුරු දේශනාවක් අනේපිඬු සිටුතුමාට ප්‍රකාශ කළේ මක්නිසාද කියලා. අනේපිඬු සිටුතුමාගේ ජීවිතයේ සැඟවුන පැත්තක් අපි මතු කරල ගත්තොත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ වගේ ගැඹුරු දේශනාවක් ඉදිරිපත් කිරීමට හේතුව සළකාගන්න පුළුවන්.

මේ පින්වතුන් කොතෙකුත් අහල තියනවා. අනේපිඬු සිටුතුමා මේ ජේතවනාරාමය මිලදී ගත් හැටි. ජේත කුමාරයා කහවණු මේකෙ අතුරලා මිසක් දෙන්නෙ නැහැ කියලා ප්‍රකාශ කළහම අනේපිඬු සිටාණන් ''එහෙනම් ගත්ත තමයි. ඔය මිලට ගත්ත'' කියල ඒ මොහොතෙම - ආයෙ සිතුවිලි දෙකක් නැහැ. රන් කාසි අතුරවලා ඒ කියාපු විදියටම කරත්තවලින් රත්තරන් කාසි ගෙනල්ලා පුරවලා ජේතවනාරාම භූමිය පුරා අතුරලා ඒක මිලට ගත්තා කියන එක මේ පින්වතුන් කවුරුත් දන්නවා. කොයි තරම් අත හැරීමේ ශක්තියක් අනේපිඬු සිටුතුමා තුළ තියෙන්න ඇද්ද? ඒ වගේම ඒකට ජේතවනාරාමය කියන නම තමන්ගේ නම නොවෙයි යෙදුවේ. ව්‍යවහාරයට ආවා 'අනාථ පිණ්ඩිකස්ස ආරාම' කියලා නමුත් නම ජේතවනයයි. ජේත කුමාරයා අවසානයේ ඒ සද්ධාව දැකලා ඉන් කොටසක් අවසානයේ ඉල්ලාගෙන. නමුත් ඒ වෙනකොට ජේතවනාරාම භූමිය රන් කහවණු වලින් පුරවලා ඉවරයි. ඉතින් ඒ එක පැත්තක්.

ඒ වගේම තමයි අනේපිඬු සිටාණන් තමන්ගේ නිවසේ නිතිපතා සිය ගණන් බුද්ධ ප්‍රමුඛ සංඝයා වහන්සේලාට දන් දෙමින් ඉඳලා. අන්තිමට



ඒ වගේම තමන්ගේ අය කැමියන් ආදායම් වශයෙන් තිබුන ණයකාරයන් පස්සේ එළවගෙන ගියේ නැහැ. කොහොම කොහොම හරි ක්‍රම ක්‍රමයෙන් තමාගේ ධනය පරිහානියට පත්වෙලා, අන්තිමට එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ අහනවා අනේපිඬු සිටානන්ගෙන් කොහොමද සිටාණෙනි, ගෙදර තාම දානෙ දෙනවද? එසේය. ස්වාමීනි කාඩි හොද්දයි නිවුඩු හාලෙ බතයි **කාඩි හොද්දයි. නිවුඩු හාලෙ බතයි.** ඒ තත්ත්වයට බැහැලත් ඒත් දන් දෙනවා. **කොයි තරම් පුදුම උපේක්ෂාවක්ද? කොයිතරම් පුදුම පරිත්‍යාගශීලීත්වයක් ද? අත හැරීමේ ශක්තියක්ද? එතනම අනාත්ම දර්ශනයයි ඒ තුළ තියෙන්නේ, මමය මගේය කියල දෙයක් නැහැ. තෙරුවන් විෂයයෙහි ඔක්කොම අත හැරියා,** අන්න ඒ ක්‍රියාව.

ඒ පැත්ත වගේම අනේපිඬු සිටාණන්ගේ ඥාන ශක්තිය හෙළිවෙන එක්තරා ප්‍රවෘත්තියක් අඞ්ගුත්තර නිකායේ දසක නිපාතයේ උපාලි වග්ගයේ ''**කිං දිට්ඨික**'' **සූත්‍රයේ** සඳහන් වෙනවා, බලන්න ඕන නම්. මේ අනාථ පිණ්ඩික සිටුවරයා එක දවසක්දා මද්දහන වේලාවේ බුදුරජාණන් වහන්සේ දකින්ට යන්ට පිටත් වෙලා ටික දුරක් යනකොට හිතුවා මේ වේලාව හොඳ නැහැ භාග්‍යවතුන් වහන්සේ විවේකීව වැඩ සිටින, සංඝයා වහන්සේලාත් විවේකීව වැඩ සිටින, භාවනානුයෝගීව වැඩ සිටින වේලාව කියලා ටිකක් පරක්කු වෙලා යන්න ඕන කියලා. යන්න ඕන මම තීර්ථකාරාමයට කියලා ඒ ළඟ තිබුන අන්‍ය තීර්ථක ආරාමයකට ගියා. එතන බොහෝවිට සඳහන් වෙනවා, ඇතදීම දැකලා බුද්ධ ශ්‍රාවකයෙක් එනව කියලා, ඒ අය පිරිස නිහඬ කළාට පස්සේ අනේපිඬු සිටුතුමා ගිහිල්ලා සතුටු සාමීචි කථා කළාට පස්සේ මේ තීර්ථකයෙක් අහනවා, ගෘහපතිය, කියන්න බලන්න ඔය ශ්‍රමණ ගෞතමයන්ගේ දෘෂ්ටිය මොකක්ද කියලා. එතකොට අනේපිඬු සිටුතුමා පිළිතුරු දෙනවා ස්වාමීනි, ස්වාමීනි කියල ආමන්ත්‍රණය කරන්නේ මේ තීර්ථක එක්තරා විදියක ශ්‍රමණයෙක් නේ, ස්වාමීනි මම දන්නෙ නැහැ භාග්‍යවතුන් වහන්සේගේ දෘෂ්ටි මොනවද කියලා. සම්පූර්ණයෙන් මම දන්නේ නැහැ. හොඳයි එහෙනම් ඔබ ශ්‍රමණ ගෞතමයන්ගේ දෘෂ්ටිය දන්නේ නැහැ. කියන්න එහෙනම් සංඝයා වහන්සේලාගේ, භික්ෂූන් වහන්සේලාගේ දෘෂ්ටිය මොකක්ද කියලා. එතකොට අනේපිඬු සිටුතුමා කියනවා, ස්වාමීනි මම ඔක්කොම භික්ෂූන් වහන්සේලාගේ දෘෂ්ටි මොකක්ද කියල දන්නෙත් නැහැ. හොඳයි,

එහෙනම් ගෘහපතිය ඔබ ශ්‍රමණ ගෞතමයන්ගේ දෘෂ්ටිය දන්නෙත් නැහැ. ඒ භික්ෂූන් වහන්සේලාගේ දෘෂ්ටිය දන්නෙත් නැහැ. කියන්න බලන්න ඔබේ දෘෂ්ටිය මොකක්ද කියල. ඔන්න එතකොට අනේපිඬු සිටුතුමා කියනවා මගේ දෘෂ්ටිය මොකක්ද කියල මට අමාරු නැහැ කියන්න. නමුත් ඉස්සෙල්ලා ඔබ වහන්සේලා ඔබ වහන්සේලාගේ දෘෂ්ටි කියන්න කියලා ඔන්න ආරාධනා කළා. එතකොට ඒ පරිබ්‍රාජකයෝ එක එක්කෙනා තම තමන්ගේ දෘෂ්ටි කියනවා. ඒවා නිතර ධර්මයේ සඳහන් වෙනවා. දස අව්‍යාකත වස්තු කියලා ඒ ප්‍රශ්නවලට කියන්නේ. මෙහෙමයි දක්වන්නේ ඔන්න එක්කෙනෙක් කියනවා මගේ දෘෂ්ටිය මේකයි, 'ලෝකය ශාස්වතයි', ශාස්වත කියන්නේ සදාකාලිකයි. මේකම සත්‍යයි අනික් සියල්ලම බොරු ඒකයි මගේ දෘෂ්ටිය. ඊළඟට දෙවැන්නෙක් කියනවා මගේ දෘෂ්ටිය 'ලෝකය අශාස්වතයි' ලෝකය සදාකාලික නොවේ. ඒකයි මගේ දෘෂ්ටිය අනිත් සියල්ලම බොරු. ඔය විදියට ලෝකයේ කෙළවරක් ඇත. කෙළවරක් නැත. ආත්මයත් ශරීරයත් එකක්ය. ආත්මය වෙන එකක්ය. ශරීරය වෙන එකක්ය. ඔය දසවත්ථුක කාරණාවලට අහුවෙන දේවල් මේ කෙටියෙන් කියන්නේ. ඊළඟට අනිත් හතර තමයි තථාගතවරයා - යම් ශාසනයක උතුම්ම තත්ත්වයට පත්වෙච්ච පුද්ගලයා. මරණින් මතු වෙයි. මරණින් මතු ඉන්නවා. තව කෙනෙක් කියනවා මරණින් මතු නොවෙයි කියන එකයි මගේ දෘෂ්ටිය. තව කෙනෙක් කියනවා මරණින් මතු වෙයි සහ නොවෙයි. අන්තිම එක්කෙනා කියනවා මරණින් මතු වෙයිත් නොවෙයි නොවෙයිත් නොවෙයි කියලා. ඔය ධර්මයේ නිතර සඳහන් වෙන දෘෂ්ටි. ඔය දෘෂ්ටි තමයි බොහෝවිට බුදුරජාණන් වහන්සේටත් ඉදිරිපත් කළේ. දැන් මෙතන මේ දෘෂ්ටි ගත් අය ඒ ඒ දෘෂ්ටි ප්‍රකාශ කළා.

ඔන්න එතකොට අනේපිඬු සිටුතුමා කියනවා ඔබ වහන්සේලාගේ දෘෂ්ටි ඉදිරිපත් කළා. ඔබ වහන්සේලාගෙන් යම් කෙනෙක් කිව්වා නම් ලෝකය ශාස්වතයි, මෙය පමණක් සත්‍යයයි අනික් සියල්ල බොරුයි කියලා, ඒ දෘෂ්ටිය තමන්ගේම අයෝනිසෝ මනසිකාරයයි කියන වැරදි මෙනෙහි කිරීමෙන් උපන් එකක්. එහෙම නැත්නම් වෙන කෙනෙකුට කන්දීල හදාගත්තු පරතෝඝෝෂ වශයෙන් අනුන්ගෙන් අසාගෙන දැනගත්තු එකක්, ඒ හැම එකක්ම අනිත්‍යයි, සංඛතයි, හිතින් ගොතා ගත්තු එකක්, චේතයිතයි. හිතින් ගොතාගත්තු සංකල්පයක් පමණයි.



පටිච්චසමුප්පන්නයි. ඒ හැම එකක්ම අනිත්‍යයි, ඒ අනිත්‍ය වූ සකස් කර ගන්නා ලද්දා වූ එවැනි දෘෂ්ටියකුයි ඔබ අල්ලාගන ඉන්නේ. දුක් සහිත දෙයකුයි ඔබ අල්ලාගන ඉන්නේ. ඒ විදියට අර දහදෙනාගේම දෘෂ්ටි අනේපිඬු සිටුතුමා ප්‍රතික්ෂේප කළා. හැම එකක්ම සංඛතයි, අනිත්‍යයි, පටිච්චසමුප්පන්නයි දුක් සහිත දේවල්ය කියලා.

ඔන්න එහෙම ප්‍රකාශ කළාට පස්සෙ අර පරිබ්‍රාජකයින් කියනවා එහෙනම් කියන්න බලන්න ගෘහපතිය ඔබේ දෘෂ්ටිය මොකක්ද කියලා. එතකොට අනේපිඬු සිටුතුමාගේ වාරය ආවා. අනේපිඬු සිටුතුමා ඔන්න ප්‍රකාශ කරනවා. යමක් යම්තාක් ලෝකයේ තියනවා නම් පටිච්චසමුප්පන්න හේතු ප්‍රත්‍යයන්ගෙන් උපන්නා වූ චේතයිත සංඛත, සංඛත කියල කියන්නේ සංස්කාරයන්ගෙන් සකස් කරගන්න යම්තාක් දෙයක් තියනවා නම් ඒ හැම දෙයක්ම අනිත්‍යයි, දුක්ඛයි, ඒ හැම දෙයක්ම මම අනාත්ම වශයෙන් දකිනවා. ඒ එකක් වත් මම 'එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා' කියලා අල්ලා ගන්නේ නැත. මේ මගේය මේ මම වෙමි, මේ මගේ ආතමයයි කියලා මම මේ එකක් වත් අල්ලා ගන්නේ නැත. ඔන්න එතකොට එහෙම කිව්වහම, කියනවා එහෙනම් ගෘහපතිය ඔබගේ දෘෂ්ටිය මේකද, ඔය කියන එකද දෘෂ්ටිය? ඔන්න තව ටිකක් පැහැදිලි කරනවා ඒකත් නොවෙයි මගේ දෘෂ්ටිය. මම සම්‍යක් ප්‍රඥාවෙන් ප්‍රත්‍යක්ෂ කරගෙන තියනවා හැම දෙයක්ම, සංඛත වූ හැම දෙයක්ම, පටිච්චසමුප්පන්න හැම දෙයක්ම අනිත්‍යයි, ගෙවීයන ස්වභාවයකින් යුක්තයි කියලා මම ප්‍රත්‍යක්ෂ කරගෙන තියනවා. මීටත් වඩා ඉහළ විමුක්තියක් නිස්සරණයක් ඒ කියන්නේ නිවන මම අත් දැකල තියනවා. ඒ කියන්නේ සෝවාන් කෙනෙක් හැටියටයි මේ උත්තර දෙන්නේ. සම්මා දිට්ඨියේ පිහිටලා අර කියාපු මිථ්‍යා දෘෂ්ටියේ නොවෙයි. සම්මා දිට්ඨියේ පිහිටලා. ඉතින් ඔය පිළිතුර දුන්නට පස්සේ, එතන සඳහන් වෙනවා අර පරිබ්‍රාජකයින් ඒ අයට කටඋත්තර නැතිවුනා කියලා. ඒ වගේ තත්ත්වයක් ඔවුන් බිම බලාගෙන බොහොම නිශ්ශබ්ද වෙලා නිහඬ වෙලා තමන්ගේ පරාජය පිළිඅරගෙන සිටියා.

අනේපිඬු සිටුතුමා පිටත් වෙලා ගිහිල්ලා බුදුරජාණන් වහන්සේට මේ ප්‍රවෘත්තිය ප්‍රකාශ කර හිටියා. කියනවා මගෙන් මෙහෙම

පරිබ්‍රාජකයින් මේ විදියට ප්‍රශ්න ඇහුවා. මම මේ විදියට කිව්වා. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ''සාධු, සාධු, බොහොම හොඳයි ගෘහපතිය ඔන්න ඔය මෝඝ පුරුෂයින්ට විටින් විට නිග්‍රහ කරන්න ඕන ඔය විදියට'' කියලා සිටාණන්ට එතෙන්දී ප්‍රශංසා කළා. මේ සිටාණන් වැඳලා නික්ම ගියාට පස්සේ සංඝයා වහන්සේලා අමතා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, ''**මහණෙනි, උපසම්පදාවෙන් අවුරුදු සියයක් ඇති භික්ෂුවක් ඒ කියන්නේ වස් සියයක් ඇති භික්ෂුවක් වුනත් අර තීර්ථකයින්ට පිළිතුරු දිය යුත්තේ ඔන්න ඔය අනාථ පිණ්ඩික සිටුතුමා පිළිතුරු දුන් ආකාරයටය**'' කියලා. කොහොමද වැඩේ, එතකොට අනේපිඬු සිටුතුමා අපි මේ දානපතියෙක් හැටියට සළකනවා අර පරිබ්‍රාජකයින් නිහඬ කරන්න පුළුවන් තරම් ධර්මානුකූලව මේ ධර්මය ඉදිරිපත් කරන්න, අවුරුදු සියයක් ශාසනයේ සිටි භික්ෂුවකගේ තරම් දක්ෂකමක් ඇති කෙනෙක් හැටියට බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටාණන්ව හැඳින්නුවේ ඒ අවස්ථාවේ.

අපට හිතාගන්න පුළුවන් අනේපිඬු සිටුතුමා සෝවාන් තත්ත්වය පමණක් ලබා සිටි නමුත් එතුමාගේ අනාත්ම දර්ශනය, දැන් මෙතනත් කියවෙන්නේ 'එතං මම එසොහමස්මි එසො මෙ අත්තා' මෙය මගේය, මෙය මම වෙමි, මෙය මගේ ආත්මයයි කියන එක නොවෙයි. මගේ දර්ශනය. මගේ දර්ශනය ඒ කියන්නේ විදර්ශනාත්මක අවබෝධයයි මෙතන කියන්නේ සාමාන්‍ය ලෝකයා ආතම හැටියට ගන්න එක අනේපිඬු සිටාණන් අනාත්ම හැටියට දුටුවා. ඔන්න ඔය අනාත්ම දර්ශනයටම ගැලපෙන ආකාරයටයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ අවසාන බණ ඉදිරිපත් කරල තියෙන්නේ මොකද, කෙනෙක් මැරෙන්න ඉන්න කොට අල්ල ගන්නේ මොනවාද, ඔන්න ඔය ටික තමයි බුදුරජාණන් වහන්සේගේ වචනය අනුව මේ හය තුළයි ලෝකය උපන්නේ

**ඡසු ලොකො සමුප්පන්නො**
**ඡසු කුබ්බති සන්ථවං**
**ඡන්න මෙව උපාදාය**
**ඡසු ලොකො විහඤ්ඤති**

''ඡසු ලොකො සමුප්පන්නො'' හය තුළයි ලෝකය උපන්නේ, හය තුළයි ලෝකයේ සියලුම සම්බන්ධතා පවත්වන්නේ 'ඡසු කුබ්බති සන්ථවං'', මේ



හයම අල්ලාගන තමයි ''ඡන්න මෙව උපාදාය'' ලෝකයා මේ හයෙහිම වෙහෙසට පත්වෙන්නේ ඡසු ලොකො විහඤ්ඤති. නොයෙකුත් අවස්ථාවල දක්වලා තියෙනවා සළායතනය. මේක පිළිබඳ උපාදානය අත්හැරීමේ ක්‍රමයයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒ අවසාන අවස්ථාවේ අනේපිඬු සිටාණන්ට මතක් කර දුන්නේ, යම්තාක් ඒ උපාදාන වශයෙන් - ධර්මයේ නිවන හඳුන්වලා තිබෙන වචන දෙකක් තිබෙනවා. 'අනිස්සිතො අනුපාදානො', නිස්සිත කියල කියන්නේ යමක රඳා සිටීම. යමක් ඇසුරු කොට සිටීම කියන එකයි. උපාදාන කියන්නේ අල්ලා ගැනීම, ඔන්න ඔය දෙකෙන් නිදහස් වූ තැන තමයි නිවන කියන්නේ 'අනිස්සිතො අනුපාදානො' ඉතින් ඒකටමයි මේ සිත සකස් කළේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ දේශනාව තුළ. දැන් බලන්න මම ඇස උපාදාන වශයෙන් ග්‍රහණය නොකරමි. මගේ සිත ඇස ඇසුරු කොට නොපවත්නේය. අන්න නිස්සිත කියන වචනය. උපාදාන නිස්සය කියලා වචන දෙකක් ආශ්‍රිතව මේ විදර්ශනාවේ ගැඹුරු පැත්තක් ඒක, සාමාන්‍ය ලෝකයා අවසාන අවස්ථාවේ ග්‍රහණය කරන්නේ ඔය ටිකයි අල්ලාගන්නේ ඔය ටිකයි. ඒ අල්ලාගන්න ටික තමයි නැවත භවයක් මවන්නේ මේ පින්වතුන් අහලා තියනවාගේ 'උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති', ඔය පටිච්චසමුප්පාදයේ දක්වලා තියෙන්නේ, අල්ලා ගැනීම නිසා පැවැත්මක් ඇති වෙනවා. ඒ පැවැත්ම නිසා උපතක්, උපත ඇති වූ තැන ජරා මරණාදිය ඔක්කොම තියනවා. ඒක නිසා මරණ අවස්ථාවේදී යමක් සිතින් අල්ලා ගත්තොත් ඒ අරමුණ අනුව උත්පත්තිය ලබනවා. සාමාන්‍ය අරමුණු පමණක් නොවෙයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දක්වූවා ඉතාම සියුම් අරමුණු, අරූප ලෝකවල පවා. ඒ කිසිවක් අල්ලන්න එපා. මෙලොව අල්ලන්නත් එපා. පරලොව අල්ලන්නත් එපා කියල කිව්වා අන්තිමට, මෙයින් පෙන්නුම් කරන්නේ නිවන හැර වෙන කිසිවකට හිත යොමු කරන්න එපා කියලා කිව්වා. නිවන කියන කොට මොකක්ද කියල ඒ අර්ථයෙන්ම තේරුම් ගන්න පුළුවන්. යටත් පිරිසෙයින් සිතට එන අරමුණු වත් සිතෙන් සොයා බැලූ ඒ අල්ලාගත්තු කිසිවක් උපාදාන වශයෙන් අල්ලාගන්න එපා. නිස්සය වශයෙන් ගන්න එපා කියන එකයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ අනුශාසනාව.

එයින් අපට හිතා ගන්න පුළුවන් සතිපට්ඨාන සූත්‍රයේත් ඒ සූත්‍රය හදාරපු අය දකින්න ඇති නිරන්තරයෙන්ම සතිපට්ඨාන සූත්‍රයේ එක් එක්

ඡේදය අවසානයේ සඳහන් වෙනවා විදර්ශනා භාවනාවට අදාළ කොටසක් 'සතිපට්ඨාන භාවනා' නමින් හැඳින්වෙන. ඒක අවසාන වෙන්නෙත් නිස්සය. උපාදාන කියන වචනයෙන්. '**අනිස්සිතොච විහරති නච කිඤ්චි ලොකෙ උපාදියති**' කිසිවක් මත රඳ සිටින්නේ නැහැ. කිසිවක් ඇසුරු කරන්නෙත් නැහැ. ඒ වගේම ලෝකයේ කිසිවක් අල්ලා ගන්නේ නැහැ. එතකොට සතිපට්ඨාන භාවනා පුරුදු කරන පින්වතාට පවා බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල තියෙන්නේ සතිපට්ඨාන භාවනාව පුරුදු කරන්නේ මොකටද, ඒකත් කියවෙනවා ඒ සතිපට්ඨාන සූත්‍රයේම, මේ පින්වතුන් දන්නවා සතිපට්ඨාන භාවනා වැඩීමේදී අරමුණු හතරක් තියනවා කය, වේදනාව, සිත, ධම්ම, ධම්ම කියල කියන්නේ සිතට එන අරමුණු. දැඩි වේදනාවක් තුළින් අනේපිඬු සිටාණන් පැමිණිලි කළේ, මේ තරම් බරපතල වේදනා මට තියෙනවා. නමුත් වේදනා නාශකයක් නොවෙයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දුන්නේ. මෙතන, සාමාන්‍ය ලෝකයා සිතන වේදනා නාශකයක් නොවේ. අන්න අර නිවන් අමෘතය තුළින් වේදනාව ජයගන්න හැටි. ඒ උපාදානය තුළයි මේ වේදනාව බලපවත්වන්නේ. ඒ නිසා සතිපට්ඨාන සූත්‍රයේත් තියනවා 'අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සති මත්තාය' සතිපට්ඨාන සූත්‍රයේ කායානුපස්සනාව වඩන පින්වතාට පවා බුදුරජාණන් වහන්සේ අවසානයට කියන්නේ මොකක්ද 'මේ කයක් ඇත' කියල හිතා ගන්නෙත් **හුදෙක්** වෙන එහෙකට නොවෙයි '**හුදෙක්**' ඤාණ මත්තාය තමන්ගේ ඤාණය දියුණු කර ගැනීමටත් 'පතිස්සති මත්තාය' තමන්ගේ සිහිය දියුණු කර ගැනීමටත්, සතිපට්ඨාන සූත්‍රයේත් 'මම ඉදිරියට යම් පස්සට යම්' කියලා ඔය විදියට සඳහන් වෙනවා. මා ගැන සඳහන් වෙනවා තමාගේ ශරීරය හැටියට, නමුත් අවසානයේ කියනවා කයක් ඇතැයි කියල හිතාගන්න තියෙන්නේත් ඒකත් හුදෙක් තමන්ගේ ඤාණයත් සතියත් දියුණු කර ගැනීමට පමණයි. අවසාන වශයෙන් කියනවා 'අනිස්සිතො ච විහරති නච කිඤ්චි ලොකෙ උපාදියති' ඒකවත් අල්ලාගන්නේ නැහැ. ඒකවත් උපාදාන වශයෙන් ගන්නේ නැහැ. ඒ වගේම තමයි වේදනාව ආදී අනික් කරුණුත්. ඒ කොයි අරමුණක් වත් දැඩිව ග්‍රහණය නොකරන හැටියටයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නේ. ඒ කාරණයම තමයි මේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේගේ දේශනයේ දක්වලා තියෙන්නේ.



විශේෂයෙන්ම මරණාසන්න අවස්ථාවේදී දැන් මේ ලෝකයේ තියන තත්ත්වය අනුව හිතල බලනවා නම් දැන් මෙතන අනේපිඬු සිටාණන්ගේ අවසාන බණ, 'ආසන්න බණ'. කවුරුත් හැම බෞද්ධ පින්වතෙක්ම අවසාන මොහොත ගැන ලොකුවට හිතනවා. මොන මොනවා කර කර හිටියත් අන්තිම මොහොතේ සංඝයා වහන්සේලා කීප දෙනෙක් ගෙනල්ලා කොහොම හරි ඒ වෙලාවෙ හිත හදාගන්න පුළුවන් නම් අර ඔක්කොම හරියි කියල සමහරෙක් හිතනවා. නමුත් මේ විපත්ති කර යුගයේ සිතන්න තියෙන්නේ ඇත්ත වශයෙන් හැම වෙලාවකම 'ආසන්න සිතෙන්' සිටිය යුතු බවයි. දැන් මේ පින්වතුන් සමහර විට මඟුල් තුලා ආදී වැදගත් ගමනක් යන්න හොඳට ඇඳ පැළඳගෙන වාහනේක නැගලා යනවා. හිටි ගමන් ලොකු පිපිරීම් හඬක් ඇහෙනවා. සිහිය එනකොට ඉස්පිරිතාලේ, ආසන්න බණ අහන්න වෙලාව. එහෙම වෙලාවට මේ අනේපිඬු සිටාණන්ට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ දේශනා කළ බණ උපකාර කර ගන්න පුළුවන්. ඒ වෙලාවට සංඝයා වහන්සේලා වඩම්මන්නත් ඉඩක් නැහැ. අන්න ඒකයි කියන්න තියෙන්නේ. මරණ අවස්ථාවේ අපි යමක් ග්‍රහණය කරනවා නම් ඒක අනුවයි - කර්මයත් ඒකට ගැලපිලා එනවා නම් - ඒක අනුවයි අපේ උත්පත්තිය සිදුවන්නේ.

දැන් සමහර විට අනේපිඬු සිටාණන්ගේ ජීවිතය යම් යම් ප්‍රමාණයට ආදර්ශයට අරගෙන එහෙම නැත්නම් ආදර්ශයට ගන්න උත්සාහ කරන සමහර පින්වතුන් ඉන්න පුළුවන් විශාල ධන පරිත්‍යාග කරන. නමුත් ඒ පරිත්‍යාග කිරීමේදී සමහර විට පරමාර්ථය වෙනස් වෙන්න පුළුවන්. සමහර විට තිල තල තාන්න මාන්න ඒවා බලාපොරොත්තුවෙන් විශාල ධන පරිත්‍යාග දාන පින්කම් කරනවා. නමුත් අවසාන මොහොතේ හිත හදාගන්න බැහැ. එහෙම හිත හදාගන්න බැරුව අන්තිමට සමහර විට තමන්ගේ නිවෙස්වලම තමාගේ ගෙදරම ඉස්සරහ දොරකඩ ළඟට එනවා බල්ලෙක් වෙලා. එහෙම නැත්නම් අල්මාරිය යටට යනවා ගෙම්බෙක් ගැරඬියෙක් වෙලා. අන්න අර උපාදානය නිසා. ඒ අල්ලා ගැනීම නිසා, හිත නිදහස් කිරීමයි එතෙන්දි ඕන වෙන්නෙ. මරණාසන්න අවස්ථාවේදී උපාදානයෙන් හිත මුදාගන්න වෙනවා. නිස්සය කියල කියන ඒවා ඇසුරු කරන තැන ඇති හිත එයින් කඩාගන්න වෙනවා. ඒකයි අවශ්‍ය වෙන්නේ.

මේ විදර්ශනා බණ කියල කියන්නේ මරණ අවස්ථාවේදී අනෙක් හැම දෙයක්ම අත හරිනවා කියල කිව්වට ඒ අතහැරීම කායිකව කෙරෙන අත හැරීමක් නොවෙයි අන්තිමට බලනකොට, හිතින්මයි අපි අල්ල ගන්නේ. ඒ හිතෙන් අල්ලාගැනීම නුවණින් දැකලා ඒවායේ අනිත්‍ය ස්වභාවය, අනාත්ම ස්වභාවය දැකලා බුදුරජාණන් වහන්සේ මතු කරල දෙන්නේ මේ අල්ලා ගැනීමට හේතුවන ටික. සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් චක්ඛු විඤ්ඤාණය ගැන කිව්වා. ඒ විඤ්ඤාණය නිසා ඇතිවන ස්පර්ශය ගැන කිව්වා. ස්පර්ශය නිසා ඇතිවන වේදනාව ගැන කිව්වා. අන්න ඒ විදියට මේ සිත දිහා බලලා මේවා බැඳිලා තියන තැන්. යෝනිසෝ මනසිකාරය කියන්නේ ඒකයි. අනේපිඬු සිටුතුමා අර ගාථාවෙදිත් ප්‍රකාශ කළේ ''**යොනිසො විචිනෙ ධම්මං - එවං තත්ථ විසුජ්ඣති**'' ධර්මය 'යෝනිසෝ' නුවණින් විමසන්නට ඕන. එහෙම නැත්නම් ඒවා ඇතිවෙන තැනට හිත යොමු කරලා.

බුදුරජාණන් වහන්සේ දක්වනවා සංඥාව කියන එක මිරිඟුවක් හැටියට. ඇස කණ නාසය දිව කය මන කියන ඒ හැම එකෙන්ම ගන්නා සංඥාවන් සියල්ලම බුදුරජාණන් වහන්සේ මිරිඟුවක් හැටියට දක්වනවා. මිරිඟුව නම් ඒ මිරිඟුවට රැවටෙන්නේ මොකද කියල දැනගන්න නම් අන්න සලකල බලන්න ඕන ඇතුළත මේ මේ දේවල් මේ ඇසත් රූපයත් නිසා මේ ඇතිවන විඤ්ඤාණය එයින් ඇතිවන ස්පර්ශය ඒවා අල්ලගත්තොත් අල්ලගත්තු කෙනාට අර අවස්ථාවේ මේවා බාහිර බන්ධනයන් නොවේ. මේවා තමාම ඇතිකර ගන්නා බන්ධනයන් බව තේරුම් ගන්න පුළුවන් වෙනවා. ඒ විදියට භවයේ නැවත නැවතත් ඉපදෙමින් යන්නේ සිත ගන්නා අරමුණු අනුවයි. ඒකයි ධර්මයේ සඳහන් වෙන්නේ. මේවා පිළිබඳව '**අප්පතිට්ඨං, අප්පවත්තං, අනාරම්මණං**' නිවන පිළිබඳව සඳහන් වෙනවා අනාරම්මණ තත්ත්වය, කිසිම අරමුණක් ගන්නේ නැහැ. ඔය පරලොව හෝ මේවා කිසිම අරමුණක් නොගන්නා තත්ත්වයක්, ගත්තු අරමුණ තමයි නැවත උපතක් හැටියට මතුවෙන්නේ. ඒක ධර්මයේම සඳහන් වෙනවා. '**යඤ්ච භික්ඛවෙ චෙතෙති, යඤ්ච පකප්පෙති යඤ්ච අනුසෙති, ආරම්මණං එතං හොති විඤ්ඤාණස්ස ඨිතියා. ආරම්මණෙ සති පතිට්ඨා විඤ්ඤාණස්ස හොති**' චේතනා වශයෙන් යමක් ගැන හිතනවා නම්, යමක් ගැන කල්පනා කරනවා නම්, ප්‍රකල්පන



වශයෙන් යටත් පිරිසෙයින් ඒවා පිළිබඳ අනුශය වශයෙන් ඇලීමක්වත් තියනවා නම්, ඒකත් ප්‍රමාණවත් විඤ්ඤාණයේ සිට ගැනීමට. මරණ අවස්ථාවේ විඤ්ඤාණය ගිහිල්ලා කොහේ හරි ලගින්නේ ඒ අරමුණ ඔස්සේයි. ඒක විඤ්ඤාණයට ප්‍රතිෂ්ඨාවක් වෙනවා. එතකොට විඤ්ඤාණයේ ප්‍රතිෂ්ඨාවක් නොලබන තත්ත්වය තමයි 'අප්පතිට්ඨං' කියල කියන්නේ. නිවන හඳුන්වන වචනයක්. සිත කිසිම අරමුණක පිහිටීමක් නැහැ. අරමුණක් ගන්නේ නැහැ. අරමුණක් ගන්නේ නැති නිසා පිහිටීමක් නැහැ. පිහිටීමක් ගන්නේ නැති නිසා පැවැත්මකුත් නැහැ. ඒක නිසා තමයි '**අප්පතිට්ඨං අප්පවත්තං අනාරම්මණං**' කියල ඒ වචන සඳහන් වෙන්නේ.

ඒකම වෙනත් විදියකින් කියනවා ත්‍රිලක්ෂණය තුළින්. මේ පින්වතුන් අහලත් ඇති අනිත්‍ය සංඥාව කෙළවරට වැඩුවාම, අනිත්‍ය සංඥාව වඩන්න අපි උපකාර කර ගන්නේ අප ඉදිරිපිට තිබෙන දෙයක්. නමුත් ඒවා ගැඹුරට ගියාට පස්සෙ අන්තිමට නිමිත්තක් නැති වෙනවා. යම් කිසි නිමිත්තක් ආශ්‍රයෙන් අපි අනිත්‍ය සංඥාව වඩන්න පටන් ගන්නේ. නමුත් අවසානයේදී අවසාන ප්‍රතිඵලය තමයි අනිමිත්ත. නිමිත්තක් නොගන්න තත්ත්වයට එනවා. ඒ වගේම තමයි දුක්ඛ, යමක් අනිත්‍ය නම් එය දුක් සහිතයි කියල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා. ඒ දුක්ඛ සංඥාව ඉහළටම දියුණු කරපු කෙනාට සංඥාව ගැන ආශාව නැති වුනාට පස්සේ හිත 'පණිධි' කියල කියන්නේ ප්‍රාර්ථනාවන් ඒවා නැති වෙනවා. ඒක තමයි අප්පණිහිත කියන එකත් නිවනටම නමක්, පණිධියක් නෑ ආශාවක් නෑ. කිසිම ආශාවක් නෑ. ඊළගට අනාත්ම දර්ශනය ගැඹුරින් දියුණු කරපු කෙනාට අවසානයේදී ශූන්‍ය - මේක ශූන්‍ය වශයෙන් වැටහෙනවා ශූන්‍ය හිස් දෙයක්. මෙතන ගන්න දෙයක් නැහැ. 'සාර' වශයෙන් හිස් දෙයක්, ගන්න දෙයක් නැහැ. සාර වශයෙන් හිතෙන් අල්ලගත්තු දෙයක් අනුව තමයි නැවත නැවත උත්පත්තියක් ලබන්නේ, නිවන හඳුන්වනවා මේ තුනෙන් - පින්වතුන් අහල ඇති **අනිමිත්ත, අප්පණිහිත සුඤ්ඤත.**

ඉතින් ඔය තත්ත්වයට ගෙන ඒමට උපකාර වන්නේ නැවත උපතකට හේතු වන උපාදානය අතහැරීමයි. උපාදානය අතහැරීමට නම් තණ්හාව තුනී කරන්න ඕන. අනාථ පිණ්ඩික සිටාණන්ගේ ජීවිතය තුළින් අර තෘෂ්ණාව ඉතාමත් ක්ෂණිකව අතහැරීමේ ශක්තියක් ඒ සිටුතුමාට

තිබුනා. ඒ වගේම අර ධර්ම ඥානය අනුව සිත දියුණු කරගෙන තිබුණු නිසා අවසාන අවස්ථාවේදී අනිත් අනිත් මාර්ගඵල නොලැබූ නිසා නැවත උත්පත්තියක් ලැබුවේ වී නමුත් ඒක උපකාර වෙන්න ඇති. අපටත් හිතන්න තියෙන්නේ අපේ ජීවිත ගැන ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා මේ ධර්මයේ ගැඹුර යම් අවස්ථාවක අපි තේරුම් ගත්තේ නැතිනම් ඒ අනුව අපේ සිතුවිලි පැවැත්තුවේ නැත්නම් අපට තව දුරටත් තව තවත් සංසාරයේ යන්න සිද්ධ වෙනවා. ඇතැම් කෙනෙක් පැවිදි වෙන්න තැනක් නැතිව, බන්ධන කඩාගන්න බැරිව, හිතෙන් පැවිදි වෙන තරමට ලොකු ඕනෑකමක් ඇති අය අප හොයාගෙන එනවා. අන්න එබඳු අයට තමන්ගේ ගෙදර දොරවල්වල ඉඳගෙන හරි ඒ කියන බන්ධන බේරාගෙන කොහොම හරි බේරාගෙන සුහදව, බොහෝවිට වෙන්නේ මේ බන්ධන නිසා ඒවා පිළිබඳ නොයෙකුත් අවුල් ඇතිවෙන්න පුළුවන් ගිහි ජීවිතය තුළ. ඥානවන්තව කල්පනාකාරීව සුහදව ඒ ගැන සාකච්ඡා කරලා, ධර්මයෙන් තම තමන්ගේ සංසාර භය මතුකර ගෙන ධර්මයෙන් වැඩක් ගන්න උත්සාහ ගන්න අය මෙන්න මේ විදියේ බණවලට බය වෙන්නෙ නැහැ. විදර්ශනා බණ, මොකද කවදා හෝ අපි මේ නැතිකර ගන්න ඕන මේ සසර නැවත නැවත උපතයි. එකට හිටියත් අන්තිමට ගිහිල්ලා උපදින්නේ කොහේද? කොයි තරම් ප්‍රාර්ථනා කළත්, අන්න ඒක නිසා එක්ව සිටීම නොවෙයි වැදගත් වෙන්නේ. මේ දුර්ලභ අවස්ථාවේ, බුද්ධ ශාසනය හමුඋන අවස්ථාවේ, ධර්මය අසන්ට ලැබුණු අවස්ථාවේ, තමන් උත්සාහවත් වෙනවා නම් අර අනේපිඬු සිටුතුමා කිව්වා වාගේ සමහරවිට ඉන්න පුළුවන් ගිහි පින්වතුන් අතරත් ගැඹුරු ධර්මයක් තේරුම් ගෙන ඒ අනුව පිළිපැදීමට පුළුවන් අය. ධර්මය අසන්ට නොලැබීමෙන් පරිහානියට පත් වෙනවා කියන කාරණය නිසයි අනේපිඬු සිටුතුමා බ්‍රහ්මාරාධනාව වගේ ආරාධනයක් කළේ ගිහියන් වෙනුවෙන්.

එතකොට මේ පින්වතුන් ඒ විදියට සලකන්න ඕන. ඒකට සූදානම් වීම් වශයෙන් සතිපට්ඨාන සූත්‍රයේම වැඩිදුර නොගියත් ගිහි පැවිදි කවුරුත් - දැන් මේ කාලයේ සතිපට්ඨාන සූත්‍රය කියන එක බොහෝ දෙනා සිතන්නේ මරණ ගෙදරක සජ්ඣායනා කරන්න තියෙන එකක් හැටියටයි. එතකොට මරණ ගෙදරවල්වල අර අතීතයේ වට්ටක්කා ගෙඩියට ගිය කලයි සතිපට්ඨාන සූත්‍රයට දීල තියෙන්නේ. ඒක නොවෙයි ඊට වඩා



ගැඹුරු දෙයක් මෙතන තියනව. සතිපට්ඨාන සූත්‍රය මරණ ගෙවල්වල සිහිපත් කරන්න කියන්නේ මොකද, ඒ අවස්ථාවේ සංවේගවත් අවස්ථාවේ යථා තත්ත්වය අවබෝධ කරන්න පුළුවන්. එදිනෙදා මවාගත්ත ලෝකයක සිටියත්. නමුත් බොහෝ දෙනා හිතන්නේ ඒක සජ්ඣායනා කරන්න තියෙන දෙයක් කියලා. එහෙම නැත්නම් අශුභ දෙයක්, මරණ ගෙදරවල්වල විතරක් කියන එකක් හැටියට සමහරවිට උගත් අය පවා සිතනවා මේ සතිපට්ඨාන සූත්‍රය, නමුත් ඒක තමයි ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා මේ සතිපට්ඨාන සූත්‍රය තමයි ජීවිතයට ළංකර ගන්න ඕන. බුද්ධ කාලයේ සිටි පුරාණ ඉසිදත්ත වාගේ අය බුදුරජාණන් වහන්සේටම ප්‍රකාශ කරනවා අපි යම් අවස්ථාවක සතිපට්ඨානයට සිත යොදල සිටිය නම් අපි ගිහි ජීවිතය ගත කරන අවස්ථාවේ පවා අපට විශාල සහනයක් දැනෙනවා කියලා ප්‍රකාශ කරනවා බුදුරජාණන් වහන්සේටම ඒ කාලේ සිටිය ගිහි පින්වතුන්. ඒ නිසා තමනුත් කල්පනා කරන්න ඕන මේ සංසාරය භයානකයි, මේ කියන උපද්‍රව කෙනෙකුට ඇති වෙන්න පුළුවන් උපාදානය තුළින්, සමහර විට නොයෙකුත් විදියේ දානපතියන් හැටියට හිටියත් අර දුර්වලකම් තියනවා නම් සිතින් මේවා අල්ලාගන සිටියා නම්, අවසාන අවස්ථාවේ එන අවසාන සිතිවිල්ල කොයි විදියටද කියන්න බැහැ. ගෙදරවල්වලටම තමන් ඇසුරු කළ අය කෙරෙහි ඇල්ම හෝ වේවා, ඒ වස්තු සම්භාරය නිසා හෝ වේවා යම් යම් ඇලීම් ඇති කරගෙන තියනවා නම් ඒ අනුව සමහර විට ප්‍රේත තිරිසන් ආත්ම පමණක් නොවෙයි සමහර විට යක්ෂයින් හැටියට - ඒවා ආරක්ෂා කරන්න යක්ෂයින් රාක්ෂසයින් හැටියට - උපත ලබනවා. මේ වටිනා මනුෂ්‍ය ආත්ම භාවයේ වටිනාකම තේරුම් ගත්ත නම් ඒකයි. අනේපිඬු සිටුතුමා කිව්වේ ''**එතෙන මච්චා සුජ්ඣන්ති න ගොත්තෙන ධනෙන වා**'' මනුෂ්‍යයින් පිරිසිදු වන්නේ ගෝත්‍රයෙන් වත් උසස් කමින්වත් ඒ වගේම ධනයෙන්වත් නොවෙයි. අර කියාපු ධර්මය අනුව ජීවත්වීමෙන්, කර්මය ධර්මය විජ්ජාව - විජ්ජා කියල කියන්නේ අවබෝධයයි. 'යොනිසො විචිනෙ ධම්මං' කියල කියන්නේ ධම්ම විචය සම්බොජ්ඣංගයයි.

නුවණැති පින්වතුන් මේ විදියට තමන්ගේ ජීවිතය පිළිබඳ පුනරාවලෝකනයක් කරලා අපට මරණ අවස්ථාවේ අනික් හැම කෙනෙක්ම අතහැරියත් අවසාන වශයෙන් අපට අතහරින්න වන්නේ

**මෙන්න මේ සංඥාවත් මනසත් ඇති මේ කයයි. එතනටයි අපි අවධානය යොමු කළ යුත්තේ. බාහිර දේ වලට නොවෙයි. සළායතනය කියන්නේ ඒකයි. ආධ්‍යාත්මික ආයතන හයත් බාහිර ආයතන හයත් තුළයි ලෝකය තියෙන්නේ කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා.** එතකොට ඒ ලෝකය තුළ නිවන පිළිබඳ රහසත් තියනවා. ඒ ලෝකය තුළ අර විදියට ග්‍රහණය කර ගතහොත් ඒ ග්‍රහණය අනුව යම් තැනක ඒ සිත උත්පත්තියක් ලබනවා. එතන භවයක් සකස් වෙනවා. **'උපාදාන පච්චයා භවො, අනුපාදා පරිනිබ්බානං'** උපාදානය නිසා භවයක් ඇති වෙනවා. භව නිරෝධය වන්නේ අනුපාදානය තුළයි. අතහැරීම තුළයි. එය මොහොතක් මොහොතක් පාසා පුරුදු කළ පින්වතාට ක්‍රම ක්‍රමයෙන් හිත මුදාගැනීමට පුළුවන් වෙනවා. ඒ මුදා ගැනීමට පුළුවන් වන ඉඟි බුදුරජාණන් වහන්සේ දීල තියනවා. මේ හැම දේකම ඇති අනිත්‍ය සවභාවය, යමක් අනිත්‍ය නම් එය ප්‍රතිසංස්කරණය කරමින් තබා ගැනීමට සිදු වෙනවා. ඒක දුක් සහිත දෙයක්. ඒ තුළම තියනවා මේක තමන්ගේ වසයේ පවත්වන්න බැරි බව. අනාත්ම දර්ශනය කියන්නේ ඒකයි. තමන්ගේ වසයේ පවත්වන්න බැහැ. බුදුරජාණන් වහන්සේ බොහෝ දෙනාගෙන් සමහරවිට බමුණන්ගෙන් පවා අහනවා, ඒ තරම් ප්‍රකට කාරණයක් නිසයි එහෙම අහන්නේ, මොකද බමුණ, හිතන්නේ රූපය නිත්‍යද, අනිත්‍යද, අනිත්‍යයි කියලා පිළිතුරු ලැබෙනවා. යමක් අනිත්‍ය නම් එය සැපද, දුක්ද, දුක් සහිතයි කියලා ප්‍රකාශ කරනවා. අනිත්‍ය නම් වෙනස් වන සවභාවය, විපරිනාම අඤ්ඤථාභාව, සෑම දෙයක්ම අන්‍ය සවභාවයකට පත් වන විදියේ දෙයක් නම්, තමන්ගේ වසයේ පවත්වා ගන්න බැරිනම් ඒක 'එතං මම එසො හමස්මි එසො මෙ අත්තා කියලා ගැනීම සුදුසුද?' එයාගෙන්ම ප්‍රශ්න කරනවා, 'මෙය මගේ, මෙය මම, මෙය මගේ ආත්මයයි' කියල ගැනීම සුදුසුද, තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගැනීම සුදුසුද කියලා එය එයාටම හිතන්න අරිනවා. ඒ විමසූ කෙනාටම.

අන්න ඒ විදියට අපි කල්පනා කරන්න ඕන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනවා මේ ශරීරයත් තමාගේ නොවේ. ඒ නිසයි තමාගේ වසයේ පවත්වන්න බැරි. අනිත් ඒවාත් එහෙමයි. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ මේ එකක් වත් තමාගේ වසයේ පවත් වන්න බැරි නිසා ඒවා අනිත්‍ය නිසා ඒවායේ සාරයක් අරටුවක් හරයක් නැති නිසායි



බුදුරජාණන් වහන්සේ මේ පින්වතුනුත් අහල තියන උපමා දක්වල තියෙන්නේ රූපය කියන්නේ පෙණ පිඬුවක්ය. වේදනාව කියන්නේ දිය බුබුලක්ය. සංඥාව කියන්නේ මිරිඟුවක්ය. සංස්කාර කියන්නේ කෙසෙල් පතුරු ගොඩක්ය. කෙසෙල් කඳක්ය. විඤ්ඤාණය අවසානයේ කියනකොට, දැන් මෙතන මේ සාරිපුත්ත සවාමීන් වහන්සේ නිරන්තරයෙන් විඤ්ඤාණය ගැන සඳහන් කළා. විඤ්ඤාණය මායාවක් බව ප්‍රකාශ කළා. මේ විඤ්ඤාණය තුළ නැති දෙයක් ඇති හැටියට පෙන්නුම් කරන ගතියක්, මොකක්ද එතකොට අල්ල ගන්නේ. අරමුණ හැටියට අල්ල ගන්නේ ධර්මානුකූලව. ඒක තමයි විදර්ශනා යෝගියා ගන්නේ නාම රූපය හැටියට. එතකොට අල්ලගන්නේ නාම රූපයයි. **ඒ නාම රූපය කියන්නේ විඤ්ඤාණයේ වැටෙන ඡායාවක් පමණක් බව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා.**

මේකට තරමක් හරි අදාළ පොඩි උපමා කථාවක් පැරණි බෞද්ධ සාහිත්‍යයේ නොවෙයි, පැරණි ග්‍රීක සාහිත්‍යයේ සඳහන් වෙනවා. එක්තරා ග්‍රීක තරුණයෙක් හිටියා නාසිසස් කියලා. මේ නාසිසස් කියන ග්‍රීක තරුණයා ඉතාම රූමත්, නමුත් කවදාවත් තමාගේ මූණ දැකලා නැහැ. කන්නාඩියක් දිහා බලලා නැහැ. දවසක් දා කැලේ ගිහිල්ලා පොකුණකට නැමුණා මුහුණ සෝදන්න. පළමුවරට දැක්කා තමාගේ මුහුණ, රැවටුනා දෙවඟනක් කියලා. වතුරේ ඉන්න දෙවඟනක් කියලා. ඉතින් ආලයෙන් මුළාවෙලා වැළඳ ගන්න බැලුවා. අත් දෙක දාන කොටම වතුර එහෙ මෙහෙ වෙනවා. නැවත නැවතත් බැලුවා බැහැ. ඊළඟ දවසෙත් ආවා. ඊළඟ දවසෙත් අවා. අර දෙවඟන වැළඳ ගන්න බැහැ. අන්තිමට එතනම ඒ වියෝවෙන් එහෙම නැත්නම් අල්ල ගන්න බැරි කමින් වියලිලා මැරිලා එතන හටගත්ත මල් පැලෑටිය 'නාසිසස්' කියලා හැඳින්වූවා. ඒක ග්‍රීක දේව කථාවක්. නමුත් මේ කථාව තුළ තියනවා අන්න අර තමන්ගේ පිළිබිඹුවට රැවටීම පිළිබඳ කථාව. ඕක ධර්මානුකූලව කියනවා නම් ආත්ම ස්නේහය. ඒකයි අන්න බුදුරජාණන් වහන්සේ මතු කරලා තියෙන්නේ. ඔය ධම්මපදයේ ගාථාවක් තියෙන්නේ ''මග්ග වග්ගයෙ''

**උච්ඡින්ද සිනෙහ මත්තනො**
**කුමුදං සාරදිකං ච පාණිනා**
**සන්ති මග්ග මෙව බ්‍රෑහය**
**නිබ්බානං සුගතෙන දෙසිතං**

බුදුරජාණන් වහන්සේත් ඒ වගේ උපමාවක් දෙනවා. මලක් පිළිබඳ උපමාවක් ''උච්ඡින්ද සිනෙහමත්තනො'', තමාට තියන සෙනෙහස ආත්ම සෙනෙහස කපා හරින්න ''කුමුදං සාරදිකං ව පාණිනා'', සරත් සමයේ කුමුදු මලක් අතින් කඩලා දාන්න වගේ ආත්ම සෙනෙහස කපා හරින්න ''සන්ති මග්ගමෙව බ්‍රෑහය - නිබ්බානං සුගතෙන දෙසිතං'' නිවනට ශාන්තියට යන සුගතයන් වහන්සේ විසින් දේශනා කළ ඒ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය පුරුදු කරන්න.

**එතකොට මේ උපමාවෙනුත් අපට පෙන්නුම් කරනවා නාම රූපය පිළිබඳ ඒ ඇලීමයි මේ අත හරින්නය කියන්නේ.** මේක උච්ඡේදයක් වශයෙන් නොවේ. බොහෝ දෙනෙක් හිතනවා මේ භව නිරෝධය කියන කථාව - ධර්‍මයේ නිවන කියන එක අපි මේ ලියන කියන දේවල් පවා උච්ඡේද වාදයක් හැටියට ඇතැම් කෙනෙකුට පේන්න පුළුවන්. නමුත් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කළේ විඤ්ඤාණ මායාවේ එක පැත්තක් තමයි. විඤ්ඤාණ මායාවේ වැටෙන ඡායාවයි නාම රූපය හැටියට ධර්‍මයේ දක්වල තියෙන්නේ. ඒක නමට රූපයක් අනිත් පැත්තට බලන කොට රූප සවරූපයක්, නියම නමකුත් නොවෙයි නියම රූපයකුත් නොවේ. ඒක නමකුත් නොවෙයි, රූපයකුත් නොවෙයි. නමට රූපයක් රූප සවරූපයක් ඕකයි නාම රූප කියන්නේ. නාම කියන්නේ නාම ධර්‍මයි. වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාර කියන ධර්‍ම ටිකයි, රූප කියල කියන්නේ අර මහාභූත ධර්‍ම, යථා තත්ත්වය තේරුම් ගන්න බැරි, තනි තනිව අඳුනා ගන්න බැරි පඨවි, ආපො, තෙජො වායො ආශ්‍රයෙන් අරගන්න රූප සංඥාවයි. ඕකයි නාමරූපය කියල කියන්නේ. මෙන්න මේ නාම රූප පිළිබිඹුව තුළයි ලෝකයා මේ එහෙම පිටින්ම අල්ලාගන සිටින ඕනෑම දෙයක් තියෙන්නේ. නාම රූප ටික විතරයි. වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර, අනිත් එක ධාතු හතර ආශ්‍රයෙන් ගන්න රූප සංඥාව, අන්න ඒ අවබෝධය තුළිනුයි විදර්ශකයා ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට ගමන් කරන්නේ. බුදුරජාණන් වහන්සේ හඳුන්වා දුන්න ත්‍රිලක්ෂණය උපකාර කරගෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම ත්‍රිලක්ෂණය උපකාර කරගෙන ඒ වගේම මේ හැම දෙයක්ම පිළිබඳව ලෝකයේ තියන විපල්ලාස හැටියට දක්වන විපරීත සංඥා තමන් තේරුම් අරගෙන අනිත්‍ය දේ නිත්‍ය හැටියට දකින, දුක් සහිත දේ සැප හැටියට දකින, අනාත්ම දේ ආත්ම හැටියට දකින



අශුභ දේ ශුභ හැටියට දකින ඒ විපරීත දර්‍ශනයේ යථා තත්ත්වය තේරුම් අරගෙන විදර්‍ශනා මාර්ගයේ යනවා නම් සතිපට්ඨාන සූත්‍රය ආශ්‍රයෙන් මේ පින්වතුන්ටත් පුළුවන් ගිහි ජීවිතයේ සිටියත්, සුදු ඇඳුම් අඳින ගිහියන් අතරත් සමහර විට ඉන්න පුළුවන් ධර්‍මාවබෝධය ඇති අය. එතකොට මේ අවස්ථාව අපි ප්‍රයෝජනයට ගනිමු. ඇත්ත වශයෙන් මේ පින්වතුන් පින් දෙන්න ඕන අර අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයාට. මෙතෙක් වේලා මේ දේශනා කළ බණ අර කියාපු ආකාරයට මේ පින්වතුන්ට යම් වෙලාවක, අපි එසේ නොවේවා කියල හිතුවත් අර විදියේ උපද්‍රව අවස්ථාවක හදිස්සියේ හෝ රෝහලක සිහිය ආපු වෙලාවක උනත් මේ බණ උපකාර වේවා කියන එක අපේ ප්‍රාර්ථනාවයි.

මේ පින්වතුන් මෙතෙක් ඇසූ මේ විදර්‍ශනාත්මක බණ හැකිතාක් ප්‍රයෝජනයට ගෙන මේ ජීවිතය තුළම සෝවාන් සකදාගාමී අනාගාමී, අර්හත් කියන මාර්‍ග ඵල ප්‍රතිවේධය තුළින් උතුම් අමා මහ නිවනින් සැනසීමට ශක්තිය බලය ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරන අතර, අවීචියේ සිට අකනිට්ඨා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් අර අනාථ පිණ්ඩික දිව්‍ය පුත්‍රයා ඇතුළු යමෙක් මේ විශ්වයේ සිටිනවා නම් මෙබඳු ධර්‍ම දේශනාවක ධර්‍ම ශ්‍රවණයක ආනිශංස අනුමෝදන් වෙන්න පුළුවන් ඒ හැම කෙනෙක් මත් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියල මේ ගාථා කියල පින් අනුමෝදන් කරන්න.

**එත්තාවතා ච අම්හෙහි......**

# 45 වන දේශනය

## 45 වන දේශනය (පහන් කණුව ධර්ම දේශනා අංක 209)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

**කිං පත්තිනමාහු භික්ඛුනං**
**සොරතං කෙන කථංච දන්තමාහු**
**බුද්ධොති කථං පවුච්චති**
**පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි**

**පජ්ජෙන කතෙන අත්තනා**
**පරිනිබ්බාන ගතො විතිණ්ණ කංඛො**
**විභවංච භවංච විප්පහාය**
**වුසිතවා ඛීණ පුනබ්භවො ස භික්ඛු**

**සබ්බත්ථ උපෙක්ඛකො සතිමා**
**නසො හිංසති කඤ්චි සබ්බලොකෙ**
**තිණ්ණො සමණො අනාවිලො**
**උස්සදා යස්ස න සන්ති සොරතො සො**

**යස්සින්ද්‍රියානි භාවිතානි**
**අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ**
**නිබ්බිජ්ඣ ඉමං පරංච ලොකං**
**කාලං කංඛති භාවිතො ස දන්තො**

**කප්පානි විචෙය්‍ය කෙවලානි**
**සංසාරං උභයං චුතූපපාතං**
**විගත රජමනංගණං විසුද්ධං**
**පත්තං ජාතික්ඛයං තමාහු බුද්ධන්ති**
සභිය සු සුත්ත නිපාත

සැදැහැවත් පින්වතුනි,

බුදුරජාණන් වහන්සේ පහළවෙන කාලයේදී දඹදිව සත්‍ය ගවේෂණයම ජීවිතයේ පරමාර්ථය කර ගත්තු පිරිසක් හිටිය සමාජයේ



පරිබ්‍රාජක නමින් සම්මතවුන. ඒ පරිබ්‍රාජක කියන වචනයේ සාමාන්‍ය තේරුම නම් 'හැමතැනම ඇවිදින' කියන එකයි. ඒ අය හැමතැනම ඇවිද්දෙ නිකරුනේ නොවෙයි. සත්‍යය සොයමිනුයි. සත්‍ය ගවේෂණයේදි ඒ අය බොහෝ විට උපකාර කරගත්තේ ප්‍රශ්නෝත්තර ක්‍රමයයි. යම්කිසි දර්ශනවාදයක් ප්‍රකාශකරන ශාසතෘවරයෙක් හමුඋනහම ප්‍රශ්නමාලාවක් ඉදිරිපත් කරනව. ඒකට නිසි පිළිතුරු ලැබුනහොත් ඒ ශාස්තෘවරයාගේ ශ්‍රාවකයෙක් වීමට තරම් නිහතමානී සත්‍යකාමී බවක් ඒ අයට බොහෝවිට තිබුන. ඒකට හොඳ නිදර්ශනයක් සුත්ත නිපාතයේ සභිය සූත්‍රයෙන් අපට ලැබෙනවා, සභිය පරිබ්‍රාජකයා පිළිබඳ ප්‍රවෘත්තියෙන්. සභිය පරිබ්‍රාජකයා පිළිබඳ අතීත කථාන්තර රාශියක් අටුවාවල සුළු සුළු වෙනස්කම් සහිතව සඳහන් වෙනවා. සුත්ත නිපාතයේ දැක්වෙන ඒ නිදාන කථාවට අමතරව ඒවායේ දැක්වෙන ආකාරයට ඒ සභිය පරිබ්‍රාජකයා අතීතයේදී කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ ඒ ශාසනයේ මහණ වෙලා හිටපු භික්ෂුන්ගෙන් කෙනෙක්. භික්ෂුන් වහන්සේලා හත් නමක් කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය පරිහානියට පත්වෙන ආකාරය දැකල සංවේගයට පත්ව කැලෑවකට ඇතුල්වෙලා පර්වතයකට නැගල ඉණිමගක් උපකාර කරගෙන ඉණිමග පෙරළල දාල දැඩි වීර්යයෙන් භාවනා කරන්න පටන් ගත්තා. කෙසේ හෝ නිවන් ප්‍රත්‍යක්ෂ කරමි කියන අදහසින්. ඒ සංඝයා වහන්සේලා හත්නමගෙන් එක නමක් එක රැයින්ම අභිඥාලාභී රහත් තත්ත්වය ලබාගෙන පස්සෙන්දා උදෑසන අහසින්ම පිණ්ඩපාතය වැඩම කරල ඒ පිණ්ඩපාතය ගෙනත් අනිත් හය නමට පැවරුවට මොකද ඒ හය නම වැළඳුවේ නැහැ. දෙවන දවසේ දෙවන ස්වාමීන් වහන්සේත් අභිඥාලාභී අනාගාමී තත්ත්වය ලබාගෙන ඒත් අර විදියට පිණ්ඩපාතය ලබාගෙන අර පස්නමට පැවරුවා කියනවා. මේක ප්‍රපඤ්චයක්. ප්‍රමාදයක් හැටියට හිතලා ඒක පිළිගත්තෙ නැතිව නිරාහාරවම භාවනා කළා. අර රහත් ස්වාමීන් වහන්සේ පිරිනිවන් පෑව. අනාගාමී ස්වාමීන් වහන්සේ ශුද්ධාවාස බ්‍රහම ලෝකයේ උපන්න. අනිත් පස් නම නිරාහාරවම ජීවිත පරිත්‍යාගයෙන් භාවනා කරල ගල උඩම අපවත් උනා. අපවත් වෙලා ඒ පොත පතේ දැක්වෙන හැටියට බුද්ධාන්තරයක්ම දිව්‍ය ලෝක ආදියේ සැරිසරල බුදුරජාණන් වහන්සේගේ කාලයේ ඒ ඒ තැන්වල ඒ පස් දෙනාම

උපන්න. ඔවුන් ධර්‍මයේ හැඳින්වෙන්නෙ මේ ආකාරයටයි. පුක්කුසාති, කුමාර කස්සප, බාහිය දාරුචීරිය, දබ්බමල්ලපුත්ත, සභිය පරිබ්‍රාජක කියන පස්දෙනා හැටියට ශාසනයේ අපට පසුකාලයේ දකින්නට ලැබෙනවා.

මේ සභිය පරිබ්‍රාජකයා පිළිබඳව මෙහෙමත් සඳහන් වෙනවා. පරිබ්‍රාජිකාවකගේ පුතෙක් හැටියට ඉපදිලා තමන් වේද ශාස්ත්‍රාදිය ගැන හොඳ අවබෝධයක් ලබාගෙන ආශ්‍රමයක් හදාගෙන හිටියය. එක් දවසක් රෑ අර කියාපු ශුද්ධාවාස බ්‍රහ්මරාජයා මේ සභිය පරිබ්‍රාජකයාට බුදුරජාණන් වහන්සේ මුණගස්වන අදහසින් ඇවිල්ල රාත්‍රී කාලයේ 'සභිය' කියල ආමන්ත්‍රණය කරල ප්‍රශ්න විස්සක් ඉගැන්නුවා. මේ ප්‍රශ්න විස්සට යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් පිළිතුරු දුන්නොත් ඒ ශාස්තෘවරයා යටතේ පැවිදි වෙල මහණදම් පුරන්නය කියල අවවාද කළා. ඒ අනුව සභිය පරිබ්‍රාජකයා ඒ කාලයේ ප්‍රසිද්ධව සිටිය ශාස්තෘන් වහන්සේලා, මේ පින්වතුන් අහල තියනව පූරණකස්සප, මක්ඛලීගොසාල, අජිතකෙසකම්බලී, පකුධකච්චායන, සංජයබෙල්ලට්ඨිපුත්ත, නිගණ්ඨනාථපුත්ත කියන හය දෙනාම හමුවෙන්න ගිහිල්ල ඒ අයගෙන් මේ ප්‍රශ්න ඇහුව. ඒ අය මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙනව වෙනුවට එයින් කෝපය අසහනය ඇතිකර ගත්ත. සභිය පරිබ්‍රාජකයාගෙන්ම ඇහුව ඒවායේ තේරුම. ඔහුටත් බැරිඋනා පිළිතුරු දෙන්න. ඊළඟට ඒ ගැන කලකිරීම කොයිතරම්ද කියතොත් සභිය පරිබ්‍රාජකයා කල්පනා කළා මීට වැඩිය හොඳයි ගිහිවෙලා පස්කම් සැප විඳින එක කියල. නැවතත් මතක් උනා භවත් ගෞතමයින් වයසින් ඉතාම බාල උනාට මොකද සමහරවිට මේ ප්‍රශ්නවලට පිළිතුරු දන්නව ඇතියි කියල හිතාගෙන දුරමඟක් ගෙවලා රජගහනුවරට ගියා. ගිහිල්ල වේළුවනාරාමයේදී බුදුරජාණන් වහන්සේ හමුඋනා. හමුවෙලා ගාථාවෙන්ම ආමන්ත්‍රණය කරලා තමන් මෙහෙම සැක දෙගිඩියා ඇතිව පැමිණියාය. මට මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නය කියල බුදුරජාණන් වහන්සේට ආරාධනා කළහම බුදුරජාණන් වහන්සේ ඉතාමත්ම සහනශීලීව ප්‍රකාශ කළා හොඳයි සභිය ඔබ අහන ප්‍රශ්නවලට මම පිළිතුරු දෙන්නම්. ඒවා අනුපිළිවෙලින් අහන්න කියලා. ඒ වගේම දීඝී ප්‍රශ්නමාලාවක් ඇත්ත වශයෙන් ප්‍රශ්න විස්සක් - කියන කොට. ඒ ප්‍රශ්න විස්ස සභිය පරිබ්‍රාජකයා ඉදිරිපත් කළේ ගාථා පහකින්. එක ගාථාවක



ප්‍රශ්න හතර බැගින්. එනමුත් බුදුරජාණන් වහන්සේ ගාථා විස්සකින්ම එක එක ප්‍රශ්නයට එක එක ගාථාවකින් පිළිතුරු දුන්න. එයින් පළමුවෙන්ම අහපු ප්‍රශ්න හතර තමයි අපි අද මාතෘකාව හැටියට තබාගත්තේ.

**කිං පත්තිනං ආහු භික්ඛුනං**

- භික්ෂුවක් කවර අධිගමයක් ලබාගෙන තිබේද?

**සොරතං කෙන කථඤ්ච දන්තමාහු**

- කුමකින් 'සෝරත' නම් කියනු ලැබේද? 'දන්ත' යයි කියනුයේ කෙසේද?

**බුද්ධොති කථං පවුච්චති**

- 'බුද්ධ'යයි කියනු ලබන්නේ කවර හෙයින්ද?

**පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි**

- මවිසින් ප්‍රශ්න කරනු ලැබූ භාග්‍යවතුන් වහන්සේ මෙයට පිළිතුරු දෙනු මැනව. කියල ඉල්ලා හිටිය.

ඔන්න බුදුරජාණන් වහන්සේ ඒවාට පිළිතුරු දෙනවා.

**පජ්ජේන කතෙන අත්තනා**

- තමා විසින් භාවිත වූ මාර්‍ගය තුළින්

**පරිනිබ්බාණ ගතො විතිණ්ණ කංඛො**

- පරිනිර්‍වාණයට ගිහිල්ල සැක නැතිකරගත්තු

**විභවංච භවංච විප්පහාය**

- (විභව කියන්නේ උච්ඡේද දෘෂ්ටිය, භව කියන්නේ ශාස්වත දෘෂ්ටිය) ඒ දෘෂ්ටි අතහැරලා

**වුසිතවා ඛීණ පුනබ්භවො ස භික්ඛු**

වුසිතවා - ශාසන බ්‍රහ්මචරියාව වඩලා

ඛීණ පුනබ්භවො ස භික්ඛු - පුනර්භවය නැති කරගත්ත තැනැත්තාටයි භික්ෂුව කියල කියන්නේ.

ඊළඟ ගාථාවෙන් සෝරත කියන වචනය තෝරනවා.

**සබ්බත්‍ථ උපෙක්ඛකො සතිමා**

- සතිමත්වූ හෙතෙම හැමතන්හිම උපේක්‍ෂාව ඇත්තේ

**න සො හිංසති කඤ්චි සබ්බලොකෙ**

- ලෝකයේ කිසිවෙකුට හිංසා නොකරයි.

**තිණ්ණො සමණො අනාවිලො**

- සසරින් එතර වූ නොකැළඹුණු සිත් ඇති

**උස්සදා යස්ස න සන්ති සොරතො සො**

- යමෙකුට තණ්හා මාන දිට්ඨි ආදී ඉල්පීම් නැද්ද, ඔහුට සෝරත යයි කියයි.

ඊළඟට අනෙක් ගාථාවෙන් ‘දන්ත’ කියන වචනය තෝරනවා.

**යස්සින්ද්‍රියානි භාවිතානි - අජ්ඣත්තං බහිද්ධාච සබ්බලොකෙ**

- යම් කෙනෙකුගේ ඉන්ද්‍රියයන් ඇතුළතත් පිටතත් මුළු ලෝකය පිළිබඳවම වඩා ඇද්ද

**නිබ්බිජ්ඣ ඉමං පරංච ලොකං**

- මෙලොවත් පරලොවත් විනිවිද දැක

**කාලං කංඛති භාවිතො ස දන්තො**

- මරණය එනතෙක් කාලය බලා සිටීද භාවිත සිත් ඇතිව - ඔහු දන්තය.

ඔන්න ඊළඟට අවසානයේදී කියනව

**කප්පානි විචෙය්‍ය කෙවලානි**
**සංසාරං උභයං චුතූපපාතං**
**විගත රජමනංගණං විසුද්ධං**
**පත්තං ජාතික්ඛයං තමාහු බුද්ධං**

**කප්පානි විචෙය්‍ය කෙවලානි**

- තෘෂ්ණා දෘෂ්ටි ආදී වශයෙන් සිතෙන්ම සකස්කර ගත්තු දේවල් නුවණින් පිරික්සා දැන

**සංසාරං උභයං චුතූපපාතං**

- එසේම චුති උපපත්ති දෙක ඇති සංසාර ජීවිත නුවණින් විමසා දැන



**විගත රජං** - කෙලෙස් නැති

**අනංගනං** - කිලිටි නැති

**විසුද්ධං** - පිරිසිදු වූ (බුදුවරයා ගැනයි කියන්නේ)

**පත්තං ජාතික්ඛයං තමාහු බුද්ධං**

- උපතෙහි කෙළවර දුටු තැනැත්තාට තමයි බුද්ධයයි කියල කියන්නේ.

ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ සභිය පරිබ්‍රාජකයා එක ගාථාවෙන් අහපු ප්‍රශ්න හතරට ගාථා හතරකින්ම පිළිතුරු දුන්න. එපමණකිනුත් සභිය පරිබ්‍රාජකයා බොහොම පැහැදිලා ඊළඟට තවදුරටත් වෙන වෙන ප්‍රශ්න රාශියක් අහනව. අපි ඒවා වෙන වෙනම කියන්න යන්නෙ නැහැ. ඊට කලින් යමක් කියන්න වෙනවා මේ ප්‍රශ්නවල ස්වභාවය ගැන. මේ ප්‍රශ්නවල මූලික සැකැස්ම අනුව හිතන්න තියෙන්නේ ඒ කාලයේ සමාජ ව්‍යවහාරයේ පැවතුනු ආධ්‍යාත්මික ජීවිතයට අදාළ මූලපද විස්සකුයි. දැනටම කියැවුනා භික්ඛු, සෝරත, දන්ත, බුද්ධ ආදී වශයෙන්. ඒ වගේම තව ඉදිරියට තියනව බ්‍රාහ්මණ, නහාතක, සමණ, වේදගූ ආදී ඒ කාලයේ සම්මත වචනවල අර්ථයයි මේ අහන්නේ.

අන්න එතෙන්දි විශේෂ දෙයක් අපට දකින්නට ලැබෙනව. බුදුරජාණන් වහන්සේගේ **සිවුපිළිසිඹියා නුවණ** මේ සූත්‍රය පුරා විහිදිලා තියනව. කොයි තරම්ද කියතොත් ඒ ගාථා 20න් පිළිතුරු දුන්නට පස්සෙ සභිය පරිබ්‍රාජකයා සෑහීමට පත්වෙලා ශාසනයේ මහණ උනා. මේ සිවුපිළිසිඹියා කියල අපි පාවිච්චි කරන වචනය චතු පටිසම්භිදා. පටිසම්භිදා හතර කියන එක පොත පතේ බොහොම කෙටියෙන් දක්වල තියන නිසා, බොහෝ දෙනා අපෙනුත් නිතර ඇවිල්ල අහනව. සිවුපිළිසිඹියා ධර්මයේ දක්වන්නේ මෙහෙමයි. **අත්‍ථ, ධම්ම, නිරුත්ති, පටිභාන** කියල. අත්‍ථ කියන එක තෝරන්නේ අප ඉදිරියේ තියන කාරණයයි. හේතු ඵලයයි අප ඉදිරියේ තියෙන්නේ. ධම්ම කියල කියන්නේ ඒකට යටින් තියන හේතුවයි. නිරුක්තිය කියන්නේ ඒවා සම්බන්ධයෙන් තියෙන වචන පිළිබඳව ඇති භාෂාවට අදාළව පවත්නා අවබෝධයයි. පටිභාන කියන්නේ කවුරුත් දන්නව වැටහීමේ නුවණයි. මෙතන විශේෂත්වයක් තියෙන්නේ යම්කිසි ප්‍රශ්නයක් වචනයක් ඉදිරිපත් උනහම බුදුරජාණන් වහන්සේට හැකියාව තියනව ඒකතුළ අර්ථප්‍රභේදයක්

දකින්න. එක වචනයක් තුළ අර්ථ ප්‍රභේද රාශියක්. 'අත්ථ නානත්තං' කියල කියනව. ප්‍රභේදයක් දැකීමේ හැකියාව තියනව. එසේම ඒවා ප්‍රකාශ කරල ප්‍රකට කරල ඒවා ඒත්තු ගන්වන්න. ඊළඟට ඒ ඒ අර්ථවලට යටින් තියෙන ධර්මය මතු කරල දෙන්න ශක්තිය තියනවා. 'ධර්ම නානත්වය' නැත්නම් ධර්ම ප්‍රභේදය. ඊළඟට ඒවා ඉදිරිපත් කිරීමට සුදුසු නිරුක්තිය භාෂාව හැසිරවීමේ, භාෂාව විනිවිද දක්මේ ලොකු ශක්තියක් මේ පටිසම්භිදාව ඇති අය තුළ තියනව. ඊළඟට අවසාන වශයෙන් පටිභාන කියල කියන්නේ, ඔය කවුරුත් දන්නවා උපමා රූපක ආදී වශයෙන් විශේෂ වැටහීම්. ඒ අර කියාපු කාරණා සවිර කරන්න ඒත්තු ගන්වන්න උපකාරවන උපමා රූපක. අන්න ඒ පිළිබඳ විශේෂ අවබෝධය තමයි ඔය පටිසම්භිදා ඥානය තුළ තියෙන්නෙ.

අපි මේකට නිදර්ශන කීපයක් විතරක් කියමු. මේක දිග සූත්‍රයක්. දැන් කියාපු ඒවාට අමතරව පරිබ්‍රාජකයා අහන ඊළඟ ප්‍රශ්නය බ්‍රාහ්මණ කියන්නෙ කවුද කියන එකයි. ඒකට බුදුරජාණන් වහන්සේ දෙන හැඳින්වීම තුළ මෙහෙම කියවෙනව. සියලුම පව්- 'බාහිත සබ්බ පාපං' කියල කියනව. ඒ කියන්නේ සියලුම පව් බැහැර කළා. කියන එක. ඒ අර්ථයෙන් බ්‍රාහ්මණයෙක් වෙනවා. බ්‍රාහ්මණ කියල ශාසනයේ සඳහන් වෙනවා රහත් භික්ෂුවට. ඊළඟට කෙවලී. කේවලී කියන්නේ 'ඒකත්වයට ගිය.' බ්‍රාහ්මණයින් අතර තියෙන්නේ බ්‍රහ්ම සමඟ ඒකත්වයට යාමයි. ඒ අර්ථයෙන් නොවෙයි මෙතන 'සංසාරං අතිච්ච කෙවලී' සංසාරය ඉක්මවා යන අර්ථයෙන් 'කේවලී' කියනවා. ඔය ආදී වශයෙන් මේ ගාථාවේ අර්ථ රාශියක් තියනවා. නිරුක්ති පිළිබඳව විශේෂයි. ඒ වගේම තමයි 'සමණ' කියන වචනය තෝරන්නේ 'සමිතාවී' පින් පව් දෙකම සමනය කළ කියන අර්ථයෙන්. පින් පව් දෙකම සමනය කළා. ඒ තුළින් 'සබ්බ සංඛාර සමථ' කියන ඒ පැත්ත පෙන්නුම් කරනවා. බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ශ්‍රමණ කියල කියන්නේ පින් පව් දෙකම සමනය කළ. ඒ වගේම ඊළඟට 'නහාතක' කියන වචනය. ඒක බමුණන් අතර නිතර පාවිච්චි වෙනවා. මේ පින්වතුන් අහල තියනව බමුණන්ගේ සිරිතක් තිබුන දවසට තුන් සැරයක් වතුරෙ බැහැල පව්සෝදා හරිනව. ඒ වෙනුවට මෙතන කියන්නේ බුදුරජාණන් වහන්සේ 'නින්හාය සබ්බපාපකානි - අජ්ඣත්තං බහිද්ධාච සබ්බ ලොකෙ' ඇතුළතත් පිටතත් මුළු ලෝකය පිළිබඳව ඇති ඒ පාපක ධර්ම සෝදාහැරිය කියලා. අර විදියේ බාහිර පිරිසිදු වීමක් නොවෙයි. ඒ



අර්ථයෙන් රහත් භික්ෂූන් වහන්සේ ගැනයි මේ ප්‍රකාශ කරන්නේ. ඊළඟට 'නාග' කියන වචනය ගැන - කෙසේ නම් නාග වන්නේද කියල අහනව. ඒකට බුදුරජාණන් වහන්සේ නිරුක්තියක් පාවිච්චිකරනවා. 'ආගුං න කරොති කිංචි ලොකෙ' ආගුං කියන වචනයේ තේරුම 'වැරදි.' එතකොට ලෝකයේ කිසිම වැරැද්දක් නොකරන අර්ථයෙන් 'නාග' නම් වෙනව. නිරුක්තිය යෙදෙන හැටි බලාගන්න. එතකොට සියලුම ඇලුම් බැඳුම් බිඳ දමල - නාග - ඇතෙකුට තියන ඒ ශක්තියෙන් ධර්මයේ පෙන්නුම් කරන්නේ සියලු සංයෝජන ආදියෙන් විමුක්ත වීම. ඊළඟට තියනව 'ඛෙත්තජින' කියන වචනය. ඒකත් ගැඹුරු අර්ථයක් ඇති වචනයක්. 'ඛෙත්තජින' කියල කියන්නේ සාමාන්‍ය අර්ථය 'කෙත් දිනූ' ඒකත් බුදුරජාණන් වහන්සේ තෝරන්නේ.

**ඛෙත්තානි විචෙය්‍ය කෙවලානි**

**දිබ්බං මානුසකංච බ්‍රහ්මඛෙත්තං**

දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්ම සියලුම කෙත් හරියට තේරුම් අරගෙන, ඊළඟට

**සබ්බ ඛෙත්ත මූලබන්ධනා පමුත්තො**

සියලුම කෙත්වලට යන මූල බන්ධනය - එයින් මිදුනා කියන එක. ඉතින් මෙතන කෙත් කියන එක අපට තේරුම් ගන්න පුළුවන්. මේ පින්වතුන් සමහරවිට දන්නවත් ඇති ධර්මයේ තියනව '**කම්මං ඛෙත්තං විඤ්ඤාණං බීජං තණ්හා සිනෙහො**' කියල කර්මය කෙතක් හැටියට දක්වනව. එතකොට කෙතේ මුල සින්ද කියන්නේ අර කුසලාකුසල කර්ම සියල්ලෙන්ම මිදුන කියන එකයි. ඒ අර්ථයම තමයි, ඊළඟට තියන කුසල කියන වචනය තෝරල තියෙන්නේ

**කොසානි විචෙය්‍ය කෙවලානි**

**දිබ්බං මානුසකංච බ්‍රහ්ම කොසං**

නියම කුසල කියන අර්ථය ඇති පුද්ගලයා දිව්‍ය බ්‍රහ්ම ආදී - (ඒ කට්ටිය එතන දක්වන්නේ) කෝෂයක් හැටියට. කෝෂයක් තුළට යන ගතිය නැතිකෙරුවා කියන අර්ථය.

**සබ්බකොස මූලබන්ධනා පමුත්තො**

ඒ කෝෂයන්ට යන මුල බන්ධනය කැඩුව කියන අර්ථයෙන් කුසල කියන වචනය. ඒවගේම වෙදගු කියන වචනය තෝරනවා. වේදගු කියන්නේ කවුරුත් දන්නවා ත්‍රිවේදපාරගත තත්ත්වයට ගිය අයට. බ්‍රාහ්මණයින්ට, නමුත් බුදුරජාණන් වහන්සේ ඒක අමුතු විධියකට තෝරන්නේ. '**වෙදානි විචෙය්‍ය කෙවලානි**' ඒ වේද හැම එකක්ම තේරුම් ගන්නව අර

බ්‍රාහමණයින් ශ්‍රමණයින් පිළිබඳව. නමුත් ඊළඟට කියන්නේ '**සබ්බ වෙදනාසු වීතරාගො**' ඒ සියලුම වේදනාවන් පිළිබඳව වීතරාගී වේද, බුදුරජාණන් වහන්සේ ඒ වචනය ආශ්‍රයෙන් වේදනාවම මතුකරනව. හැම දෙනාටම තියන වේදනාව කියන කාරණය මතුකරල '**සබ්බං වෙදං අතිච්ච වෙදගූ සො**' සියලුම වේදනාවන් ඉක්මවීම යන අර්ථයෙන් මේ ශාසනයේ වෙදගූ නම් වෙනව කියල දක්වනවා. ඔය ආකාරයට තව කරුණු රාශියක් දක්වනවා. ඊළඟට 'අනුවිදිත' කියන වචනයේ තේරුම අනුවිදිත කියල කියන්නෙ යමක් හොඳින් තේරුම් ගත්තා කියන එක. ඒකෙදිත් බුදුරජාණන් වහන්සේ ගැඹුරු ධර්ම කාරණයක් ඒ තුළින් ඉදිරිපත් කරනවා.

**අනුවිච්ච පපඤ්ච නාමරූපං**
**අජ්ඣත්තං බහිද්ධා ච රොගමූලං**
**සබ්බ රොග මූලබන්ධනා පමුත්තො**
**අනුවිදිතො තාදි පවුච්චතෙ තථත්තා**

අනුවිච්ච පපඤ්ච නාමරූපං - මේ ප්‍රපඤ්චය තුළින් ලෝකයා ඇතිකරගත්තු නාමරූපය කියන එක යථා පරිදි තේරුම් අරගෙන. ඒක තමයි - අජ්ඣත්තං බහිද්ධා ච රොග මූලං - ඇතුළතත් පිටතත් තියන හැම රෝගයකටම මුල 'සබ්බ රොග මූල බන්ධනා පමුත්තො' - ඒ රෝග මූල බන්ධනයෙන් මිදුන තැනැත්තාට අන්න 'අනුවිදිතො තාදි' පුද්ගලයයි කියල කියනව.

අවසාන වශයෙන් - අපි සමහර දේවල් දිගින් දිගට නොකීවත් විශේෂ වශයෙන් පෙනෙන දෙයක් තමයි 'පරිබ්බාජක' කියන වචනය. අපි මුලදී කිවුව පරිබ්බාජක කියන වචනයේ සාමාන්‍ය අර්ථය. තැන තැන ඇවිදිනව කියන එක. තව ඕන නම් සත්‍ය සොයමින් ඇවිදිනව. නමුත් බුදුරජාණන් වහන්සේ 'පරිබ්බාජක' කියන වචනයේ නිරුක්තියට අනුව එයින් එන ධ්වනියට - හඬට - අනුව දක්වනවා 'පරිවජ්ජයිත්වා' - ඒ කියන්නේ පාපකර්ම සියල්ල පරිවර්ජනය කිරීම - පරිවර්ජනය කරල 'පරිඤ්ඤචාරී' අවබෝධයෙන් යුක්තව හැසිරෙනවා. ඊළඟට ඒවායින් පරිබාහිරවීමේ අර්ථයෙන්. ඊළඟට කියනව '**පරියන්තං අකාසි නාමරූපං**' - නාමරූපයේ 'පරියන්ත' කියල කියන්නේ කෙළවර. කෙළවර දුටු අර්ථයෙන්. පරිබ්‍රාජක යයි කියනව. ඉතිරි පද සියල්ලම තව ධර්ම කාරණාවලින් පෝෂණය කරල බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළා. ඒක



අහල සභිය පරිබ්‍රාජකයා බොහොම සතුටට පත්වෙලා ඊළඟට බුදුරජාණන් වහන්සේට ස්තෝත්‍ර වශයෙන් ගාථා හතක් ප්‍රකාශ කරනව. එතකොට මේක බොහොම දීර්ඝ සූත්‍රයක්. සභිය පරිබ්‍රාජකයාට ඇතිවෙච්ච ශ්‍රද්ධාව කොයි තරම්ද කියතොත් එහෙමම ආසනයෙන් නැගිටල කල්පනා කළා. අර ශාස්තෘන් ළඟින් මට කිසිදෙයක් ලබාගන්න බැරි උනා. ඒ අය උත්තර දෙනව තියා ඒවට ඇහුම්කන් දුන්නෙත් නැහැ. ඒ වෙනුවට බුදුරජාණන් වහන්සේ මේ අන්දමින් හොඳට විවරණය කළා කියන අදහස ඇතිව ඊළඟට ස්තෝත්‍ර විදියේ ගාථා හතකින් බුදුරජාණන් වහන්සේට ස්තුතිකළා. ඉන් පළමුවෙනි ගාථාව පමණක් එහි විශේෂ අර්ථයක් නිසා මතක් කරනවා.

පළවෙනි ගාථාවෙ කියනව -

**යානිච තීණි යානිච සට්ඨි**
**සමණප්පවාද සිතානි භූරිපඤ්ඤ**
**සඤ්ඤක්ඛර සඤ්ඤ නිස්සිතානි**
**ඔසරණානි විනෙය්‍ය ඔඝන්තමගා**

ටිකක් තේරුම් ගන්න අමාරු විදියේ ගාථාවක්. කාලය තියන හැටියට විවරණය කරනවා. ඒක තුළ මහ ගැඹුරු අදහසක් තියනවා.

යානිච තීණි යානිච සට්ඨි
සමණප්පවාද සිතානි භූරිපඤ්ඤ

භූරිපඤ්ඤ කියන්නෙ මහා ප්‍රාඥයන් වහන්ස යම් හැටතුනක් ශ්‍රමණප්‍රවාද තිබෙනවානම් - ඒ ශ්‍රමණප්‍රවාදවල ස්වභාවය කියන්නේ 'සඤ්ඤක්ඛර සඤ්ඤනිස්සිතානි' සඤ්ඤාව, අකුරුවලින් සැදිල තියන ඒ ශ්‍රමණප්‍රවාද හැටතුන පිළිබඳව. ඒ හැම එකක්ම තේරුම් අරගෙන ඊළඟට 'ඔසරණ' කියල හඳුන්වල තියෙන්නෙ ඇතුළට ඇදගන්න සවභාවය ඇති 'විනෙය්‍ය ඔඝන්තං අගා' - ඒවා දුරුකරල ඕඝ අන්ත කියල කියන්නෙ චතුරොඝයක් ගැන ධර්මයේ කියවෙනවා ලෝකයා ඇදගෙන යන සැඩවතුරු, සැඩවතුරු කෙළවරට පැමිණියා. ඒකත් ප්‍රකාශ කරලා තවත් සතුති වශයෙන් ගාථා පෙළක් කියනවා. ඒකෙ අවසාන ගාථාවත් විශේෂ වටිනාකමකින් යුක්තයි.

**පුණ්ඩරීකං යථා වග්ගු - තොයෙන න උපලිප්පති**
**එවං පුඤ්ඤෙ ච පාපෙ ච - උභයෙ ත්වං න ලිප්පසි**
**පාදෙ වීර පසාරෙහි - සභියො වන්දති සත්ථුනො**

අවසාන කළේ මේ විධියට කියල.

පුණ්ඩරීකං යථා වග්ගු - තොයෙන න උපලිප්පති

යම් සේ මනහර සුදු නෙළුම් මලක්, සුදු පියුමක්, වතුර තැවරී කිලිටි නොවේද ඒවගේම 'එවං පුඤ්ඤෙච පාපෙච - උභයෙ ත්වං න ලිප්පසි - ඔබ වහන්සේ පින් පව් දෙකෙහිම ඇලෙන්නේ නැහැ.

'පාදෙ වීර පසාරෙහි සභියො වන්දති සත්ථුනො.' බුදුරජාණන් වහන්ස පා දිගු කරන්න. මෙන්න සභිය වැන්දා කියල ප්‍රකාශ කරල ඊට අමතරව අර සාමාන්‍ය සූත්‍රවල තියන ආකාරයට අති විශිෂ්ටයි ස්වාමීනි, අති විශිෂ්ටයි ස්වාමීනි කියල තමන්ගේ ශ්‍රද්ධාව ප්‍රකාශ කරල තුණුරුවන් සරණ ගිය බවත් කියල ඊළඟට බුදුරජාණන් වහන්සේගෙන් අවසර ඉල්ලනව පැවිදි උපසම්පදා වෙන්න. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරන සේක්වා උපසම්පදා කරන සේක්වා කියල. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව 'සභිය මේ මගේ ශාසනයේ ප්‍රතිපත්තියක් තියනව යම් කලින් තීර්ථක වෙල හිටපු කෙනෙක් මේ ශාසනයේ පැවිදි වෙන්න එනවානම් මාස හතරක් පරිවාස කාලයක් ගත කරන්න ඕන. ඒ පරිවාස කාලයෙන් පස්සේ භික්ෂූන් අනුමැතිය දුන්නොත් භික්ෂූන් කැමති උනොත් පමණයි පැවිදි කරන්නෙ. නමුත් මට පුළුවන් 'පුග්ගල වෙමත්තතා' කියන පුද්ගලයින් පිළිබඳ විශේෂත්වය සලකලා මට අනුග්‍රහයක් කරන්න පුළුවන් කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. එතකොට සභිය කියනව කොයිතරම් ශ්‍රද්ධාවක් තියනවද කියතොත් භාග්‍යවතුන් වහන්ස, එහෙම ශාසනයේ නීතියක් තියනව නම් හාරමාසයක් නොවෙයි වර්ෂ හතරක් උනත් පරිවාස කාල සීමාවේ මම ඉන්නම්. ඊටපස්සේ භික්ෂූන් වහන්සේලා කැමති නම් මා පැවිදි කරත්වා කියල. එහෙම කිව්වට මොකද බුදුරජාණන් වහන්සේ සභිය පරිබ්‍රාජකයා පැවිදි උපසම්පදා කළා. ඊළඟට බොහෝ තැන්වල සඳහන් වෙන අන්දමට අප්‍රමාදීව විවේකයට ගිහිල්ල වීර්‍යයකරල නොබෝ කලකින්ම අරහත්වයට පැමිණ වදාළ ඒ සභිය ස්වාමීන් වහන්සේ. එතකොට මේ සභිය කථාවට අනුව, එක පැත්තකින් මේ සූත්‍රය වැදගත් වෙනව සිවුළිසිඹියා චතුපටිසම්භිදා ගැන අවබෝධයක් ලබන්ට. අපි ඒක යම්තමින් මතුකළා පමණයි. බුදුරජාණන් වහන්සේ මූල පද එක එකක් උපකාර කරගත්තා අමුතු අර්ථගන්වල අපට ඒක තේරෙනව 'බ්‍රහමණ' 'නහාතක' ආදී පද තේරූ ආකාරයෙන්. සමාජයේ පවතින වචනවලට නව්‍යාර්ථයක් - අලුත් අර්ථයක් දුන්න. ඒක තමයි භාෂාව විනිවිද දැකීමේ ශක්තිය. ඊළඟට ඒක හැසිරවීම, ඒකට අනුකූල අන්දමින්



ඒකට වැටහෙන ඒකට ගැලපෙන අන්දමින් උපමා ආදිය ආශ්‍රයෙන් තේරුම් කිරීමේ ශක්තිය. ඒ එක පැත්තක්. ඊළඟට අපි කිව්වනේ යම්කිසි හේතුවක් නිසා සභිය පරිබ්‍රාජකයා ඉදිරිපත් කළ ගාථාවලින් මුල් එක

**යානිච තීණි යානිච සට්ඨි**

**සමණප්පවාදසිතානි භූරිපඤ්ඤ**

මෙතන කියවෙනව සමණප්පවාද හැට තුනක් ගැන. මේක බොහෝවිට උගතුන්ට ප්‍රශ්නයක් වෙනව. අපට අහල පුරුදු බ්‍රහ්මජාලයේ දෘෂ්ටි හැට දෙකයි. අටුවාවේ හැටතුන හැදෙන්නේ කොහොමද කියල තෝරන්නේ බ්‍රහ්මජාල සූත්‍රයේ දැක්වෙන දෘෂ්ටි හැටදෙකට සක්කාය දිට්ඨිය එකතු කළහම හැටතුනක් හැදෙනවය කියල. නමුත් අපට පේන හැටියට ඒක එච්චර පිළිගත හැකි එකක් නොවෙන්නෙ මොකද ඒකට අපට සාක්ෂියක් ලැබෙනවා. සූත්‍ර පිටකයේම සංයුත්සඟියේ සළායතන සංයුක්තයේ චිත්තගෘහපතියා අහන ප්‍රශ්නයකට - ඉසිදත්ත කියන ස්වාමීන් වහන්සේගෙන් අහන ප්‍රශ්නයකට - ඉසිදත්ත ස්වාමීන් වහන්සේ දුන්න පිළිතුර තුළින් පේනව ඒ අටුවාවේ මතය පිළිගත නොහැකි බව. ප්‍රශ්නය මෙහෙමයි. චිත්ත ගෘහපතිය අහනව ඉසිදත්ත ස්වාමීන් වහන්සේගෙන් බ්‍රහ්මජාලයේ තිබෙන දෘෂ්ටි හැටදෙක කුමක් ඇති කල්හි පැන නගීද? කුමක් නැති කල්හි නැති වේද? කියල එතකොට ඉසිදත්ත ස්වාමීන් වහන්සේ දෙන පිළිතුර සක්කාය දිට්ඨිය ඇති කල්හි දෘෂ්ටි හැටදෙක පැන නගිනව. සක්කාය දිට්ඨිය නැති වුනහම ඒ දෘෂ්ටි නැතිවෙල යනව කියල. එතකොට අපට පේනව එයින් සක්කාය දිට්ඨිය නිසා ඒ දෘෂ්ටි හැටදෙක ඇතිවෙනව නම් සක්කාය දිට්ඨිය හැටතුන්වන එක හැටියට පිළිගන්න අමාරුයි.

එහෙනම් මොකක්ද කියන ඊළඟ ප්‍රශ්නය පැන නගිනව. ඒකෙදි අපට තව ඉඟියක් ලැබෙන වටිනා සූත්‍රයක් තියනව අංගුත්තර නිකායේ දසක නිපාතයේ ගහපති වග්ගයේ. අපි අනේපිඬු සිටාණන් ගැන හිතන්නේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රධාන දායකයා වැඩිම උනොත් සෝවාන් උපාසකයෙක්. අනේපිඬු සිටාණන් එසේ මෙසේ කෙනෙක් නොවන බව ඒ සිටාණන් අන්‍ය තීර්ථක පරිබ්‍රාජකයින් කීපදෙනෙක් අහපු ප්‍රශ්නයකට පිළිතුරු දුන්න ආකාරයෙන් පෙනී යනවා. ඒ සිද්ධිය මෙහෙමයි දැක්වෙන්නෙ. එක දවසක්දා අනේපිඬු සිටාණන් බුදුරජාණන්

වහන්සේ දකින්න ජේතවනාරාමයට යන අතරේ අතර මගදී කල් වැඩියි බුදුරජාණන් වහන්සේ, සංඝයා වහන්සේලා දකින්න කියලා හිතලා ඒ ළඟතිබුණු තීර්ථකාරාමයට ගොඩනැඳුන. ගොඩවැදිල ඉඳගත්තහම ඒ තීර්ථකයො අහනව අනාථ පිණ්ඩික සිටුතුමාගෙන් ගෘහපතිය ඔය ශ්‍රමණ භවත් ගෞතමයින්ගේ දෘෂ්ටිය මොකක්ද? එතකොට අනේපිඬුසිටාණන් කියනව ස්වාමීන් වහන්ස, මම දන්නෙ නැහැ. බුදුවරුන්ගේ දෘෂ්ටිය මොකක්ද කියල. එතකොට කියනව එහෙනම් ඔබ දන්නෙ නැහැ බුදුවරුන්ගේ දෘෂ්ටිය කියන්න එහෙනම් ගෘහපතිය භික්ෂූන්ගේ දෘෂ්ටිය මොකක්ද කියල. ඒත් අනේපිඬු සිටාණන් කියනව භික්ෂූන්ගේ දෘෂ්ටිය ගැනත් මම දන්නෙ නැහැ හරියට. එතකොට කියනව හොඳයි එහෙනම් ශ්‍රමණ භවත් ගෞතමයින්ගේ දෘෂ්ටියත් දන්නෙ නැහැ. භික්ෂූන් වහන්සේලාගේ දෘෂ්ටියත් දන්නෙ නැහැ. කියන්න ගෘහපතිය ඔබගේ දෘෂ්ටිය මොකක්ද කියල. එතකොට අනේපිඬු සිටාණන් පිළිතුරු දෙනව ඒක මට කියන්න අපහසු නැහැ. නමුත් ඊට කලින් ඔබවහන්සේලාගේ දෘෂ්ටි කියන්න බලන්න.

එහෙම කිවුවහම පරිබ්‍රාජක පිරිසෙන් එක්කෙනෙක් කිව්ව ලෝකය ශාස්වතයි. සදාකාලිකයි. මෙයම සත්‍යයයි අනික් සියල්ලම බොරුයි. මේක තමයි මගේ දෘෂ්ටිය, තවත් පරිබ්‍රාජකයෙක් කියනව ලෝකය අශාස්වතයි. සදාකාලික නොවෙයි. මෙයම තමයි සත්‍යය. අනික් සියල්ල බොරුයි. මේකයි මගේ දෘෂ්ටිය. තුන්වැන්නා කියනව ලෝකයේ කෙළවරක් තියනව. ඒකයි සත්‍යය. අනික් සියල්ලම බොරුයි. සස්සතො ලොකො අසස්සතො ලොකො අන්තවා ලොකො ආදී වශයෙන්. අර අව්‍යාකත ප්‍රශ්න දහයටමයි ඔය එන්නෙ. ඊළඟට හතර වැන්නෙක් ඉදිරිපත්වෙලා කියනවා ලෝකයේ කෙළවරක් නෑ කියන එකයි මගේ දෘෂ්ටිය. ඒ විධියට කෙටියෙන් සලකගන්න. ඊළඟට පස්වැන්නෙක් ඉදිරිපත් වෙලා කියනව ජීවයත් ශරීරයත් එකක් කියලා. 'තං ජීවං තං සරීරං කියල' එතන ජීව කියන එක ආත්ම කියන අදහසින් යොදන්නෙ. තව කෙනෙක් කියනව ජීවය වෙන එකක්. ආත්මය අනිකක් කියල. ඉතින් ඔය විදියට හයදෙනෙක්ම කිව්වට පස්සෙ තවත් හතර දෙනෙක් ඉදිරිපත් වෙනවා. එක්කෙනෙක් කියනව මරණින් මතු තථාගත තෙම වෙයි තථාගත කියල කියන්නෙ ඒකාලෙ ඕනෑම ශාසනයක උත්තම තත්වයට



ගිය උත්තම පුරිසො, පරම පුරිසො පරමප්පත්ති පත්තො' කියල කියන උත්තම තත්ත්වයට ගිය පරම තත්ත්වයට ගිය කෙනා. මරණින් මතු 'වෙයි' කියන එකයි මගේ දෘෂ්ටිය. ඊළඟ එක්කෙනා කියනවා තථාගත තෙම මරණින් මත්තෙහි නොවෙයි. ඒ අටවැන්නා, නවවැන්නා කියනවා තථාගත තෙම මරණින් මතු වෙයි සහ නොවෙයි. ඒකයි මගේ දෘෂ්ටිය. දසවැන්නා කියනවා තථාගත තෙම මරණින් මතු වෙයිත් නොවෙයි නොවෙයිත් නොවෙයි. අපි කලිනුත් හඳුන්වල දුන්නු සූත්‍රවල සඳහන් බුදුරජාණන් වහන්සේ පිළිතුරු නොදුන්න අව්‍යාකත ප්‍රශ්න දහයයි ඔය ඉදිරිපත් කළේ.

එහෙම කියල ඊළඟට මේ පරිබ්‍රාජකයින් අහනව හොඳයි දැන් අපි අපේ දෘෂ්ටි කිව්ව. ගෘහපතිය දැන් ඔබ කියන්න ඔබේ දෘෂ්ටිය මොකක්ද කියල. ඔන්න ඔතන ඉඳල බොහොම සැලකිල්ලෙන් අහන් ඉන්න. අනේපිඬු සිටාණන් එසේ මෙසේ කෙනෙක් නොවන බව මේ දෙන පිළිතුරෙන් තේරුම් ගන්න පුළුවන්. ''දැන් යම් ආයුෂ්මතුන් වහන්සේ කෙනෙක් කිව්ව නම් ලෝකය සදාකාලිකයි. අන් සියල්ල බොරුයි කියල ඒ දෘෂ්ටිය ඇතිඋනේ අයෝනිසෝ මනසිකාර කියන වැරදි මෙනෙහි කිරීම තුළින්. ඒ කිව්වේ මේ හැම දෘෂ්ටියක්ම අයෝනිසෝමනසිකාරයෙන් ඇති කරගත්ත ඒව කියල. සංඛත, චේතයිත, පටිච්චසමුප්පන්න ඒවා ඔන්න එතකොට අර තීර්ථකයෙක් කියනව හා හොඳයි එහෙනම් ඔබේ දෘෂ්ටිය මොකක්ද කියන්න. ඔබේ දෘෂ්ටිය මේ කියන සංඛතයි චේතයිතයි අනිත්‍යයි දුක්ඛයි කියන එකද ඔබේ දෘෂ්ටිය. ඔබ ඒ දෘෂ්ටියේ නේද ඇලිල ඉන්නෙ. එතකොට අනේපිඬු සිටාණන් කියනව (ඒක කියන්නෙ අමුතු විදියකට) යමක් අර විදියට චේතයිත සංඛත පටිච්චසමුප්පන්න වශයෙන් තියනව නම් ඒක සුදිට්ඨං - ඒක මම ප්‍රඥාවෙන් දැකල තියනවා. ප්‍රඥාවෙන් දැකල තියනව මම ඒක අනිත්‍ය දුක්ඛ වශයෙන්. නමුත් මම ඒකත් ග්‍රහණය කරන්නෙ නැහැ. මම ඒ එක්කම දැකල තියනව ඒ දෘෂ්ටිවලින් නිස්සරණ කියල කියන එයින් නික්මීමකුත් මම දැකල තියනව. තේරුම් ගන්න බලන්න. මෙතන හරි ගැඹුරු කාරණයක් තියෙන්නෙ. ගෘහපතියෙක් හැටියට අනේපිඬු සිටාණන් කියන නිසා මේ පින්වතුන්ටත් බැරිවෙන එකක් නැහැ. මේක තේරුම් ගන්න. අපි මේක විදර්ශනාත්මකව බලනවානම් මේ සංඛතය, (සකස්කරගත්තු හැමදෙයක්ම) අනිත්‍යයි

දුක්ඛයි අනාත්මයි. කියන එකවත් අනේපිඬු සිටාණන් ග්‍රහණය කරගන්නෙ නැහැ. මොකද, මෙහෙමයි කියන්නෙ මම දන්නව ඊට එහා 'නිස්සරණය.' අන්න ඒ වචනය මතක තියාගන්න. ඒ දෘෂ්ටිවලින් නික්මීමකුත් මම දැකල තියනවා. ඒක නිසා මොකක්වත් අල්ලගන්නෙ නැහැ.

ඔන්න ඔහොම කිව්වට පස්සෙ ඊළඟට ඒ සූත්‍රයේ මෙහෙමයි තියෙන්නෙ. ඒක කිව්වට පස්සෙ අර තීර්ථකයො පරිබ්‍රාජකයෝ ඒකට උත්තර දීගන්න බැරිව නිරුත්තරව බිම බලාගෙන හිටියයි. අනේපිඬු සිටාණන් පිටත්වෙලා ගිහින් මේ සිද්ධිය බුදුරජාණන් වහන්සේට කිවුව. මම මෙහෙම පරිබ්‍රාජකාරාමයට ගිහිල්ල මේ විදියට ඔවුන් ඇසුව මේ වචනවලින්. මේ විදියට මම පිළිතුරු දුන්නය කියල. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ, 'සාධු සාධු ගෘහපතිය බොහොම හොඳයි බොහොම හොඳයි ගෘහපතිය. ඔය විදියට තමයි විටින් විට ඔය මෝඝ පුරුෂයින්ට නිග්‍රහ කරන්න ඕනෙ. ඔය විදියට තර්කයක් ඉදිරිපත් කරලයි කියල ප්‍රකාශ කළා. ප්‍රකාශ කරල ඊළඟට අනේපිඬු සිටාණන් පිටත්වෙලා ගියාට පස්සෙ සංඝයා වහන්සේලා අමතලා කියනවා. 'මහණෙනි වස් සියයක් තියන භික්ෂුන් වහන්සේ නමක් උනත් තීර්ථකයින්ට අනේපිඬු සිටාණන් දුන්න විදියට තමයි පිළිතුරු දෙන්න ඕනෙ.' මේක විශේෂ දෙයක්. ඒ අනේපිඬු සිටාණන්ට තේරුණත් සමහරවිට මේ පින්වතුන්ට නොතේරෙන්න පුළුවන්. එතන තියන කාරණය. ඒක අපි ටිකක් සම්බන්ධ කරගනිමු අර ගාථාවට. ඒ ගාථාවෙන් කියන්නේ

**යානිච තීණි යානිච සට්ඨී**
**සමණප්පවාද සිතානි භූරිපඤ්ඤ**
**සඤ්ඤක්ඛර සඤ්ඤ නිස්සිතානි**
**ඔසරණානි විනෙය්‍ය ඔඝතමගා**

ඒ කියන්නේ 'සමණප්පවාද' කියල කියනව ශ්‍රමණයන් අතර තියන වාද. වාද හැටතුනක් ගැන කියනව. ඒව ගැන කියන්නේ 'සඤ්ඤක්ඛර සඤ්ඤ නිස්සිතානි' අපි කලින් යම්තම්න් සඳහන් කළ ආකාරයට සංඥාවලින් අකුරුවලින් හැදිච්ච ඒ ශ්‍රමණප්‍රවාද. ඊළඟට 'ඔසරණානි' ඒවා ඇතුළට ඇදගන්නවා. 'නිස්සරණ' කියල කියන්නේ නික්මීම නම් 'ඔසරණ' කියල කියන්නේ මේ පැත්තට ඇදගැනීම කියන එකයි. 'ඔසරණ' කියන්නේ මහපුදුම වචනයක්. සභිය පරිබ්‍රාජකයා එයින් හඳුන්වන්නේ ඒවා



ලෝකයට අදින දේවල්, නික්මීමට හේතුවන දේවල් නොවෙයි. ඒ නිසා 'ඔසරණානි විනෙය්‍ය ඔඝන්තං අගා' ඒ හැට තුනම අතහැරල 'ඕඝන්ත' කියල කියන්නේ අපි කලින් සඳහන් කළානෙ චතුරෝඝයක් ගැන සංසාරයෙන් එතරවෙනව කියන්නෙ කාම භව දිට්ඨි අවිජ්ජා කියන සැඩ වතුරු හතරෙන් එතර වීමයි. බුදුරජාණන් වහන්සේ ඒ එතරවීම තුළින් අරකියාපු ශ්‍රමණප්‍රවාද හැටතුනෙන්ම එතර උනා. ඔය කාරණය තව ටිකක් පැහැදිලි කරනවා නම්, බ්‍රහමජාල සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා හැට දෙකක් දෘෂ්ටි ගැන කියල ඉවරවෙල ඒ හැට දෙක පිළිබඳ විග්‍රහය - ඒකවත් බුදුරජාණන් වහන්සේ අල්ලා ගන්නේ නැහැ. මොකද හේතුව 'අනුපාදා විමුත්තො තථාගතො' තථාගතයින් වහන්සේ ඒවා කිසිවක් ග්‍රහණය නොකොට - ඒ දෘෂ්ටිවල ස්වභාවය ප්‍රඥාවෙන් දුටුව. නමුත් ඒවා ග්‍රහණය කරන්නේ නැහැ. **ඒ දැක්මවත්, ඒ අවබෝධයවත් ග්‍රහණය කරන්නේ නැහැ.** ඒ වෙනුවට 'අනුපාදා විමුත්තො' එයිනුත් විමුක්ත උනා. ඒවගේ තවත් තැනක තියනවා. වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා, ''භවත් ගෞතමයිනි, ඔබට යම්කිසි දෘෂ්ටිගතයක් තියනවද'' කියල. ඒ කියන්නෙ යම්කිසි දෘෂ්ටියක් තියනවද කියල. බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා, ''**දිට්ඨිගතන්ති බො වච්ඡ ගොත්ත අපනීතං එතං තථාගතස්ස**''.

තථාගතයන් වහන්සේ තුළ ඒ දෘෂ්ටිගතයක් කිසිවක් නැහැ. මොකද හේතුව? තථාගතයන් වහන්සේ 'සුදිට්ඨං' හොඳින් දැකල තියනවා. ප්‍රඥාවෙන් දැකල තියනව. දැකල තියෙන්නෙ මොකක්ද? පිළිවෙතක් -
**ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථගමො**
**ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො ඉතිවෙදනාය අත්ථගමො**
**ඉති සංඛාරා ඉති සංඛාරානං සමුදයො ඉති සංඛාරානං අත්ථගමො**
**ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථගමො**

කියලා. පංච උපාදානස්කන්ධය පිළිබඳව ඇතිවීමත් නැතිවීමත් මම ප්‍රඥාවෙන් දැක්ක. නමුත් ඒ දර්ශනයවත් මම අල්ලගන්නෙ නැහැ. ඒක ග්‍රහණය කරගන්නෙ නැහැ. ඒ වෙනුවට ඒක ප්‍රඥාවෙන් දැක්ක. ඒ දැකල අර කියාපු ඒ 'සබ්බ මඤ්ඤිත මථිත' ඒ හිතෙන් හදාගත්තු ඒ සියල්ලම අතහැරල 'අනුපාදා විමුත්තො' විමුක්තයි. මේ කියන කාරණය කෙනෙකුට

ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. මේ අපි කියන සම්මා දිට්ඨියත් අතහරින්න වෙනවද කියල. ඔතනයි ප්‍රශ්නය තියෙන්නෙ. අපි මේ ලොකුවට අල්ලගෙන ඉන්නෙ සම්මා දිට්ඨියනෙ. අපි කිව්ව හැටියට හැටතුන්වෙනි එකත් සම්මාදිට්ඨිය නම් ඒකත් අතහරින්න වෙනව. අතහැරියහම කොහොමද? ඒකත් අතහැරියහම අපේ බෞද්ධකමත් යනවනෙ. ඔතෙන්දි තමයි අපි මතක් කරගන්න ඕනෙ අර අලගද්දූපම සූත්‍රය. අලගද්දූපම සූත්‍රයේ මේ පින්වතුන් අපේ දේශනාවලින් හා පොතපතින් දැනගෙන ඇති - ඒ සූත්‍රයේ විශේෂත්වය තියෙන්නේ අර පහුරේ උපමාව තුළයි. ඊළඟට සර්පයාගේ උපමාව තුළයි. ඒ විශේෂ උපමා දෙකක් තියනව. පහුර උපමාව ගැන කියනව නම් බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියනව අලගද්දූපම සූත්‍රයේදී පමණක් නොවෙයි ඊට පස්සෙත් ඒක ආශ්‍රයෙන් සංඝයා වහන්සේලාට මතක් කරල දීල තියනවා මා විසින් මේ ධර්මය දේශනා කරල තියෙන්නේ '**නිත්ථරණත්ථාය නො ගහණත්ථාය**' එතරවීම සඳහා මිසක් ග්‍රහණය සඳහා නොවෙයි කියල.

එතකොට ඒ පහුරේ කථාවේ පහුර ටිකක් 'ලිහල' බලමු. පහුර ලිහුවහම තියෙන්නේ මොනවද? මෙතෙර තියන ගස්වල අතු තියෙන්න පුළුවන්. ඊළඟට වැල් තියෙන්න පුළුවන්. ඕව එකතු කරලනෙ පහුර හදාගන්නෙ. මේක හදාගත්තෙ මොකටද? අල්ලගෙන ඉන්නද? සරසන්නද? නැහැනේ? එතෙර වෙන්න පමණයි. එතෙර වෙන්නෙ කොහොමද? නැවක් ගැන කියන්නෙ නැතුව මේ පහුරක් ගැන කිව්වෙ මොකද? '**හත්ථේහිච පාදෙහිච වායමමානො**' පහුර උපකාර කරගෙන. පහුර උපකාර කරගෙන අත්පාවලින් උත්සහයක් කරල ඕන මේ පහුරෙන් එතරවෙන්නෙ. එතර උනාට පස්සෙ පහුර කරගහගෙන යන්නෙ නැහැ. ඇයි? පහුරෙ වටිනාකම නැහැනෙ එතර උනාට පස්සෙ. එයින් අපට පෙන්වන්නෙ මොකක්ද? සම්මාදිට්ඨිය හුදෙක්, - **හුදෙක්** - එතරවීම සඳහා මිසක් ග්‍රහණය සඳහා නොවෙයි. **අනිත් ඒව වගේම ඒකත් ග්‍රහණය කරගත්තොත් අල්ලගන්නෙ මොනවද? අන්න අර කියාපු සංඥා අකුරු.** අර අනිත් අය කළ දේම තමයි අපිත් කරන්නෙ. ඔය ටික තේරුම් ගන්න බොහොම අමාරුයි. දැන් වෙලා තියෙන්නෙ අනික් පැත්ත. පයර්‍යාපතිය හෝ වේවා කොයි එක හෝ වේවා අපි අල්ලා ගැනීම තුලින් ඊළඟට 'ඉදමෙව සච්චං' කියන්නෙ අන්න ඒ විදියටයි. ඒකට තවත් හේතුවක් අපට දක්වන්න පුළුවන්.



කීප තැනකම සඳහන් වෙන කාරණයක් අපි අපේ ඇතැම් දේශනාවලදී කිවුවා '**ද්වයතාව**' කියන වචනය. අපේ සම්ප්‍රදාය තුළ යටපත් වෙච්ච වචනයක්, 'ද්වයතාව' - දෙකක් පිළිබඳ කථාව. මේ ද්වයතාව ඉක්මවන කෙනෙක් තමයි බුදුරජාණන් වහන්සේ. ඒකයි බුදුරජාණන් වහන්සේ මෙතෙන්දි කියන්නේ, **පුඤ්ඤ පාප පහීන.** පුඤ්ඤ පාප දෙකම ප්‍රහීන කළා. තවත් බොහෝ තැන්වල ඒ විදියට කියනව. දැන් ඔය ධම්මපද ගාථාවක් තියනවා. '**යස්ස පාරං අපාරංවා පාරාපාරං න විජ්ජති**' රහතන් වහන්සේලා බුදුරජාණන් වහන්සේලා ගැන කියන්නෙ. යම් කෙනෙකුට පරතෙරකුත් නැහැ. මෙතෙරකුත් නැහැ. පරතෙරක් මෙතෙරක් කියලා ඒ දෙකකුත් නැහැ. මොකද ද්වයතාවෙන් මිදුනයි කියන අවස්ථාව. මහ ගැඹුරු කාරණයක් ඒක. මොකද එතරවීම තුළින් අන්තිමට **එතරවීමට උපකාරවෙන ඒ ඥානයවත් අල්ලගන්නෙ නැහැ. 'අනුපාදා විමුත්තො'** අන්න ඒක නිසා තමයි මෙතන වෙනසක් දක්වල තියෙන්නේ. **මෙතන යොදල තියෙන්නේ 'සමණප්පවාද' කියල.** දෘෂ්ටි කියන වචනයවත් නොවෙයි. ඒ නිසා තමයි අපි කියන්නෙ සම්මාදිට්ඨිය ඍජු කරගන්න කියල. **සම්මාදිට්ඨිය ඇත්ත වශයෙන්ම මාර්ග අවස්ථාවේදීයි කෙනෙකුට පහළ වෙන්නෙ කියල. එතකං තියෙන්නෙ වචන මාලාව විතරයි. ඒකෙ ප්‍රායෝගික වටිනාකමක් තිබෙන බව ඇත්තයි. ඒක හැදිල තියෙන්නෙ, අර කියාපු ගස්කොළන්වලින් පහුර හැදුන වගේ ව්‍යවහාරයේ තියෙන වචන අකුරුවලින්, හැදිල තියෙන්නේ. සම්මාදිට්ඨිය** ඒක උපකාර කරගන්න ඕන අර පහුර වගේ. එතරවීම සඳහා පමණයි ග්‍රහණය සඳහා නොවෙයි. ඔන්න ඔය අදහසයි තියෙන්නෙ. ඒ එක්කම අපට තියෙනව අර සභිය පරිබ්‍රාජකයා යොදාගත්තු වචනය '**ඔසරණානි**' ඒවා අල්ලගත්තොත් වෙන්නෙ මෙහා පැත්තට ඇදිල එනවා. අතහැරීම කියන එකෙයි නිස්සරණ කියන නික්මීම තියෙන්නෙ. මේකෙදි අපට ධර්මයේ මහපුදුම පැත්තක් හෙළිවෙනව. ඒකයි අපි කිවුවෙ අනේපිඬු සිටාණන් එසේ මෙසේ කෙනෙක් නොවෙයි කියල. ඒක පැත්තකින් බැලුවහම පොඩි දෙයක් කියල හිතෙන්න පුළුවන්. සෝවාන් මාර්ගඥානයේ සත්‍ය දර්ශනය. මේ පින්වතුන් ඔය කියන්නෙ -

**'දිට්ඨිංච අනුපගම්ම සීලවා - දස්සනෙන සම්පන්නො'**

දෘෂ්ටිය අල්ල ගත්තෙ නැහැ. ඒ උනත් දර්ශනයෙන් යුක්තයි' ඒ නිසයි අනේපිඬු සිටාණන් බය නැතුව කථාකළේ. බලන්න බුදුරජාණන්

වහන්සේ කොයිතරම් පුදුම ප්‍රශංසාවක්ද ඒ අනේපිඬු සිටාණන් වෙනුවෙන් දුන්නෙ? ඇයි මේ පින්වතුන්ට බැරි ඒ පැත්තෙන් යන්න කියල හිතන්න ඕනෙ. අර පිළිතුරු දුන්න ආකාරය බලන්න කොයිතරම් ඥානවන්තද කියල. අනිත් අයට කිව්වෙ ඕගොල්ලන්ගෙ දෘෂ්ටි කියන්න. කිව්වට පස්සෙ ඒක විග්‍රහ කලා. ඒ හැම එකක්ම අයෝනිසෝ මනසිකාරයෙන් ජනිත දේවල්. ඒවා හිතින් හදාගත්තු සංඛත දේවල්. හිතින් සකස්කර ගත්තු දේවල්. ඒවා හැම එකක්ම අනිත්‍යයි. ඒවා අල්ලාගත්තොත් වෙන්නෙ අනිත්‍යදේ අල්ලාගත්තා වෙනවා. අනිත්‍ය නම් ඒක දුකයි. දුක නම් ඒක අල්ලගත්තොත් එතනින් එහාට යන්න බැහැ. අන්න ඒ විදියේ ගැඹුරු අර්ථයක් එතනින් කියවෙන්නෙ. ඒ වෙනුවට අනේපිඬු සිටාණන් අන්තිමට කිව්ව ඊට වඩා **නිස්සරණයක්** මට පේනව. ඒ **නිස්සරණය** තමයි බුදුරජාණන් වහන්සේ දක්වන ඕඝ තරණයෙන් පසුව එන **නිස්සරණය.** ඒ නිස්සරණයට අදාළ වචන රාශියක් ධම්මපද ආදියේ තියනව. ඒවා සමහරවිට තෝරගන්න බැරිව ඉන්නවා. **ඛයතාවෙන්** මිදුනු බව දක්වනවා.

කෙනෙක් ඒක ගැන සැක හිතනව කොහොමද අපි පින් පව් දෙකම අතහැරියහම කියල. මෙතන තියෙන්නේ අර පහුර මෙතෙරදීම කඩා බිඳදැමීමක් නොවෙයි. එහෙම කඩා බිඳ දැමීම තමයි අන්න අලගද්දූපම සූත්‍රයේ තියෙන දෙවන උපමාව. සර්පයාගේ උපමාව ගැන කියල තියෙන්නෙ ඒකයි. සර්පයාගේ වල්ගෙන් අල්ලාගත්තොත් සර්පයා දෂ්ට කරනවා. තර්ක කාරයින් ඒක අල්ලගෙන යනවා. ''බුදුරජාණන් වහන්සේ කියල තියෙන්නෙ පින්පව් අතහරින්න කියල පින්පව් කිරීම තුළින් සංසාරය වැඩෙනව'' කියල. ඔන්න අනිත් පැත්ත ඒ යන්නේ. ඒ සඳහා යම් අවස්ථාවක් එනව. මේව අතහරින්න වෙනව. ඒකට අදාළව විසුද්ධිමග්ගයේ තියන උපමාවක් අපි නිතර ප්‍රයෝජනයට ගත්ත. යම්කිසි දොලපාරක් වේගයෙන් ගලාගෙන යන අතරේ ඒකෙන් එතරවෙන්න බලාපොරොත්තුවන කෙනෙකුට එක ක්‍රමයක් තියනව. මෙහාපැත්තෙ ගහේ එල්ලෙන වැලක එල්ලිලා පැද්දෙනවා. පැද්දිලා පැද්දිලා පැද්දිලා එහා පැත්තට ගිය හැටියේ වැල අතහරිනවා. වැල අතහැරියෙ නැත්නම් ආයිත් පැද්දිලා එනවනෙ. **අන්න ඒ වැල තමයි සංස්කාර කියන්නේ. යෝගාවචරයා මේ හැම එකක්ම දිහා බලන්නේ සංස්කාර හැටියට.**



**සංස්කාර අනිත්‍යයි. අනිත්‍ය නම් ඒවා දුකයි. දුක නම් ඒවා අනාත්මයි.** බුදුරජාණන් වහන්සේත් ඒකනෙ ප්‍රකාශ කරන්නේ. 'නෙතං මම නෙසො හමස්මි නමෙ සො අත්තා' වච්ඡගොත්ත පරිබ්‍රාජකයාට කියනවා මම ප්‍රඥාවෙන් දැක්ක. 'මෙය මගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවෙයි කියල පංච උපාදානස්කන්ධය ගැන ප්‍රකාශ කරන අවස්ථාවේ. හැබැයි ඒ දෘෂ්ටිය වත් මම අල්ල ගන්නෙ නැහැ. මොකද ඒක උපකාර කරගෙන මම එතරවෙලා. '**අනුපාදා විමුත්තො**' ග්‍රහණය නොකරගත් තත්ත්වයට පත්උනයි කියනවා. යටත් පිරිසෙයින් මේකටවත් හිත යොදනව නම් අර අන්ත දෙකක් තිබෙන බව. මේ ප්‍රතිපදාවේ කොහෙත්ම නොහික්මෙන අය ඒවා බලාපොරොත්තුත් නැතිව බුද්ධ වචනය වැරදිව අරගෙන අනෙක් අන්තයට යනව. සර්පයාගේ වලිගෙන් අල්ලගත්ත වගේ. **එතර වෙන්නත් කලින් පහුර බිඳදාල වැඩේ ඉවර කරගන්න බලනවා. නමුත් අනිත් පැත්තෙන් ඉන්නව පහුර කරගහගෙන යන අය. දැන් අපේ පිරිස අතරෙ වැඩිපුර ඉන්නෙ එබඳු අයයි.** මෙතෙරම පහුර කරගහගෙන එහාට මෙහාට යනව. එතර වෙන්න බලාපොරොත්තුවක් වත් නැහැ. ඒ පහුරත් දැන් හුඟක් විසාලයි. එන්න එන්නම විසාලයි. ඒකත් කරගහගෙන එහාට මෙහාට යනවා. ඒක නිසා තමයි ධම්මපදයේ දැක්වෙන්නේ

**අප්පකා තෙ මනුස්සෙසු**
**යෙ ජනා පාර ගාමිනො**
**අථායං ඉතරා පජා**
**තීරමෙවානුධාවති**

මනුෂ්‍යයින් අතර බොහොම ටික දෙනයි එතරට යන්නෙ. අනිත් අය මෙතෙරම එහාට මෙහාට දුවනව. කෝ තාම ලැස්ති නැද්ද පහුර? කියල. ඔන්න ඔහොම දෙයක් මෙතන තියෙන්නෙ. ඒ නිසා මේ පින්වතුන් මේක ආශ්‍රයෙන් අපි මේ ඔක්කොම කියන්නේ දෘෂ්ටි වශයෙන් ගැනීමට නොවෙයි. අවදි කරන්න. අවදිමත් කරන්න. අපේ ධර්මය තියෙන්නෙ මොකක් සඳහාද කියල. **අපි නිතර කියන එකක් පර්යාප්තිය තියෙන්නේ ප්‍රතිපත්තිය සඳහා. ප්‍රතිපත්තිය තියෙන්නේ ප්‍රතිවේධය සඳහා.** ඊළඟට විශුද්ධි පරම්පරාව ගැන බැලුවත් අපි කලින් අවස්ථාවක දක්වපු රථවිනීත ආදී සූත්‍රවල තියෙන්නේ අර ධර්මතාවමයි. මේ මුළු මහත් සද්ධර්මයම අළලා

සාර්ථක දේශනාවක් - සාර්ථක නොවෙන්න පුළුවන් - සාරවත් දේශනාවක් පවත්වන්න පුළුවන් එකම වචනයක් ඉදිරිපත් කරගෙන. මොකක්ද වචනය '**යාවදෙව**'. '**යාවදෙව**' කියන වචනයේ තේරුම පින්වතුනි '**හුදෙක්**' දැන් ඒක ව්‍යවහාරයේ තියෙනවද කියල මම දන්නෙ නැහැ. හුදෙක් කියන වචනය '**මේ සඳහා පමණක්ය**' කියන එක. ඒක තමයි ඔය රථ විනීත සූත්‍රය ආදියේදී අපි නොයෙකුත් ආකාරයෙන් සහාය දිවීමේ ආදී උපමාවලින් පෙන්නුවේ. දිනන්නෙක් නැහැ අන්තිමට බලනකොට. එකක් අනිකක් සඳහා, එකක් අනිකක් සඳහා. කොසොල් රජ්ජුරුවො සැවැත්නුවර ඉඳල සාකේතය දක්වා යන්න තිබුන හදිස්සි ගමනේදී රථ පිළියෙල කරල තිබුන අශ්වයින්ට වෙහෙස නිසා එක ගැම්මක් දුවල ඉවරවෙලා ඒ රථය අතහැරල වෙන රථයකට නගිනවා. ඒක අතහැරල තුන්වෙනි එකට නගිනවා. ඔහොම ඔහොම ගිහිල්ල සාකේත නුවරට ගියාට පස්සෙ කවුරුහරි ඇහුවොත් මහරජ, කොහොමද ආවෙ කියල අර සම්පූර්ණ කථාන්තරය කියන්න වෙනව. මුල් එකෙනුත් නොවෙයි. දෙවෙනි එකෙනුත් නොවෙයි. තුන්වෙනි එකෙනුත් නොවෙයි. ඒවා උපකාර කරගෙන ඒවා නැතුවත් නොවෙයි. අන්න ඒ විදියේ මහා පුදුම තත්වයක් මේ ධර්මයේ තියනවා. **ඕක තමයි මධ්‍යම ප්‍රතිපදාව.** මොකද ලෝකයා ඉන්නෙ 'ඇත. නැත' කියන දෙක තුළයි. දෘෂටි ඔක්කොම තියෙන්නෙ මේ දෙක තුළයි. **ඒ නිසා තමයි දෘෂ්ටිය පිරිසිදු කරගන්න ඕනෙ. පිරිසිදු කරගන්නෙ බමුණන් වගේ ගඟේ බැහැල නොවෙයි. මේකෙ යෙදිලයි.** ඒ යෙදීම තුළින් යම් අවස්ථාවක ත්‍රිලක්ෂණය පිළිබඳ ඒ බුද්ධ දේශනාව යම්යෝගාවචරයෙක් උපකාර කරගෙන ඒ නියමිත තත්ත්වයට පැමිණුනානම් අන්න ඒක දර්ශනයක් බවට පත්වෙනව, ඒ ධර්මයේ ඕපනයික ගුණය තුළින්, අන්න එබඳු අවස්ථාවලදී **ඇතුළතින් එන ආලෝකයක් තුළින් එහෙම නැත්නම් අවබෝධයක් තුළින් දකිනව. ඒකයි දහම් ඇස කියල කියන්නේ.**

ඒ දහම් ඇස උදාවුනු කෙනෙක් අනේපිඬු සිටාණන්. ඒකයි බය නැතුව කථා කළේ. මේකවත් මම දෘෂටියක් හැටියට ගන්නෙ නැහැ. 'නෙතං මම, නොසොහමස්මි න මෙසො අත්තා' කියන එකත් මම දෘෂටියක් හැටියට ගන්නෙ නැහැ. ඊට එහා නිස්සරණයක් මා දන්නවා කියල කිවුවෙ. අන්න අර චතුරෝඝයෙන් එතරවීමයි. ඒ ටික කොයිතරම් ලස්සනට සභිය පරිබ්‍රාජකයාට පළමුවෙනි වරට ඉදිරිපත් කළාද කියන එක



සම්පූර්ණ සූත්‍රය සැලකිල්ලෙන් කිවුවොත් තේරෙයි. චතු පටිසම්භිදා කියන සිවුපිළිසිඹියාව ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ ඒ සමාජයේ තිබුන එක එක වචනයක් තමන්ගේ ධර්මය ඉදිරිපත් කරන ඥානයක් බවට පුදුමාකාර ලෙස යොදාගත්ත. ඒකෙ අර්ථය ධර්මය නිරුක්තිය ඒකට අනුව ගිය ප්‍රතිභානය ආශ්‍රය කරගෙන. ඒ අනුව අපි කල්පනා කරන්ට ඕන. **සම්මා දිට්ඨිය කියනකොට බොහෝ දෙනෙක් සිතන්නේ පොත පත හා සම්බන්ධ දෙයක්. එහෙම නැත්නම් ඒ වචනය. ඒවා අනවශ්‍ය නෙවෙයි. ඒවා උපකාර වන්නෙ ඒකෙන් එතර වෙන්න උත්සාහ කරන කෙනාටයි. අනිත් අය ඒක සර්පයාගේ වල්ගෙන් අල්ලගත්ත වගේ. ඒවා මුලදීම ප්‍රතික්ෂේප කරල පහුර බිඳදාල විපතට පත් වෙනව. ඔය මැදුම් පිළිවෙත හොඳට තේරුම් ගන්න ඕන.** ඒකට උපකාර වෙනව අද දින මේ පැවැත්වූ දේශනාව. මේක දීර්ඝ සූත්‍රයක් නිසා එක එකක් පරිවර්තනය කරන්න බැහැ. යම්තම් මතුකරල දුන්න විතරයි. ඒ ආශ්‍රයෙන් තේරුම් ගන්න ඕන සිවුපිළිසිඹියා කියන එක බුදු කෙනෙකුට වගේම සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනව උන්වහන්සේට උපසම්පදා වෙලා සති දෙකකින් සිවුපිළිසිඹියා ඇති උනා කියල. ඒ විධියට ධර්මයේ සඳහන් වෙනවා. සිවුපිළිසිඹියාව කියන ඒ භාෂාව විනිවිද දැකල යමක් ඒත්තුයන අන්දමින් පැහැදිලි කිරීමට හැකියාවක් ඇති අය. එබඳු ඒ හැකියාව ඇති අය නොබෝ කලකින්ම ඒ තත්ත්වයට පත්වෙන බවත් සඳහන් වෙනවා. ඒ හැම එකකටම උපකාර වෙනව ධර්මය කටපාඩම් කරල ගිරව් වගේ කියන එක නොවේ. ඔන්න ඔය විදියෙ ගැඹුරු සූත්‍ර ආශ්‍රයෙන් ඒවට හිත යොදල ඒක සමථයේ ශක්තිය තුළින් ඇතිකරගත්තු විදර්ශනාව යොදල තේරුම් ගන්න යනකොට යම් අවස්ථාවක් එනව අර පහුරත් අතහරින්න පුළුවන් විදියේ තත්ත්වයක්. ඒකයි මේ ධර්මයේ තිබෙන ගැඹුරුම කොටස. ඒක වඩාත්ම සුත්ත නිපාතයේ ඒ ඒ තැන්වල මහ පුදුම අන්දමින් දක්වනව. අර එතරත් මෙතරත් දෙකම අතහැරිය වගේ පින් පව් දෙකම අතහරින්නය. කළු සුදු දෙකම අතහරින්නය. ඒ කථාව කියන්නේ අරටික මතු කරන්නයි. **වෙන කිසිම දර්ශනයක නැති මහපුදුම දෙයක් මෙතන, හැටතුන්වෙනි ශ්‍රමණප්‍රවාදය තුළ තියෙන්නේ. ග්‍රහණය කිරීම සඳහා නොවෙයි, එතරවීම සඳහායි.**

මේවා යම් යම් ප්‍රමාණයකට මේ පින්වතුන්ට තේරෙනවා කියල හිතනවා. ඒවා ආශ්‍රයෙන් ඒ සභිය පරිබ්‍රාජකයාගේ ඒ ශ්‍රේෂ්ඨ චර්යාවත් ඒ

ශ්‍රේෂ්ඨ චරිතයත් බුදුරජාණන් වහන්සේ පිළිතුරු වශයෙන් වදාළ ගාථාවල ගැඹුරත් අපි කල්පනා කරන්ට ඕන. අපේ යෝගාවචර ජීවිතයට - ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා - ඒවා කඩපාඩම් කර කර පර්යාප්ති පැත්ත විතරක් නොවෙයි. ඒවා අවබෝධ කරගන්නයි ඕනෙ. ගැඹුරින් ඒක විනිවිද දැකල තමන්ගේ ප්‍රත්‍යක්ෂය හා සංසන්දනය කරල එදිනෙදා ජීවිතයේ. මේක අමුතු දෙයක් නොවෙයි. මේ බඹයක් පමණ වූ ශරීරයේම - සංඥාවත් මනසත් ඇති ශරීරයේම - ලෝකයත් ලෝකයේ හටගැන්මත් ලෝක නිරෝධයත් ලෝක නිරෝධ ගාමිණී මාර්ගයත් තියන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියනව. **ඒ නිසා වැඩි ඈතට යන්න ඕනෙ නැහැ. මේවා සොයන්න. තම තමන්ගේම පංච උපාදානස්කන්ධය අරවිදියට නුවණින් පිරික්සල බලල අනිත්‍ය ස්වභාවය දැකල යමක් අනිත්‍ය නම් එය දුකයි. දුක නම් එය මගේ කියල ගන්න දෙයක් නැහැ කියන ඒ චින්තනය තුළයි විදර්ශනා වැඩීමෙන් දර්ශනයක් බවට පත්වෙන්නෙ.** ඒක නිසා මේ වචන ටික ආශ්‍රයෙන් මේ පින්වතුන් තම තමන්ගේ ඒ යෝගාවචර ජීවිතය හැඩගස්වාගෙන හැකිතාක් ඉක්මණින් මේ සංසාර දුක් කෙළවර කරල උතුම් අමාමහ නිවනට එතරවීමට හැකියාව ලබත්වා කියල අපි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුශලයක් අනුමෝදන් වීමට කැමතිනම් ඒ අනුමෝන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් වූ අමාමහ නිවනින් සැනසෙත්වා කියා ප්‍රාර්ථනා ඇතිකරගෙන මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හේහි...'